සටහන

2025 අප්‍රේල් - ජූනි
44 වෙළුම 4 - 6 කලාපය

මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ සටහන විශේෂ කලාපය

- නිවැරදි පුද්ගල මූල්‍ය කළමනාකරණය සහ මූල්‍ය ස්ථාවරත්වය
- දිවි මග ජය පිණිස ළඟා කර ගත යුතු මූල්‍ය සාක්ෂරතාව
- දැන ගෙන ණය ගමු... උගුලේ නොවැටෙමු...
- මූල්‍ය සාක්ෂරතාවය සහ අයවැයකරණය
- පුද්ගල මූල්‍ය කළමනාකරණය
- මූල්‍ය පාරිභෝගිකයෙකු ලෙස ඔබගේ අයිතිවාසිකම් හා යුතුකම් හඳුනා ගනිමු!
- තහනම් යෝජනා ක්‍රම හෙවත් පිරමිඩ යෝජනා ක්‍රමවල අහිතකර ප්‍රතිඵල හා ඒවායින් වැළකී සිටීමේ අවශ්‍යතාව
- මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහිලා මූල්‍ය ආයතන සතු වගකීම
- ඉතිරි කිරීමේ කලාව: හුදෙක් එය වියදම් කපා හැරීමකට වඩා වැඩි දෙයක් වන්නේ ඇයි?
- මොකක්ද මේ මූල්‍ය ආයතන නිරාකරණය?
- මූල්‍ය වංචා හඳුනා ගනිමු: ඩිජිටල් ලෝකයක ඔබ ආරක්ෂා වන්නේ කෙසේද?
- ගෙවීම් කාඩ්පත්වල විකාශය: වර්තමාන ගැටලු සහ ඉදිරි ගමන් මග

රු. 150/-

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

0 06667 90427 9
ISSN 1391-3697

මූල්‍ය සාක්ෂරතාව ගැන ....





උපුටා ගැනීම: "මූල්‍ය සාක්ෂරතාව"
(ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රකාශනයකි-2011)

නිවැරදි පුද්ගල මූල්‍ය කළමනාකරණය සහ මූල්‍ය ස්ථාවරත්වය

සංජීව ගුරුගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය

පුද්ගල මූල්‍ය කළමණාකරණය යනු පුද්ගලයෙකුගේ මූල්‍ය සම්පත් උචිත ලෙස කළමණාකරණය හරහා මූල්‍ය ස්ථාවරත්වයක් ඇතිකර ගැනීම සහ එම මූල්‍ය තත්ත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කිරීමයි. එලෙස මූල්‍ය ස්ථාවරත්වයක් ඇති කර ගැනීම අංශ කිහිපයක් නිසි ලෙස සැලසුම් කිරීම සහ එම සැලසුම් නිවැරදි ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් ඇතිකර ගත යුතු ය. එනම්, නිවැරදි ලෙස ආදායම් උපයා ගැනීම, අයවැය සැලසුම් කිරීම, ඉතිරි කිරීම, වියදම් නිසි ලෙස කළමණාකරණය, ණය නිසි ආකාරයෙන් පාලනය කිරීම, ඵලදායී ආයෝජනයන් සිදු කිරීම ආදී ක්ෂේත්‍රවලට අදාළ කටයුතු සැලකිලිමත් ව සැලසුම් කිරීම සහ නිසියාකාර ව ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු ය.

නිසි පෞද්ගලික මූල්‍ය සැලසුමක් ක්‍රියාත්මක කිරීම පුද්ගලයින්ට කෙටි කාලීන සහ දිගු කාලීන මූල්‍ය ඉලක්ක ළඟා කර ගැනීමට මෙන් ම මූල්‍ය ආර්ථික අපහසුතාවලට මුහුණ නොදීමට ද උපකාරී වේ. නිසි මූල්‍ය කළමණාකරණය පුද්ගලයෙකුට ස්ථාවර ධනයක් ගොඩනගා ගැනීම, අනපේක්ෂිත සිදුවීම්වලට මුහුණ දීමට ඇති හැකියාව වර්ධනය කිරීම මෙන් ම දීර්ඝ කාලීන ව මූල්‍ය ස්වාධීනත්වයක් ලබා ගැනීමට ද සහාය වේ.

නිවැරදි ආදායම් උත්පාදනය

නිසි ආචාරධර්මවලට අනුකූල ව, තිරසර ආකාරයෙන් ආදායම් උපයා ගැනීම යනු පෞද්ගලික මූල්‍ය කළමණාකරණයේ මූලික පදනමයි. නීත්‍යානුකූල ව උපයාගනු ලබන ස්ථාවර ආදායමක් ඇතිකර ගැනීම පුද්ගලයෙකුට මූල්‍ය ආරක්ෂාවක් ඇති කරන අතර තම මූල්‍ය කටයුතු නිසියාකාර ව ඵලදායී ලෙස සැලසුම් කිරීමට ද ඉඩ සලසයි. ආදායම් උපයා ගැනීම විවිධ ක්‍රම මගින් සිදු කළ හැකි අතර ඒ එක් එක් ක්‍රමයෙහි ඇති වාසි සහ එලෙස ආදායම් උපයා ගැනීමේ දී මුහුණ දීමට සිදු වන අභියෝග සලකා බැලීම වැදගත් ය.

තම අධ්‍යාපන සුදුසුකම් හෝ කුසලතා උපයෝගී කරගෙන රැකියාවක් කිරීම තුළින් වැටුපක් උපයා ගැනීම බොහෝ දෙනෙක් ආදායම් උපදවා ගැනීමට යොදා ගනු ලබන පොදු ක්‍රමයකි. පූර්ණ කාලීන සහ අර්ධ කාලීන රැකියාවල නිරත වීම තුළින් ස්ථාවර ආදායම් ප්‍රවාහයක් ලබා ගැනීම සහ, වෛද්‍ය ප්‍රතිලාභ, රක්ෂණ ආවරණ මෙන් ම විශ්‍රාම ප්‍රතිලාභ වැනි අනෙකුත් විවිධ ප්‍රතිලාභ ලබා ගැනීමට ද එය උපකාරී වේ. ඒ අනුව පුද්ගලයෙකුට ස්ථිර රැකියාවක් කිරීම මූල්‍ය ආරක්ෂාවක් ලබා දෙන අතර ම, ක්‍රමානුකූල ව ඉතිරි කිරීමට සහ ආයෝජනයන් සිදු කිරීමට ද එය උපකාරී වේ.

අතුරු රැකියා සහ නිදහස් රැකියා ද (freelancing) ආදායම් උපයා ගැනීම සඳහා යොදාගනු ලබන විකල්ප ක්‍රම ලෙස ප්‍රචලිත ව ඇත. බොහෝ පුද්ගලයන් තම ප්‍රධාන රැකියාවට අමතර ව, තම කුසලතාවන්ට අනුව විවිධ අතුරු රැකියාවල නිරත වීම තුළින් මෙලෙස

ආදායම් උපදවා ගනිති. විවිධාකාර ලේඛන කටයුතුවල නිරත වීම, දේශන පැවැත්වීම, උපදේශන සේවා සැපයීම, තොරතුරු තාක්ෂණය සම්බන්ධ සේවා සැපයීම විවිධ පුද්ගලයින් ආදායම් උපයා ගැනීමට නිරතවන අතුරු රැකියාවලට උදාහරණ ලෙස දැක්විය හැකි ය. මෙවැනි අතුරු රැකියා මගින් අමතර ආදායමක් ලබාගත හැකි අතර පුද්ගලයෙකුට වඩාත් ස්වාධීන ව ක්‍රියා කිරීමට අති හැකියාව ද වර්ධනය කරයි.

එසේම ව්‍යවසායකත්වය මගින් පුද්ගලයෙකුට තමන්ගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීම තුළින් ආදායම් ලබා ගත හැකිය. ව්‍යවසායකත්වය හරහා ඉහළ ආදායමක් උපයා ගැනීමේ හැකියාව තිබුණ ද, ඒ සඳහා විවිධ අවදානම්වලට මුහුණ දීමට සිදුවන අතර අදාළ ව්‍යාපාර කටයුතු ඒ පිලිබඳ නිසි දැනුමකින් සහ දක්ෂ කළමණාකරණයකින් සිදු කිරීම අත්‍යවශ්‍ය කරුණක් වේ.

කිසියම් කාල පරිච්ඡේදයක් තුළ ඍජු ව කාලය කැප කිරීමකින් හෝ වෙහෙස වීමකින් තොරව, අනෙකුත් වක්‍රව ආදායම් උපයා ගැනීමේ මූලාශ්‍ර (passive income sources) මගින් ආදායම් උපදවා ගැනීම පුද්ගල මූල්‍යකරණයේ වැදගත් අංගයක් ලෙස සැලකිය හැකි ය. එලෙස ඒ වෙනුවෙන් ඍජු ව කාලය කැප කිරීමකින් තොර ව ආදායම් ලබා ගැනීමට, පුද්ගලයෙකු සතු ව ආදායම් ජනිත කරවන වත්කම් සහ දේපොළ තිබිය යුතු ය. එනම් බදු කුලී ආදායම් උපයා ගත හැකි ඉඩම් සහ ගොඩනැගිලි, රථවාහන, යන්ත්‍රෝපකරණ වැනි භෞතික වත්කම් (Real Assets) හෝ බැඳුම්කර, ණයකර සහ ව්‍යාපාර කොටස් වැනි මූල්‍ය වත්කම් (Financial Assets) අත්පත් කරගැනීම තුළින් කිසියම් කාල පරිච්ඡේදයක් තුල අවම ක්‍රියාකාරී ප්‍රයත්නයක් දැරීම තුළින් ආදායම් උපදවා ගැනීමට පුද්ගලයෙකුට හැකියාව ලැබේ.

පුද්ගලයෙකුට තම ආදායම් උපදවා ගැනීමේ හැකියාව වර්ධනය කර ගැනීම සඳහා ඒ වෙනුවෙන් අවශ්‍ය වන සුදුසුකම්, දක්ෂතා සහ නිපුණතා වර්ධනය කරගැනීම ඉතා වැදගත් සාධකයක් වේ. වෙනස් වන අවශ්‍යතා නිසියාකාර ව හඳුනා ගනිමින් අඛණ්ඩ ව උසස් අධ්‍යාපනය ලබා ගැනීම සහ පුහුණු පාඨමාලාවලට සහභාගී වීම තුළින් පුද්ගලයෙකුට තම කුසලතා වර්ධනය කර ගැනීමට හැකි වන අතර එය වඩා හොඳ රැකියා අවස්ථා ලබා ගැනීමට උපකාරී වේ. එමෙන් ම ඉතා වේගයෙන් සහ නිරතුරු ව වෙනස්වන රැකියා වෙළෙඳපොළ තුළ ඇති තරගකාරීත්වයට මුහුණ දීමට ඇති හැකියාව වර්ධනය කරගැනීම තුළින් ආදායම් උපයා ගැනීමේ හැකියාව වර්ධනය කර ගත හැකි ය.

විවිධ ආදායම් මූලාශ්‍ර ගොඩනගා ගැනීම තුළින් පුද්ගලයෙකුට මූල්‍ය ස්ථාවරත්වයක් ඇති කර ගැනීමට හැකිවන අතර, එක් ආදායම් මූලාශ්‍රයකට පමණක් සීමා වීමෙන් ඇති වන අවදානම අඩු කර ගැනීමටද හැකියාව ලැබේ. ලොව සිටින ඉහළම ධනවතෙක් වන වොරන් බෆට් (Warren Buffett) තම ආදර්ශවත් ජීවිතය තුළින් පෙන්වා දෙන්නේ, පුද්ගලයෙකු එක් ආදායම් මූලාශ්‍රයකට පමණක් සීමා නොවිය යුතු බවයි. ඒ අනුව, පුද්ගලයෙකුට මූල්‍ය ස්වාධීනත්වයක් සහ යහපත් ආර්ථික තත්ත්වයක් ගොඩනගා ගැනීමට හැකි වනුයේ, විවිධ ආදායම් මූලාශ්‍ර ඇතිකර ගැනීම සහ ඒ සඳහා වැදගත් වන දක්ෂතා වර්ධනය කරගැනීම හරහා ය.

ඉතිරි කිරීම

ඉතිරි කිරීම පුද්ගලයෙකුට මූල්‍ය ආරක්ෂාව ඇතිකර ගැනීමට සහ අනාගත අවශ්‍යතා සඳහා සූදානම් වීමට උපකාරී වන බැවින් එය පුද්ගල මූල්‍යකරණයට ඉතාමත් වැදගත් අංගයකි. නිසි ලෙස ඉතිරි කිරීම අනපේක්ෂිත වියදම් දැරීමට ඇති හැකියාව ඉහළ නංවන අතර ම, තම මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම තුළින් මානසික නිදහසක් පවත්වා ගැනීමටද පුද්ගලයෙකුට උපකාරී වේ. නිසි ලෙස ඉතිරි කිරීමට පුරුද්දක් ඇතිකර ගැනීම පුද්ගලයෙකුට ශක්තිමත් මූල්‍ය පදනමක් ඇතිකර ගැනීමට ඉවහල් වනවා පමණක් නොව, විවිධ අවශ්‍යතා සඳහා අනවශ්‍ය ලෙස ණය ලබා ගැනීම වළක්වා ගැනීමට ද උපකාරී වේ. ඒ අනුව ක්‍රමවත් ලෙස ඉතිරි කිරීමට මුදලක් අඛණ්ඩ ව වෙන් කිරීමට පුරුදු වීම

තුළින් පුද්ගලයෙකුට මූල්‍ය ස්වාධීනත්වයක් ඇති කර ගැනීමට මෙන් ම දිගු කාලීන ව ඉහළ ධනයක් ගොඩ නගා ගැනීමට ද හැකියාව ලැබේ.

ඉතිරි කිරීමේ වැදගත් අංගයක් වශයෙන් හදිසි අවස්ථා සඳහා යොදාගත හැකි අරමුදලක් ගොඩනගා ගැනීම සැලකිය හැකි ය. එවැනි අරමුදලක් පුද්ගලයෙකුට මූල්‍ය ආවරණයක් (financial safety net) ලෙස යොදාගත හැකි අතර එමගින් අනපේක්ෂිත ව ඇති විය හැකි අවස්ථාවලට මුහුණ දීමේ ශක්තිය ද ලබා දෙයි. ඉතිරි කිරීම් තුළින් ගොඩනගා ගනු ලබන එවැනි මූල්‍ය තත්ත්වයක් තුළින්, හදිසියේ වෛද්‍ය වියදම්, රැකියා අහිමි වීම් වැනි හේතු නිසා ඇතිවිය හැකි මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට හැකියාව ලැබේ. මූල්‍ය විශේෂඥයන් නිර්දේශ කරන්නේ අවම වශයෙන් මාස 3ත් 6ත් අතර කාල පරිච්ඡේදයකට අවශ්‍ය ජීවන වියදම සපුරාලිය හැකි මුදලක් ඉතිරි කිරීම් වශයෙන් පවත්වාගත යුතු බවයි. ඉතිරි කිරීම් තුළින් එවැනි අරමුදලක් ගොඩනගා ගැනීම තුළින්, මූල්‍ය අර්බුද ඇතිවිය හැකි කාලයක දී ඉහළ පොලියක් සහිත ණය (ක්‍රෙඩිට් කාඩ්පත් හෝ පුද්ගලික ණය) ලබා ගැනීමෙන් ඇති විය හැකි දුෂ්කරතා සහ මූල්‍ය අලාභයන් වළක්වා ගත හැකි ය.

"Phycology of Money" නමැති පුද්ගල මූල්‍යකරණය පිළිබඳව මෝගන් හවුසෙල් (Morgan Housel) විසින් රචිත කෘතියෙහි ඉතා පැහැදිලි ව දක්වා ඇත්තේ පුද්ගයෙකුට ඉතිරි කිරීමට විශේෂ හේතුවක් අවශ්‍ය නොවන බවයි. ඉතිරි කිරීම පුරුද්දක් ලෙස සිදු කළ යුතු අතර, එවැනි කෙටි කාලීන ව සිදුකරන ඉතිරි කිරීම් පුද්ගලයෙකුට ඉතා ම ප්‍රයෝජනවත් වේ. එවැනි කෙටිකාලීන ඉතිරි කිරීම් නිවසට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම, නිවාඩු ගත කිරීම, ගෘහ භාණ්ඩ නවීකරණය කිරීම වැනි කටයුතු සඳහා යොදාගත හැකි ය. වියදම් සිදුකිරීමට ප්‍රථම කිසියම් මුදලක් ඉතිරි කිරීම සඳහා වෙන්කිරීම තුළින්, පුද්ගලයෙකුට අවශ්‍ය නොවන කටයුතු සඳහා සිදුවිය හැකි වියදම් වැලැක්විය හැකි අතර, මූල්‍ය ආතතිය වලක්වා ගැනීමට ද එය උපකාරී වේ. කෙටිකාලීන ඉතුරුම් පවත්වා ගැනීම තුළින්, හදිසි අවස්ථා සඳහා යොදා ගැනීමට පවත්වාගෙන යනු ලබන අරමුදලින් මුදල් ලබාගැනීම අවම කරගැනීමට ද හැකියාව ලැබේ.

අනෙක් අතට දිගුකාලීන ඉතිරි කිරීම්, සැලකිය යුතු මුදලක් යෙදවිය යුතු දිගු කාලීන ව අවශ්‍ය වන කටයුතු සඳහා පවත්වාගෙන යා යුතු ය. එනම්, තම දරුවන්ගේ උසස් අධ්‍යාපන කටයුතු මූල්‍යනය කිරීම, නිවසක් මිලදී ගැනීම, විශ්‍රාම සැලසුම් කිරීම වැනි අනාගත ඉලක්ක සපුරා ගැනීමට දිගුකාලීන ඉතිරි කිරීම් අවශ්‍ය වේ. එවැනි ඉතිරි කිරීම් සඳහා මනා සැලසුම් කිරීමක් අවශ්‍ය වන අතර, ඒවා ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලබාගත හැකි මූලාශ්‍රයවල ආයෝජනය කළ යුතු ය. එලෙස ක්‍රමවත් ලෙස දිගුකාලීන ව මුදල් ඉතිරි කිරීම මගින්, පුද්ගලයන්ට මූල්‍ය ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමට මෙන් ම විශේෂ ජීවන අවස්ථා මූල්‍ය ආතතියකින් තොර ව ජය ගැනීමටද හැකියාව ලැබේ.

අයවැය සැලසුම් කිරීම

නිවැරදි සහ ක්‍රමවත් ලෙස අයවැය සැලසුම් කිරීම පුද්ගල මූල්‍ය කළමණාකරණයේ ඉතා වැදගත් අංගයක් වන අතර, එය පුද්ගලයන්ට මූල්‍ය විනිවිදභාවය පවත්වාගෙන යැමට සහ මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම සඳහා උපකාරී වේ. නිසියාකාර ව සැලසුම් කරන ලද අයවැයක් පවත්වා ගැනීම තුළින් පුද්ගලයෙකුට තම ආදායම් වියදම් පිළිබඳ ඉතා හොඳ අවබෝධයක් පවත්වා ගත හැකි වන අතර, ඒ අනුව තම ආදායමට සරිලන පරිදි තම වියදම් සහ ඉතිරි කිරීම් පිළිබඳ නිවැරදි තීරණ ගත හැකි ය. තම මූල්‍ය කටයුතු ක්‍රමවත් අයවැයක් මගින් නිසියාකාර ව කළමණාකරණය කිරීමෙන්, අනවශ්‍ය වියදම්වලට ආදායම යෙදවීම වලක්වා ගතහැකි අතර එමගින් මූල්‍ය ආතතිය අවම කර දිගුකාලීන මූල්‍ය ආරක්ෂාවක් ලබා ගැනීමට හැකි වනු ඇත.

අයවැය සැලසුම් කිරීමේ දී ඉතාමත් වැදගත් මුල් පියවරක් වනුයේ තම ආදායම සහ වියදම නිසිලෙස විශ්ලේෂණය කිරීම යි. තම වැටුපෙන් හෝ වෙනත් අදායම් මූලාශ්‍රවලින් කිසියම් කාල පරිච්ඡේදයක් තුළ ලබා ගත හැකි සමස්ත ආදායම නිවැරදි ව හඳුනා ගැනීම, කොපමණ මුදල් ප්‍රමාණයක් විවිධ අවශ්‍යතා සඳහා වෙන් කළ හැකිදැයි තීරණය කිරීමට අත්‍යවශ්‍ය



කරුණකි. එමෙන් ම පුද්ගලයෙකු විසින් තම වියදම් රටා නිවැරදි ව හඳුනා ගැනීම තුළින් අවශ්‍ය සහ අත්‍යවශ්‍ය නොවන වියදම් නිසි ලෙස හඳුනා ගැනීමට හැකි වේ. ඒ අනුව අයවැය සකස් කිරීමේ දී තමාට ලබා ගත හැකි සමස්ත ආදායමත්, එම අදායමට සරිලන පරිදි වියදම් සහ ඉතුරුම් තීරණය කිරීමත් පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගැනීම අයවැය සැලසුම් කිරීමට අත්‍යවශ්‍ය වේ.

ආදායම් සහ වියදම් නිසියාකාර ව විශ්ලේෂණය කිරීමෙන් අනතුරු ව, අදාළ වියදම් වර්ගකොට හඳුනා ගැනීම ඵලදායී මූල්‍ය කළමණාකරණය සඳහා ඉතාමත් වැදගත් වේ. ස්ථාවර සහ විචල්‍ය වශයෙන් වියදම් මූලික ව වර්ග කළ හැකි ය. ස්ථාවර වියදම් වන්නේ සෑම මසක ම, අඩු කිරීමකින් තොර ව නිසැක වශයෙන් ම දැරිය යුතු වියදම් වේ. එනම් බදු කුලී, ණය වාරික, රක්ෂණ වාරික, විදුලිය සහ ජල ගාස්තු වැනි වියදම් වන අතර මෙවැනි වියදම් බොහෝ දුරට නිශ්චිත ව ගණනය කළ හැකි බැවින් අයවැය සැකසීමේ දී ඒවාට මූලිකත්වය දිය යුතු ය. අනෙක් අතට, කිසියම් කාල පරිච්ඡේදයක තුළ පාලනය කළ හැකි, අත්‍යවශ්‍ය නොවන වියදම් විචල්‍ය වියදම් ලෙස සැලකිය හැකි ය. මෙවැනි වියදම් තම ආදායමට අනුව පාලනය කිරීමට හෝ පමා කිරීමට හැකියාවක් ඇත. නිවැරදි ව වියදම් වර්ගීකරණය කිරීම තුළින් අත්‍යවශ්‍ය සහ ඵලදායී වියදම් හඳුනා ගැනීමටත් අනවශ්‍ය වියදම් පාලනය කිරීමටත් හැකි වනවා මෙන් ම, ඉතිරි කිරීම් වර්ධනය කිරීමටත් උපකාරී වේ.

තවද වියදම් වර්ගීකරණය තුළින් එක් එක් වියදම් වර්ග සඳහා සීමාවන් නියම කර ගත හැකි අතර, තම ආදායමට ගැළපෙන අයුරින් වියදම් සැලසුම් කරගැනීමටත් එමගින් දිගු කාලීන ව මූල්‍ය ස්ථාවරත්වයක් ලබා ගැනීමටත් උපකාරී වේ. එලෙස ආදායමෙන් නිශ්චිත කොටස් අත්‍යවශ්‍ය වියදම් සඳහාත්, ඉතිරි කිරීම් සඳහාත්, විනෝදාස්වාදය සඳහාත් වෙන් කිරීම තුළින් මූල්‍ය කටයුතුවල සමබරතාවක් පවත්වා ගැනීමට හැකියාව ලැබේ. මූල්‍ය ප්‍රමුඛතා හඳුනාගනිමින් ප්‍රායෝගික ව වියදම්වලට සීමා පනවා ගැනීම තුළින් පුද්ගලයෙකුට තම අත්‍යවශ්‍ය වියදම් දැරීමෙන් පසු යම් මුදලක් තම අභිමතය පරිදි විනෝද ක්‍රියාකාරකම්වලට යෙදවීමට ද හැකියාව ලැබේ. එසේ ම, එවැනි සීමා පනවා ගැනීම තුළින් අනවශ්‍ය වියදම් දැරීම සහ එවැනි වියදම් නිසා ඇතිවිය හැකි අනවශ්‍ය ණය වගකීම් වලක්වා ගැනීමටත් උපකාරී වේ.

තම මූල්‍ය අරමුණු ලඟා කර ගැනීමේ දී, අයවැය නිවැරදි ව විශ්ලේෂණය කොට එයට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම වැදගත් ය. තම ආදායමෙහි වෙනස්කම් ඇති වීම, අනපේක්ෂිත වියදම් ඇති වීම හෝ මූල්‍ය ප්‍රමුඛතා වෙනස් වීම වැනි කරුණු නිසා අයවැයෙහි වෙනස්කම් කිරීමට සිදු වේ. ඒ අනුව, නිසි ලෙස ආදායම් සහ වියදම් අධ්‍යනය කිරීම, වියදම් වර්ගීකරණය කිරීම සහ එක් එක් වියදම් කාණ්ඩයට සීමා පවත්වා ගැනීම, සහ සැලසුම් කළ ආකාරයට මූල්‍ය කටයුතු පවත්වාගෙන යෑමට හැකි වූයේදැයි අඛණ්ඩ ව නිරීක්ෂණය කිරීම තුළින් පුද්ගලයෙකුට මූල්‍ය විනයක් පවත්වා ගැනීමට හැකිවන අතර, ආරක්ෂිත මූල්‍ය අනාගතයක් ළඟා කර ගැනීමටද එය උපකාරී වේ.

වියදම් කළමණාකරණය

සාර්ථක වියදම් කළමණාකරණය පුද්ගල මූල්‍ය කළමණාකරණයේ ඉතා ම වැදගත් අංගයකි. ජයහජදකදටහ දග එදබැහ කෘතියෙහි කතුවරයා පෙන්වා දෙන්නේ ඉතිරි කිරීම සඳහා අත්‍යවශ්‍ය ම සාධකය ලෙස බොහෝ දෙනා සලකනු ලබන්නේ ආදායම වැඩිකර ගැනීම වුවත්, එය නිවැරදි අදහසක් නොවන බවයි. ඉතිරි කිරීම සඳහා අත්‍යවශ්‍ය ම සාධකයක් වන්නේ වියදම් කළමණාකරණය බව එකී කෘතියෙහි කතුවරයා සඳහන් කරයි. ඔහු තව දුරටත් පෙන්වා දෙන්නේ "පොහොසත්" බව (Rich) සහ "ධනවත්" බව (Wealthy) යනු එකිනෙකට වෙනස් සංකල්පයන් බවයි. පුද්ගලයෙකු වර්තමානයේ ඉහළ ආදායමක් ලබයි නම් සහ ඉහළ මිලදී ගැනීමේ හැකියාවක් තිබේ නම් ඔහු පොහොසත් පුද්ගලයෙකු ලෙස සැලකිය හැකි ය. නමුත් ධනවත් බව යනු වියදම්

නොකළ ප්‍රමාණයයි. එනම් කිසියම් පුද්ගලයෙකු සතු ව ඉහළ ඉතිරි කිරීම් ප්‍රමාණයක් තිබේ නම්, එවිට ඔහු ධනවත් පුද්ගලයෙකු ලෙස සැලකිය හැකි ය. ඒ අනුව, ඉතිරි කිරීම වැඩිකර ගැනීම සඳහා පුද්ගලයෙකු අනුගමනය කළ යුතු ප්‍රධාන අංගයක් වන්නේ වියදම් කළමනාකරණයයි. එලෙස වියදම් අවම කර ගැනීම සඳහා පුද්ගලයෙකු අත්‍යවශ්‍ය නොවන විවිධ කටයුතු වෙනුවෙන් වියදම් කිරීමට ඇති කැමැත්ත අඩු කර ගත යුතු ය. එසේ අත්‍යවශ්‍ය නොවන කරුණු වෙනුවෙන් වියදම් දැරීම අවම කර ගැනීමට හැකි වන්නේ, අනෙකුත් පුද්ගලයන් තමන් ගැන සිතන ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීම හෝ ඒ පිළිබඳ ව පසුතැවිලි වීම අවම කර ගැනීමෙන් බව, Phycology of Money කෘතියෙහි කතුවරයා මනාව පැහැදිලි කර දෙයි.

ලොව පුරා විවිධ භාෂාවලට පරිවර්තනය වූ, පුද්ගල මූල්‍ය කළමණාකරණය පිළිබඳ ලියැවුනු ඉතා ප්‍රචලිත කෘතියක් වන, රොබර්ට් කියෝසාකි (Robert Kiyosaki) විසින් රචිත, "Rich Dad Poor Dad" කෘතියෙහි පෙන්වා දෙන්නේ, ඉතා ඉහළ ආදායම් ලබන පුද්ගලයෙකු වුවත් එම ආදායම නිසි ලෙස කළමණාකරණය නොකොට අනවශ්‍ය ලෙස වියදම් දරන්නේ නම්, ඔහුට මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වන බවයි.

ණය කළමණාකරණය

විධිමත් ආකාරයෙන් ලබා ගෙන නිසි කළමණාකරණයකින් ඵලදායී කටයුතු වෙනුවෙන් යොදාගන්නේ නම් ණය පහසුකම් යටතේ මුදල් ලබා ගැනීම පුද්ගල මූල්‍ය කළමණාකරණයේ වැදගත් අංගයක් ලෙස සැලකිය හැකි ය. විවිධ කටයුතු වෙනුවෙන් ණය පහසුකම් ලබා ගැනීමට සිදු වීම ඕනෑම පුද්ගලයෙකු මුහුණ දිය හැකි තත්ත්වයකි. එය නිවසක් හෝ මෝටර් රථයක් අත්පත් කර ගැනීම, තමාගේ හෝ තම පවුලේ සාමාජිකයෙකුගේ අධ්‍යාපන කටයුත්තක් වෙනුවෙන් යොදා ගැනීම හෝ අනපේක්ෂිත වියදම් පියවා ගැනීම වැනි කරුණු හේතුවෙන් ඇති විය හැකිය. කෙසේ වුව ද අධික ලෙස ණය ලබා ගැනීම හෝ ලබාගත් ණය අවිධිමත් ලෙස කළමණාකරණය අධික පොලී වියදමක් දැරීමට හේතු වනවා පමණක් නොව මූල්‍ය ආතතිය ඇති කිරීමටත්, දිගු කාලීන ව මූල්‍ය අස්ථාවරත්වයක් ඇති කිරීමටත් හේතු වනු ඇත. ඒ අනුව විධිමත් ණය කළමණාකරණයක් අවශ්‍ය වන්නේ විධිමත් ආකාරයෙන් ණය පහසුකම් ලබා ගැනීමටත්, ලබා ගන්නා ණය ඵලදායී අරමුණු වෙනුවෙන් පමණක් යොදා ගැනීමටත් වන අතර, එමගින් ණය වගකීම්වලින් ඇතිවන පීඩනය අවම කරගත හැකි ය.

විධිමත් ලෙස ණය පහසුකම් ලබා ගැනීමේ මූලධර්මයක් වන්නේ අත්‍යවශ්‍ය අවස්ථාවන්වල දී පමණක් ණය ලබා ගැනීම යි. ඇතැම් පුද්ගලයන් නිසි අධ්‍යනයකින් තොරව යම් හැකියාවක් හෝ අවස්ථාවක් ඇති සියලු ම මාර්ගවලින් ණය ලබා ගෙන ඒවා ඵලදායී නොවන කටයුතුවලට යොදවා මූල්‍ය අර්බුදවලට මුහුණ දුන් අවස්ථා දැකගත හැකි ය. රොබර්ට් කියෝසාකි තම "Rich Dad Poor Dad" කෘතියෙහි පෙන්වා දෙන්නේ බොහෝ පුද්ගලයින් මූල්‍ය දුෂ්කරතාවලට දිගින් දිගට ම මුහුණ දෙන්නේ, වත්කම් යැයි සිතා වගකීම් අත්පත් කරගැනීමෙන් බවයි. ඔහු තව දුරටත් පෙන්වා දෙන්නේ බොහෝ පුද්ගලයන් දුගී බවෙන් පීඩා විඳින්නේ වත්කම් සහ වගකීම් පිළිබඳ නිවැරදි අවබෝධයක් නැතිකමින් බවයි. ඔහු සඳහන් කරන්නේ බොහෝ පුද්ගලයන් තම ආදායම සතුටුදායක තත්ත්වයකට පත්ව ප්‍රමාණවත් ධනයක් ගොඩනැගීමට ප්‍රථම, විශාල ලෙස ණය ලබා ගනිමින් ඉහළ වටිනාකමින් යුතු දේපළ සහ රථවාහන මිලදී ගැනීමට පෙළඹෙන අතර එමගින් ණය උගුලකට හසුවන බවයි. ඒ අනුව තම රැකියාවෙන් හෝ වෙනත් මූලාශ්‍රවලින් ලැබෙන ආදායමෙන් විශාල ප්‍රතිශතයක් ණය සහ පොළී පියවා දැමීමට මෙන් ම එලෙස ණය වී ලබාගත් දේපළ නඩත්තු කිරීමට යොදා ගැනීමට සිදුවන බවයි.

සියලු පුද්ගලයින් සුඛෝපභෝගී නිවසක හිමිකරුවකු වීමටත්, වටිනා රථවාහන පරිහරණය කිරීමටත් කැමැත්තක් දැක්වුවත්, එවැනි දේ අත්පත් කර ගැනීමට පියවර ගත යුත්තේ ස්ථාවර මූල්‍ය තත්ත්වයක් සහ ප්‍රමාණවත් ධනයක් ගොඩනැගීමෙන් පසුව මිස, අධික ලෙස දැරිය නොහැකි තරම් ණය ලබාගැනීමෙන් නොවන බව රොබර්ට් කියෝසාකි තම කෘතියෙන් පැහැදිලි ව පෙන්වා දෙයි. එලෙස අධික ණය බරකට යටත්ව කිසිදු ආදායමක් ජනිත නොකරන දේපළ සහ රථවාහන මිලදී ගැනීම, වත්කම් යැයි සිතා වගකීම් අත්පත් කරගැනීමක් ලෙස ඔහු පෙන්වා දෙන්නේ එබැවිනි.

තම ආදායමට සරිලන ආකාරයට, ඵලදායී අරමුණු වෙනුවෙන් පමණක් විධිමත් ව ණය පහසුකම් ලබාගෙන එය නිසියාකාර ව කළමණාකරණයෙන් මූල්‍ය ආතතිවලට පත් නොවී තම මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට පුද්ගලයන්ට හැකියාව ලැබේ.

ආයෝජනය

කිසියම් පුද්ගලයෙකුට ප්‍රමාණවත් ධනයක් ගොඩනගා ගනිමින් මූල්‍ය ස්ථාවරත්වයක් සහ වර්ධනයක් ඇතිකර ගැනීම සඳහා අවශ්‍ය තීරණාත්මක වැදගත් සාධකයක් ලෙස ආයෝජනය සැලකිය හැකි ය. එලෙස ආයෝජනය මගින් ආදායම් උත්පාදනය කළ හැකි වත්කම් අත්පත් කරගැනීම තුළින්, ඍජුව ම කාලය සහ ශ්‍රමය කැප කිරීමකින් තොරව වක්‍රව ආදායම් ලබා ගැනීමට හැකිවීම තුළින් ආරක්ෂිත මූල්‍ය තත්ත්වයක් ගොඩනගා ගැනීමට හැකි වේ. විධිමත් ලෙස සැලසුම් කරන ලද ආයෝජන උපාය මාර්ගයක් පුද්ගලයෙකුට කාලයක් මුළුල්ලේ තම ධනය වර්ධනය කිරීමට උපකාරී වන අතර අයහපත් ආර්ථික තත්ත්වයන් සහ උද්ධමනකාරී තත්ත්වයන් නිසා ඇතිවිය හැකි අවදානම අවම කරගැනීමටත් උපකාරී වේ. තමාට ගැලපෙන ආයෝජන සිදු කිරීම නිසි දැනුමකින් සහ කල්පනාකාරී ව සිදුකරනු ලබන නිසි විශ්ලේෂණයකින් පසු ව සිදු කළ යුතු අතර අවදානම් දැරීමට ඇති කැමැත්ත සහ හැකියාව සලකා බලමින් තම මූල්‍ය අරමුණුවලට අනුව එය සිදු කළ යුතු ය.

පුද්ගලයෙකුට ආයෝජනය කළ හැකි විවිධ ක්ෂේත්‍ර සහ විවිධ වත්කම් හඳුනා ගත හැකි අතර එය තම මූල්‍ය අරමුණු සහ ආයෝජනයේ දී දැරිය යුතු අවදානමේ ස්වභාවය අනුව තෝරාගත යුතු ය. ඒ අනුව විවිධ පුද්ගලයන් විසින් ආයෝජනය සඳහා භෞතික වත්කම් (ඉඩම්, ගොඩනැගිලි, රථවාහන, යන්ත්‍ර උපකරණ), කොටස් වෙළෙඳපොළ, රජයේ සුරැකුම්පත්, ස්ථාවර තැන්පතු වැනි විවිධ වත්කම් යොදා ගැනෙයි. මෙවැනි විවිධ වත්කම්වල ආයෝජනයේ ඇති වාසි සහ අවාසි හඳුනා ගැනීම වැදගත් ය.

වඩාත් ආරක්ෂිත සහ සහතික කරන ලද ප්‍රතිලාභ ලබා ගත හැකි ආයෝජන මාධ්‍යයක් ලෙස බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල ස්ථාවර තැන්පතුවක ඉතිරි කිරීම සැලකිය හැකි ය. එමගින් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා නිශ්චිත පොලී අනුපාතයක් යටතේ සහතික කරන ලද පොලී ආදායමක් ලබා ගත හැකි නිසා වැඩි අවදානමක් දැරීමට අකමැති පුද්ගලයන්ට වඩාත් ගැළපෙන විකල්පයක් ලෙස ස්ථාවර තැන්පතු සැලකිය හැකි ය. ආර්ථිකය තුළ පවතින ඇතැම් ආයෝජන හා සැසඳීමේදී, ස්ථාවර තැන්පතු සඳහා ලැබෙන ප්‍රතිලාභය අඩු මට්ටමක පැවතිය ද, ස්ථාවර සහ විශ්වාසදායක මූල්‍ය ආයතනයක එවැනි තැන්පතු පවත්වා ගෙන යෑමෙන් තැන්පත් කළ ප්‍රාග්ධනයේ සුරක්ෂිතභාවය මෙන් ම සහතික කළ පොලී ආදායමක් ද ලැබෙන බැවින්, වැඩි අවදානමක් දැරීමෙන් හෝ පරිශ්‍රමයක් දැරීමකින් තොර ව ආදායම් ලබා ගැනීමට කැමති පුද්ගලයන්ට එය හොඳ ආයෝජන මාධ්‍යක් ලෙස සැලකිය හැකි ය. කෙසේ වුවද, උද්ධමනය අධික කාලයන්හි දී ස්ථාවර තැන්පතුවල ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම මූර්ත වශයෙන් අඩු වේ.

රජයේ සුරැකුම්පත්වල (භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාකාර බැඳුම්කර) අයෝජනය කිරීම වඩාත් සුරක්ෂිත අයෝජන මාධ්‍යයක් ලෙස සලකනු ලැබේ. මෙවැනි සුරැකුම්පත් රජයේ සහතිකය සමග නිකුත් කරන බැවින් එයට අදාළ පොලිය වෙනස්වීමකින් තොර ව ආයෝජකයන්ට ලැබෙන බැවින් මෙවැනි සුරැකුම්පත් අවධානම් රහිත වත්කම් (Risk-free asset) ලෙස සැලකෙයි. වෙළෙඳපොළ පොලී අනුපාත උච්ඡාවචනය වන විට, බැඳුම්කරවල මිල වෙනස් වීමට ලක්වුව ද, නිසි දැනුමක් සහිතව රජයේ සුරැකුම්පත්වල අයෝජනය කිරීම තුළින් වැඩි අවදානමකින් තොරව ඉහළ ප්‍රතිලාභයක් ලැබීමට හැකියාව ඇත.

විවිධ පුද්ගලයන් අතර ප්‍රචලිත ආයෝජන මාධ්‍යයක් ලෙස කොටස් වෙළෙඳපොළෙහි සිදු කෙරෙන ආයෝජනයන් සැලකිය හැකි ය. මෙවැනි ආයෝජනයක් තුළින් ඉහළ ප්‍රතිලාභයක් ලැබීමට හැකියාව පවතින අතර ඒ සඳහා අවදානමක් දැරීමට ද සිදු වේ. ව්‍යාපාර කොටස්වල අයෝජනය කිරීම තුළින් ලාභාංශ ආදායමක් ලබාගත හැකි අතර, ඉහළ මිලක් යටතේ එම කොටස් නැවත විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ ලැබීමට ද හැකියාව ඇත. කෙසේ වුව ද, මෙලෙස ලබාගත හැකි ප්‍රතිලාභ නිශ්චිත හෝ සහතික කොට නොමැති අතර එම ප්‍රතිලාභ ව්‍යාපාර ලබන ලාභ සහ ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය මෙන් ම වෙළෙඳපොළ තත්ත්ව සහ දේශීය, විදේශීය ආර්ථික තත්ත්වයන් මත වෙනස්වීම් වලට ලක්වේ. ඒ අනුව, මෙවැනි ආයෝජන මගින් ඉහළ ප්‍රතිලාභයක් ලැබීමට අවස්ථාව ඇති නමුත්, ඒ සඳහා ඉහළ අවදානමක් දැරීමට සිදු වේ. කොටස් වෙළෙඳපොළ සහ ව්‍යාපාර පිළිබඳ ව විධිමත් අධ්‍යයනයක් කිරීම තුළින් ආයෝජනයට සුදුසු කොටස් හඳුනාගත හැකි වුවත්, මෙවැනි ආයෝජනවල ඵලදායීබව එවැනි විශ්ලේෂණයක් සඳහා යොදාගනු ලබන තොරතුරුවල නිවැරදි බව මත රඳා පවතී. විශේෂයෙන් ම කොටස්වල මිල වෙළෙඳපොළ බලවේග අනුව තීරණය වන බැවින්, එවැනි මිල ගණන්වල

සාධාරණත්වය කොටස් වෙළෙඳපොළෙහි ඉල්ලුමට සහ සැපයුමට බලපාන තොරතුරු අනුව තීරණය වේ. ඒ අනුව, කිසියම් රටක කොටස් වෙළෙඳපොළ ඉහළ කාර්යක්ෂමතාවක් යටතේ ක්‍රියාත්මක නොවන්නේ නම්, එහි ආයෝජකයන්ට ප්‍රතිලාභ අපේක්ෂා කළ හැක්කේ ඉහළ අවධානමකට යටත්ව ය.

දේපළ වෙළෙඳාම් ක්ෂේත්‍රයෙහි සිදු කරනු ලබන ආයෝජන ඉහළ ප්‍රතිලාභ සහිත ආයෝජන විකල්පයක් ලෙස සැලකිය හැකි ය. එවැනි ආයෝජන තුළින් බදු කුලී ආදායම් උපයා ගත හැකි අතර, දේපළවල මිල කාලයත් සමග ඉහළ යන බැවින් එමගින් සැලකිය යුතු ප්‍රාග්ධන ලාභ ලැබීමට ද හැකියාව ලැබේ. දේපළ වෙළඳාම් ක්ෂේත්‍රයේ අයෝජනය කිරීම තුළින් දිගුකාලීන ව ප්‍රතිලාභ ලැබීමට හැකියාව ඇති නමුත්, ඒ සඳහා සැලකිය යුතු ප්‍රාග්ධනයක් අවශ්‍ය වන අතර එවැනි වත්කම් අත්පත් කරගැනීමේ දී විධිමත් වෙළෙඳපොළ අධ්‍යයනයක් මෙන් ම එම වත්කම් නඩත්තු කිරීම සඳහා සැලකිය යුතු පිරිවැයක් සහ ප්‍රයත්නයක් දැරීමට ද සිදුවේ. තව ද, මෙවැනි වත්කම්වල ආයෝජනය ද්‍රවශීලතාවෙන් අඩු ආයෝජන මාධ්‍යක් වන බැවින්, හදිසි අවස්ථාවක දී මුදල් බවට හරවා ගැනීමට කාලයක් ගත විය හැකිවීම මෙවැනි ආයෝජනවල පවතින අවාසියක් ලෙස සැලකිය හැකි ය.

ඒ අනුව, ආයෝජනය කිරීම සඳහා විවිධ විකල්ප පවතින අතර තම හැකියාව සහ කැමැත්ත අනුව නිවැරදි ආයෝජන තෝරා ගනිමින් සතුටුදායක ප්‍රතිලාභ හිමිකර ගත හැකි ය. ආයෝජන පිළිබඳ නිවැරදි දැනුම, මුහුණ දීමට කැමති අවදානම් තත්ත්වය මෙන් ම තම මූල්‍ය අරමුණු නිසි ලෙස හඳුනාගෙන ආයෝජන තෝරාග ැනීම වැදගත් ය. විනයානුකූල මෙන් ම, උපාය මාර්ගික ප්‍රවේශයක් යොදාගනිමින් ක්‍රමවත් ව සිදු කරනු ලබන ආයෝජන තුළින් ඉහළ ධනයක් ගොඩනගා ගැනීමට හැකිවනවා මෙන් ම දිගුකාලීන මූල්‍ය ස්වාධීනත්වයක් ලබා ගැනීමට ද උපකාරී වේ.

නිගමනය

පුද්ගල මූල්‍ය කළමණාකරණය යනු විධිමත් සැලසුමකින්, මූල්‍ය විනය පවත්වා ගනිමින්, නිසි තොරතුරු යොදා ගනිමින් නිවැරදි තීරණ ගනිමින් සිදු කළ යුතු දීර්ඝ කාලීන ක්‍රියාවලියකි. එය පුද්ගලයෙකුට මූල්‍ය සුරක්ෂිතභාවය ඇතිකර ගැනීමට අඩිතාලම සපයන අතරම ආදායම්, වියදම්, ඉතිරි කිරීම, ණය කළමණාකරණය සහ ආයෝජනය කිරීම ආදී විවිධ කටයුතු පිළිබඳ නිවැරදි සහ ඵලදායී තීරණ ගැනීමට උපකාරී වේ. එවැනි කටයුතු පිළිබඳව නිවැරදි මූල්‍ය පුරුදු පවත්වා ගැනීමෙන් පුද්ගලයෙකුට මූල්‍ය දුෂ්කරතා මගහරවා ගනිමින්, දිගු කාලීන මූල්‍ය අරමුණු කරා ළඟා වීමට හැකියාව ලැබේ.

නිවැරදි ලෙස ආදායම් උත්පාදනය හරහා හොඳින් ව්‍යුහගත මූල්‍ය සැලසුමක් ඇරඹෙන අතර, එසේ උපයන ආදායම බුද්ධිමත් ලෙස කළමණාකරණයත් කාර්යක්ෂම ලෙස ඵලදායී අරමුණු වෙනුවෙන් වෙන් කිරීමත් ඉතා වැදගත් වේ. ඵලදායී මූල්‍ය කළමණාකරණයක් සඳහා නිසි ලෙස අයවැය සැලසුම් කිරීම ඉතා වැදගත් පියවරක් වන අතර එය මූල්‍ය විනය පවත්වා ගැනීමටත්, වියදම් නිසි ලෙස පාලනය කිරීම තුළින් අනවශ්‍ය වියදම් වළක්වා ගෙන ඵලදායී මූල්‍ය අරමුණු වෙනුවෙන් ආදායම යොදවා ඉතිරි කිරීම වර්ධනය කිරීමටත් උපකාරී වේ.

ඉතිරි කිරීම සහ අයෝජනය මූල්‍ය ආරක්ෂාව තරදුරටත් ශක්තිමත් කිරීමට හේතුවන අතර එමගින් ප්‍රමාණවත් ධනයක් ගොඩනැගීමට උපකාරී වී, පුද්ගලයෙකුට අනපේක්ෂිත අවස්ථාවලට මුහුණ දීමට ඇති හැකියාව ඉහළ නැංවීමට ද හේතුවේ.

නිවැරදි පුද්ගල මූල්‍ය කළමණාකරණයක් තුළින් මූල්‍ය ස්ථාවරත්වයක් ගොඩනගාගෙන ආතතියකින් තොර ව තම ජීවන කටයුතු පවත්වා ගෙන යාමට පුද්ගලයෙකුට හැකියාව ලැබේ. ඒ අනුව, විධිමත් මූල්‍ය සැලසුම් සිදුකරමින්, අඛණ්ඩව මූල්‍ය සාක්ශරතාවය වර්ධනය කරගනිමින්, නිසි විනයකින් සහ අවබෝධයකින් යුතු ව තීරණ ගනිමින් වඩාත් ගුණාත්මක ජීවන තත්ත්වයක් ගොඩනගා ගැනීමට හැකි වනු ඇත.

දිවි මග ජය පිණිස ළඟා කර ගත යුතු මූල්‍ය සාක්ෂරතාව

ශ්‍රී ලංකාව සාක්ෂරතාව අතින් ඉහළ අගයක් ගන්නා රටක් වුව ද මූල්‍ය සාක්ෂරතාව අතින් පවතින්නේ සාපේක්ෂව පහළ මට්ටමක. මූල්‍ය සාක්ෂරතාව යන්න අද සමාජයට අත්‍යවශ්‍ය ම වැදගත් සංකල්පයක් බවට පත්ව තිබෙනවා. මූල්‍ය සාක්ෂරතා සන්දර්භය යටතේ මූල්‍ය සැලැස්ම, වියදම් කළමනාකරණය, ණය කළමනාකරණය, ඉතිරි කිරීම්, ආයෝජන, රක්ෂණ සහ විශ්‍රාම සැලසුම් පිළිබඳ ව ඔබ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ චතුර ආරියදාස සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කීර්ති දුනුතිලක යන මහත්වරුන් සමග කළ සාකච්ඡාවකි මේ.

- ***සමාජයේ පුද්ගලයින් විවිධ ආතතිවලට ලක් ව සිටිනවා. ඒ අතර මූල්‍ය ආතතිය යනු බරපතල තත්ත්වයක්. අපි චතුර මහත්මාගෙන් දැන ගැනීමට කැමතියි මූල්‍ය ආතතිය යනු කුමක් ද? එය ඇති වීමට හේතු මොනවා ද? සහ මූල්‍ය ආතතියෙන් පුද්ගලයන් මිදෙන්නේ කෙසේ ද? යන්න පිළිබඳ ව.***

සාකච්ඡාවට සුදුසු ආරම්භයක් ඔබ ගත්තේ. කිසියම් කෙනෙක් එදිනෙදා වියදම් පියවා ගැනීමට නොහැකි වීම, හදිස්සියක දී ඉතිරි කිරීම් නොමැති වීම, ණය ගෙවා ගැනීමට නොහැකි වීම ආදි කරුණු නිසා මූල්‍ය ආතතියට පත් වනවා. තවත් කෙනෙක්ට වියදම් කිරීමට මුදල් තිබෙනවා. වෙලාවට ණය ගෙවනවා. නමුත් මූල්‍ය ආතතියෙන් පෙළෙනවා. එයට හේතුව ඔවුන් බලාපොරොත්තු වන ජීවන රටාවට සරිලන පරිදි වියදම් කිරීමට නොහැකි වීම. ඒ අනුව මූල්‍ය ආතතිය ඇති වීමට බලපාන ප්‍රධාන හේතු අතරට බලාපොරොත්තු වන ජීවන වියදම සඳහා අවශ්‍ය ආදායම නොමැති වීම්, අධික ජීවන වියදම සහ අධික ණය බර අයත් වනවා. මේවා සඳහා විසඳුම් සෙවීමෙන් අපිට මූල්‍ය ආතතියෙන් මිදීමට පුළුවන්.

- ***දැන් අපි පිවිසීමට සූදානම් වන්නේ අද දවසේ ප්‍රධාන තේමාව වෙත. කීර්ති මහත්මයාගෙන් දැන ගැනීමට කැමතියි මූල්‍ය සාක්ෂරතාව යනු කුමක් ද? සහ ඒවායේ විවිධ පැතිකඩ පිළිබඳ ව?***

මූල්‍ය සාක්ෂරතාව තමයි කෙනෙකුට මූල්‍ය ආතතියෙන් මිදීමට ඇති හොඳ ම මෙවලම. රටක් විදිහට ශ්‍රී

ලංකාවේ සාක්ෂරතාව 93%ක අගයක පැවතියත් මූල්‍ය සාක්ෂරතාව පවතින්නේ 58%ක අගයක. කලාපීය වශයෙන් සැලකූ විට එය තරමක් ඉහළ අගයක පවතිනවා වුවත්, ලංකාවේ අපිට තිබෙන ගැටලුව දැනුම නිවැරදිව භාවිත නොකිරීම. පොලී අනුපාතික, උද්ධමනය වැනි මූලික සංකල්ප පිළිබඳ දැනුම සහ ආදායම් ඉපැයීම, වියදම් කළමනාකරණය, ඉතුරු කරන්නේ කෙසේ ද? ඉතිරි කිරීම් පවත්වා ගෙන යා යුත්තේ කුමන ආයතනවල ද? ණයක් ලබා ගන්නේ කෙසේ ද? ඒ සඳහා තිබිය යුතු සුදුසුකම් මොනවා ද? නිවැරදිව ආයෝජනය කරන්නේ කෙසේ ද? කෙනෙක් විශ්‍රාම සැලසුමක් සකස් කර ගන්නේ කෙසේ ද? යන කරුණු දක්වා මූල්‍ය සාක්ෂරතාව යන්න විහිදී පවතිනවා. වැදගත්ම කාරණය නම්, ඒ සම්බන්ධ පවතින දැනුම. ඒ දැනුම තුළින් මූල්‍ය සාක්ෂරතාව සම්බන්ධ කුසලතා ජනිත කර ගැනීමයි. එකී කුසලතා තාර්කික හැසිරීමක් බවට පත් කර ගැනීම අවශ්‍ය යි. තොරතුරු මත පදනම් ව තාර්කික ව මූල්‍ය තීරණ ගැනීමට සමාජයේ පුද්ගලයෙකු තුළ පවතින දැනුම, කුසලතා සහ හැකියා මූල්‍ය සාක්ෂරතා යන්නෙන් අදහස් කරනවා.

පුද්ගලයෙක් පාර පනින්න ඕනේ සලකුණු කරපු තැනින්. ඒ කියන්නේ කහ ඉරෙන් හෝ සුදු ඉරෙන්. ඒක දැනුම. නමුත් ඒ පුද්ගලයා ඒ ස්ථානයෙන් ම පාර පනිනවා ද නැද්ද කියන එක ඒ පුද්ගලයාගේ විනය සහ හැසිරීම මත තීරණය වෙනවා. ලංකාවේ අපට තිබෙන ගැටලුව තමයි දැනුම තිබුණාට ඒ දැනුම, හැසිරීමෙන් නිරූපණය නොකිරීම. සමාජයේ පුද්ගලයෙක් මූල්‍ය සාක්ෂරතාවෙන් හෙබි නම් ඔහු ඉතුරු කරනවා. අවශ්‍ය ප්‍රාග්ධනය සඳහා ණය ගන්නවා. නමුත් ඒ අවශ්‍ය ප්‍රමාණයට. විධිමත් ආයතනවල ඉතිරි කිරීම් පවත්වාගෙන යනවා. නිසි වේලාවට ණය ගෙවනවා. ණය අවභාවිත කරන්නේ නැහැ. වියදම් නිසිලෙස කළමනාකරණය සිදු කරනවා. මූල්‍ය සාක්ෂරතාවෙන් අපි බලාපොරොත්තු වන්නේ මෙවැනි කුසලතා ප්‍රගුණ කිරීම යි.

සමාජයේ බොහෝ දෙනා තමන්ගේ ආදායමෙන් සියලු වියදම් කිරීමෙන් පසුව යි ඉතිරි කිරීම සිදු කරන්නේ. නමුත් අප කළ යුත්තේ ආදායම ලැබුණු විට මුලින් ම යම්කිසි මුදල් ප්‍රමාණයක් ඉතිරි කර, ඉතිරි වන ආදායමෙන් අනෙක් අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම යි. ඉතිරි කිරීම් කියන්නේ අපි නිතිපතා පුරුදු පුහුණු විය යුතු පුරුද්දක්. එය අපි වේලාසනින් ආරම්භ කළ යුතු යි. එවිට දීර්ඝ කාලීන ව ඔහුට විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට පුළුවන්.

- ***මූල්‍ය සාක්ෂරතාවේ දී ප්‍රකාශ කෙරුණු වැදගත් කාරණාවක් වන්නේ මූල්‍ය සැලැස්ම. චතුර මහත්මයා ඇයි අපිට මූල්‍ය සැලැස්මක් අවශ්‍ය?***

කීර්ති මහත්මා පැහැදිලි කළා වගේ මූල්‍ය ආතතියෙන් මිදීම සඳහා අවශ්‍ය මෙවලම තමයි මූල්‍ය සාක්ෂරතාව. මූල්‍ය සාක්ෂරතාවෙන් හෙබි පුද්ගලයා ප්‍රථමයෙන් සිදු කළ යුත්තේ මූල්‍ය සැලැස්මක් සකසා ගැනීම. ඒ කියන්නේ මේ මොහොතේ මගේ මූල්‍ය තත්ත්වය මොකක් ද කියන කාරණය. අපේ ශුද්ධ වත්කම කීය ද? කියන කාරණය. අපි සැලසුමක් සාදා ගන්නේ මූල්‍ය ආතතියෙන් මිදීමට නම් අද තත්ත්වය පිළිබඳ ව මුලින්ම අවබෝධයක් ලබා ගත යුතුයි.

වෛද්‍යවරයෙක් රෝගයකට පිළියම් යොදන්න නම් මුලින් ම රෝගය හඳුනාගන්න අවශ්‍යයි. ඒ වගේම මූල්‍ය ආතතියෙන් මිදීමට, පළමුව ඔබේ ශුද්ධ වත්කම් දැන ගැනීම වැදගත්. දෙවනුව අපි මූල්‍ය ඉලක්ක සකස් කර ගත යුතුයි. තෙවනුව කළ යුත්තේ ඉලක්ක සඳහා වන සැලසුමක් සකස් කර ගැනීම. නිදහස් ජීවිතයක් ගැන සිතීමේ දී අපේ එක් මූල්‍ය අරමුණක් වෙන්න පුළුවන් වාර්ෂික චාරිකාවන් යෑම, දැනට තමාට ඇති ප්‍රථම උපාධිය පශ්චාද් උපාධියකට ගෙන යෑම. මෙවැනි කාරණා සාධනය කිරීමට නම් මුදල් අවශ්‍ය වනවා. ඒ සඳහා ආදායම් උත්පාදනය කිරීමට සිදු වනවා. හතරවන කාරණය ලෙස සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති අවශ්‍යතාව. පස්වනුව සැලසුම ඉදිරියට ගෙන යෑම. ඉන්පසු එය නිසි පරිදි ක්‍රියාත්මක වන බව සාක්ෂාත් කිරීම සඳහා පසු විපරම් කිරීම ඉතා වැදගත්.

- ***සමාජයේ බොහෝ දෙනා අතර පවතින මතයක් තමා "කොපමණ ආදායමක් ලැබුවත් ඉතිරි කරන්න බෑ" කියන කාරණය. කීර්ති මහත්මා කොහොම ද අපි ඉතිරි කිරීම්වලට පුරුදු වෙන්නේ?***

යම් පුද්ගලයෙකුට මූල්‍ය ආතතියෙන් මිදෙන්න මූල්‍ය සැලසුමක් ඔස්සේ කටයුතු කිරීම අවශ්‍යයි. ඒ

සැලසුම ඇතුළේ ආදායම, වියදම් පිළිබඳ සැලැස්මක් තිබෙනවා. ආදායම් ඉලක්ක පැවතීම ඊට අමතර ව, ණය ආයෝජන, විශ්‍රාම සැලසුම් ඒ අතර තිබෙනවා. සැලැස්මේ තිබෙන්නේ ඒ සියලු කොටස්වල එකතුවක්. ඉතිරි කිරීම් කියන්නේ ඒ සැලැස්ම තුළ පුද්ගලයෙකු ප්‍රගුණ කළ යුතු පුරුද්දක්. වැදගත් කාරණාව ඉතුරු කරන විට, ඉතුරු කරන මුදල වැදගත් නැහැ. තිබිය යුත්තේ පුරුද්ද යි. වඩාත් වැදගත් වන්නේ අනාගතය උදෙසා වර්තමානයේ දී අපගේ ආදායමෙන් කොටසක් වෙන් කර තබා ගැනීම යි. ඉතිරි කිරීම් විවිධ අරමුණු සඳහා සිදු කරන්න පුළුවන්. කෙනෙකුට තමන්ගේ මූල්‍ය සුරක්ෂිතතාව උදෙසා බැංකු ගිණුමක යම් මුදලක් ඉතිරි කරන්න පුළුවන් එසේ කිරීමෙන් මානසික සහනයක් ඇති කර ගැනීමට පුළුවන්. එවිට ඔහු හෝ ඇය මූල්‍ය ආතතියෙන් මිදෙනවා. තව කෙනෙක් කෙටි හෝ මැදි කාලීන අරමුණක් උදෙසා, උදාහරණ ලෙස නිවසක් ඉදි කිරීම, මෝටර් රථයක් මිල දී ගැනීම වැනි කාරණා උදෙසා ඉතිරි කරන්න පුළුවන්. ඒ වගේ ම, හදිසි අවශ්‍යතාවක් සඳහා, ලෙඩක් දුකක් ඇති පවුලේ සමීප කෙනෙකු වෙනුවෙන් ඉතිරි කරන්න පුළුවන්. තව කෙනෙක් ආයෝජන අරමුණින් දිගු කාලීන ව ඉතිරි කරන්න පුළුවන්. මේ සියලු දෙයින් බලාපොරොත්තු වෙන්නේ සමාජය තුළ මූල්‍යමය වශයෙන් සුරක්ෂිත වීම. එම නිසා වර්තමානයේ අපේ ආදායමෙන් යම් කිසි කොටසක් වෙන්කර තබා ගත යුතු යි. මුලින්ම කළ යුත්තේ ඉතිරි කිරීම. සමාජයේ බොහෝ දෙනා තමන්ගේ ආදායමෙන් සියලු වියදම් දරූ පසුව යි ඉතිරි කිරීමට උත්සාහ කරන්නේ. නමුත් අප කළ යුත්තේ ආදායම ලැබුණු විට මුලින්ම යම්කිසි මුදල් ප්‍රමාණයක් ඉතිරි කර, ඉතිරි වන ආදායමෙන් අනෙක් අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම යි. ඉතිරි කිරීම් කියන්නේ අපි නිතිපතා පුරුදු පුහුණු විය යුතු පුරුද්දක්. එය අපි වේලාසනින් ආරම්භ කළ යුතු යි. එවිට දීර්ඝ කාලීන ව විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට පුළුවන්. අනාගතයේ දී ආයෝජනයකට ඉතිරි කිරීම් යොදවන්න පුළුවන්. එවැනි ප්‍රාග්ධනයක් තිබෙනවා නම් ණය වීමට අවශ්‍ය නැහැ. අවශ්‍ය වුනත් ලබා ගත යුතු ණය ප්‍රමාණය අඩුයි.

අවශ්‍යතා සහ උවමනා කියන්නේ කරුණු දෙකක්. අපිට බඩගින්නක් ඇති වූ විට සුළු වියදමක් සිදු කර ආහාර ලබා ගන්නත් පුළුවන් විශාල වියදමක් සිදු කර ආහාර ලබා ගන්නත් පුළුවන්. අපි සලකා බැලිය යුත්තේ ආදායම අනුව බඩගින්න නිවා ගන්න පුළුවන් සුදුසු ක්‍රමවේදයයි.

වියදම් කළමනාකරණය කිරීමේ දී අනවශ්‍ය වියදම් කපා හැරීම තුළින් බලාපොරොත්තු වන ප්‍රමාණයට වඩා ඉතිරි කිරීම් පවත්වාගෙන යෑම සිදුකළ හැකි යි. අතීත පවුල් සංස්කෘතිය තුළ අපේ අම්මා අපිට ඉතිරි කරන අයුරු කියලා දුන්නා. නමුත් දැන් ඒවා ඒ විදිහට ම නැහැ. ණය පරිභෝජනවාදී සමාජයක අපි උපයන සියලු ම මුදල් වියදම් කරනවා. හදිස්සියක දී ගන්න අපි ළඟ මුදල් නැහැ. පුද්ගලයෙකු ලෙස බැංකු ගිණුමක මුදල් තබා ගෙන නැහැ. පුද්ගලයින් 90% අතර පමණ පිරිසක් ගිණුම් පවත්වාගෙන යනවා. නමුත් ඉතිරි කිරීම් පවත්වා ගෙන යන්නේ සීමිත පුද්ගලයින් පිරිසක් පමණයි. ඒ අනුව පුද්ගල ඉතිරි කිරීම් මට්ටම පවතින්නේ පහළ අගයක. එම නිසාම, රටක් විදිහට ගත්තොත් අපේ ඉතිරි කිරීම් පවතින්නේ පහළ මට්ටමක. අනිත් කාරණය තමයි අපි කොහෙ ද ඉතිරි කිරීම් පවත්වා ගෙන යන්නේ කියන කාරණය. අපේ සමාජයේ මේ වනවිට දක්නට ලැබෙන ප්‍රවණතාවක් තමයි ප්‍රතිලාභය පමණක් අරමුණු කර ගෙන අවිධිමත් ආයතන වල ඉතිරි කිරීම. අපි අවධාරණය කරන්නේ, ඉතිරි කිරීම් විධිමත් ආයතනයක සිදුකරන ලෙසට. එමගින් අපිට ප්‍රතිලාභ ලබා ගන්න වගේම ඉතිරි කිරීම්වලට සුරක්ෂිතතාවක් ලබා ගන්නත් පුළුවන්.

- ***කීර්ති මහත්මා පැහැදිලි කරන පරිදි, ඉතුරු කරන්නට නම් අපිට වියදම් කළමනාකරණය කරන්න සිදු වෙනවා. චතුර මහත්මයා අපිට පැහැදිලි කරනවද කොහොම ද වියදම් කළමනාකරණය කරන්නේ කියලා.***

මූල්‍ය සුරක්ෂිතතාවේ තිබෙන ඉතා සංකීර්ණ ක්ෂේත්‍රයක් තමයි වියදම් කළමනාකරණය. එසේ තැන්නම්, විචක්ෂණශීලී ව වියදම් සිදු කිරීම. ලාංකීය සමාජය තුළ ඇති ප්‍රධාන ම ගැටලුව අපි වියදම් කරන්නේ තමා පිළිබඳ සිතා බලා ද යන්නයි. බොහෝ දෙනා වියදම් කරන්නේ අන් අය දිහා බලලා. ඒ කියන්නේ වෙනත් කෙනෙක් වෙන්න. සමාජ මාධ්‍ය තුළ අපි එය ඉතා බහුල ව දකිනවා.

මෙහිදී ගැටලුව තමා තමන්ගේ උවමනා, අවශ්‍යතා නොසළකා අන් අය පිනවීම වෙනුවෙන් වියදම් කිරීම.

අවශ්‍යතා සහ උවමනා කියන්නේ කරුණු දෙකක්. අපිට බඩගින්නක් ඇති වූ විට සුළු වියදමක් සිදුකර ආහාර ලබා ගන්නත් පුළුවන් විශාල වියදමක් සිදුකර ආහාර ලබා ගන්නත් පුළුවන්. අපි සලකා බැලිය යුත්තේ ආදායම අනුව බඩගින්න නිවා ගන්න පුළුවන් සුදුසු ක්‍රමවේදය. අද සමාජය තුළ දකින දෙයක් තමයි බහුතරයක් ණය ලබාගෙන පරිභෝජන වියදම් සිදු කිරීම. අපගේ පරිභෝජන රටාව කොතරම් දුරට අධිපරිභෝජනය වෙලා ද කියනවා නම්, ණය භාවිතයෙන් එදිනෙදා පරිභෝජනය සිදුකර අනාගතයේ ලැබෙන ආදායම ඒ ණය ගෙවීමට වියදම් කිරීම දක්නට ලැබෙනවා. ණය වාරික සමග පොළියත් ගෙවීමට සිදු වීමෙන් අපි ණය උගුලකට හසු වීමට පුළුවන්. සියලු දෙනාටම කිව යුතු යි ණය අරගෙන පරිභෝජන වියදම් සිදු කරන්න එපා කියන කරුණ. ඉතිරි කිරීම් ලෙස තබා ගත් මුදල් පරිභෝජනයට යොදවන තව පිරිසක් ඉන්නවා. උදාහරණයක් ලෙස අපි නුවරඑළියේ චාරිකාවක් යන්න යොදා ගන්නවා. ඒ වෙනුවෙන් අපි මාසිකව රු.10,000/= බැගින් ඉතිරි කරනවා. අවුරුද්ද අවසානයේ අපිට ලැබෙන රු.120,000/= මුදලින් චාරිකාව යනවා. නමුත් ප්‍රශ්නය වන්නේ චාරිකාව නිම වූ පසු අපට ඉතිරි කිරීම් කිසිවක් නොමැති වීම. එකතු කර ගත් ප්‍රාග්ධනය අහිමි වී තිබෙනවා.

> ***නිවසක් ඉදිකිරීමට ලබාගන්නා ණය මුදලින් මෝටර් බයිසිකලයක් මිලදී ගැනීම නොකළ යුතුය. එසේත් නැත්නම් තමන්ගේ ගොවිතැන් කටයුතු හෝ ගව සම්පත පාලනයට මඩුවක් සෑදීමට ණය ලබා ගෙන එය වෙනත් අරමුණකට යොදවනවා නම් එයින් විශාල හානියක් සිදුවන්න පුළුවන්. එය ණය අවභාවිතා කිරීමක්.***

ඉතුරු කරන මුදල් ආයෝජනය කිරීමයි වඩාත් සුදුසු. ඉන් පසු එයින් ලැබෙන ප්‍රතිලාභ වියදම් කිරීම තමයි වඩාත්ම සුදුසු විදිහ. පෙර උදාහරණයේ පරිදි, අපි ඉතුරු කර ගත් මුදල් ආයෝජනය කළහොත් ඉන් අපිට ලැබෙන ප්‍රතිලාභවලින් චාරිකාව යාම මෙන්ම මුදල් ඉතිරි කල මුදල රැක ගැනීම යන කරුණු දෙකම සිදු කළ හැකියි.

අත්‍යවශ්‍ය වියදම් කෙසේ හෝ සිදු කළ යුතු යි. ලෙඩ දුක්, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වගේ දේවල් මගහැරිය නොහැකි වියදම්. දෙවනුව ආරක්ෂණ වියදම්. අපගේ සෞඛ්‍ය පවත්වාගෙන යෑම, දේපළ සුරක්ෂිත කිරීම සඳහා ගිනි රක්ෂණ, සොරබිය රක්ෂණ වියදම් අනිවාර්යෙන් සිදුකළ යුතු යි. තුන්වනුව වුවමනා වියදම් සිදුකළ යුතු ය. උදාහරණ විදිහට මම මගේ දරුවාගේ උපන්දිනය ලොකු හෝටලයක ගන්නවා ද? ගෙදර ගන්නවා ද? කියන දේ තීරණය විය යුත්තේ අපේ ආදායම මත. හතරවන කරුණ ඵලදායී වියදම්. උදාහරණ ලෙස මට දැන් තිබෙන්නේ ප්‍රථම උපාධියක් නම් මම පශ්චාත් උපාධියකට වියදම් කරනවා. ඒක ඵලදායී වියදමක්. මොකද එයින් මගේ වටිනාකම වැඩි වනවා. පස්වන කාරණාව නිෂ්ඵල වියදම්. උදාහරණයක් විදිහට අපි හිතමු, දැන් අපේ ගෙදර ඉන්නේ තුන් දෙනයි. නමුත් අපේ ගෙදර කාමර 8ක් තිබෙනවා. අපි එයින් 2ක් පාවිච්චියට ගත්තත් 6ක් ඉතුරුයි. එක් කාමරයක් සඳහා ලක්ෂ 10 බැගින් වියදම් දැරුවා නම් ගේ හදන්න ලක්ෂ 80ක මුදලක් වියදම් වනවා. නමුත් ප්‍රයෝජනයට ගැනෙන්නේ ලක්ෂ 20යි. ඉතිරි ලක්ෂ 60ම නිෂ්ඵල වියදම්. ඊට හේතුව අනෙක් කාමර නඩත්තු කිරීමට යම් මුදලක් වැය වී තිබීම. එම නිසා අපි සැම විට ම නිශ්ඵල වියදම්වලින් ඈත් විය යුතු යි. මෙලෙස, ඵලදායී අයුරින් වියදම් සිදු කළහොත් එනම් සැලසුම තුළ වියදම් විචක්ෂණ ව සිදු කළහොත් අපිට හොඳ තැනකට ගමන් කරන්න පුළුවන්.

● ණය කියන්නේ සමාජය තුළ සුලබ ව පරිහරණය කෙරෙන මූල්‍ය උපකරණයක්. පුද්ගලයින් විවිධ අරමුණු සඳහා විවිධ ණය වර්ග ලබා ගන්නවා. ඒ විධිමත් හෝ අවිධිමත් ආයතනවලින් විය හැකියි. කීර්ති මහත්මයා කොහොම ද නිවැරදි ව ණය කළමනාකරණය කරන්නේ?

කාලෝචිත හොඳ ප්‍රශ්නයක්. සමාජයේ පුද්ගලයෙකුගේ මාසික ආදායම රුපියල් ලක්ෂයක් වුනාට ඔහුගේ වියදම ලක්ෂ දෙකක් වෙන්න පුළුවන්. ඉන් අදහස් කෙරන්නේ ඉතිරි ලක්ෂය ඔහු ලබාගන්නේ ණයක් විදිහට. ණය කියලා කියන්නේ අපි තවත් පාර්ශ්වයකින් ගිවිස ගත් පොලී අනුපාතිකයකට ගිවිසගත් කාලයකදී ආපසු ගෙවීමේ පොරොන්දුව පරිදි ලබා ගන්නා මුදලක්. එය ආපසු ගෙවිය යුතු යි. පුද්ගලයින් විවිධ අරමුණු සඳහා ණය ලබාගන්නා නමුත් සමාජයේ බොහෝ දෙනා මේ ණය ලබා ගන්නේ පරිභෝජනය උදෙසා කෙනෙක් ණය ලබාගත් විට ණය වාරික ගෙවීමේ දී මාසික ව වියදම් කළ හැකි මුදල තවත් අඩු වනවා. ණය ලබා

ගැනීමට අවශ්‍ය වන්නේ නව ආදායම් උත්පාදනය කිරීමේ අරමුණින්. ණය, හොඳ ණය සහ නරක ණය ලෙස බෙදා දක්වනවා. නිශ්චිත අරමුණක් උදෙසා ලබා ගන්නා ණය එහෙමත් නැත්නම් ආදයම් උත්පාදනය සඳහා ලබා ගන්නා ණය, හොඳ ණය ලෙසත් සැලැස්මක් නොමැතිව එදිනෙදා වියදම් පියවා ගැනීමට ලබා ගන්නා ණය නරක ණය ලෙසත් හඳුන්වනවා. අසීමිත ලෙස නරක ණය පසුපස හඹා ගොස්, ගම් නගරවල බොහෝ පිරිස් ණය උගුලක පැටලී සිටිනවා. මේ ණය උගුලෙන් බේරෙන්න නම්, ණය ගත යුත්තේ තමන්ට අවශ්‍ය නම් පමණයි. දරා ගැනීමට පුළුවන් පිරිවැයකට, පොලී අනුපාතිකයකට විධිමත් ආයතනයකින් ණය ලබා ගත යුතු යි. විධිමත් ආයතනයකින් ණය ලබා ගන්නා විට සුදුසුකම් විමසීමක් සිදු කරනවා. බැංකු ගිණුමක් තිබෙනවාද? කලින් ලබාගත් ණය ගෙවනවා ද? ණය ආපසු ගෙවීමේ හැකියාවක් පවතිනවා ද? යන්න ඒ අතරට අයත්. මේවා සම්පූර්ණ කර නොමැති නම් ණය ලබා ගත නොහැකි වනවා. එවිට කිසි ම අවශ්‍යතාවක් හඳුනා නොගෙන අවිධිමත් ව ණය ලබා දෙන පිරිසකගෙන් ණය ලබා ගැනීමට ජනතාව පෙළඹෙනවා. මෙම අවිධිමත් ණය නිසා පුද්ගලයින්ට එම ණය ගෙවා ගත නොහැකි වීමෙන් තර්ජනවලට ලක් වීමට, නිවෙස්වලින් පළා යෑමට, ජීවිත නැති කර ගැනීමට පවා සිදු වනවා.

විධිමත් අංශයෙන් විශේෂයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් ණය ලබා ගතහොත්, අපට ණය ආපසු ගෙවීමට නොහැකි නම්, අපට බැංකුව සමඟ ඒ පිළිබඳ ව සාකච්ඡා කර පොලී අනුපාතික අඩු කර ගැනීමට හෝ ණය ගෙවිය යුතු කාලය දීර්ඝ කර සහන ලබා ගත හැකි යි. නමුත් අවිධිමත් අංශයෙන් ණය ලබාගත් විට අපට එලෙස සාකච්ඡා කිරීමේ හැකියාවක් නැහැ. එලෙස අපට ණය ගෙවාගත නොහැකි වූ විට එයට නව ණය මුදලක් ලබා දීමෙන් ඔවුන් අපව ණය උගුලක පැටලවීම සිදු කරනවා.

මේ වනවිට සමාජයේ බොහෝ පිරිසක් පහසු ණය පසුපස හඹා යෑමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙනවා. මූල්‍ය සාක්ෂරතාව යන සංකල්පය තුළ විශේෂයෙන් ම ණය පිළිබඳ ව සාකච්ඡා කරන්නේ ණය ලබා ගත යුත්තේ විධිමත් ආයතනයකින් යන්න සහ ණය අවභාවිත නොකළ යුතු යි යන්න පැහැදිලි කිරීමට යි. උදාහරණයක් ලෙස, සමාජයේ බොහෝ දෙනෙක් නිවසක් ඉදි කිරීමට ලබා ගන්නා ණයෙන් මෝටර් බයිසිකලයක් මිල දී ගන්නවා. එසේත් නැත්නම් තමන්ගේ ගොවිතැන් සඳහා හෝ ගව මඩුවක් සෑදීමට ණය ලබා ගෙන එය වෙනත් පරිභෝජන අරමුණකට යොදවනවා නම් එයින් විශාල හානියක් සිදුවන්න පුළුවන්. අපි පවසනවා ණය නැති එක සැපයක් (අනණ සුඛ) යනුවෙන්. එසේ වීමට නම් මුලින් සාකච්ඡා කළ පරිදි සැලසුම තුළ ප්‍රාග්ධනයක් ලෙස ඉතිරි කිරීම් පවත්වා ගැනීම වැදගත්.

- ***නිවැරදි ව ණය කළමනාකරණය කරන අයුරු අපි දැනගත්තා. කීර්ති මහත්මා සඳහන් කළ මූල්‍ය සාක්ෂරතාවේ තවත් වටිනා මාතෘකාවක් වන්නේ ආයෝජන. චතුර මහත්මා ආයෝජන පිළිබඳ ව පැහැදිලි කරාවි.***

මූල්‍ය සාක්ෂරතාව තුල සැලසුම් අතර ආයෝජන වැදගත් අංගයක්. තවත් පැහැදිලි කළහොත් ප්‍රතිලාභ අපේක්ෂාවෙන් වියදම් කිරීම. ආයෝජන තුළ කිසියම් ප්‍රතිලාභයක් ගැබ් වෙලා තිබෙනවා. පළමු ව මුදල් ආයෝජනය කිරීමේ දී අවදානම පිළිබඳ ව අවබෝධයක් තිබිය යුතු යි. විශේෂයෙන් ඇතැම් පුද්ගලයින් ආයෝජනය කරන්නේ ආයෝජන පිළිබඳ ව අවබෝධයක් නොමැතිවයි. කොටස් වෙළෙඳපොළ ආයෝජන කරන අයෙක් නම් ඒ ගැන අවබෝධයක් තිබිය යුතු යි. සමහරවිට ඔබට ගත හැකි අවදානම මට ගත නොහැකි වන්නට පුළුවන්. අවදානම ගැනීම පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්. දෙවන කාරණාව ආයෝජනය කරන ක්ෂේත්‍රය පිළිබඳ දැනුම. තුන්වන කාරණය ආයෝජනය සම්බන්ධයෙන් ඇති කරන නීත්‍යානුකූලභාවය. ඉහළ ප්‍රතිලාභ ලබා දෙන ආයෝජන තිබිය හැකියි. නමුත් ඒවා නීත්‍යානුකූල නෑ. ගස් වවන ආයෝජන ක්‍රම, පිරමිඩ යෝජනා ක්‍රමවල ආයෝජනය ඒ අතර වෙනවා. ආයෝජනයේ දී අපි සැලකිලිමත් විය යුතුයි ආයෝජන නීත්‍යානුකූලද නැද්ද කියන කාරණාව සම්බන්ධ ව.

විශේෂයෙන් ම මුදල් ආයෝජනයේ දී විවිධ වෘත්තීන් වල හා ව්‍යාපාරවල නිරත වන්නන් තමන්ගේ ආයෝජන විවිධාංගීකරණය කරන්න ඕනේ. අපි අපේ සියලු ම ආයෝජන සංචාරක ක්ෂේත්‍රෙය් යොදවා තිබුණොත් යම්කිසි හේතුවක් නිසා සංචාරක ක්ෂේත්‍රයට බලපෑමක් ඇති වුවහොත් අපිට ඉන් ලැබෙන ප්‍රතිලාභ අහිමි වී යා හැකියි. කෙනෙක් සියලු ම ආයෝජන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කුඹුරුවල, හේන් ගොවිතැන්වල යොදවලා තිබියදී ගංවතුර හෝ පොහොර ප්‍රශ්නයක් නිසා සියලු ප්‍රතිලාභ අහිමි වෙන්න පුළුවන්. ඒ නිසා ආයෝජන විවිධ ක්ෂේත්‍රවල දේපළවල, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ, සංචාරක ක්ෂේත්‍රයේ, බැංකුවල, කොටස් වෙළඳපොළේ,

රත්රන් බඩුවල ආයෝජනය කර විවිධාංගීකරණය සිදු කළ යුතුයි.

විශේෂයෙන් අපේ නිහඬ ආදායම වර්ධනය වන ආයෝජන සිදු කළ යුතුයි. ඔබ දන්නවා ද නිහඬ ආදායම කියන්නේ මොකක්ද කියලා? නිහඬ ආදායම කියන්නේ අපි ආයෝජන තුළ යෙදෙන ප්‍රමාණය අවමයි (zero) කියන දේ. උදාහරණයක් විදිහට යම් කිසි වෘත්තිකයෙකුට වැටුප් ලැබෙන්නේ වැඩ කළොත් පමණයි. නමුත් අපාර්ට්මන්ට් එකක් හදලා ඒක කුලියට දීලා තියෙනවා නම් ඉන් මාස්පතා ආදායමක් එනවා. ඒක නිහඬ ආදායමක්. ඒ දේපළ සම්බන්ධයෙන් නිතර යෙදීමේ අවශ්‍යතාවක් නැහැ. මූල්‍ය සාක්ෂරතාවේ නිහඬ ආදායම වියදම ඉක්මවා යනවා නම් මූල්‍යමය වශයෙන් නිදහස් වෙනවා. ඒකට කියනවා Financial Freedom කියලා.

- ***අපි දන්නවා අපේ රටේ ජනගහනයෙන් 12.3%ක් ම ඉන්නේ ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ. ඒ අය වෙනුවෙන් කථා කළ හැකි වැදගත් මාතෘකාවක් තමයි මේ විශ්‍රාම සැලසුම් කියලා කියන්නේ. කෙනෙක් විශ්‍රාම සැලසුමක් සකස් කර ගන්නේ කෙසේද? තමන්ගේ විශ්‍රාම දිවිය මූල්‍යමය අතින් ශක්තිමත් ව ගත කරන්නේ කොහොමද? කීර්ති මහත්මයා ඒ ගැන අපිට පැහැදිලි කළොත්.***

අපි දන්නවා ස්ථිර රැකියාවක නියුතු කෙනෙක් හෝ එසේ නොමැති කෙනෙක් වුණත් ජීවිතයේ යම් තැනකදී රැකියාවක් කළ නොහැකි තත්ත්වයකට පත්වෙනවා. රැකියාවලින් සමුගන්න වෙනවා. ඔවුන්ට නැවත වැටුප් හෝ ප්‍රතිලාභ ලැබෙන්නේ නැහැ. එලෙස ඔහුට ආදායම අහිමි වන නිසා තමයි අපි යෝජනා කරන්නේ සේවා නියුක්ත ව ඉන්න කාලයේ ම අර සැලැස්ම ඇතුළේ විශ්‍රාම සැලසුමක් සාදාගත යුතු බව. සමහර කෙනෙක්ට ඔහුගේ ආයතනයෙන් විශ්‍රාම වැටුපක් හිමි අයෙක් විය හැකියි. එවැනි අයෙක් නැවත විශ්‍රාම සැලසුමකට යාමේ අවශ්‍යතාවක් නැහැ. නමුත් සමහරවිට එම විශ්‍රාම මුදල ඔහුට ප්‍රමාණවත් නොවන විට වෙනත් විශ්‍රාම සැලසුමකට යාමේ හැකියාව තිබෙනවා. පුද්ගලයෙක් විශ්‍රාම සැලසුමකට යන්නේ මාසික වාරිකයක් ගෙවමින් නම් තමන්ට ලැබෙන ප්‍රතිලාභය ගැන අවබෝධයක් තිබිය යුතු යි. මෙහි දී යම් උපදේශන සේවාවක සහාය ලබා ගැනීම ඉතා වැදගත්.

ඔබ සඳහන් කළ පරිදි වැඩිහිටි ජනගහනය වැඩි වෙනවා කියන්නෙ ම ඒක රටකට බරක්. සමාජයට බරක්. ඔවුන් ව බලා ගැනීම සඳහා විශාල පරිශ්‍රමයක් හා ජනතාවගේ බදු මුදල් වියදම් කරන්න සිදු වෙනවා.

අපි අපිටම අනන්‍ය වූ විශ්‍රාම සැලසුමක් සකස් කර ගත යුතු යි. එවිට අන් අයගේ බදු මුදල් වෙනත් ආයෝජන සඳහා යෙදවිය හැකියි. මූල්‍ය සාක්ෂරතාවෙන් හෙබි පුද්ගලයා අනිවාර්යෙන් ම තමන් වෙනුවෙන් විශ්‍රාම සැලසුමක් සකස්කර ගන්නවා. යම්කිස් අවස්ථාවක දී ඔහුගේ පවුලේ අයට වුවත් විවිධ හේතු මත ඔහුව බලාගැනීම අසීරු වන්නට පුළුවන්. එවන් අවස්ථාවක දරුවන් අසරණ නොකර තම ජීවිතය පවත්වා ගැනීමට මේ විශ්‍රාම සැලසුම් වැදගත් වනවා. ලංකාවේ බොහෝ දෙනා තමන්ගේ සියලු වත්කම් දරුවෝ වෙනුවෙන් වියදම් කරනවා. දරුවන්ට ඉගැන්වීමට වියදම් කිරීමේ වරදක් නැහැ. නමුත් සමහර අවස්ථාවල සියලු ම ඉතිරි කිරීම් දරුවන්ට වියදම් කළ පසු තමන් විශ්‍රාම යන දවසට තමන් සතුව කිසිදු ඉතිරියක් නැහැ. පුද්ගලික අංශයේ බොහෝ විට විශ්‍රාම වැටපකුත් නැහැ. සමහර විට ලැබෙන අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභත් දරුවෝ වෙනුවෙන් වියදම් කරනවා. දරුවන්ට උගන්වලා විදේශයන්ට යැවීමෙන් පසුව දෙමව්පියන්ට ජීවත් වෙන්න විදිහක් නැහැ අසරණ වෙලා. එහෙම අය මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්වල දී අපට හමුවෙලා තිබෙනවා. අපි දරුවන්, අන් අය වෙනුවෙන් හැකි උපරිමයෙන් වියදම් කළ යුතුයි. නමුත් අපේ විශ්‍රාම දිවියත් නිදහසේ ගත කළ යුතුයි.

- ***විශ්‍රාම සැලසුම් ළඟින් ම යන සංකල්පයක් තමයි රක්ෂණය කියලා කියන්නේ. රක්ෂණ වියදම් නැත්නම් ආරක්ෂණ වියදම් පිළිබඳ ව අපි කැමතියි චතුර මහත්මයාගෙන් දැනගන්න?***

අප මුලින් සාකච්ඡා කළා වියදම් වර්ග 5ක් ගැන. ඒකෙන් එකක් තමයි ආරක්ෂණ වියදම්. මෙය අනිවාර්යෙන් කළ යුතු වියදමක්. බොහෝ දෙනා වාහන සඳහා ලබා ගන්නේ ලබා ගන්නේ තුන්වන පාර්ශ්වයේ රක්ෂණයක්. එවිට යම් අවස්ථාවක හදිසි අනතුරක් ඇති වුවහොත් වාහනය හදා ගන්න වෙන්නේ අතේ ඉතුරු මුදල්වලින්. සමහර පුද්ගලයින් රක්ෂණය කරනු ලබන්නේ, වාහනයේ වටිනාකමින් භාගය යි. එවිට හදිසි අනතුරක දී ලබා ගත හැක්කේ වාහනයේ වටිනාකමින් භාගය යි. ඔබගේ නිවසේ ගිනි රක්ෂණයක් තිබෙනවා නම් එය ඉතා හොඳ යි. ශ්‍රී ලංකාවේ මිනිසුන් ගිනි සහ සොර බිය රක්ෂණ සඳහා මුදල් යොදවන්නේ ඉතා අඩුවෙන්. අපගේ දේපළ, පවුල්වල අයගේ ජීවිත රක්ෂණය කර

තිබීම වැදගත්. සමහර විට සෞඛ්‍යමය ගැටලු ඇති වූ අවස්ථාවල බොහෝ පිරිස් සෞඛ්‍ය රක්ෂණයක් නොමැතිව දැඩි මූල්‍ය ආතතියකින් පෙළෙනවා. නමුත් අපි සුදුසු සෞඛ්‍ය රක්ෂණයක් අරගෙන තිබෙනවා නම් ඒ හරහා සියලු සෞඛ්‍ය වියදම් පියවා ගැනීමේ හැකියාව තිබෙනවා. මූල්‍ය සාක්ෂරතාවෙන් හෙබි පුද්ගලයෙක් අනිවාර්යයෙන් කළ යුතු දෙයක් තමයි රක්ෂණය කියලා කියෙන්නෙ. විශේෂයෙන් රක්ෂණයක් ගැනීමේ දී රක්ෂණ ගිවිසුම කියලා කියන්නේ වැදිගත් සාධකයක්. අපි ණයක්, රක්ෂණයක් හෝ විශ්‍රාම සැලසුමක් ලබා ගන්නේ නම් ගිවිසුම පිළිබඳ ව මනා අවබෝධයකින් එය ලබා ගැනීම වැදගත්.

- ***අවසාන වශයෙන් කීර්ති මහත්මයාගෙන් දැනගන්න කැමතියි මූල්‍ය සාක්ෂරතාව ගැන සමාජමය වගකීම පැවරිලා තිබෙන්නේ කොහොම ද? ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය සාක්ෂරතාව කෙරෙහි අනුගමනය කරන ක්‍රියාමාර්ග මොනවා ද?***

ඔව් අපි අද දවසේ ඉතාම වැදගත් කරුණු රාශියක් සාකච්ඡා කළා. කොහොම ද මූල්‍ය ආතතිය ඇති වෙන්නේ? සහ එයට තිබෙන හොඳම විසඳුම මූල්‍ය සාක්ෂරතාවය ප්‍රගුණ කිරීම බව අපි දැනගත්තා. ඒ අනුව, පුද්ගලයෙකු අනුගමනය කළ යුතු ක්‍රියාකාරී සැලැස්ම අපි සාකච්ඡා කළා. පුද්ගලයෙකු තමන්ගේ ආදායම් වර්ධනය කර ගන්නේ කෙසේ ද? වියදම් කළමනාකරණය කර ගන්නේ කෙසේ ද? ඉතිරි කිරීම් පවත්වාගෙන යන්නේ කෙසේ ද? විධිමත් ව ණයක් ලබාගන්නේ කෙසේ ද? ඒ වගේම විශ්‍රාම සැලසුමක් සකස් කර ගන්නේ කෙසේ ද? රක්ෂණයේ හා ආයෝජනයේ වැදගත්කම වැනි කාරණා අප සාකච්ඡා කළා. මූල්‍ය සාක්ෂරතාව සමාජයේ බාල මහලු සියලු දෙනා සඳහා වටිනා සංකල්පයක්. ශ්‍රී ලංකා මහ බැංකුව විදිහට අප ඔබගෙන් ඉල්ලන්නේ අප සාකච්ඡා කළ කරුණු, ලබා ගත් දැනුම සමාජයේ අනෙක් කොටස්වලට ලබා දෙන්න කියන කාරණයයි. මූල්‍ය අන්තර්ගතභාවය දියුණු කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ එක් කාර්යයක්. අවිධිමත් මුදල් වෙළෙඳපොළේ සිටින පිරිස් විධිමත් මූල්‍ය වෙළෙඳපොළට එකතු කර ගැනීම එහි ඇතුළත්. 2021 වසරේ සිට මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික සැලැස්ම ක්‍රියාත්මක වෙනවා. මූල්‍ය සාක්ෂරතාව දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙනම ම මාර්ගෝපදේශයක් සකස් කර තිබෙනවා. ඒ අනුව, රටේ ඒ හා සම්බන්ධ සියලුම පාර්ශ්ව එකතු කර ගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ නායකත්වය ඇතිව රට පුරා විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක වනවා. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් එම මාර්ග සිතියම ක්‍රියාත්මක කෙරෙනවා. මෙම කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගෙන් ලැබෙන නායකත්වය මෙහිදී මතක් කල යුතුයි. අධිපතිතුමා ඇතුළු ඉහළ කළමනාකාරිත්වය මේ සඳහා දක්වන උනන්දුව, කැපවීම ප්‍රසංසනීයයි. රටේ හැමෝම පුරුදු පුහුණු විය යුතු දැන ගත යුතු කාලීන සංකල්පයක් ලෙස මූල්‍ය සාක්ෂරතාව හඳුනා ගත යුතු බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුයි.■

සාකච්ඡා සටහන:

වයි එම් එස් පී යාපා

සහකාර අධ්‍යක්‍ෂ

සන්නිවේදන දෙපාර්තමේන්තුව

මූල්‍ය සාක්ෂරතාව සම්බන්ධයෙන් දැනුවත් වීමක් අවශ්‍ය වන්නේ නම් රාජකාරී වේලාවන්හි දී අමතන්න.

011-2477437

මෙම සාකච්ඡාව නැරඹීමට පහත QR කේතය Scan කරන්න.

YouTube

දැන ගෙන ණය ගමු... උගුලේ නොවැටෙමු...

එල් එච් එම් යූ එම් ලන්සකාර
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

රටක ආර්ථික අර්බුදයක් අතරතුර දී, ආදායම් අඩු වීම, රැකියා අහිමි වීම, මූල්‍ය අවිනිශ්චිතතාවන්ට මුහුණ දීම වැනි රටක කුටුම්බ අත්විඳින දුෂ්කරතා හේතුවෙන් ගෘහස්ථ ණය බර තියුණු ලෙස ඉහළ යා හැකි ය. මෙහි දී බොහෝවිට අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීම සඳහා ණය ගැනීමට කුටුම්බ යොමු කරවන අතර එමඟින් ණය බර වැඩි වේ. මූල්‍ය බැඳීම් සපුරාලීමට නොහැකි වීම හේතුවෙන් ණය ආපසු ගෙවීමේ අභියෝග මතුවන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ණය ගෙවීම් ප්‍රමාද වීම, ණය පැහැර හැරීම හෝ ණය මත යැපීම සිදුවිය හැකි ය. අධික කුටුම්බ ණය ආතතිය පුද්ගලයින්ගේ මානසික යහ පැවැත්මට බලපායි. එපමණක් නොව කුටුම්බයන්ගේ අධික ණයගැතිභාවය සමාජයට දැඩි සෘණාත්මක බලපෑමක් ඇති කරනු ලබන අතර ම එය ප්‍රධාන සමාජ ගැටලුවක් බවට ද පත්වනු ඇත. මෑතක දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් කරන ලද සමීක්ෂණයකට අනුව 20222023 කාලය තුළ ශ්‍රී ලාංකික කුටුම්බවලින් 20%ක් පමණ ණය බරින් මිරිකී සිටින අතර පරිභෝජනය සඳහා සාමාන්‍යයෙන් හතර වතාවකට වඩා ණයට ගෙන ඇති බව හෙළි වී ඇත.* එමෙන් ම නවතම වාර්තාවලට අනුව, 2024 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 6.5ක් දක්වා ළඟා වී ඇත.**

ණය යනු ප්‍රමාණවත් අරමුදල් නොමැති අවස්ථාවන්හි යම් ආර්ථික ක්‍රියාකාරකම් එනම් ආයෝජනය සහ

* (UNDP 2024) Addressing household debt induced vulnerability in Sri Lanka.
** (Sri Lanka Household debt, 2010-2025 CEIC Data)

පරිභෝජනය වෙනුවෙන් වියදම් කිරීමට පුද්ගලයින්, ව්‍යාපාර සහ රජයක් විසින් භාවිත කරන වැදගත් මෙවලමක් ලෙස හඳුන්වා දිය හැක. ණය ගැනීම මඟින් ව්‍යාපාරයන්ට හෝ පුද්ගලයන්ට වර්තමාන අවශ්‍යතා සපුරා ගැනීමට ඉඩ සලසයි. කෙසේ වෙතත්, මූල්‍ය දුෂ්කරතා සහ අධික පොලී වියදම් වළක්වා ගැනීම සඳහා ඥානාන්විත ව ණය ගැනීම ඉතා වැදගත් වේ.

එබැවින් ණය මුදලක් ලබාගැනීමේ දී සහ එකී ණය මුදල පරිභෝජනය කිරීමේ දී ඒ පිළිබඳ ව මනා අවබෝධයෙන් යුතු ව කටයුතු කළ යුතු අතර එය මූල්‍ය සාක්ෂරතාවයෙන් හෙබි පුද්ගලයෙකුගේ ලක්ෂණයයි. පුද්ගලයෙකු හට තම ජීවිතයේ යම් යම් අවස්ථාවල දී තම මූල්‍ය අවශ්‍යතාවන් සපුරා ගැනීමට මෙන් ම තම මූල්‍ය ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා මුදල් ණයට ගැනීමට සිදු වේ. එහි දී නිවැරදි ආකාරයට ණය මුදලක් ලබාගැනීමටත් නිවැරදි ආකාරයට එය පරිහරණය කිරීමටත් මනා දැනුමක් පුද්ගලයෙකු සතු විය යුතු ය. එබැවින් මෙම ලිපියේ අරමුණ වනුයේ ණයක් ලබාගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද යන්න පිළිබඳ ව සවිස්තරාත්මක ව ඉදිරිපත් කිරීමයි.

1. ණයක් ගැනීම අත්‍යවශ්‍ය ම ද යන්න පිළිබඳ ව සොයා බැලීම

ණය ලබාගැනීමට අවශ්‍ය කටයුත්ත සඳහා ණයක් ලබාගත යුතුමද? යන්න මෙන් ම තමන් හට ඇත්තට ම ණයක් ගැනීමේ අවශ්‍යතාවක් පවතීද? යන්න පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය. ණයක් ගැනීමේ දී ඒ සඳහා යම් පිරිවැයක් ඇති බැවින් ණය ගැනීමට වඩා තමන් සතු ව දැනට පවතින මුදල් යොදවා ගැනීම වඩාත් වාසි දායකද යන්න පිළිබඳ ව සලකා බැලිය යුතු ය. එහි දී, ණය ගැනීම වෙනුවට ඇති වෙනත් විකල්ප පිළිබඳ සොයා බැලිය හැක. විශේෂයෙන් ඉතිරි කිරීම් භාවිත කිරීම, වත්කම් විකිණීම හෝ වියදම් කල් දැමීම වැනි විකල්ප ප්‍රභව වෙත යොමුවීමේ හැකියාවක් පවතී ද යන්න පිළිබඳ ව පෙර විමසීමක් සිදු කළ හැකිය.

2. ණය මුදලේ අරමුණ පිළිබඳ ව ඇති අවබෝධය

ණය ලබාගැනීමේ අරමුණ පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් තිබිය යුතු ය. විශේෂයෙන් ණය මුදල යොදා ගනිමින් ඵලදායී ආයෝජනයක් සිදු කරන්නේද?, එමගින් අපේක්ෂිත ආදායමක් උපයා ගත හැකිද? නැතිනම් මෙය පරිභෝජනය සඳහා හෝ එදිනෙදා වියදමට යොදාගනු ලබන ණය මුදලක්ද? යන්න පිළිබඳව නිවැරදි අවබෝධයක් ණය ලබාගන්නා සතු ව තිබිය යුතු ය. එමෙන් ම ලබාගනු ලබන ණය මගින් යම් ආයෝජනයක් සිදු කරන්නේ නම් ඒ තුළින් ලබන ආදායමෙන් තම ණය වාරිකය හා පොළිය ගෙවීමේ හැකියාවක් පවතීද? යන්න පිළිබඳ ව සහ විශේෂයෙන් ණයක් ලබාගැනීමට පෙර එම ණය සෑම මසක ම ආපසු ගෙවීමට හැකිවන පරිදි තමන් සතු ව ප්‍රමාණවත් ආදායමක් පවතීද? යන්න පිළිබඳ වද සොයා බැලිය යුතු අතර ඒ තුළින් ණය ලබාගන්නා හට මූල්‍ය ස්වාධීනත්වයක් අත්පත් කර ගත හැකි වේ.

3. ණය ගිවිසුම සහ කොන්දේසි පිළිබඳ ව දැනුවත් වීම

ණය ලබාදෙනු ලබන ආයතනයට හෝ පුද්ගලයාට තමන් ලබාගත් ණය ආපසු ගෙවීමට නොහැකි වුවහොත් එකී ආයතනයට හෝ පුද්ගලයාට ලබා දී ඇති ඇපකරය තමන් සන්තක කර ගැනීමේ හැකියාවක් පවතින බව ණය ලබාගැනීමේ දී තරයේ සිතෙහි තබාගත යුතු ය. යම් ආයතනයක් ණයක් ලබාදීමේ දී යම් ඇපකරයක් ඉල්ලා සිටිනුයේ ණයක් ලබා දීම ඉතා අවදානම් සහගත වන නිසා ය. නමුත් අද සමාජයේ බොහෝ ආයතන මෙන් ම පුද්ගලයන් ද ණය ඇපකර ලබානොගෙන ඉහළ පොලී අනුපාත අයකර ගනිමින් ණය ලබාදෙයි. එවැනි වංචනිකයින්ට හසු නොවී ණය මුදලේ කොන්දේසි පිළිබඳ ව සොයා බලා ණයක් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ.

විශේෂයෙන්, ණය මුදලට අදාළ කොන්දේසි සහිත ලියවිලි කියවීම හෝ පැහැදිලි කර ගැනීමට වගබලා ගත යුතු වේ. එබැවින් ණයක් ලබාගැනීමට පෙර අවශ්‍ය සියලු ම තොරතුරු තමන්ට පුරුදු භාෂාවෙන් ලබාගැනීම තමන් සතු අයිතියක් වන අතර ම එම තොරතුරු ලබා දීම ණය ලබාදෙන්නාගේ වගකීමක් වේ. තව ද, ණය ලේඛන කියවීමට සහ අවබෝධ කරලීමට ණය ලබාදෙන්නෙකු තමන් අධෛර්යට පත්කරයි නම් එවැන්නෙකුගෙන් ණය ලබා ගැනීමෙන් වැලකී සිටිය යුතු ය. එබැවින් ණයක් ලබාගැනීමේ

දී ණය ගිවිසුම් පිළිබඳ ව ඇති අවබෝධය සහ ණය කොන්දේසි පිළිබඳ ව ඇති දැනුවත්භාවය ඉතා වැදගත් වේ. එසේ නොවුනහොත් මූල්‍ය ආයතන ඔබේ මූල්‍ය නොදැනුවත්කමින් අයුතු ප්‍රයෝජන ගනු ඇත.

4. **ණය මුදලට අදාළ පොළිය ගණනය කරන ආකාරය පිළිබඳව සැලකිලිමත් වීම**

ණයක් ලබාගැනීමේ දී ණය මුදල සඳහා අයකරනු ලබන පොලිය ගණනය කරන ආකාරය සහ ණය වාරිකය දැරිය හැකි එකක් ද යන්න පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය. තවද, පොළිය ගණනය කරනු ලබනුයේ හීන වන ශේෂ ක්‍රමයටද? නැතහොත් සමතල ක්‍රමයටද? යන්න පිළිබඳ ව ද අවබෝධයක් තිබීම වැදගත් ය.

උදා: සමතල ක්‍රමයට ණය පියවීම

ණය මුදල	රු. 60,000 යැයි සිතමු.
වාර්ෂික පොළිය	12%
මාසික වාරික ගණන	12
මාසික පොළිය	1%

ණය වාරිකය (රු.)	මාසික පොළිය (රු.)	මාසික වාරිකය (රු.)
60,000/12 = 5,000	60,000 x 1% = 600	5,600
60,000/12 = 5,000	60,000 x 1% = 600	5,600
60,000/12 = 5,000	60,000 x 1% = 600	5,600

ගෙවීමට සිදුවන මුළු ගණන = 5,600 + 5,600 + 5,600 + ... = 67,200 (රු.60,000 + (රු.600x12))

මෙහි දී ණය ආපසු ගෙවීමේ දී එක සමාන වටිනාකම් ඇති වාරික මුදලක් ගෙවීමට හැකි වේ. එමෙන් ම මෙහි දී ණය මුදලට අදාළ පොළිය මුළු මුදලට එකතු කර එම මුළු මුදල වාරික ගණනින් බෙදා මාසික ව ගෙවිය යුතු වාරිකය තීරණය කරනු ලබයි.

උදා: හීනවන ශේෂ ක්‍රමයට පියවීම

මුළු ණය මුදල	60,000
වාර්ෂික පොළිය	12%
මාසික පොළිය	1%
මාසික වාරික ගණන	12

ණය ශේෂය (රු.)	ණය වාරිකය (රු.)	මාසික පොළිය (රු.)	මාසික වාරිකය (රු.)
60,000	5,000	60,000 ං 1% = 600	5,600
55,000	5,000	55,000 ං 1% = 550	5,550
50,000	5,000	50,000 ං 1% = 500	5,500

ගෙවිය යුතු මුදල = 5,600 + 5,550 + 5,500 + ... = 63,900

මේ ආකාරයට බලන කල හීන වන ශේෂ ක්‍රමයට ණයක් ලබා ගැනීමට හැකි වේ නම් වාසිදායක වන බව පැහැදිලි වේ. එබැවින්, ණය මුදලක් ලබා ගැනීමට පෙර ණය මුදලෙහි මුළු කාල සීමාව තුළ දී ආපසු ගෙවිය යුතු මුළු මුදල පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ණය මුදල ලබාගැනීම ඥානාන්විත වේ.

5. ණය පොළිය ගණනය කරනු ලබන පොළී අනුපාතය පිළිබඳව අවබෝධයක් තිබීම

ණය පොළිය ණය ලබා ගැනීමේදී සැලකිලිමත් විය යුතු තවත් කරුණක් නම්, පොළී ගණනය කිරීම ස්ථාවර පොළී අනුපාතයක් යටතේද? නැත්නම් විචල්‍ය පොළී අනුපාතයක් යටතේ අය කෙරේද? යන්න පිළිබඳවයි. එහි දී විචල්‍ය පොළි අනුපාතයක් යටතේ පොළිය ගණනය කිරීම සිදුවුවහොත් අනාගතයේ දී වෙළෙඳපොළ පොළි අනුපාත වැඩිවුවහොත් ණය දෙන්නාගේ අභිමතය පරිදි ඉහළ මාසික වාරිකයක් ගෙවීමට සිදුවේ. නමුත් ස්ථාවර පොළී අනුපාතයක් යටතේ ණය ලබාගත් විට අනාගත පොළී ගෙවීම් පිළිබඳ ව නිවැරදි පුරෝකථනයක් කිරීමට එමගින් අවස්ථාව සැලසේ. එබැවින් අනාගතයේ වෙළෙඳපොළ තුළ ඇතිවිය හැකි විචල්‍යයන් පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ණයක් ගැනීමට හැකි වේ නම් එය වඩාත් හිතකර වේ.

6. ණය මුදල ලබාගන්නා ආයතනය කෙරෙහි පවතින විශ්වාසය පිළිබඳ ව සොයා බැලීම

ණය මුදල ලබාගන්නා ආයතනය සම්බන්ධයෙන් පවතින විශ්වසනීයත්වයත් විශේෂයෙන් මහජනයාගේ තැන්පත් මුදල් භාරගැනීමටත්, එම මුදල් ණයට දීම සහ හෝ ආයෝජනය කිරීම යන කාර්යයන් කරගෙන යෑම සඳහා ත් අවසර ලබාදී ඇති ආයතනයක්ද? යන්නත් එකී ආයතනය නියාමනය වනු ලබන ආයතනයක්ද? යන්න පිළිබඳ ව විමසා බැලීම ද ණය මුදලක් ලබාගැනීමේ දී වැදගත් වේ. මන්ද, විධිමත් ආයතන යම්කිසි නියාමන අධිකාරියක අධීක්ෂණයට සහ නියාමනයට යටත් වන බැවින් එවැනි ආයතන පිළිබඳ ව විශ්වසනීයත්වයක් මෙන් ම සුරක්ෂිතතාවක් පාරිභෝගිකයන් තුළ ඇතිවේ. එමෙන් ම, විධිමත් මූල්‍ය ආයතනයක් මගින් සහන ණය මෙන් ම කිසියම් හේතුවක් මත පාරිභෝගිකයන්ට සිය ණය ආපසු ගෙවීමට දුෂ්කරතාවක් මතුවුවහොත් ඔවුන්ට සිය ණය උපදේශන සේවා හරහා සහනදායී වැඩපිළිවෙල් ක්‍රියාත්මක කරනු ලබයි. එමෙන් ම, බොහෝ ආයතන ව්‍යාපාරික අදහසින් පමණක් කටයුතු කරනු ලබන අතර ණය ලබාගත් පුද්ගලයින් කෙරෙහි සැලකීමක් නොදක්වයි. නමුත් විධිමත් මූල්‍ය ආයතන තම පාරිභෝගිකයින් ආරක්ෂා කර ගනිමින් රටේ දියුණුවට තම පාරිභෝගිකයින් දායක කර ගැනීම ඔවුන්ගේ අපේක්ෂාවයි. එබැවින් විධිමත් මූල්‍ය පද්ධතියකින් ණය ගැනීමට යොමු විය යුතු වේ.

7. මූල්‍ය ආයතන ණය ලබා දී මේ දී අය කරනු ලබන අනෙකුත් ගාස්තු පිළිබඳ ව දැනුවත් වීම

ණය ගැනීමේ දී අය කළ හැකි අමතර ගාස්තු එනම්, සමහර ණය සඳහා මුලින් ම ගෙවිය යුතු ගාස්තු, ණය සැකසීමේ ගාස්තු, එමෙන් ම ණය වාරිකයක් ගෙවීමට අතපසු වුවහොත් අය කළ හැකි දඩ මුදල් සහ අය කරනු ලබන ගාස්තු පිළිබඳවත් ණය නියමිත කාලයට පෙර ගෙවීමේ දී යම් අමතර ගෙවීමක් සිදු කළ යුතුද? යන්න පිළිබඳවත් විමසා බැලිය යුතු ය. එහි දී විශේෂයෙන් අප විසින් සලකා බැලිය යුතු සුවිශේෂී කරුණක් නම් මෙවැනි ආකාරයේ තවත් ගාස්තු දඩ මුදල් ආදියෙන් නිදහස්, විධිමත් මූල්‍ය ආයතනයක් පවතීද? යන්න පිළිබඳවයි. මන්ද, මෙම තරගකාරී වෙළෙඳපොළ තුළ බොහෝ මූල්‍ය ආයතන පාරිභෝගිකයින් ඇදගැනීම සඳහා මෙවැනි ආකාරයේ ගාස්තු රහිත අඩු පොළී අනුපාතික ලබාදෙයි. එබැවින් එවැනි ආයතන පිළිබඳ ව අප සොයා බැලීමෙන් වඩාත් හොඳ මූල්‍ය ආයතනයක් කරා යොමු වීමේ හැකියාව පවතී.

8. ණය මුදලක් ගැනීමේ දී දැරිය යුතු පිරිවැය පිළිබඳ ව මනා අවබෝධයක් තිබිය යුතු වීම

ණයක් ගැනීමේ දී දැරිය යුතු ඕනෑ ම ආකාරයේ පිරිවැයක් ණය මුදලේ පිරිවැය වේ. විශේෂයෙන් ණයක් ගැනීමේ දී ඒ සඳහා අදාළ වන පොලිය සහ අනෙකුත් වියදම් මෙයට අදාළ වේ. මෙහි දී ණය මුදලක් ගැනීමේ දී ගෙවිය යුතු සඵල පොළී අනුපාතිකය, එය ගණනය කිරීමේ දී ණය මුදලේ කාලසීමාව කුමක්ද? යන්න පිළිබඳව, මූල්‍ය කල්බදු සඳහා වන මූල්‍ය ගාස්තු පිළිබඳව මෙන් ම විදේශ ණය ගැනීම් හා සම්බන්ධ පොලිය ගෙවීමේ දී සිදුවන විනිමය අනුපාතිකයේ වෙනස ආදිය පිළිබඳව ද දැනුවත් විය යුතු අතර ඔබ විසින් මුළු ණය කාලය තුළ ම ගෙවිය යුතු සම්පූර්ණ ණය මුදල පිළිබඳ ව ද මනා වැටහීමක් ඔබ සතු විය යුතු ය.

සමස්තයක් ලෙස බැලූ කල, ණය මුදලක් ලබාගැනීමේ දී දැන සිටිය යුතු කරුණු රාශියක් ඇති බව පැහැදිලි ය. විශේෂයෙන් ණය මුදලක් ලබාගැනීමේ දී සිතිය යුතු මූලික කරුණක් වනුයේ තම කාර්යය ඉටු කර ගැනීමට ණය මුදලක් ලබාගත යුතුමද? යන්නත් එසේ නොමැති නම් ණය ගැනීමකින් තොර ව ඊට වඩා අඩු පිරිවැයක් ඇති විකල්ප අරමුදල් ප්‍රභවයකින් තම මූල්‍ය අවශ්‍යතාව ය සපුරා ගත හැකිද? යන්න ය. එමෙන් ම ණය ගැනීමේ අරමුණ පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ණය ලබා ගන්නා තුළ තිබිය යුතු ය. ණයක් ලබාගත් විට එම ණය ලබාගත් අරමුණ සඳහා ම භාවිත කිරීමට අප විසින් වගබලා ගත යුතු ය. වත්කමක් අත්පත් කර ගැනීම, අධ්‍යාපනයට අරමුදල් සපයා ගැනීම, මෙන් ම හදිසි මූල්‍ය අවශ්‍යතා වැනි සාධාරණ අරමුණක් වෙනුවෙන් පමණක් ම ණය ලබාගත යුතු අතර විශේෂයෙන් කෙටි කාලීන පරිභෝජන අවශ්‍යතාවන් තෘප්තිමත් කරගැනීමට වඩා දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වයක් සඳහා ණය ලබා ගැනීම වැදගත් බව සිහියේ තබා ගත යුතු ය. තව ද, කිසිවිටකත් ආයෝජනය සඳහා ලබාගත් ණය, පරිභෝජනය සඳහා හෝ වෙනත් ණයක් පියවීම සඳහා භාවිත නොකළ යුතු ය. එනම්, ණය අවභාවිත නොකළ යුතු ය. සුඛෝපභෝගී භාණ්ඩ මිලට ගැනීමට හෝ මුදල් උත්පාදනයක් සිදු නොවන වාහන මිලදී ගැනීම, මිල අධික ඇඳුම් මිලදී ගැනීම, විදේශ සංචාර ආදිය සඳහා කිසිවිටකත් ණයට මුදල් ගැනීම ඥානාන්විත නොවේ. එසේ ම, අප ණයක් ලබාගත යුත්තේ අවසාන විකල්පය ලෙස පමණි. මන්ද ණය ලබා ගැනීමට අවශ්‍ය ම නම් පමණක් ණය ලබාගත යුතු අතර අනෙක් අය ණයට ගන්නා නිසා ණය ගැනීමෙන් වැළකිය යුතු ය.

එපමණක් නොව අප විසින් ණය මුදලක් ගත් විට එම ණය මුදල නිසි ලෙස භාවිත කරන ආකාරය පිළිබඳ ව සහ එම ණය මුදල නැවත ආපසු ගෙවන්නේ කෙසේද? යන්න පිළිබඳ ව ද මනා සැලැස්මකින් යුතුව කටයුතු කළ යුතුය. තවද අප විසින් ණය ගිවිසුමේ එකඟ වූ පරිදි කලට වේලාවට නියමිත පරිදි ගෙවීමට කටයුතු කළ යුතු අතර යම් හෙයකින්, සාධාරණ හේතුවක් මත එසේ ගෙවීමට අපහසු වුවහොත් මූල්‍ය ආයතනය වෙත ගොස් ණය ප්‍රතිව්‍යුහගත කර ගැනීමට කටයුතු කිරීම හරහා ණය මුදල නිසි පරිදි ගෙවීමට හැකි වීමෙන් විශ්වාසදායී ගනුදෙනුකරුවෙකු බවට පත්විය හැකි ය.

එමෙන් ම තමාගේ පුද්ගලික මූල්‍ය සැලසුම්වලට බලපෑමක් නොවන පරිදි අත්‍යවශයෙන් ම සිදු කළ යුතු වියදම් ද කැප නොකර මාසික ව ණය ආපසු ගෙවීම සිදු කළ හැකිද? යන්න පිළිබඳ ව එනම් තම ණය ආපසු ගෙවීමේ හැකියාව යහපත් මට්ටමක පවතීනම් පමණක් අප විසින් ණය මුදලක් ලබාගත යුතු ය. උදාහරණ ලෙස යම් පුද්ගලයෙකුට වාහනයක් මිලදී ගැනීමට අවශ්‍ය වූ විට තමන්ගේ මාසික ආදායම සහ මාසික වියදම හඳුනාගෙන එතුළින් ණය වාරිකය ආපසු ගෙවීමට ණය ගැණුම්කරුට ඇති හැකියාව මත පදනම් ව ණය මුදල තීරණය කළ යුතු ය.

ඉහත දී සාකච්ඡා කළ පරිදි, ණය මුදලක් ලබාගැනීමේ දී විශේෂයෙන් ණය ලබා ගන්නා ආයතනය පිළිබඳ ව පවතින විශ්වාසවන්ත භාවය පිළිබඳ ව සොයා බැලීම වැදගත් වේ. ණය ලබාගැනීමේ දී අදාළ වන කොන්දේසි පිළිබඳ ව හා ණය කාල සීමාව පිළිබඳව සැලකිලිමත් විය යුතු ය. මන්ද ණයෙහි කාලසීමාව සහ කොන්දේසි ණය ගැණුම්කරුවාගේ මූල්‍ය සැලසුම් සහ ණය ආපසු ගෙවීමේ ධාරිතාව සමඟ ගැලපිය යුතු බැවිනි. තව ද ණය පිරිවැය අවම වන පරිදි ණය මුදලක් ලබා ගැනීමට වගබලා ගත යුතු ය. එහි දී පෙර සැලසුම් කළ පරිදි, ණය ලබාගෙන මූල්‍ය ආයතන කිහිපයක පොලී අනුපාත, සැකසුම් ගාස්තු සහ අනෙකුත් ගාස්තු පිළිබඳ ව සන්සන්දනය කර ණය ගැනීමට කටයුතු කළ යුතු ය.

මේ අනුව බැලීමේ දී අප විසින් ණය මුදලක් ලබාගැනීමේ දී සැළකිලිමත් වියයුතු කරුණු බොහෝමයක් ඇති බව පැහැදිලි ය. විශේෂයෙන් අප සිතිය යුතු කරුණ නම් ණය මුදලක් ලබාගෙන තමන්ගේ ජීවන තත්ත්වයන් ඉහළ නංවා ගන්නවාද? නැත්නම් ණය උගුලකට හසුවී වැනසෙනවාද? යන්නයි. එබැවින් දැනගෙන ණය ගැනීමට අපි සුපරීක්ෂාකාරී වෙමු.

මූලාශ්‍ර:

https://www.themorning.lk/articles/OznaGpS4IbSetPESzQnh

https://www.undp.org/srilanka/publications/addressing-household-debt-induced-vulnerability-sri-lanka

මූල්‍ය සාක්ෂරතාවය සහ අයවැයකරණය

ඩී එල් රෝහිණී
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව

1. පසුබිම

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත අනුව මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් කාර්යයක් ලෙස දක්වා තිබේ. ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ තක්සේරු කිරීම සහ ඇගයීම සඳහා 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා ආයතනය මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ව සමීක්ෂණයක් පවත්වා තිබේ. එම මූල්‍ය අන්තර්ගතභාවය සම්බන්ධ ජාතික සමීක්ෂණයේ හෙළිදරව් කිරීම් අනුව ශ්‍රී ලංකාවේ වර්තමාන මූල්‍ය සාක්ෂරතා තත්ත්වය සහ මට්ටම පිළිබඳ යම්කිසි තක්සේරුවකට පැමිණිය හැකි ය. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සමීක්ෂණය මගින් තක්සේරු කරන ලද ආකාරයට ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා මට්ටම සියයට පනස්අටක් දක්වා වර්ධනය වී තිබේ. තව ද මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ සමීක්ෂණයෙන් දක්වන ආකාරයට ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතා මට්ටම ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වෙයි.එනම් මූල්‍ය දැනුම, මූල්‍ය ආකල්ප සහ මූල්‍ය හැසිරීම ය. කෙසේ වුව ද ශ්‍රී ලාංකේය ජනතාව තුළ වර්ධනය වී ඇති ඉහළ මූල්‍ය දැනුම සහ මූල්‍ය ආකල්පවලට සාපේක්ෂ ව බලන විට මූල්‍ය හැසිරීම පහළ මට්ටමක පවතින බව එම සමීක්ෂණය මගින් පෙන්වා දී තිබේ. එසේ වීමට ප්‍රධාන හේතුවක් ලෙස අවිධිමත් මූල්‍ය අංශය තුළින් කුටුම්බවල මූල්‍ය අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සැලකිය යුතු ඉහළ මට්ටමක පැවතීම ප්‍රධාන සාධකයක් ලෙස පෙන්වා දී තිබේ. මේ නිසා මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා විධිමත් මූල්‍ය අංශය තුළ ඇති මූල්‍ය සේවා භාවිතයට යොමු වීම සඳහා එම විධිමත් මූල්‍ය සේවා සහ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම ජාතික වශයෙන් වැදගත්වන අවශ්‍යතාවක් ලෙස පෙන්වා දී තිබේ. මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම තුළින් විධිමත් අංශය වෙතින් මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීම, ග්‍රාමීය දරිද්‍රතාව අඩු කිරීම, ආර්ථික කටයුතු සඳහා සක්‍රීය සහභාගීත්වය වැඩි වීම තුළින් මූල්‍ය තත්ත්වය වැඩි දියුණු කිරීම, විධිමත් මූල්‍ය අංශය තුළ මූල්‍ය වත්කම් සංචලනය වැඩි කිරීම, කාර්යක්ෂමතාව ඉහළ දැමීම, ආර්ථික වර්ධනය ඉහළ නැංවීම, මූල්‍ය ස්ථායීතාව ඇතුළු අරමුණු රාශියක් ඉටු කර ගැනීමට අපේක්ෂිත ය.

විවිධ රටවල සිදු කර ඇති පර්යේෂණ මගින් සොයා ගන්නා ලද ආකාරයට මූල්‍ය අන්තර්ගතභාවය වැඩිවීම සහ විරැකියාව, මන්දපෝෂණය, දරිද්‍රතාව අතර ප්‍රතිලෝම සබඳතාවක් තිබේ. මේ පිළිබඳව සිදු කළ පර්යේෂණයක් (IKoomson) et al 2020) මගින් හෙළිදරව් වී ඇත්තේ මූල්‍ය අන්තර්ගතභාවය වැඩි වීම කුටුම්බයන්හි දරිද්‍රතාව අඩු කිරීම කෙරෙහි දෙආකාරයකින් බලපාන බවයි. පළමු ව දැනට පවතින දිළිඳු කුටුම්බයන්හි දරිද්‍රතාව 27%කින් අඩු වීම සහ දෙවනු ව කුටුම්බ විසින් අනාගතයේ දී දරිද්‍රතාවට නිරාවරණ ය වීමේ ප්‍රතිශතය 28%කින් පමණ අඩු වීමට හේතු වේ. තව ද ඉන්දියාවේ දත්ත යොදාගෙන සිදු කළ පර්යේෂණයක් (T Inoue 2019) මගින් මූල්‍ය අන්තර්ගතභාවය සහ දරිද්‍රතාව අඩු කිරීම සඳහා රාජ්‍ය අංශයේ බැංකු මගින් විශේෂ දායකත්වයක් ලබා දෙන බවත් මේ නිසා මූල්‍ය අන්තර්ගතභාවය තුළින් දරිද්‍රතාව අඩු කිරීම සඳහා රාජ්‍ය අංශයේ බැංකු සේවා ප්‍රවර්ධනය සඳහාත් නිර්දේශ ඉදිරිපත් කර තිබේ. මූල්‍ය අන්තර්ගතභාවය සම්බන්ධයෙන් රටවල් 116ක හරස්කඩ

දත්ත යොදාගෙන සිදු කර ඇති පර්යේෂණයකට (MA Omar, K Inaba 2020) අනුව මූල්‍ය අන්තර්ගතභාවයේ මට්ටම සඳහා ඒකපුද්ගල ආදායම, අන්තර්ජාල පරිශීලක අනුපාතය, වයස අනුව ජනගහන ප්‍රතිශතය, උද්ධමනය සහ ආදායම් අසමානතාව යන හේතු බලපාන බව දක්වා තිබේ. තවද මූල්‍ය අන්තර්ගතභාවය මගින් සංවර්ධනය වෙමින් පවතින රටවල දරිද්‍රතා අනුපාතිකය සහ ආදායම් අසමානතාව සාධනීය ලෙස අඩු වීමට හේතුවන බව පෙන්වා දී තිබේ. දියුණුවන රටවල ආර්ථික වර්ධනය සහ මූල්‍ය අන්තර්ගතභාවය අතර අනුලෝම සබඳතාවක් පවතින බව විවිධ රටවල සිදු කර ඇති පර්යේෂණ මගින් ඔප්පු කර තිබේ. මේ සඳහා පර්යේෂණ පත්‍රිකා විශාල සංඛ්‍යාවක් පළ වී ඇත. මෑත කාලීන ව සිදු කරන ලද පර්යේෂණ පත්‍රිකාවක සඳහන් වන පරිදි මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය තුළින් අඩු ආදායම් රටවල ආර්ථික වර්ධනය ද සැලකිය යුතු මට්ටමකින් ඉහළ යන බව (LTH Van,) et al 2021) සොයාගෙන තිබේ.

මේ ආකාරයට ජාතික වශයෙන් වැදගත් වන මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද ප්‍රතිපත්තිමය වශයෙන් වැදගත් වන පියවර රැසක් මේ වන විට ක්‍රියාත්මක කරමින් තිබේ. ඒ අනුව මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වන උපායමාර්ගික ග්‍රන්ථය (2021-2024) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එළි දක්වා තිබේ. ඒ තුළ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන ජාතික වශයෙන් වැදගත් වන පියවර රාශියක් දක්වා තිබේ. මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වන උපායමාර්ගික ග්‍රන්ථය (2021-2024)ට අනුව මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් හඳුනාගත් අංශ හතරක් දක්වා තිබේ.

1. විද්‍යුත් මූල්‍යය සහ ගෙවීම්
2. කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය මූල්‍යනය
3. පාරිභෝගික ආරක්ෂණය
4. මූල්‍ය සාක්ෂරතාව සහ ධාරිතා සංවර්ධනය

විද්‍යුත් මූල්‍යය සහ ගෙවීම් කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනතේ සඳහන් ප්‍රතිපාදන ප්‍රකාර ව පියවර රාශියක් ගෙන තිබේ. විද්‍යුත් මූල්‍යය හා සම්බන්ධ ගෙවීම් ක්‍රම රාශියක් හඳුන්වා දී ඇති අතර එම කටයුතු නියාමනය සහ අධීක්ෂණය කරයි. විද්‍යුත් මූල්‍යය පහසුකම් භාවිතය වර්ධනය කිරීම ජාතික අවශ්‍යතාවක් ලෙස මේ වන විට හඳුනාගෙන තිබේ. විශේෂයෙන් ම ඩිජිටල් හැඳුනුම්පත හඳුන්වා දීම සහ රජයේ ගනුදෙනු සඳහා විද්‍යුත් සහ ඩිජිටල් ගෙවීම් මාධ්‍ය භාවිතය ඉහළ යෑම තුළින් විද්‍යුත් මූල්‍යය සහ ගෙවීම්වල සාධනීය වර්ධනයක් අපේක්ෂා කළ හැකි ය. එසේ ම පාරිභෝගික ආරක්ෂණය සඳහා විද්‍යුත් මූල්‍ය පහසුකම් භාවිත කිරීමේ දී ගනුදෙනු සනාථ කර ගැනීම සඳහා මූල්‍යායතනය වෙත ලබා දී ඇති ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩ මගින් දැන්වීම අනිවාර්ය වේ. එසේ ම බැංකුව වෙතින් එම කෙටි පණිවුඩ සේවාව මෙතෙක් ලබා නොගත් අයට තම බැංකුවට දන්වා එම කෙටි පණිවුඩ සේවාව ලබා ගත හැකි ය. ඊට අමතර ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පාරිභෝගික ආරක්ෂණය සඳහා තැන්පතු රක්ෂණය හඳුන්වා දී තිබේ. තැන්පතු රක්ෂණය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි සෑම මූල්‍යායතනයක ම (බැංකු සහ බැංකු නොවන) පවත්වාගෙන යන තැන්පතු සඳහා තැන්පතු වටිනාකම උපරිම ලක්ෂ 11ක් දක්වා රක්ෂණාවරණයක් හිමි වේ. ඊට අමතර ව ශ්‍රී ලංකා මහ බැංකුවේ පිහිටුවා ඇති මූල්‍ය පාරිභෝගික කටයුතු දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය පාරිභෝගික විමසීම් සම්බන්ධයෙන් ක්‍රියා කරන අතර ඒ පිළිබඳ විමසීම් සඳහා ක්ෂණික ඇමතුම් අංක 1935ට අවශ්‍ය තොරතුරු ලබා දිය හැකි ය. මේ අනුව පැහැදිළි වන්නේ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කරුණු ඇතුළත් පුළුල් විෂය පථය විවිධ දෙපාර්තමේන්තු සහ ආයතන සමූහයක් විසින් ආවරණය කෙරෙන බවයි.

2. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය

විශේෂයෙන් ම වර්තමානයේ දී මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්දේශිත එක් පියවරක් වන මූල්‍ය සාක්ෂරතාව සහ ධාරිතා සංවර්ධනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරමින් පවතී. මූල්‍ය සාක්ෂරතාව සහ ධාරිතා සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028) නිකුත් කර තිබේ. මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයේ අරමුණ වනුයේ ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය හැසිරීම වැඩි දියුණු කිරීම සහ

මූල්‍ය හැකියා ඉහළ නැංවීම වේ. මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයට අනුව මූල්‍ය සාක්ෂරතාව වැඩි දියුණු කර ගැනීමේ දී අවශ්‍ය වන ප්‍රධාන කරුණු හතරක් පෙන්වා දී තිබේ.

1. **ආර්ථික සහ මූල්‍ය පරිසරය:** මූල්‍ය සේවා, මූල්‍ය සේවා සපයන ආයතන, මූලික සාර්ව ආර්ථික සංකල්ප, මූල්‍ය අධිකාරියේ කාර්යභාරය, මූල්‍ය තොරතුරු ලබා ගැනීම සහ මූල්‍ය සේවා තෝරා ගන්නා ආකාරය පිළිබඳ ව කරුණු ආවරණය කිරීම අපේක්ෂා කෙරේ.

2. **විද්‍යුත් මූල්‍ය සාක්ෂරතාව:** විද්‍යුත් මූල්‍ය සේවා පිළිබඳව හඳුන්වා දීම, අන්තර්ජාල බැංකුකරණය, ජංගම දුරකථන භාවිතයෙන් බැංකුකරණයට පිවිසීම, කාඩ්පත් මගින් ගෙවීම් කිරීම, විද්‍යුත් ගනුදෙනුවල ආරක්ෂාකාරී සහ සුරක්ෂිතතාව සඳහා ගතයුතු පියවර පිළිබඳ ව අවශ්‍ය දැනුම ලබා දීම තුළින් විද්‍යුත් මූල්‍යය ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

3. **මූල්‍ය කළමණාකරණය:** අයවැයකරණය තුළින් ඉතිරි කිරීම් සහ ආයෝජන වලට යොමු කරවීම සඳහා පුද්ගලයින්ට තම තමන්ගේ එදිනෙදා මූල්‍ය කටයුතු ඵලදායී ලෙස වර්ධනය කර ගැනීමට අවශ්‍ය වන උපදෙස් ලබා දීම අරමුණු කරයි.

4. **පාරිභෝගික ආරක්ෂණය:** මූල්‍ය ගනුදෙනුවල ඇති ආරක්ෂාකාරී බව සම්න්ධයෙන් පාරිභෝගිකයන්ට දැනුම ලබා දීමෙන් සවිබල ගැන්වීම තුළින් මූල්‍ය කටයුතු සඳහා ඇති විශ්වාසය සහ උනන්දුව ඉහළ නැංවීම මෙයින් අපේක්ෂා කෙරේ.

3. මූල්‍ය කළමනාකරණය තුළ අයවැයකරණය

අයවැයකරණය යනු මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමේ දී මූල්‍ය කළමණාකරණය යටතේ සාකච්ඡා කෙරෙන එක් වැදගත් මාතෘකාවකි. අයවැයකරණය පුද්ගලික මූල්‍ය කළමණාකරණය තුළ සාකච්ඡා කිරීමෙන් ඒ පිළිබඳ ව අවශ්‍ය වන මූලික සංකල්ප පැහැදිලි කර ඉතුරුම් වැඩි කිරීම සහ ඒවා ආයෝජන ඉහළ නැංවීම දක්වා වර්ධනය කර ගැනීමේ අවකාශය වැඩි කර ගැනීමේ හැකියාව පිළිබඳව අවබෝධයක් ලබා දීම වැදගත් වේ. විශේෂයෙන් ම වර්තමානයේ ඉතුරුම් අනුපාතිකය වර්ධනය කිරීමේ අවශ්‍යතාව පුද්ගලයන් වශයෙන්, කුටුම්බ වශයෙන් සහ ජාතික වශයෙන් වැදගත් සංකල්පයකි. රටක් වශයෙන් ඉදිරියට යෑමේ දී මූල්‍ය අතරමැදිකරණය තුළ ඉතිරි කිරීම හෝ ණය ගැනීම තුළින් සංවර්ධනය වෙමින් පවතින රටවල නිමවුම් මට්ටම සහ ජාතික නිෂ්පාදනය වර්ධනය කර ගත හැකි බව රටවල් 130ක දත්ත යොදා ගෙන සිදු කර ඇති පර්යේෂණයක් මගින් (Brueckner, Markus) et al, 2016) තහවුරු කර ඇත. මූල්‍ය සාක්ෂරතාවේ එක් අංශයක් වන පුද්ගලික මූල්‍ය හා සම්බන්ධ කරුණු අතරින් ආදායම්, ඉතුරුම්, ආයෝජන, වියදම්, ණය ගැනීම් ආදී සියලු ම අයිතමයන් අයවැය තුළට ඇතුළත් වන අතර එදිනෙදා ජීවිතයට පුද්ගලික වශයෙන් සහ කුටුම්බ වශයෙන් ගනුදෙනු සම්බන්ධයෙන් සහ තීරණ ගැනීමේ දී වැදගත් වන කරුණු පමණක් මෙහි දී සලකා බලන අතර ඒ තුළින් ඉතිරි කිරීම් වර්ධනය කර ගැනීම සහ ආයෝජනය වර්ධනය කර ගත හැකි ආකාරය පිළිබඳ ව අවධානය යොමු කෙරේ.

3.1 ඔබේ මූල්‍ය සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා අයවැයකරණයේ වැදගත්කම

සීමිත සම්පත් අසීමිත අවශ්‍යතා අතර බෙදා හරින ආකාරය ආර්ථික විද්‍යාව විෂයය තුළින් සාකච්ඡා වේ. මිල ක්‍රමය මගින් මේ සඳහා මනා පිටිවහලක් ලැබේ. සීමිත සම්පත් අතර මූල්‍ය සම්පත ද සීමිත සම්පතක් වන බැවින් මුදල් ගනුදෙනු පිළිබඳ ව සාකච්ඡා කිරීමට අයවැයකරණය වැදගත් වේ. සීමිත සම්පත් භාවිත කිරීම යම් පිළිගත් හා සම්මත සැලැස්මකට අනුව සිදු කිරීම අවශ්‍යතාවකි. අයවැයකරණය යනු වියදම් කපා හැරීමේ උපක්‍රමයක් නොවන අතර නිශ්චිත කාලයක් තුළ දී ප්‍රමුඛතා අරමුණු වෙත ළඟාවීම සඳහා ආදායම් සහ වියදම් උපායශීලී ව කළමනාකරණය කිරීමේ සම්මත ක්‍රමයක් ලෙස හඳුන්වමු.

රටක් ලෙස ගත්විට අයවැය සකස් කිරීම සඳහා විසර්ජන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සහ සම්මත කිරීම, අයවැය යෝජනා ලබා දීම සහ එම යෝජනා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම දක්වා විවිධ වූ ක්‍රියාවලි විශ්ලේෂණ සහ සැසඳීම් ඉදිරිපත් කරමින් සාධාරණීකරණය කිරීම, පාර්ලිමේන්තුවේ පළමු, දෙවන හා තෙවන වර කියවීමෙන් පසු ව වැඩි ඡන්දයෙන් සම්මත වීම අත්‍යවශ්‍ය කරුණකි. අයවැය වැඩි ඡන්දයෙන් සම්මත නොවුණහොත් එය රජය පරාජයට පත්වීමට තරම් ප්‍රබල හේතුවකි. මේ

ආකාරයට රජයේ සහ පෞද්ගලික අංශයේ සියලුම ආයතන තුළ ඊළග වසර සඳහා අපේක්ෂිත සියලුම ආකාරයේ ලැබීම් සහ ගෙවීම් සඳහා වන මූල්‍ය ගනුදෙනු ඇතුළත් කර අයවැය ඉදිරිපත් කිරීම සහ අනුමත කිරීම අත්‍යවශ්‍ය කටයුත්තකි. කුඩා පරිමාණයේ ව්‍යාපාරවල දී අයවැයකරණය සංකීර්ණ ක්‍රියාවලියක් තුළ සිදු නොකළ ද ඒ පිළිබඳ මනා අවබෝධයෙන් කටයුතු කිරීම ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම සඳහා ඉවහල් වේ. මේ සා වැදගත් වන අයවැකරණය පුද්ගලික මූල්‍යකරණයේ මූලික ම අංගයක් වන අතර, මූල්‍යය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ද අතිශයින් ප්‍රයෝජනවත් වේ. අයවැයකරණයේ වැදගත්කම ප්‍රධාන අංශ කිහිපයක් සැලකිල්ලට ගෙන සාකච්ඡා කළ හැකි ය.

මූල්‍යය පාලනය සඳහා අයවැයකරණය ඉතාම වැදගත් වේ. අයවැයකරණය තුළින් ඔබට මූල්‍යය හා සම්බන්ධ බොහෝ දේ පාලනය කිරීමට හැකි වන අතර ඔබ අයවැයක් සකස් නොකරන්නේ නම් ඔබේ මුදල් විසින් ඔබගේ අනෙක් සියලු කටයුතු පාලනය වීම සිදුවේ. එය ඇතැම්විට ඉතා අවදානම් සහගත තත්ත්වයක් දක්වා වර්ධනය විය හැකි ය. අවශ්‍ය තරම් මුදල් නොමැති අවස්ථාවල දී විවිධ වූ දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවීම තුළ අපේක්ෂාභංගත්වයට ද පත්විය හැකි ය.

ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ දී ද අයවැයකරණය අදාළ වේ. අප සියලු දෙනා ජීවිතයේ විවිධ කාලවල විවිධ ඉලක්ක ඉටු කරගැනීමේ අපේක්ෂාවෙන් පසු වන්නෙමු. විදෙස් රටක නිවාඩුවක් ගත කිරීම සඳහා ඉතිරි කිරීම, නව උපකරණයක් මිල දී ගැනීම, අධ්‍යාපන කටයුතු සඳහා හෝ උත්සවයක් පැවැත්වීම වැනි ඕනෑ ම අවස්ථාවක දී, අයවැයකරණය ඔබේ මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය සම්පත් වෙන් කිරීමට උපකාරී වේ.

අධික ලෙස ණය වීම සහ අවදානම් සහගත පාර්ශ්වයන්ට ණය දීම වළක්වා ගැනීම සඳහා අයවැයකරණය වැදගත් ය. වියදම් සහ ආදායම නිරීක්ෂණය කිරීමෙන්, අයවැය තුළ අනවශ්‍ය ණය සහ අධික වියදම් නිරීක්ෂණය කළ හැකි අතර ඒ තුළ ගම්‍ය වන නිර්දේශයන් සලකා බලා අධික ලෙස ණය වීම් වළක්වා ගත හැකි වේ. මේ නිසා ණය ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටින හෝ ණය ලබා ගත් අය සඳහා අයවැය සකස් කිරීම විශේෂයෙන් වැදගත් වේ.

ඉතුරුම් සහ ආයෝජන වැඩි කිරීම අයවැයකරණයේ තවත් අරමුණක් වේ. අයවැයකරණය තුළ වියදම් කිරීම් ආදායමට වඩා අඩුවෙන් තබා ගැනීමෙන් ඇතිවන අතිරික්තය යොදාගෙන ඉතිරි කිරීම් ආරම්භ කළ හැකි අතර ඉන්පසු ව ඒවා ප්‍රතිලාභය සහ අවදානම සැලකිල්ලට ගෙන ආයෝජන අවස්ථා දක්වා වර්ධනය කර ගත හැකි වේ. ඉතුරුම් සහ ආයෝජන අවස්ථා සඳහා මූල්‍යායතන සේවා ලබා ගැනීමට විධිමත් මූල්‍ය අංශය වෙත යොමු වීමෙන් ඉතුරුම් හා ආයෝජන සඳහා නියමිත ප්‍රතිලාභය සමග මූලික තැන්පතු මුදල ද අපේක්ෂිත ආකාරයටම ලැබේ. මේ තුළින් මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශයෙන් අපේක්ෂිත විධිමත් අංශය වෙත මූල්‍ය හැසිරීම වර්ධනය කරගත හැකි අතර මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනයට ද හේතු වේ.

4. ඔබේ මූල්‍ය සැලැස්ම අයවැයකරණයට

ඔබේ මූල්‍ය සැලැස්ම අනුව වාර්ෂික ව අයවැයක් සකස් කිරීම අත්‍යවශ්‍ය වන අතර ආදායම් සහ වියදම් ප්‍රවාහය අනුව අවශ්‍ය නම් මාසික ව හෝ සතිපතා වුව ද අයවැයක් සකස් කිරීම මගින් මූල්‍ය කළමණාකරණය උපායශීලී ව සිදු කළ හැකි ය. මේ අනුව අයවැයක ප්‍රධාන කොටස් වන ආදායම් සහ වියදම් මූලාශ්‍ර පිළිබඳව සාකච්ඡා කරමු.

4.1. ආදායම

අයවැය සකස් කිරීම සඳහා අතවශ්‍ය වන ලැබීම් මූලාශ්‍රය ආදායම් ලෙස පෙන්වා දිය හැකි ය. ආදායම් ලැබීමේ මූලාශ්‍ර ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍ර ලෙස වර්ග කළ හැකි ය. රැකියා නියුක්තිය තුළින් ලැබෙන වැටුප් සහ වේතන, ස්වයං රැකියාවෙන් හෝ ව්‍යාපාර මගින් ලැබෙන ආදායම්, රජයෙන් ලැබෙන සහනාධාර ආදී නිශ්චිත වශයෙන් යම් කාලයක් තුළ දී ගලා එන ලැබීම් ප්‍රාථමික ඉපයීම් මූලාශ්‍ර ලෙස හඳුනාගත හැකි වේ. ප්‍රාථමික ඉපයීම් මූලාශ්‍රවල දී අතට ලැබෙන වැටුප් සහ වේතන පිළිබඳව පමණක් අයවැයකරණයේ දී සැලකිල්ලට ලක් විය යුතු වේ. ද්විතියීක ආදායම් මූලාශ්‍ර ලෙස ආයෝජන ආදායම්, විශ්‍රාම දීමනා, වෙනත් අතිරේක ආදායම් හඳුන්වා දිය හැකි ය. මේ සියලු ම ආදායම් මූලාශ්‍රයන් බද්දකට යටත් වන නිසා බදු ගැලපීම් ද ඇතුළත් ශුද්ධ ආදායම පිළිබඳව අවධානය දැක්විය යුතු වේ.

4.2. වියදම්

ප්‍රාථමික සහ ද්වීතියික මූලාශ්‍රවලින් ලැබෙන ආදායම වියදම් අතර බෙදී යා යුතු ආකාරය කළමනාකරණය කිරීම මේ මගින් සිදු වේ .මෙය තමා උපයන ආදායම

කෙතරම් උපක්‍රමශීලී ව වියදම්, ඉතුරුම් සහ ආයෝජන අතර බෙදා හැරීමට දක්ෂ ද යන්න පිළිබඳ ව පෙන්වා දෙන අතර ඔබ බැංකුකරණය සහ විද්‍යුත් මූල්‍යය හරහා ගනුදෙනු සිදුකර ඇතිනම් මූල්‍යායතන මගින් අදාළ ගනුදෙනුකරු වෙත නිකුත් කරන මාසික වාර්තා තුළින් ද ඒ සියල්ල පිළිඹිබු වේ. කෙසේ වුව ද, ස්ථාවර සහ විචල්‍ය වියදම් ලෙස ප්‍රධාන වශයෙන් වියදම් කොටස් 2කි. ස්ථාවර වියදම් අත්‍යවශ්‍ය වියදම් වන අතර මේ සඳහා කුලී/උකස් ගෙවීම්, උපයෝගීතා බිල්පත් සහ රක්ෂණ වාරික සහ වෙනත් වාරිකමය වශයෙන් සිදු කරන ගෙවීම් (ණය වාරික, පාසැල් ගාස්තු) ආදිය අයත් වේ. විචල්‍ය වියදම් සඳහා අනෙකුත් වියදම් අයත්වේ.

4.2.1. අවශ්‍යතා සහ උවමනා

වියදම් හා සම්බන්ධ ගනුදෙනු හඳුනාගැනීමේ දී අවශ්‍යතා සහ උවමනා යන වර්ගීකරණයට අනුව වියදම්වල අත්‍යවශ්‍ය ස්වරූපය හඳුනාගත හැකි අතර අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා දරන වියදම් සඳහා ප්‍රමුඛතාව දිය හැකි ය. ඒ මගින් උවමනා ඉටු කරගැනීම සඳහා සිදුකරන වියදම් අවම කර ගැනීම හෝ කල් දැමීම තුළින් මුළු වියදම් සඳහා වැය වන මුදල අඩු කර ගත හැකි ය. විශේෂයෙන් ම ආදායම් ලැබීමේ අඩු ශීඝ්‍රතාවට සාපේක්ෂ ව බලන විට දෛනික ව සිදුකළ යුතු සහ සිදු වන වියදම් බොහෝ ප්‍රමාණයක් තිබේ. මේ නිසා වියදම් කළමනාකරණය ඉතා සූක්ෂ්ම ආකාරයෙන් සිදු කිරීම සඳහා උවමනාවන්ට වඩා අවශ්‍යතා පිළිබඳ සලකා බලා වියදම් කිරීම සඳහා අවශ්‍යතා සහ උවමනා පිළිබඳ ව නිවැරදි අවබෝධයෙන් කටයුතු කිරීම වැදගත් වේ.

4.3. ඉතුරුම් සහ ආයෝජනය

අයවැය සකස් කිරීමේ දී මුළු ආදායමට වඩා අඩුවෙන් මුළු වියදම්වල එකතුව සැලසුම්කර ගත්විට ඔබේ ආදායමෙන් කොටසක් ඉතිරි කිරීම් සඳහා අනිවාර්යයෙන් වෙන් කළ හැකි ය. මෙම ඉතිරි කිරීම් සඳහා හදිසි අරමුදල්, විශ්‍රාම ඉතුරුම් සහ කෙටි කාලීන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා වෙන් කළ මුදල් ඇතුළත් විය හැකි ය.

සාර්ථක අයවැයක් සකස් කිරීමෙන් පසුව ඉතිරි කිරීම් ලෙස බැංකු ගිණුමක තැන්පත් කරන මුදල් සඳහා ලැබෙන ප්‍රතිලාභය සාපේක්ෂ වශයෙන් අඩු නිසා අවදානම සහ ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන ලියාපදිංචි මූල්‍යය ආයතනයක, මූල්‍යය උපකරණයක ආයෝජනය සඳහා යෙදවිය හැකි ය. ඒ තුළින් මාසික ව හෝ දී ඇති කාලය තුළ ලැබෙන ප්‍රතිලාභය නැවතත් අයවැය සකස් කිරීමේ දී ආදායමක් ලෙස ඇතුළත් කළ හැකි ය. මේ ආකාරයට ඊළඟ වසර තුළ ආයෝජන ප්‍රතිලාභ ද ඇතුළත් ව ඉහළ වටිනාකමකින් යුත් සාර්ථක අයවැයක් සකස් කර ගත හැකි වේ. අයවැය සකස් කිරීම සඳහා වන ප්‍රායෝගික පුහුණු අභ්‍යාසයක් www.rdd.cbsl.lk තුළින් ද මූල්‍යය සාක්ෂරතාව පිළිබඳ දැනුම වැඩිදියුණු කළ හැකි ප්‍රශ්නාවලියක්ය https://docs.google.com/forms/d/e/1FAIpQLScPVuzjGrw1_CvBQ8uDsyurnGAEreh8ZqY1ZPb3UJqW0BJUw/viewform තුළින් ද ලබා ගත හැකි ය.

අප අසා ඇති ආකාරයට බුදුරජාණන්වහන්සේ විසින් සිඟාලෝවාද සූත්‍රයේ දී දේශනා කර ඇති පරිදි තමා මහන්සියෙන් උපයන දෙය වියදම් කළ යුත්තේ කෙසේ ද යන්න මෙසේ දැක්විය හැකි වේ.

"ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය

ද්වීහි කම්මං පයෝජයේ

චතුත්ථංච නිධාපෙය්‍ය

ආපදාසු භවිස්සති"

මෙහි දැක්වෙන ආකාරයට උපයන ධනයෙන් පළමු කොටස පරිභෝජනය සඳහාත් 2වන සහ 3වන කොටස් තමාට ජීවිකාව පවත්වාගෙන යෑම සඳහා උපකාරී වන කර්මාන්තවල ආයෝජනය සඳහා යෙදවීමත් අවසාන කොටස ඉතුරුම් සඳහා යෙදවීමත් අවශ්‍ය බව දේශනා කර තිබේ. මේ අනුව බලන විට ද පැහැදිළි වන්නේ උපයන ධනයෙන් පාරිභෝජනය සඳහා කැප කළ යුත්තේ 25%ක පමණ ප්‍රමාණයක් බවයි. එම කොටස පාරිභෝජනයට ප්‍රමාණවත් නොවේ නම් ධනය උපයන ප්‍රමාණය වැඩි කිරීමෙන් පාරිභෝජනයට එකතු වන කොටස වැඩි කර ගත හැකි ය. හදිසි ආපදා සඳහා ප්‍රයෝජනයට ගැනීමට උපයන ධනයෙන් 25% තැන්පත් ලෙස ඉතුරු කළ යුතු වේ. මෙහි සඳහන් 2වන සහ 3වන කොටස් ජීවිකාව පවත්වාගෙන යෑම සඳහා උපකාරී වන කර්මාන්ත සඳහා යෙදවීම යන්න වර්තමානයේ දී ආයෝජනය යන අදහසට බොහෝවිට සමාන වේ. ඒ අනුව ගත්විට පැහැදිළි වන්නේ අයවැයකරණයේ අරමුණු වන ඉතිරි කිරීම් සහ ආයෝජනය යහපත් ව ජීවිතය පවත්වා ගෙන යෑම සඳහා අතවශ්‍ය අංග ලෙස ඈත අතීතයේ සිට ම පිළිගැනීමට ලක් වී ඇති ප්‍රායෝගික සංකල්ප බව ය.

5. අයවැය සකස් කිරීමේ දී ඇති ගැටලු සහ අභියෝග

ඉහත සඳහන් ආකාරයට ඉතුරුම් සහ ආයෝජනය ධෛර්යමත් කරන අයවැයක් සකස් කිරීමට උපදෙස් ලබා දුන්න ද එය වර්තමාන සංකීර්ණ ජීවන රටාව සමග ගැලපෙන්නේ කෙලෙසදැයි ඔබට නිතැතින් ම ප්‍රශ්න නැගෙනු ඇත. සංකීර්ණ ජීවන රටාව සමග බැඳී ඇති ප්‍රචාරණයේ බලපෑමට වැසී යන පාරිභෝජන රටාව නිසා ඔබගේ වියදම් පාර්ශ්වයේ අයිතම වැඩිවීමත් ඉතිරි කිරීම් සහ ආයෝජන අවස්ථා සඳහා මුදල් යෙදවීම අඩුවීමත් නිසා ඔබ විසින් දරන සහ දැරීමට නියමිත වියදම්වල තිරසරබවට ගැටලු ඇතිවේ. මෙ නිසා සංකීර්ණ ජීවන රටාව වෙනුවට සරල ජීවන රටාවක් පුරුදු පුහුණු කිරීම වැදගත් වේ. එසේ ම විධිමත් මූල්‍ය පද්ධතිය තුළ මූල්‍ය ගනුදෙනු පවත්වාගෙන යෑමෙන් ඔබ මහන්සියෙන් උපයන ධනයට සැබෑ වටිනාකමක් සහ ආරක්ෂාවක් ලැබෙනු ඇත. සාර්ථක අයවැයක් සකස් කිරීම සඳහා යථාර්ථවාදී ව සිතීම සහ ක්‍රියා කිරීම අවශ්‍ය වේ. අයවැය සකස් කිරීමේ දී අවශ්‍ය නම් මේ සඳහා තාක්ෂණික මෙවලම් ද වැඩි දියුණු කර ඇත. ප්‍රශ්නය ආදායම ප්‍රමාණවත් නොවීම නම් ඔබ ඉපැයුම් වැඩි කළ යුතු වේ. බුද්ධ දේශනාව තුළ කෙනෙකු මී කුණක් විකුණා ධනවතෙකු බවට පත්වූ කථාවක් ද අප අසා ඇත. මෙ මගින් පෙන්වන්නේ ඔබට මුදල් ඉපයීමට හැකි මාර්ග ඕනෑ තරම් තිබෙන අතර අවශ්‍ය වන්නේ ඒ පිළිබඳව ප්‍රායෝගිකව සිතීම සහ ක්‍රියාත්මක වීම බවයි. අයවැයකරණය තුළ ඔබගේ වියදම් අයිතම වැඩි නම් ඔබ තව දුරටත් සරල දිවි පෙවෙතක් අනුගමනය කිරීම දෙසට යොමු වීමත් අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා දරන වියදම්වලට ප්‍රමුඛතාව ලබා දීම සහ උවමනා ඉටුකර ගැනීම සඳහා දරන වියදම් කල් දැමීමත් කපා හැරීමත් සිදු කළ හැකි ය. අධික වියදම් ක්‍රමයෙන් පාලනය කිරීමට හැකි වීම නිසා සාර්ථක අයවැයක් සකස් කිරීම තුළ ඉතුරුම් සහ ආයෝජන වැඩි කර ගත හැකි ය. සාර්ථක අයවැයක් තුළ ඉතුරුම් සහ ආයෝජනය ඉහළ යෑමෙන් මූල්‍ය නිදහස්භාවය වෙත ද ක්‍රමයෙන් ඔබට ලඟා විය හැකි හැකි වේ. මේ නිසා යථාර්ථවාදී ව සිතීම තුළින් සාර්ථක අයවැයක් සකස් කර, ක්‍රියාත්මක කර ඉතුරුම් සහ ආයෝජනය වර්ධනය කිරීමෙන් මූල්‍ය ස්ථාවරභාවය වෙත ළඟාවීමට සහ අයවැයකරණයෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට අදිටන් කර ගනිමු.

මූලාශ්‍ර

Brueckner, Markus, Tomoo Kikuchi, and George Vachadze. Effects of income growth on domestic saving rates: the role of poverty and borrowing constraints. Australian National University, 2016.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/financial_literacy_servey_sri_lanka_2021_e.pdf

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/NFIS%20Summary_%20English_2.pdf

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/otherpub/financial_literacy_roadmap_of_sri_lanka_e.pdf

Inoue, Takeshi. "Financial inclusion and poverty reduction in India." Journal of Financial Economic Policy 11.1 (2019): 21-33.

Koomson, Isaac, Renato A. Villano, and David Hadley. "Effect of financial inclusion on poverty and vulnerability to poverty: Evidence using a multidimensional measure of financial inclusion." Social Indicators Research 149.2 (2020): 613-639.

Omar, Md Abdullah, and Kazuo Inaba. "Does financial inclusion reduce poverty and income inequality in developing countries? A panel data analysis." Journal of economic structures 9.1 (2020): 37.

Van, Loan Thi-Hong, et al. "Financial inclusion and economic growth: An international evidence." Emerging Markets Finance and Trade 57.1 (2021): 239-263.

www. cbsl.gov.lk

පුද්ගල මූල්‍ය කළමනාකරණය

කේ මුණසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

හැඳින්වීම

පුද්ගල මූල්‍ය කළමනාකරණය යන්නෙන් අදහස් කෙරෙන්නේ එක් එක් පුද්ගලයා තමන්ගේ මූල්‍ය කටයුතු මනාව, විචක්ෂණශීලී ව හා තාර්කික ව හසුරුවා ගතයුතු ආකාරය විමසා බැලීමයි. පුද්ගලයා තම මූල්‍ය කටයුතු පැහැදිලි ඉලක්ක ඔස්සේ කාර්යක්ෂම ව හා ඵලදායී ලෙස හසුරුවා ගැනීම සඳහා තමන්ට ඇති සම්පත් නිසි ලෙස සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සිදු කිරීමේ දී බුද්ධිමත් ව කටයුතු කළ යුත්තේ කෙසේද? යන්න පිළිබඳ ව මෙහි දී සොයා බැලේ. තමන්ගේ මූල්‍ය සම්පත් හසුරුවන කළමනාකරුවා තමා ම වන බැවින් දැනුවත් තීරණ ගැනීම තුළින් තම පුද්ගලික මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට මෙමගින් අවකාශ ලැබීමෙන් සාර්ථක පුද්ගලයෙක් වීමේ සිහිනය සැබෑ කර ගත හැකිවේ. එපමණක් නොව එවැනි සාර්ථක පුද්ගලයන්ගෙන් සමන්විත වන පවුලක්, එවැනි පවුල් ඇති සමාජයක් හෝ රටක් දියුණුවෙන් දියුණුවට පත්වීම කිසිවෙකුටත් වළකාලිය හැකි නොවේ. එසේ හෙයින් මූල්‍ය කටයුතු හැසිරවීම පිලිබඳ දැනුම ඇතුළත් මූල්‍ය සාක්ෂරතාව ඉතා වැදගත් සංකල්පයක් ලෙස ඉස්මතු ව ඇති අතර එහි ප්‍රධානතම අංගයක් ලෙස පුද්ගල මූල්‍ය කළමනාකරණය වඩාත් කතාබහට ලක් වන මාතෘකාවක් බවට පත්ව ඇත.

පුද්ගල මූල්‍ය කළමනාකරණය සාර්ථක කර ගැනීමේ පියවර කිහිපයකි. පළමු පියවර ලෙස පුද්ගලයා තමන් කුමන මට්ටමක මූල්‍ය තත්ත්වයක සිටින්නේදැයි තක්සේරු කර ගැනීම ඉතා ම වැදගත් වේ. තමන්ගේ මූල්‍ය තත්ත්වය වැඩිදියුණු කරගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම ඉන් අනතුරුව සිදු කළ යුතු ය. එකී සැලසුම් තමන්ට ප්‍රයෝගික ව ක්‍රියාත්මක කළ හැකි සහ තමන්ගේ පවුල හා රැකියාව ආදී අනෙකුත් කටයුතු සමග නොගැටෙන ඒවා විය යුතුයි. එසේ ම එකී සැලසුම්වල වාසි අවාසි ආදිය ද සලකා බලමින් එකී අරමුණු කර යෑමේදී කළ යුතු ක්‍රියා හෝ ගතයුතු ක්‍රියාමාර්ග කාල රාමුවක් සහිත ව සකස් කරගත යුතු ය. ඉන් පසුව සැලසුම් කළ පරිදි අදාළ කාල රාමුව තුළ එකී කටයුතු සිදු කිරීම මගින් තම මූල්‍ය තත්ත්වය වර්ධනය කර ගැනීමට පුද්ගලයාට හැකියාව ලැබේ. මේ යටතේ සාකච්ඡා කළ හැකි ප්‍රධාන අංග කිහිපයකි. ඒවා නම් පුද්ගල ආදායම් හා වියදම් සැලසුම් කිරීම, ආදායම් හා වියදම් ඇතුළත් අයවැයක් සකස් කර ගැනීම, ඉතිරි කිරීම් සැලසුම් කිරීම, ණය හසුරවා ගැනීම, ආයෝජන සැලසුම් කිරීමයි. තමන්ගේ ආදායම් සහ වියදම් විශ්ලේෂණය කරගන්නේ කෙසේද? ආදායම සහ වියදම අතර පරතරයක් තිබෙන්නේද? ඉතිරි කරන්නට සම්පත් වෙන් කරන්නේ කෙසේද? ණය ගැනීමට සිදුවන්නේ නම් එය කළමනාකරණය කර ගන්නේ කෙසේද? හා අනාගත අභිවෘද්ධිය සඳහා විවිධ ආකාරයෙන් ආයෝජනය සිදු කරන්නේ කෙසේද? යනාදී ප්‍රශ්න රාශියකට මෙහි දී පිළිතුරු සපයා ගැනීමට සිදු වේ. මේ කාරණයේ දී සිහි තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ මෙකී සියලු මූල්‍ය කටයුතු නීත්‍යානුකූල සේ ම සමාජ විරෝධී නොවන ක්‍රමවලට සම්බන්ධ ඒවා විය යුතු බවයි. සාර්ථකත්වයට කෙටි හා සරල ක්‍රම නොමැති බව අප සියලු දෙනා ම දන්නා පරම සත්‍යයකි. එබැවින් පුද්ගලයින් රවටන, අනීතික සේ ම සමාජයට හානිදායක වන මූල්‍ය ජාවාරම් මත ඉපයීම, වියදම් කිරීම, ආයෝජනය කිරීම ආදිය නො කළ යුතුයි. පුද්ගල මූල්‍ය කළමනාකරණය යටතේ අවධානය යොමු කළ යුතු ප්‍රධාන අංග කිහිපයක් මෙම ලිපියෙන් සැකෙවින් සාකච්ඡා කෙරේ.

ආදායම

පුද්ගල මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන අංගයක් වන්නේ ආදායමයි. ආදායම පිළිබඳ ව පුළුල් ලෙස විශ්ලේෂණය කළ යුතු ය. අපගේ ප්‍රධාන ආදායම් මාර්ග මොනවාද? අමතර ආදායම් මාර්ග මොනවාද? එකී ආදායම් මාර්ගවලින් ලැබෙන ආදායම් ප්‍රමාණ

මොනවාද? ඒවා ලැබෙන්නේ කවර කාලවලද? යනාදී කරුණු ආදායම් යටතේ විස්තර කර ගත යුතු ය. නිරන්තරයෙන් එකී ආදායම් වැඩි දියුණු කර ගැනීමේ මං පෙත් සොයා බැලිය යුතු ය. රැකියාවක් කරන්නේ නම් එකී රැකියාවෙන් ඉහළ වැටුප් තලයකට යන්නේ කෙසේද? වෙනත් ව්‍යාපාරයක් කරන්නේ නම් එය වැඩි දියුණු කරගන්නේ කෙසේද? යන්න සොයා බැලිය හැක. මෙහි දී සියලු දෙනාට ම කාලය යන සම්පත සමසේ ලැබී ඇති බව සිහි තබා ගත යුතු අතර එකී කාලය හොඳින් කළමනාකරණය කර ගැනීමෙන් ආදායම මට්ටම් ඉහළ නංවා ගත හැකි බව සාර්ථක පුද්ගලයන්ගේ ජීවිත කතාවලින් ආදර්ශ සපයයි. මෙලෙස ආදායම් පමණක් නොව ආදායම් සැලසුම් ද අයවැයට ඇතුළත් කර ගත හැක. ආදායම් මට්ටම වැඩිදියුණු කිරීමේ දී තමන්ට ඇති සම්පත් පිළිබඳ ව ද හොඳ වැටහීමක් ලබාගත යුතු ය. එම සම්පත් උපරිම ප්‍රයෝජනයක් ලැබෙන පරිදි යොදාගත හැකි ය. සරල උදාහරණයක් ලෙස ලෙස යමෙක් ගෙවතු අලංකාරයට වවන යම් විසිතුරු පැලෑටියක් තව කෙනෙක් අමතර ආදායමක් ලැබෙන පරිදි වගා කරනු ලැබිය හැක. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසාය ලෙස විවිධ ආකාරයෙන් අප සියලු දෙනා සතු ව විවිධ අයුරින් පවතින අපගේ සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමෙන් ආදායම් වර්ධනය කර ගැනීමේ අවස්ථාව ලැබේ. සාර්ථක මූල්‍ය කළමනාකරුවෙක් තමන් සක්‍රිය ව නොසිටින කාලයේද තමන්ට ආදායම් ගලා ඒමේ උපක්‍රම සකස් කර ගනී. එනම් තමන් නිදා සිටියද තමාවෙත ගමන් කරන ආදායම් (passive income) ඇති කර ගනී. මෙහි දී සිහි තබා ගත යුතු ප්‍රධාන ම කරුණය වන්නේ එකී ආදායම් මාර්ග නෛතික සහ සදාචාරාත්මක ආදායම් මාර්ග විය යුතු බවයි.

වියදම

පුද්ගල මූල්‍ය කළමනාකරණයේ අනෙත් ප්‍රධාන ම අංගය වන්නේ වියදමයි. ඉන් පසුව වියදම් වර්ග මොනවා ද? යන්න විග්‍රහ කර ගත යුතු ය. අනිවාර්යයෙන් ම කළ යුතු වියදම් නැතහොත් අත්‍යවශ්‍ය වියදම් වර්ග හඳුනා ගැනීම මෙහි දී විශේෂ වේ. මෙම කාරණයේ දී එකී වියදම්වලට සම්බන්ධ පවුලේ සාමාජිකයින්ගේ ද අදහස් හා යෝජනා ලබාගැනීම ඉතා වැදගත් විය හැකියි. ඇතැම් වියදම් අඩු කර ගැනීමට සේම ඇතැම් වියදම් වර්ග කපා හැරීමට මෙ මඟින් අවස්ථාව සැලසේ. මෙම කටයුත්ත වියදම් තාර්කීකරණය ලෙස ද හැඳින්විය හැක. එනම් යම් වියදමක් සිදු කිරීමට හේතුවක්/තාර්කික පදනමක් පැවතිය යුතු ය. මෙහි දී අවශ්‍යතා හා උවමනා අතර පවතින වෙනස සහ එකී සංකල්ප තුළ සාමාන්‍ය පුද්ගලයාගේ හැසිරීම ද අවබෝධ කරගැනීම වටී. අවශ්‍යතා යනු අපට ජීවත් වීමට අත්‍යවශ්‍ය වන දේ වන අතර අප ධනවත් වනවිට අපගේ අවශ්‍යතා ද වෙනස් විය හැක. ජීවත් වීමට අවශ්‍ය ආහාර, නිවාස ආදිය මූලික අවශ්‍යතා සඳහා උදාහරණ වේ. මිනිසා වඩාත් දියුණු තත්ත්වයට පත්වන විට තවත් පහසුකම් අවශ්‍ය විය හැක. උවමනා යනු එකී අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට පුද්ගලයාට ඇති විකල්ප මාර්ගයන්ය. සරල උදාහරණයක් ලෙස කුසගින්න නිවාගැනීමට අපට විවිධ වූ ආහාර ලබා ගත හැක. එනම් විකල්ප විශාල සංඛ්‍යාවක් ඇත. මෙකී උවමනාවල ලක්ෂණය වන්නේ ඒවා අසීමිත වීම හා ඒවා තෘප්තිමත් කර ගැනීමට ඇති සම්පත් සීමිත වීමත් ය. ඒ නිසා එම උවමනා අතරින් සුදුසු දේ අනිවාර්යයෙන් ම තෝරා ගත යුතු ය. එනම් වියදම් කිරීමේ දී තෝරා බේරාගත් අයිතමයන් පමණක් මිලදී ගැනීමට සිදුවීමයි. මෙම ස්වභාවය හේතුවෙන් වියදම් කළමනාකරණය ඉතා භාරධූර කටයුත්තක් වී තිබේ. තම ආදායමින් ගිලිහෙන සෑම රුපියලකට ම එසේ ගිලිහී යාමට ඉඩ දෙන්නට තරම් හොඳ හේතුවක් සොයා ගත යුතු ය. මේ සඳහා පවුලේ වියදම් සමඟ සම්බන්ධ වන සියලු දෙනාගේ අදහස් ලබා ගැනීම වැදගත් ය. වියදම් තාර්කීකරණයේ තවත් පැතිකඩක් වන්නේ අත්‍යවශ්‍ය වියදම් වුවත් කළමනාකරණය කර ගැනීමයි. නො එසේ නම් වියදම් පාලනය කර ගැනීමයි. උදාහරණ ලෙස නිවසේ විදුලි බිල පසුගිය මාසයට වඩා මෙම මාසයේ වැඩි නම් එය අඩු කර ගැනීමට සියලු දෙනාට ම එක්ව අවශ්‍ය පියවර ගත හැක. මෙය ගෘහයකට පමණක් නොව රටේම බලශක්ති සංරක්ෂණය සඳහා වන දායකවීමක් ද වනු ඇත. මෙලෙස අත්‍යවශ්‍ය වියදම් හඳුනා ගත් පසු අනෙකුත් වියදම් මොනවා ද? යන්න ද හඳුනා ගැනීම අවශ්‍යවේ. අනෙකුත් වියදම් සැබෑවටම සිදු කළ යුතුම ද?, කල් දැමිය හැකි ද? අනෙකුත් වියදම් වැඩි වුවහොත් එය ඉතිරි කිරීම්වලට හා ආයෝජනවලට බලපාන්නේ කෙසේ ද? වැනි කරුණු ගැඹුරින් විමසා බැලිය යුතු ය.

ඒ අනුව ආදායම්වියදම්වල කෙටි, මැදි හා දිගු කාලීන වශයෙන් වූ සැලසුම් ද මේ තුළ අන්තර්ගත කළ හැකිවේ. ඒ ආකාරයට ම හුදෙක් වියදම් තාර්කීකරණයට අමතර ව වියදම් සැලසුම් කිරීම ද ඉතා වැදගත් ය. එය ඉතා කල්පනාකාරී ව දුර දක්නා නුවණින් සිදු කළ යුතු වන්නේ වියදම් කිරීම යන්න ඉතා ම පහසු කටයුත්තක් වන බැවිණි. අප උදෑසන පිබිදුනු මොහොතේ පටන් නින්දට යන තෙක් ම වියදම් කිරීමට අප ව පෙළඹවීම සඳහා විවිධ වට්ටම ප්‍රදානයන් වැනි විවිධ විකුණුම්කරණ සැලසුම් හා සංවේදී වෙළෙඳ ප්‍රචාරණ ක්‍රියාත්මක වන අතර ඒවා අපගේ මනසට යොමු කර

විවිධ වියදම් අදහස් අප තුළ ජනිත කිරීමට විවිධ පුද්ගලයින් සැදී පැහැදී සිටී. උදාහරණ ලෙස යම් භාණ්ඩයක් මිලදී ගැනීමේදී 80% ක වට්ටමක් ලබා ලබා දෙන්නේ නම් එකී භාණ්ඩයේ නිෂ්පාදනය කිරීමට ගිය වියදමවත් ආවරණය වේ යයි සිතිය නොහැක. එවිට එය භාවිතයට නුසුදුසු භාණ්ඩයක් හෝ ව්‍යාජ වටිනාකමක් දක්වන භාණ්ඩයක් බව සිතීම සාධාරණ වේ. එනම් එකී වට්ටම් ප්‍රදානයේ අරමුණ පාරිභෝගියා ආකර්ෂණය කරගැනීම පමණක් විය හැක. ඒ අනුව වියදම් කිරීම පහසු වුවත් තමාගේ වියදම් සිමාව තුළ ජීවත් වීම ඉතාම දුෂ්කර කටයුත්තක් වී තිබේ. එසේම ඕනෑම පුද්ගලයකු සතු 'හොඳ' හා 'නරක' වියදම් පුරුදු පැවතිය හැක. තම මූල්‍ය තත්වය පහළට ඇද දමන හෝ ඉදිරියට යෑම වලක්වන වියදම් නරක වියදම් ලෙස සිතිය හැක. හොඳ මූල්‍ය කළමනාකරුවා නිතරම නරක වියදම් පුරුදු මග හරියි. මේ හේතුවෙන් නිතර ම සැලසුම්ගත වියදම් වෙත යෑම සාර්ථක පුද්ගල මූල්‍ය කළමණාකරුගේ දැක්මයි. අවශ්‍යතා ඉටුකරගැනීමට යෑමේදී සුදුසු ම විකල්පය තෝරාගෙන වියදම් කිරීම මෙහිලා ඉතා ම වැදගත් වේ. බොහෝවිට පුද්ගලයින් තමන්ට ඔරොත්තු නොදෙන වියදම් මට්ටම්වලට වැටී අපහසුතාවට පත්වන්නේ මේ නිසා ය.

පුද්ගල අයවැය

'රජයේ අයවැය' ලෙස හැඳින්වෙන තම ආදායම්, වියදම්, ආයෝජන සහ ඉදිරි සැලසුම් ඇතුළත් කර රජය විසින් සකස්කරන ලේඛනය බොහෝ දෙනෙකුට අසා හුරු පුරුදු ය. එලෙස පුද්ගලයා ද තමන්ගේ පුද්ගල අයවැය සකස් කරගැනීම ඉතාම වැදගත් ය. එය පුද්ගල මූල්‍ය කළමනාකරණයේ තීරණාත්මක අංගයකි. ආදායම්වියදම් ප්‍රමාණය කෙතරම් කුඩා වුවත් අයවැය සකස් කිරීම ප්‍රයෝජනවත් වේ. නිවසක් තැනීමට සැලසුමක් අවශ්‍යවන්නා සේ අපගේ මූල්‍ය සම්පත් හසුරවා ගනිමින් ජීවිතය සාර්ථක කර ගැනීමට අයවැයක් සකස් කර ගැනීම අත්‍යවශ්‍ය වුවකි. මෙහි දී විශ්ලේෂණය කරගත් ආදායම සහ වියදම සුදුසු පරිදි පෙළගස්වා ගත යුතු ය.

මින් පසුව ආදායම් සහ වියදම් අතර පරතරය එනම් අයවැය හිඟයක් හෝ අතිරික්තයක් පවතින්නේද? යන්න විභාග කළ හැකි යි. අදාළ කාලයේ ආදායම ඉක්මවා වියදම පවතින්නේ නම් එකී වියදම පියවා ගැනීමට තමන්ගේ ඉතුරුම් හෝ ආයෝජනයට තබා ගත් මුදල් යොදා ගැනීමටත්, එලෙස ඉතිරි කළ මුදල් නොමැති නම් ණය ගැනීමට සිදු වන බවටත් සිහි තබා ගත යුතු වේ. මෙලෙස අනෙකුත් වියදම් අතරින් කල් දැමිය හැකි හෝ අත හැර දැමිය හැකි වියදම් මොනවාද? යන්න විග්‍රහ කරගත හැකියි. එමගින් අයවැය හිඟයක් පවතින්නේ නම් එම හිඟය අඩු කර ගත හැකි වේ. එයින් ඉතිරි කිරීම්/ආයෝජන සඳහා වැඩි මුදලක් වෙන් කර ගැනීමේ අවස්ථාව ලැබේ. මෙයින් පැහැදිළි වන්නේ ආදායම්, වියදම්, ඉතුරුම් හා ආයෝජන එකිනෙක හා සම්බන්ධ අන්‍යෝන්‍ය වශයෙන් හැසිර විය යුතු අංග බව යි. වියදම් තාර්කීකරණය මගින් වඩාත් හොඳ සියලු දෙනාට ම සතුට ලබා දෙන වියදම් රටාවක් සකස් කර ගැනීමට හැකිවේ. බොහෝ විට දරිද්‍රතාවෙන් පෙළෙන ඇතැම් පුද්ගලයින් ආදායම් උපයන නමුත් වැරදි වියදම් රටාව හේතුවෙන් දුප්පත්කමින් මිදීමට නොහැකි තත්වයක් උදා වී ඇති බව පෙනේ. අනිත් අතට සාමාන්‍යයෙන් සැලකිය යුතු ආදායමක් ලබන්නන් වුවත් අතාර්කික වියදම් රටාවකට යොමු වීමෙන් බුන්වත් බවට පත්විය හැකි ය.

මෙලෙස වූ විග්‍රහයකට මග පැදෙන්නේ අයවැයක් සකස් කිරීම තුළින් බව ද වටහා ගැනීම යෝග්‍ය වේ. මේ අනුව අයවැය වනාහී යමෙක් උපයා ගත් මුදල් වියදම් කරන්නේ කෙසේද? යන්න පිළිබඳ සැලැස්මක්/පැහැදිලි චිත්‍රයක් ලබා දෙන්නා සේ ම මුදල් ගලා යන්නේ කුමන දිශාවකටද? හා එයින් තම මූල්‍ය ඉලක්ක සපුරා ගත හැකිද? යනාදිය පිළිබඳ ව පැහැදිළි අවබෝධයකින් යුක්ත ව තම වියදම් පිළිබඳ ව තාර්කික තීරණ ගැනීමට උපකාරී වන මාහැඟි මෙවලමක් බව ද පැහැදිලි ය.

අයවැය වනාහී ආදායම් හා වියදම් ලේඛනයක් පමණක් ම නොවේ. මෙය පුද්ගල මූල්‍ය කළමනාකරණය පිළිබඳ ව සමස්ත සැලසුමක් ද වේ. සෑම පුද්ගලයකුට ම තම සාර්ථකත්වය සඳහා වන ඉලක්ක තිබිය යුතු බවට තර්කයක් නොමැත. පොදුවේ සෑම පුද්ගලයකුට ම ජීවත් වීමට අවශ්‍ය නිවසක්, අවශ්‍ය ලී බඩු ආදී උපකරණ, විදුලි හා අනෙකුත් උපකරණ, යෑම්ඊම් සඳහා යානවාහන පමණක් නොව පවුලේ සාමාජිකයන්ගේ අධ්‍යාපන හා අනෙකුත් අවශ්‍යතා වෙනුවෙන් වන වියදම් ආදී මෙකීනොකී සියලු ආකාරයේ වියදම් පවතී. එකී වියදම් දැරීමට හැකි පුද්ගලයෙක් බවට පත්වීම, ආර්ථික සහ සමාජයීය සත්වයකු ලෙස සෑම පුද්ගලයෙකුගේ ම මූලික අරමුණක් බව උපකල්පනය කළ හැක. හුදෙක් උපයන්නා වූ යම් මුදලක් විවිධ දේ සඳහා වියදම් කිරීම මගින් එවැනි අරමුණු සාක්ෂාත් කර ගැනීමට නො හැක. ඒ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් අවශ්‍ය වන අතර අයවැයකරණය ඊට කදිම මෙවලමක් සපයයි.

මෙවැනි පරිසරයක් තුළ විශේෂයෙන් සිහි තබා ගත යුතු කරුණු වන්නේ තම අයවැයේ අයිතිකරු තමන් වන බවත් තමන්ගේ මූල්‍ය කළමණාකරු ද තමන් වන බවත්, පුද්ගල මූල්‍ය කළමනාකරණයේ දී පුද්ගලයෙකු වශයෙන් තමා තුළ ගොඩනගා ගත යුතු ස්වයං කැපවීමක් හා විනයක් පැවතිය යුතු බවත් ය. එහි දී යථාර්ථවාදීබව, ඉවසිලිවන්තකම, නම්‍යශීලීබව, ස්ථාවරබව, හා කැපවීම ආදී පුද්ගල ගුණාංග ද වර්ධනය කර ගත යුතු වේ.

ඉතිරි කිරීම

ඉතිරි කිරීම පුද්ගල මූල්‍ය කළමනාකරණයේ තීරණාත්මක අංගයකි. මෙය හදිසි අවස්ථා, නිවාඩුවක් ගත කිරීම වැනි කෙටි කාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා හෝ විශ්‍රාම දිවිය සැලසුම් කිරීම වැනි දිගු කාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා අනාගතයේ දී භාවිත කිරීමේ අරමුණින් ආදායමෙන් කොටසක් වෙන් කිරීම ඇතුළත් වූ පුළුල් සංකල්පයකි. ආදායමින් සියලු වියදම් කිරීමෙන් පසුව ඉතිරිවන යමක් ඉතිරි කිරීම් ලෙස නොසැලකිය යුතු ය. පසුව වියදම් කිරීමට නම් මුලින් ඉතිරි කල යුතු බව පැහැදිලි කරුණකි. ඇතැම් විට ආදායම, අත්‍යවශ්‍ය වියදම් සේ ම ඉතිරි කිරීම් ද අනිවාර්යයෙන් කළ යුත්තක් ලෙස සැලකීමේ වරදක් නැත. ඊට හේතුව වන්නේ හදිසි අවශ්‍යතා ඕනෑ ම කෙනෙකුට ඕනෑ ම අවස්ථාවක ඇතිවිය හැකි වීම සහ ඒ සඳහා අදාළ වන වියදම් දැරීමට ඉතුරුම් පැවතිය යුතු වීම යි. ඉතිරි කිරීම් වැදගත්වන්නේ එමඟින් ණය වීමේ සීමාව ද සලකුණු කිරීම හේතුවෙනි. එනම් ඉතිරි කිරීම් අවසන් වීමෙන් පසු ඊළඟ විකල්පයට යෑමට එනම් ණය ගැනීමට සහ එයින් ණය ගැතියෙකු ද වීමට සිදු වීමයි. මීට අමතර ව අවශ්‍ය මූල්‍ය ආරක්ෂාව සලසා ගැනීම: එනම් වෛද්‍ය බිල්පත් හෝ මෝටර් රථ අලුත්වැඩියාව වැනි අනපේක්ෂිත වියදම් සඳහා ආරක්ෂිත මුදලක් ලෙස ක්‍රියා කිරීම; මූල්‍ය ඉලක්ක සාක්ෂාත් කර ගැනීම: එනම් නිවසක් මිලට ගැනීම, දරුවන්ගේ අධ්‍යාපනය සඳහා අරමුදල් සැපයීම ආදිය සඳහා; ධනය ගොඩනැංවීම: එනම් ස්ථාවර ඉතිරි කිරීම් හෝ ඉදිරි ආයෝජනය සඳහා සම්පත් ඉතිරි කිරීම හරහා කාලයත් සමඟ තම ධනය වර්ධනය කර ගැනීමට උපකාරී වීම; ආතතිය අඩු කිරීම: එනම් ඉතිරි කිරීම් ඇති බව හිතට දැනීමෙන් ඇතිවන සැහැල්ලුව යනාදී වශයෙන් විවිධ ඉතිරි කිරීම් අරමුණු පැවතිය හැක.

ආදායම් වැඩි කර ගැනීම සේ ම වියදම් පාලනය කර ගැනීමෙන් ද ඉතුරුම් වර්ධනය කර ගත හැකි බව නො රහසකි. එලෙස ඉතුරුම් වැඩි කිරීමට උත්සාහ දරන අතර ම එම ඉතිරි කිරීම් සිදු කිරීම ද ක්‍රමානුකූල ව කළ යුතු ය. මෙහි දී මූලික ව ම ඉතිරි කිරීමේ අරමුණ වටහා ගැනීම ඉතා වැදගත් ය. කෙටි කාලීන ව ඉතිරි කරන්නේද? නැතහොත් අනාගතයේ යම් අරමුණක් ඉටු කර ගැනීමට අඛණ්ඩව ඉතිරි කරන්නේද? තම ආදායමින් එලෙස ඉතිරි කිරීමට වෙන් කළ හැකි ප්‍රතිශතය කවරේද? යනාදිය පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය වේ. එනම් යථාර්ථවාදී ඉතුරුම් ඉලක්ක පැවතිය යුතු ය. එසේ ම තරගකාරී ව අඩු ගාස්තු අය කෙරෙන හා වැඩි ප්‍රතිලාභ ගෙන දෙන ඉතුරුම් යෝජනාක්‍රම සොයා බැලීම කළ යුතු ය. නූතන තරගකාරී පරිසරය තුළ වඩාත් ලාභදායි ඉතුරුම් යෝජනා ක්‍රම තෝරා ගත යුතු වේ. මෙහි දී මතක තබාගත යුතු වැදගත් ම කාරණය වන්නේ ඉතිරි කිරීමට ආයතනයක් තෝරා ගැනීමේ දී මූල්‍ය ජාවාරම්කරුවන් නොවන පුද්ගලයින් තෝරා ගැනීමයි. ශ්‍රී ලංකා මහ බැංකුව වැනි පිළිගත් ආයතනයන්හි අධීක්ෂණයට යටත් වීම වැනි නිර්ණායක හරහා එවැනි තෝරා ගැනීමක් කළ හැක. ඉතිරි කිරීම ඉතා කැප වීමෙන් හා පරිස්සමෙන් කළ යුතු කාර්යයකි. වියදම් නමැති වෙස්වළා ගත් සතුරා නිතර ම ඉතිරි කිරීම් නමැති දුබලයා තළාපෙළා දමන්නට උත්සාහ කරනු ඇත. ඊට ඉඩ ලබා නොදීම පිණිස ඉතිරි කිරීම පුරුද්දක් කර ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙමඟින් ඇති කර ගන්නා මූල්‍ය විනය විවිධ ආකාරයෙන් පුද්ගලයාට වාසි ගෙන දෙයි. පුද්ගලයා හොඳ ගනුදෙනුකරුවකු ලෙස බැංකුවක් විසින් හඳුනාගනු ලැබීම සහ එමඟින් බැංකු ණයක් ලබාගැනීම ආදියට ප්‍රවේශ වීමට හැකියාව ලැබීම වැනි වාසි ද ඒ අතර වේ.

ආයෝජනය

පුද්ගල මූල්‍ය කළමනාකරණයේ අනෙක් තීරණාත්මක අංගය වන්නේ ආයෝජනයයි. සාර්ථකත්වයේ ඉලක්ක කරා යන මූල්‍ය සාක්ෂරතාවෙන් යුතු පුද්ගලයා ආයෝජනය හරහා ඉහළ ආදායම් උපයන්නෙකු බවට පත් වේ. භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර, ඉතිරි කිරීම් ආයෝජන සැලසුම්, වෙනත් විවිධ රක්ෂණ ආයෝජන සැලසුම්, විශ්‍රාම සැලසුම් ආදී කෙටි, මැදි හා දිගු කාලීන ආයෝජන සැලසුම් සේ ම ඉඩමක් මිලදී ගැනීම, නිවසක් තැනීම, දරුවන්ගේ අධ්‍යාපනයට අරමුදල් සැපයීම වැනි වෙනත් දිගු කාලීන ව ප්‍රතිලාභ ලැබෙන වත්කම් අත්පත් කර ගැනීම ආදිය මෙම පුද්ගල ආයෝජනය යන පුළුල් මාතෘකාවට අදාළ වේ. සාමාන්‍යයෙන් අඩු පොලී අනුපාත පවතින ඉතුරුම් ගිණුමකට වඩා වැඩි ප්‍රතිලාභයක් ලබා ගැනීම, මිල ගණන් ඉහළ යන උද්ධමනකාරී පරිසරයක මුදලේ අගය පවත්වා ගැනීම, මූල්‍ය ඉලක්ක සාක්ෂාත් කර

ගැනීම වැනි පුළුල් අරමුණු ඔස්සේ ආයෝජන අදහස් ජනිත විය හැක. ආයෝජනයක දී සැලකිය යුතු ප්‍රධාන කරුණු අතර ආයෝජන අරමුණ නිශ්චය කර ගැනීම, ආයෝජනය සඳහා සම්පත් සපයා ගන්නා ආකාරය යනාදිය නිවැරදි ව තීරණය කිරීම වැදගත් වේ. එසේ ම එකී සම්පත් භාවිතය හේතුවෙන් අහිමි වන ප්‍රතිලාභ පිළිබඳ ව තක්සේරු කිරීම හෙවත් ආවස්ථික පිරිවැය තීරණය කිරීම හා එකී ආවස්ථික පිරිවැය තමන්ට දරාගත හැකිද? යන්න නිශ්චය කිරීම ද වැදගත් ය. උදාහරණ ලෙස ඉතුරුමක තිබූ මුදල් ගෙන ඉඩමක් මිලදී ගන්නේ නම් එකී ඉතුරුමෙන් ලැබිය හැකිව තිබූ පොළී මුදල අහිමි වී යයි. එසේ ම එකී ඉඩමේ වටිනාකම වැඩි වීමට කාලයක් ගත වන බැවින් අහිමි වූ පොළී මුදලින් අඩු වන ආදායම පුද්ගල මූල්‍ය හැසිරවීමේ අනෙකුත් අංශවලට කෙලෙස බලපාන්නේද? යන්න තක්සේරු කළ යුතු වේ. එසේ ම ආයෝජනයේ දී යොදාගන්නේ ණයට ගත් මුදල් නම් ණය මුදල සහ ආයෝජනය අතර මනා සංසන්දනයක් හෝ පිරිවැයප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කළ යුතු වේ. එකී ආයෝජනයේ ප්‍රතිලාභ ලැබෙන තුරු ණය වාරික හා පොළිය ආපසු ගෙවන්නේ කෙසේද? යන්නත් එයින් තමන්ගේ සමස්ත මූල්‍ය කළමනාකරණයට වන බලපෑම ද තක්සේරු කළ යුතුවේ. ආයෝජනයක වැදගත්ම සංකල්පය වන්නේ එහි ප්‍රතිලාභයයි. නිශ්චිත කාල සීමාවක් තුළ ආයෝජනයක ශුද්ධ ලාභය හෝ අලාභය කුමක්ද යන්න එයින් කියවේ. සාමාන්‍යයෙන් එකම කාසියේ දෙපැත්ත මෙන් පවතින ආයෝජනයේ ඉහළ ප්‍රතිලාභ සහ ආයෝජනයේ අවදානම පිළිබඳ ව මනා වැටහීමක් පැවතිය යුතු බවත් එක ම ආයෝජනයක මුදල් නොයොදා විවිධ ආයෝජනවල මුදල් යෙදවීමත් පිළිගත් සිද්ධාන්ත වේ. එනම් ඉඩමක් මිලදී ගැනීම, කොටස් වෙළෙඳපොළ ආයෝජනය, භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කරවල ආයෝජනය වැනි විවිධ අංශවල ආයෝජනය මෙයින් අදහස් කෙරේ. එමගින් ආයෝජනයේ අවදානම බෙදා හැරීම මඟින් පුද්ගලයාගේ මූල්‍ය තත්වයට වියහැකි හානි වලක්වාගත හැකිවනු ඇත.

ආයෝජනයක දී අදාළ යෝජනා සැලැස්ම හෝ කොන්දේසි පිළිබඳ ව ආයෝජනයට පෙර දැනුවත් වීම ඉතා වැදගත් ය. උදාහරණ ලෙස ඇතැම් ආයෝජන සැලසුම්වල නියමිත වාරික නියමිත දිනට නියමිත ආකාරයට නොගෙවන්නේ නම් අදාළ ගිවිසුම් අවලංගු වන අතර එතෙක් ඉතිරි කළ මුදල් අහිමි වී යා හැක. අනිත් අතට සිහි තබා ගත යුතු තවත් වැදගත් කරුණක් වන්නේ අදාළ ආයෝජන සැලසුම ඉදිරිපත් කෙරෙන ආයතනය ව්‍යාජ හෝ ජාවාරම්කාර ආයතනයක්ද? යන්න විමසා බැලීමයි.

ණය ගැනීම

පුද්ගල මූල්‍ය කළමනාකරණයේ තවත් තීරණාත්මක අංගයක් වන්නේ ණය කළමනාකරණය යි. පුද්ගල අයවැයේ හිඟයක් ඇත්නම් සහ එය පියවා ගැනීමට ඉතිරි කිරීම් නොපවතින්නේ නම් මීළඟ පියවර වන්නේ ණය ලබා ගැනීම යි. ඊට අමතර ව වෙනත් අරමුණු සඳහාද ණය ලබා ගැනේ. මේ නිසා "හොඳ ණය" සහ "නරක ණය" ලෙස දෙ පැත්තක් පැවතිය හැකි බව අවබෝධ කර ගැනීම වටී. දිගු කාලීන මූල්‍ය යහ පැවැත්ම වැඩි කළ හැකි ආයෝජන සඳහා හෝ වත්කමක් අත්පත් කර ගැනීමට හෝ වන ණය ගැනීම් "හොඳ ණයක්" ලෙස ගත හැකි අතර අනවශ්‍ය වියදම් සඳහා යමෙක් ණය වන්නේ නම් හෝ ලබාගත් ණයක් අදාළ අරමුණට යොදා නොගැනීමත් හේතුවෙන් ණය පැහැර හැරෙන මට්ටමට වැටෙන විට "නරක ණයක්" ලෙස සැලකිය හැකියි. මේ අනුව ණය ලබාගැනීමේ අරමුණ පැහැදිළි කරගැනීම ඉතා වැදගත් ය. එදිනෙදා පරිභෝජන අවශ්‍යතා සඳහා ණය ලබාගැනීම එතරම් නුවණට හුරු කටයුත්තක් නොවේ. ආපසු ගෙවීමට සිදුවන මුදල සහ එය අනාගත ආදායම්වලින් ගෙවිය යුතු බව කල් ඇතිව වටහා ගත යුතු ය. ණය ලබා ගැනීමේ අරමුණ නිශ්චය කිරීමෙන් පසුව අදාළ අරමුණ සඳහා ම එම මුදල් යොදා ගැනීම, අදාළ ණය වාරික සහ ණය පොළී ගෙවීම් පිළිබඳව ද ඉතා හොඳ වැටහීමක් ලබා ගැනීම, ආදායමෙන් එම ගෙවීම් සඳහා වැය වන ප්‍රතිශතය පිලිබඳව නිශ්චය කර ගැනීම කල් ඇතිව සැලකිල්ලට ගතයුතු ප්‍රධාන කරුණු ය. ණය ලබා ගැනීමේ දී විශේෂයෙන් නියාමනයට ලක්වන මූල්‍ය ආයතනයක් තෝරා ගැනීම ඉතා වැදගත් ය. එසේ ම එම ණය මුදලට අදාළ කොන්දේසි පිළිබඳ ව ඉතා ගැඹුරින් වටහාගත යුතු ය. විශේෂයෙන් පොළී අනුපාතය, ණය වාරිකය, ණය ආපසු ගෙවිය යුතු කාලය ආදී සියලු කරුණු විමසා බැලිය යුතු ය. පොළිය ගණනය කිරීමේ දී හීනවන ශේෂ ක්‍රමය, සමතල ක්‍රමය වැනි ක්‍රමවලින් කුමන ක්‍රමයක් තෝරා ගන්නේද? එකී ක්‍රමවල වාසි අවාසි කවරේද? යන්න විමසා බැලිය යුතු ය. මෙහි දී නාමික පොලී අනුපාතය හා මූර්ත පොලී අනුපාතය වැනි සංකල්ප පිළිබඳව ද වටහා ගැනීම යෝග්‍ය වේ. එමගින් උද්මධනය ද සලකා බලමින් ණය පිරිවැයේ නියම තක්සේරුවක් කරමින් ණය ගැනීමේ වාසි අවාසි පිළිබඳ ව වටහා ගැනීමට අවස්ථාව ලැබේ. ණය ලබා ගැනීමට ප්‍රථමයෙන් එකී කරුණු සියල්ල ම පැහැදිලි වූ බව තහවුරු කරගත යුතු ය. එම කොන්දේසි සාධාරණ නම් හා පොළී අනුපාතයට එකඟ විය හැකි නම් ණය මුදල ලබාගැනීමට තීරණය කළ හැක. කිසිදු නියාමනයට ලක් නොවන ඉතා ඉක්මනින් ණය ලබාදෙන ආයතනවලින් ඔවුන් ඉදිරිපත්

කරන කොන්දේසි නොසලකා හරිමින් ණය ලබා ගැනීමෙන් ඇතැම් පුද්ගලයන් ඉතාමත් අපහසුතාවට ලක්වන අවස්ථා වාර්තා වේ.

ණයක් ගැනීමේ දී අවම වශයෙන් එම ණය සහ ඊට අදාළ අනෙකුත් වියදම් ද ඇතුළත් ණය පිරිවැය පියවා ගැනීමට හෝ ණය පිරිවැය ඉක්මවා ප්‍රතිලාභ ලැබීමටත් හැකි වන අයුරින් ණය ලබා ගැනීමයි. ණය ලබා ගැනීම හුදෙක් තමන්ට ලැබෙන මුදලක් සේ ම එය විශාල වගකීමක් ද වන බව සිහි තබා ගත යුතුයි. හදිසි කරදරයක දී ඒ සඳහා ප්‍රමාණවත් ඉතුරුම් නොමැති විට කොන්දේසි නොසලකා ණය ලබා ගැනීමට පුද්ගලයා පෙළඹෙන අතර ණය නැවත ගෙවීමේ දී ගැටලු රැසකට මුහුණ පාන්නට සිදුවේ. එ බැවින් එවැනි ණය මුදල් තමන් ණය උගුලක සිර කර තබන බව තරයේ සිහි තබා ගත යුතු වේ.

එසේම ණය පත්/හරපත් භාවිත කිරීම පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. හරපත් ඉතා පහසු ගනුදෙනු මාධ්‍යයක් වුවත් එය කෙටි කාලීන ණයක් සේ ම අදාළ දිනයට ගෙවීමට නොහැකි වන්නේ නම් අධික ණය පොලියක් ගෙවීමට සිදුවන මෙවලමක් බව භාවිතයට පෙර සිහි තබා ගත යුතු ය. ඒ අනුව හරපත් භාවිතයෙන් සිදු කෙරෙන වියදම් වඩාත් ගැඹුරින් හා මූල්‍ය විනයක් සහිත ව සිදු කිරීම ඥානාන්විත ය.

දැනුවත් වීම සහ දැනුම යාවත්කාලීන කර ගැනීම

පුද්ගල මූල්‍ය කළමනාකරණය වැඩි දියුණු කරගැනීම සඳහා කටයුතු කළ හැක්කේ කෙසේ ද? යන කරුණ ද මෙහිලා වැදගත් වේ. දැනුවත් වීම සහ දැනුම යාවත්කාලීන කර ගැනීම පුද්ගල මූල්‍ය කළමනාකරණය වැඩි දියුණු කර ගැනීම සඳහා අනිවාර්ය අංගයක් ව පවතින බැවින් ඒ සඳහා අඛණ්ඩ ව කැප විය යුතු වේ. සංකීර්ණ පරිසරයක් තුළ හතු පිපෙන්නාක් මෙන් බිහි වන මූල්‍ය ජාවාරම්කරුවන් ආදායම්, වියදම්, ඉතුරුම් ආයෝජන වැනි දෑ ව්‍යාජ ලෙස හඳුන්වා දීමත් ඒවා පුළුල් ප්‍රචාරණ හරහා ජනගත කිරීමත් දැක ගත හැකි ය. මේ අනුව දැනුවත් වීම හරහා එවැනි කූට උපක්‍රමවලට හසු නොවී සිටීමට කටයුතු කළ යුතු වේ. මූල්‍ය සාක්ෂරතාව යන්න වර්තමානය වනවිට ලෝක මට්ටමින් ඉහළ පිළිගැනීමක් ඇති මාතෘකාවක් වන අතර රාජ්‍ය හා පුද්ගලික ආයතන සේ ම අන්තර්ජාතික ආයතන ද මේ සඳහා තම දායකත්වය ඉහළ මට්ටමින් ලබා දීමට කටයුතු සලස්වා ඇත. ඒ හා සමගාමීව දැනුම බෙදා හරිම සඳහා පුළුල් වැඩ පිළිවෙළ රැසක් සම්පාදනය වී ඇති බව පෙනේ. අවදානම් කළමනාකරණය, රක්ෂණය ආදී මූල්‍ය සාක්ෂරතාවට අදාළ වෙනත් පුළුල් පරාසයක මාතෘකා ද ඇතුළත් වන පරිදි මහජනතාවගේ දැනුවත් වීම සඳහා පොත් පත්, සඟරා ලිපි ආදිය ශ්‍රව්‍යදෘශ්‍ය මාධ්‍ය ඔස්සේ එළි දක්වා ඇති අතර, තොරතුරු තාක්ෂණය වැඩි වශයෙන් භාවිත වන වෙබ් අඩවි හා අන්තර් ජාල/සමාජ මාධ්‍ය ආදිය සේ ම පුද්ගල මට්ටමෙන් සහය ලබා ගත හැකි මූල්‍ය උපදේශකයින්ගේ සේවාවන් ද බහුලව පවතී. එ පමණක් නොව තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග ඩිජිටල්කරණය වැනි භාවිත ඔස්සේ බිහිවන නව ප්‍රවණතා ද පවතින අතර එම මාධ්‍යවලින් උපරිම ඵල නෙලා ගැනීම තුළින් ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් අත්පත් කර ගැනීම පුද්ගල මූල්‍ය සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය පිණිස විසල් කාර්යභාරයක් ඉටු කෙරෙන අතර තොරතුරු මූලාශ්‍රයක් ලෙස ද මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් රැසක් දියත් කරයි. මූල්‍ය සාක්ෂරතාවෙන් පිරිපුන් දරු පරපුරක් තුළින් අනාගතයේ සාර්ථක පුරවැසියන් සහිත දියුණු රටක් ගොඩ නැංවීමේ අරමුණින් වර්තමානය වන විට මූල්‍ය සාක්ෂරතාව පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීමට ද සලකා බලමින් සිටී. එසේ ම රටක සමස්ත මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතභාවයට මෙන් ම සාර්ව ආර්ථික හා සමාජ සංවර්ධනයට ද පුද්ගල මූල්‍ය කළමනාකරණය ධනාත්මක ව බලපාන්නා වූ සාධකයක් බව පුළුල් ව පිළිගැනේ.

1. https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/otherpub/financial_literacy_roadmap_of_sri_lanka_e.pdf
2. https://www.oecd.org/en/topics/sub-issues/financial-education.html
3. https://finance.ec.europa.eu/consumer-finance-and-payments/financial-literacy_en
4. https://www.weforum.org/stories/2024/05/financial-literacy-education-money-matters/
5. https://www.gpfi.org/sites/gpfi/files/documents/5_OECD%20INFE%20Report_Supporting%20resilience%20through%20digital%20financial%20literacy.pdf

මූල්‍ය පාරිභෝගිකයෙකු ලෙස ඔබගේ අයිතිවාසිකම් හා යුතුකම් හඳුනා ගනිමු!

වයි වයි රණවීර
නියෝජ්‍ය අධ්‍යක්ෂ
මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව

දැනුවත්ව සහ වගකීම් සහගත ව මූල්‍ය තීරණ ගනිමු!

මහජනතාව රටක විධිමත් මූල්‍ය ආයතන සමග ගනුදෙනු කිරීමට පෙළඹීම හා විධිමත් මූල්‍ය පද්ධතිය තුළට එක් කර ගැනීම මූල්‍ය අන්තර්ගත භාවය යටතේ සාකච්ඡා කරනු ලබන අතර එලෙස විධිමත් මූල්‍ය ආයතන සමග එකතු වන මූල්‍ය පාරිභෝගිකයන් අසාධාරණ සහ වගකීම් විරහිත ව්‍යාපාරික හැසිරීම්වලින් ආරක්ෂා කිරීම මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය මගින් බලාපොරොත්තු වේ. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධව ගෝලීය වශයෙන් පසුගිය දශකය පුරා සාකච්ඡා කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියාවෙහි නැංවිය යුතු මනා පරිචයන් (best practices) හඳුන්වා දී ඇත. එමගින්, මූල්‍ය පාරිභෝගිකයින්ගේ බැඳියා සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන නෛතික රාමුවක අවශ්‍යතාව පෙන්වා දී ඇති අතර රටක මූල්‍ය පද්ධතියෙහි ස්ථාවර භාවය පවත්වා ගැනීමට එමගින් සිදුවන දායකත්වය සාකච්ඡා කර ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධයෙන් සුවිශේෂී නෛතික ප්‍රතිපාදන මෑතක දී එනම්, 2023 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දුන් අතර එම ප්‍රතිපාදන 2023 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි ලෙස නම් කොට ඇත. එමගින් ශ්‍රී ලංකාව තුළ පැවති මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ නෛතික රාමුව තවත් ශක්තිමත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතනවල පාරිභෝගිකයින් වන ඔබට සමාන හා සාධාරණ අයුරින් තරගකාරී මූල්‍ය සේවාවක් ලබා ගැනීම තහවුරු කිරීම අරමුණු කෙරෙන අතර මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව හා සම්බන්ධ නෛතික ප්‍රතිපාදන සම්බන්ධයෙන් මූල්‍ය ආයතන දක්වන අනුකූලතාවත් ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ.

මෙම මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි මගින් මූල්‍ය පාරිභෝගික ඔබට මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ අයිතිවාසිකම් හඳුන්වා දී ඇති අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතන සමග ගනුදෙනු කිරීමේදී ඔබට සමාන, සාධාරණ හා විනිවිදභාවයකින් යුත් මූල්‍ය සේවාවක් ලබා ගැනීම මෙන් ම වංචා සහගත, අසාධාරණ හා වගකීම් විරහිත ව්‍යාපාරික හැසිරීම් තුළින් ඔබ ව ආරක්ෂා කර ගැනීම තහවුරු කර ඇත.

මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව තුළ මූල්‍ය පාරිභෝගිකයින්ට ඇති අයිතිවාසිකම්

1. සාධාරණ සැලකිල්ලක් ලැබීමට ඇති අයිතිය

මූල්‍ය සේවා සපයන්නන් විසින් සපයනු ලබන මූල්‍ය නිෂ්පාදන හා සේවා සඳහා ඇතුළත් වීමේ දී සහ ඒවා භාවිතයේ දී මූල්‍ය පාරිභෝගිකයකු ලෙස ඔබට සාධාරණ හා සමාන සැලකිල්ලක් නොලැබෙන්නේ නම් ඔබ අසාධාරණයකට ලක්වන අතර එම මූල්‍ය සේවා සපයන්නන් වෙතින් ඈත් වීමට ඔබ උත්සාහ කරනු ඇත. නමුත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතනයක් වෙතින් එවැනි සිදුවීම් අපේක්ෂා නොකරන අතර ඔබගේ ආරක්ෂාව වෙනුවෙන් පහත සඳහන් මූල්‍ය පාරිභෝගික අයිතීන් තහවුරු කර ඇත.

1.1 වෙනස්කොට සැලකීම්වලට ලක් නොවී සමාන අයිතියක් ලැබීමට ඇති අයිතිය

මූල්‍ය පාරිභෝගික ඔබ විසින් මූල්‍ය සේවා සපයන්නන් වෙතින් මූල්‍ය සේවා ලබාගැනීමේ දී ඔබගේ සමාජ තත්ත්වය, ශාරීරික හැකියාව, විවාහ/අවිවාහක බව, වර්ගය, කුලය, ස්ත්‍රී පුරුෂභාවය, වයස, ආගම හෝ මූල්‍ය සාක්ෂරතාවය වැනි මූල්‍ය සේවා ලබා ගැනීමේ දී අදාළ නොවන කරුණු මත පදනම් ව මූල්‍ය සේවා සපයන්නන් විසින් ඔබට වෙනස්කොට සලකයි නම්

එලෙස වෙනස්කොට සැලකීම්වලට ලක්නොවී සමාන අයිතියක් ලැබීමට ඔබට අයිතියක් ඇත.

1.2 ප්‍රවේශතා අයිතිය

- තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය

මූල්‍ය පාරිභෝගික ඔබගේ ඉල්ලීම පරිදි, ප්‍රවේශ විය හැකි ආකෘතිවලින් ඔබගේ ගනුදෙනුවලට අදාළ වන ඔබට අවශ්‍ය සියලු ම ලියකියවිලි, තොරතුරු ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත. එසේ ම, ඔබ විසින් ඇටෝර්නි බලපත්‍රයක්, අධිකාරී ලිපියක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් මගින් බලය පවරන ලද පුද්ගලයෙකුගෙන් සහය ලබා ගැනීම තුළින් අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා ද ඔබට අයිතියක් ඇත.

- වෙබ් අඩවි සඳහා ප්‍රවේශතා අයිතිය

මූල්‍ය සේවා සපයන්නන් විසින් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවි වෙත ප්‍රවේශ වීමට මූල්‍ය පාරිභෝගික ඔබට අයිතිය ඇති අතර වෙබ් අන්තර්ගතයන් හඳුනාගත හැකි, ක්‍රියාත්මක කළ හැකි, තේරුම්ගත හැකි සහ මනා ලෙස සැකසූ වෙබ් අඩවියක් භාවිතය සඳහා එම අයිතිය තහවුරු කොට තිබේ.

1.3 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සතු අයිතීන්

විශේෂ අවශ්‍යතා සහිත මූල්‍ය පාරිභෝගිකයකු වන ඔබට ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතනයක් සමග ගනුදෙනු කිරීමේ දී පහත සඳහන් සුවිශේෂී මූල්‍ය පාරිභෝගික අයිතීන් හිමි වනු ඇත.

- ගොඩනැගිලි සඳහා ප්‍රවේශ අයිතිය

මූල්‍ය සේවා සපයන්නන්ගේ ගොඩනැගිලි හා පරිශ්‍ර තුළට ප්‍රවේශතා පහසුකම් ලබා ගැනීමට පොදු නීති අවශ්‍යතා අනුව අයිතියක් ඔබට හිමි වේ.

- වෙබ් අඩවි සහ ජංගම යෙදවුම් (Mobile Applications) භාවිතය සඳහා අයිතිය

මූල්‍ය සේවා සපයන්නන්ගේ වෙබ් අඩවි තුළ සහ ඔවුන් විසින් හඳුන්වා දී ඇති ජංගම යෙදවුම් තුළ අකුරුවල ප්‍රමාණය, වර්ණය සහ වර්ණ පරස්පර ගැලපුම් හැකියාව; සම්පූර්ණ සංචරණය සහ යතුරු පුවරුව සමග ක්‍රියා කිරීමේ හැකියාව; තිර කියවනය සමග සම්පූර්ණයෙන් ම කියවීමේ හැකියාව; සුදුසු ලෙස නම් කරන ලද සියලු ම වෙබ් මූලිකාංග හෝ විකල්ප පාඨ භාවිත කරන ලද වෙබ් මූලිකාංග භාවිත කිරීමට ඇති හැකියාව; සහ සියලු ම ආරක්ෂිත හෝ සුරැකුම් අංග පාඨ ආකාරයෙන් සහ ශ්‍රව්‍ය මාධ්‍යයෙන් තෝරා ගැනීම සඳහා පහසුකම් ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතය සඳහා අයිතිය

තිර කියවනය සහ අනෙකුත් ප්‍රවේශතා විශේෂාංග සක්‍රීය කරන ලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ අනෙකුත් ප්‍රවේශතා වැඩිදියුණු කරන ලද ස්වයංක්‍රීය උපකරණ භාවිතය සඳහා ඔබට අයිතියක් ඇති අතර විශේෂ අවශ්‍යතා සහිත මූල්‍ය පාරිභෝගිකයකු වන ඔබගේ ඉල්ලීම පරිදි ප්‍රවේශතා විශේෂාංග සහිත කාඩ්පත් (හරපත් සහ බැරපත්) ලබා ගැනීමට ඔබට හැකියාව හිමි විය යුතු ය.

1.4 අසාධාරණ ව්‍යාපාර පරිචයන්ගෙන් ආරක්ෂාවීමේ අයිතිය

මූල්‍ය සේවා සපයන්නා මූල්‍ය නිපැයුම් සහ සේවාවන් සැපයීමේ දී සෑම විට ම සද්භාවයෙන් සහ සැලකිල්ලෙන් ක්‍රියා කළ යුතු අතර මූල්‍ය සේවා සපයන්නා හෝ එහි නියෝජිතයකු / මූල්‍ය සේවා සපයන්නා විසින් පත්කරන ලද තෙවන පාර්ශ්වයක් විසින් කරනු ලබන අනර්ථකාමී අසාධාරණ ව්‍යාපාර පරිචයන්ගෙන් ආරක්ෂා වීමට මූල්‍ය පාරිභෝගිකයකු ලෙස ඔබට අයිතියක් ඇත.

1.5 අසාධාරණ ගිවිසුම් නියමවලින් ආරක්ෂා වීමේ අයිතිය

මූල්‍ය පාරිභෝගිකයකු වන ඔබට අවාසි සහගත වන පරිදි, ඔබගේ අයිතිවාසිකම් සහ බැඳීම්වල අසමතුලිතතාවක් ඇති කරන පරිදි ඇති කරනු ලබන ගිවිසුම් නියමයන් අසාධාරණ ගිවිසුම් නියමයන් ලෙස සැලකිය හැකි අතර එවැනි නියමයන් සමග බැඳීම් ඇති කර ගැනීමෙන් ආරක්ෂා වීමට ඔබට අයිතියක් ඇත. විශේෂයෙන් ම, ඔබගේ අවසරයකින් තොර ව ඔබ සතු අයිතිවාසිකම් සීමාවන අයුරින්, ගිවිසුමක් යටතේ වන මූල්‍ය සේවා සපයන්නාගේ වගකීම් ඔබ වෙත පැවරීමේ හැකියාව මූල්‍ය සේවා සපයන්නා වෙත ලබා දෙන අසාධාරණ ගිවිසුම් නියමවලින් ආරක්ෂාවීමේ අයිතිය ඔබට ඇත.

1.6 සාධාරණ කාලයක් තුළ ප්‍රතිචාර ලබා ගැනීමට ඇති අයිතිය

මූල්‍ය සේවා සපයන්නෙකු වෙතින් මූල්‍ය පාරිභෝගික ඔබගේ කැමැත්ත පරිදි සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් සහ වඩාත් කැමති සන්නිවේදන මාර්ග යක් හරහා ලිඛිත ව හෝ විද්‍යුත් මාර්ගයෙන්, පැහැදිලි ව සහ සාධාරණ කාලයක් තුළ ඔබ විසින් ඉදිරි පත් කරන ලද තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර ලෙස අදාළ තොරතුරු ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

1.7 ණය අයකර ගැනීමේ දී සාධාරණ හා ආචාරශීලී සැලකීමක් ලැබීමට ඇති අයිතිය

ණය අයකර ගැනීමේ දී විනිවිදභාවයෙන් යුතු, සාධාරණ ව සහ ආචාරශීලී ව මෙන් ම, අනිසි පීඩන ඇති කිරීම්, බිය ගැන්වීම්වලින්, හිරිහැරවලින්, අවමානවලින් හෝ තර්ජනවලින් තොර සාධාරණ හා ආචාරශීලී සැලකීමක් ලැබීමට මූල්‍ය පාරිභෝගිකයකු වන ඔබට අයිතියක් ඇත.

1.8 මූල්‍ය පාරිභෝගික අධ්‍යාපනය හා දැනුවත්වීම් ලැබීමට ඇති අයිතිය

මූල්‍ය සේවා සපයන්නා වෙතින් ම හෝ මූල්‍ය ක්ෂේත්‍රයේ අනෙකුත් සංගම් වෙතින් හෝ මහ බැංකුව හෝ මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කරන නියෝජිතායතන වෙතින්, ප්‍රමාණවත් මූල්‍ය අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් මූල්‍ය පාරිභෝගික අධ්‍යාපනය හා දැනුවත්වීම් ලැබීමට මූල්‍ය පාරිභෝගිකු ලෙස ඔබට අයිතියක් ඇත.

2. තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය

මූල්‍ය පාරිභෝගිකයකු ලෙස ඔබ විසින් මූල්‍ය සේවා සපයන්නකු සමග ඇතිකර ගන්නා ගිවිසුමක ඕනෑ ම අදියරයකට අදාළ ව සියලු ම තොරතුරු සහ ලේඛන ඔබගේ අභිමතය පරිදි සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවකින් සරල ව සම්පූර්ණ, පැහැදිලි, සංක්ෂිප්ත, නිවැරදි, නොමඟ නොයවනසුලු ලෙස සහ සාධාරණ කාලයක් තුළ එකී තොරතුරු ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

2.1. මූල්‍ය නිපැයුම් හා සේවාවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය

මූල්‍ය සේවා සපයන්නා විසින් ලබා දෙනු ලබන මූල්‍ය නිපැයුම් හෝ සේවාවන්ට අදාළ නිවැරදි සහ නොමඟ නොයවනසුලු තොරතුරු ලිඛිත, වාචික හෝ දෘශ්‍ය වශයෙන් ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

2.2. මූලික තොරතුරු ලේඛන ලබා ගැනීම සඳහා ඇති අයිතිය

මූල්‍ය පාරිභෝගිකයකු ලෙස ඔබ විසින් ලබා ගැනීමට අපේක්ෂා කරන මූල්‍ය නිපැයුම් හෝ සේවා සම්බන්ධයෙන් ඒවායේ විස්තර ඇතුළත් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයෙන් "මූලික තොරතුරු ලේඛනයක්" ආකාරයෙන් ප්‍රමිතිගත ලේඛනයක් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවලින් සරල භාෂා ශෛලියකින් ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

2.3. ණය ලබා ගැනීමේ දී ඉල්ලුම්පතක් / අර්පණ ලිපියක් / ගිවිසුමක් ලබා ගැනීමට ඇති අයිතිය

ණය පහසුකම් සම්බන්ධයෙන් ඔබ වෙත අයදුම්පතක් / අර්පණ ලිපියක් / ගිවිසුමක් මූල්‍ය සේවා සපයන්නා වෙතින් ලබා ගැනීමට ඔබට අයිතියක් ඇති අතර, එම ලේඛන තුළ අවම වශයෙන් ඇතුළත් විය යුතු, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසිවල සඳහන් වන තොරතුරු ලබා ගැනීමට ඔබට හැකියාව ඇත.

2.4. ගිවිසුම් නියම හා කොන්දේසි ලබා ගැනීම සඳහා ඇති අයිතිය

මූල්‍ය පරිභෝගිකයකු ලෙස ඔබ මූල්‍ය නිපැයුම් හෝ සේවාවන් ලබා ගැනීමේදී ඒවාට අදාළ සියලු නියමයන් සහ කොන්දේසි ඇතුළත්වූ ගිවිසුම් මූල්‍ය සේවා සපයන්නන් වෙතින් ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

2.5. ගිණුම් ප්‍රකාශන ලබා ගැනීමට ඇති අයිතිය

මූල්‍ය ආයතනවල ඔබ විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම්හි ප්‍රකාශනයන් ඔබගේ ඉල්ලීම මත ඔබට ලබා ගැනීමට සහ ගිවිසුමක් අවලංගු කිරීමේ දී හෝ අවසන් කිරීමේ දී ගිණුම අවසන් කිරීමේ ප්‍රකාශනයක් ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

2.6. ණය සම්පූර්ණයෙන් ම පියවා ඇති බවට ප්‍රකාශන ලබා ගැනීමට ඇති අයිතිය

ඔබ විසින් මූල්‍ය වගකීම් සම්පූර්ණයෙන් ගෙවා දමා ඇති අවස්ථාවක දී එකී වගකීම සම්පූර්ණයෙන් පියවූ බව සඳහන් ලිඛිත ප්‍රකාශනයක් ලබා ගැනීමට ඔබට අයිතියක් ඇති අතර, ණය පහසුකමක ඇපයට තබාගත් දේපළ සම්බන්ධ ලිපි ලේඛන ඊට අදාළ වගකීම් සම්පූර්ණයෙන්ම නිමකළ දිනයේ සිට වැඩ කරන දින හතක් (07) ඇතුළත ඔබ වෙත නිදහස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු මූල්‍ය සේවා සපයන්නන් විසින් කළ යුතු වේ.

2.7. තැන්පතු ගිණුම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය

ඔබ විසින් පවත්වාගෙන යන තැන්පතු ගිණුම්වලට අදාළ අයදුම්පතේ, මැන්ඩේටයේ, සහතිකයේ, පාස්පොතේ, අලුත් කිරීමේ නිවේදනයේ, ඇතුළත් විය යුතු මූලික කරුණු සහ ඊට අදාළ තොරතුරු හෙළිදරව් කර ගැනීමට ඔබට අයිතියක් ඇත.

2.8. ගිවිසුම් නියමයන් හා කොන්දේසි වෙනස් වූ බව දැන ගැනීමට ඇති අයිතිය

ඔබ විසින් එකඟ වූ නියමයන් සහ කොන්දේසි විශේෂයෙන් ම එකඟ වූ පොලී අනුපාතය සහ ගාස්තු හා අයකිරීම් මූල්‍ය සේවා සපයන්නන් විසින් වෙනස් කිරීමට පෙර සාධාරණ කාලයක් තුළ මූල්‍ය සේවා සපයන්නා වෙතින් ලිඛිතව ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

3. පැමිණිලි විසඳා ගැනීමට ඇති අයිතිය

මූල්‍ය පාරිභෝගිකයකු ලෙස ඔබගේ දුක්ගැනවිලි සහ පැමිණිලි ඉදිරිපත් කිරීමට, සාධාරණ කාලයක් තුළ ප්‍රතිචාර ලබා ගැනීමට සහ සාධාරණ සහනයක් සමග නිරාකරණයට අවස්ථාව ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

3.1. පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය

ඔබගේ මූල්‍ය ආයතනයේ පැමිණිලි හැසිරවීම සඳහා වන නවතම යාන්ත්‍රණ පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඔබට අයිතියක් ඇති අතර එම තොරතුරු ඔබ මූල්‍ය ආයතනය සමග එළඹෙන ගිවිසුම්වල ඇතුළත් විය යුතු වේ. එසේ ම, පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය වෙනස් කර ඇත්නම් එය සිදු කළ දිනය, මූල්‍ය සේවා සැපයුම්කරුගේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කළ යුතු අතර පත්‍රිකා, පෝස්ටර් ආදිය ද මේ සඳහා යොදා ගැනීම කළ යුතු වේ.

3.2. පැමිණිලි භාර දීමට ඇති අයිතිය

අදාළ මූල්‍ය ආයතනයන්ගේ උපකාරක කවුළු, දුරකථන අංක, ඒ සඳහා ම වෙන් වූ විද්‍යුත් තැපෑල, තැපැල් ලිපින සහ මාර්ගගත වෙබ් පෝරම ආදිය ඇතුළත් ව ගාස්තු රහිත, සාධාරණ, පහසුවෙන් ප්‍රවේශ විය හැකි විනිවිදභාවයකින් යුත්, මූල්‍ය ආයතනවල ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවලින් ස්වාධීන වූ යාන්ත්‍රණයක් වෙත ඔබගේ පැමිණිලි භාර දීමට ඔබට අයිතියක් ඇත.

3.3. බැඳියාවන් අතර ගැටුමක් ඇති නොවන අයුරින් පැමිණිල්ල සඳහා මැදිහත් වීමක් ලබා ගැනීමට ඇති අයිතිය

මූල්‍ය ආයතනයේ ඔබගේ පැමිණිල්ල හසුරුවන නිලධාරියා, පැමිණිල්ලට අදාළ පාර්ශ්වයක් නම් හෝ එම පැමිණිල්ලට අදාළ නිලධාරියා එය ඍජු ව අධීක්ෂණය කරයි නම්, එවැනි අවස්ථාවක බැඳියාවන් අතර ගැටුමක් ඇති විය හැකි අතර එසේ බැඳියාවන් අතර ගැටුමක් ඇති නොවන අයුරින් ඔබගේ පැමිණිල්ල සඳහා මැදිහත් වීමක් ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

3.4. සාධාරණ කාලයක් තුළ පැමිණිල්ල සම්බන්ධයනේ ප්‍රතිචාර ලබා ගැනීමට ඇති අයිතිය

ඔබ විසින් ඔබගේ මූල්‍ය ආයතනය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් පසු, ලිත් දින 21ක් ඇතුළත එම පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රතිචාර ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

3.5. ශ්‍රී ලංකා මහ බැංකුවේ පැමිණිලි හැසිරීවීමේ යාන්ත්‍රණය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර එයට ප්‍රතිචාර ලබා ගැනීමට ඇති අයිතිය

මූල්‍ය පාරිභෝගික පැමිණිල්ල හැසිරවීමේ විකල්ප යාන්ත්‍රණයක් ලෙස ඔබගේ පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීම සඳහා මහ බැංකුව කටයුතු කරන අතර ඔබගේ පැමිණිල්ල සම්බන්ධයෙන් මූල්‍ය සේවා සපයන්නාගේ ප්‍රතිචාරය පිළිබඳ ව සෑහීමකට පත් නොවන්නේ නම් හෝ මූල්‍ය සේවා සපයන්නා විසින් පැමිණිල්ල සම්බන්ධයෙන් කටයුතු කර නොතිබේ නම් මහ බැංකුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ඔබට අයිතියක් ඇත. කෙසේ වෙතත්, ඔබට හෝ මූල්‍ය සේවා සපයන්නන්හට මෙම ක්‍රියාවලිය අතරතුර ඕනෑ ම අවස්ථාවක නීතිමය ක්‍රියාමාර්ග හෝ වෙනත් ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක වෙත පිවිසීමට මෙයින් සීමා පැනවීමක් සිදු නොවේ.

4. මූල්‍ය ආයතන සතු තමන්ගේ වත්කම් සහ තොරතුරු සඳහා ආරක්ෂාව ලබා ගැනීමට ඇති අයිතිය

මූල්‍ය සේවාවන් සතුව පවත්නා ඔබගේ වත්කම් සහ තොරතුරු අයථා ලෙස භාවිතයට ලක් නොවී එකී වත්කම් සහ තොරතුරු සඳහා නිසි ආරක්ෂාවක් ලබා ගැනීමට මූල්‍ය පාරිභෝගිකයකු ලෙස ඔබට අයිතියක් ඇත.

4.1. පෞද්ගලික තොරතුරු ලබා දීමේ දී එහි අවශ්‍යතාව දැන ගැනීමට ඇති අයිතිය

මූල්‍ය සේවා සපයන්නන් විසින් නිශ්චිත, පැහැදිලි සහ නීත්‍යානුකූල අරමුණු සඳහා පමණක් නීත්‍යානුකූල සහ සාධාරණ ක්‍රම භාවිතා කරමින් ඒ සඳහා අදාළ ඕනෑ ම නීතියක, නියෝගයක හෝ මාර්ගෝපදේශයක සීමාවන් තුළ රැක්ෂෙමින් මූල්‍ය පාරිභෝගිකයන්ගේ පෞද්ගලික තොරතුරු රැස් කළ යුතු අතර ඔබ විසින් අදාළ තොරතුරු ලබාදීමේදී එකී තොරතුරු ලබා ගැනීමේ අරමුණ සහ එහි අවශ්‍යතාව දැන ගැනීමට ඔබට අයිතියක් ඇත.

4.2. පෞද්ගලික තොරතුරුවලට ආරක්ෂාව ලබා ගැනීමට ඇති අයිතිය

මූල්‍ය සේවා සපයන්නා විසින් ඔබගේ පෞද්ගලික තොරතුරුවල රහස්‍යභාවය, ආරක්ෂාව සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සකස් කර ක්‍රියාත්මක කළ යුතු අතර ඔබගේ පෞද්ගලික තොරතුරුවලට ආරක්ෂාව ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

4.3. නොසැලකිල්ල, අවභාවිතය හෝ වංචා කිරීම හේතුවෙන් වත්කම්වලට සිදුවන අලාභ අය කර ගැනීමට ඇති අයිතිය

මූල්‍ය පාරිභෝගිකයකු ලෙස ඔබගේ නොසැලකිල්ල හෝ වංචනික හැසිරීම් හේතුවෙන් අලාභය සිදු වූ බව ඔප්පු නොවන අවස්ථාවල මූල්‍ය පාරිභෝගිකයින්ගේ වත්කම් වංචා කිරීම, අවභාවිතය සහ අයථා පරිහරණය හේතුවෙන් ඔබට සිදුවන අලාභ අය කර ගැනීම සඳහා ඔබට අයිතියක් ඇත.

4.4. පෞද්ගලික තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඇති අයිතිය

ඔබගේ ඉල්ලීම මත, මූල්‍ය සේවා සපයන්නා විසින් නීතියෙන් තහනම් කර ඇති අවස්ථාවක හැරුණු කොට ඔවුන් සතු ව තබා ගන්නා ඔබ පිළිබඳ ඕනෑ ම පෞද්ගලික තොරතුරක් වෙත ඔබට තේරුම් ගත හැකි ආකාරයෙන්, සාධාරණ කාලයක් ඇතුළත, අවම පිරිවැයකින් හෝ පිරිවැයකින් තොර ව ප්‍රවේශය ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

4.5. වැරදි තොරතුරු නිවැරදි කර ගැනීමට ඇති අයිතිය

මූල්‍ය සේවා සපයන්නෙකු සතු ඔබගේ පෞද්ගලික තොරතුරු වැරදි හෝ අසම්පූර්ණ බව ඔබ අදහස් කරන්නේ නම් ඒ පිළිබඳව මූල්‍ය සේවා සපයන්නා දැනුවත් කර සාධාරණ කාලයක් ඇතුළත එය නිවැරදි කරවා ගැනීමට ඔබට අයිතියක් ඇත.

ඒ අනුව, ඔබ මූල්‍ය පාරිභෝගිකයකු ලෙස මූල්‍ය ආයතන සමග කටයුතු කිරීමේ දී ඉහතින් සඳහන් කරන ලද මූල්‍ය පාරිභෝගික අයිතීන් මගින් ඔබගේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය තහවුරු කරනු ලබන අතර මූල්‍ය සේවා සපයන්නන් සමග ඔබ සිදුකරනු ලබන ගනු දෙනුවල දී ඔබට සිදුවන වංචා, අසාධාරණ හා නොසැලකිලිමත් ක්‍රියා සම්බන්ධයෙන් මූල්‍ය පාරිභෝගික අයිතීන් ක්‍රියාවට නංවා ගැනීම සඳහා එකී අයිතීන් භාවිත කරමින් ඔබ ඉදිරිපත් විය යුතු වේ.

මූල්‍ය පාරිභෝගිකයකු ලෙස ඔබගෙන් ඉටුවිය යුතු යුතුකම් මොනවාද?

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය මගින් ඔබට ලබා දී ඇති මූල්‍ය පාරිභෝගික අයිතීන් ඔබ විසින් බුක්තිවිඳින අතර ම මූල්‍ය පාරිභෝගිකයකු ලෙස ඔබගෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් ද පවතින බැවින්, හොඳින් ඒවා අවබෝධ කර ගැනීම සහ ඊට අනුකූල වීම තුළ හිතකර මූල්‍ය පරිසරයක් පවත්වා ගැනීමට එය උපකාරී වනු ඇත.

ඒ අනුව, ඔබගේ මූල්‍ය නිෂ්පාදන හා සේවා පරිභෝජනයේ දී පහත යුතුකම් ඔබගෙන් අපේක්ෂා කෙරේ.

1. නිවැරදි තොරතුරු සැපයීමේ වැදගත්කම

මූල්‍ය සේවා සපයන්නන් විසින් නිසි ඇගයීමක් සහතික කිරීම සඳහා ඔබගේ ගිවිසුමේ නියමයන්ට බලපෑම් කළ හැකි අදාළ පුද්ගලික සහ මූල්‍ය තොරතුරු ඔබ විසින් හෙළි කළ යුතු අතර නොමඟ යවනසුලු හෝ අසත්‍ය තොරතුරු මූල්‍ය ප්‍රතිවිපාක හෝ නීතිමය ගැටලු පවා ඇති කළ හැකි බැවින් ඔබ විසින් මූල්‍ය නිෂ්පාදන හෝ සේවා සඳහා අයදුම් කිරීමේ දී ඔබගේ සත්‍ය හා නිවැරදි තොරතුරු සැපයීම මූල්‍ය පාරිභෝගික ඔබගේ යුතුකමකි.

2. ගිවිසුම් නියමයන් හා කොන්දේසි නිවැරදි ව කියවා අවබෝධ කර ගැනීමේ වගකීම

ඔබ විසින් සම්බන්ධ වන ඕනෑ ම මූල්‍ය නිෂ්පාදනයක හෝ සේවාවක නියමයන් සහ කොන්දේසි හොඳින් කියවා තේරුම් ගැනීම ඔබගේ වගකීමකි. පොලී අනුපාත, ගාස්තු, දඩ පොලී සහ අනෙකුත් වැදගත් තොරතුරු තේරුම් ගැනීම ඉතා වැදගත් වන අතර කොන්දේසිවල කිසියම් කොටසක් අපැහැදිලි නම්, ඔබ විසින් ගිවිසුමට එකඟ වීමට පෙර මූල්‍ය ආයතනයෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා සිටිය යුතු ය.

3. වගකීම් සහගත ලෙස මූල්‍ය බැඳීම් කළමනාකරණය කිරීමේ යුතුකම

ණය, ක්‍රෙඩිට් කාඩ්පත් හෝ වෙනත් මූල්‍ය බැඳීම් සඳහා ගෙවීම් නියමිත වේලාවට සිදු කිරීම ඔබගේ යුතුකමක් වන අතර, එසේ කිරීමට අපොහොසත් වීමෙන් පොලී ගාස්තු, ඔවුන්ගේ ණය ශ්‍රේණිගත කිරීම ට හෝ නීතිමය කටයුතු වැනි අපහසුතා සිදුවිය හැකි ය. එසේම, පාරිභෝගිකයින් සාධාරණ ලෙස ආපසු ගෙවිය හැකි ප්‍රමාණයට වඩා වැඩි ණය ගැනීමෙන් වැළකී සිටිය යුතු අතර වගකීමෙන් යුතු ව ණයට ගැනීම සහ

තම ආදායමට අනුව තම දෛනික අවශ්‍යතා සකසා ගැනීම මූල්‍ය යහපැවැත්මේ ප්‍රධාන අංග වේ. තව ද, ඔබ විසින් ඔබගේ වියදම් ඉතා හොඳින් නිරීක්ෂණය කළ යුතු අතර, තම මූල්‍ය බැඳීම් ඔබට දරාගත හැකි බව තහවුරු කර ගත යුතු සේ ම මූල්‍යමය පීඩනයකට තුඩු දිය හැකි අධික ණය රැස් කිරීමෙන් වැළකී සිටීම ඔබගේ යුතුකමකි.

4. පෞද්ගලික තොරතුරු ආරක්ෂා කර ගැනීමේ යුතුකම

ඔබගේ පුද්ගලික සහ මූල්‍ය තොරතුරු ආරක්ෂා කර ගැනීම ඔබගේ යුතුකමක් යන අතර ඔබගේ ගිණුම් අංක හෝ මුරපද වැනි සංවේදී තොරතුරු අන් අය සමඟ බෙදා නොගැනීම සහ වංචා හෝ වංචනික යෝජනා ක්‍රම වළක්වා ගැනීම සම්බන්ධයෙන් නිසි සැලකිලිමත්භාවයෙන් කටයුතු කළ යුතු ය. එසේ ම, ඔබගේ ගිණුම්වල කිසියම් සැක සහිත ක්‍රියාකාරකමක් හෝ වංචාවක සලකුණු දුටුවහොත්, සිදුවිය හැකි හානිය වළක්වා ගැනීම හෝ සීමා කිරීම සඳහා ඒ පිළිබඳ ව වහා ම ඔබගේ මූල්‍ය ආයතනයට වාර්තා කිරීමේ වගකීමක් ඔබ සතුව ඇත.

5. අදාළ අරමුණට පමණක් ලබාගත් මූල්‍ය නිෂ්පාදන භාවිත කිරීමේ යුතුකම

මූල්‍ය නිෂ්පාදන හෝ සේවාවන් අනිසි ලෙස භාවිතා කිරීම එනම් ලබාගත් අරමුණින් බැහැර ව භාවිත කිරීම මූල්‍ය දුෂ්කරතා සහ නීතිමය ගැටලුවලට තුඩු දිය හැකි බැවින් ඔබ විසින් ලබා ගත් මූල්‍ය නිෂ්පාදන අපේක්ෂිත අරමුණට අනුකූල ව භාවිත කිරීම ඔබගේ යුතුකමකි. තවද, නිශ්චිත මූල්‍ය නිෂ්පාදන හෝ සේවාවන් භාවිත කිරීම සඳහා අදාළ නෛතික ප්‍රතිපාදන මගින් හෝ මූල්‍ය ආයතනය විසින් යම් රීති හෝ මාර්ගෝපදේශ නියම කර ඇති අවස්ථාවක එකී නෛතික ප්‍රතිපාදන සමග අනුකූල වීම සහ මාර්ගෝපදේශ අනුගමනය කිරීම ඔබගේ වගකීමක් වේ.

6. වාර්තා අධ්‍යනය කිරීමේ හා තබා ගැනීමේ යුතුකම

ඔබ විසින් ඔබගේ ගිණුම් ප්‍රකාශන සහ ගනුදෙනු ඉතිහාසයන් නිවැරදි බව තහවුරු කර ගැනීම සඳහා කාලීන ව සමාලෝචනය කළ යුතු අතර, කිසියම් විෂමතාවක් හෝ දෝෂයක් හඳුනාගත් වහා ම එය ඔබගේ මූල්‍ය ආයතනයට වාර්තා කිරීම ඔබගේ යුතුකමකි. එසේ ම, ආරවුල් විසඳා ගැනීමට හෝ පසුව ඇතිවිය හැකි ඕනෑ ම ගැටලුවක් පැහැදිලි කර ගැනීමට උපකාරී කර ගැනීම සඳහා මූල්‍ය ආයතන සමඟ සිදුවන ඔබගේ මූල්‍ය ගනුදෙනු, ගිවිසුම් සහ සියලුම සන්නිවේදන පිළිබඳ වාර්තා පවත්වා ගැනීම ඔබගේ වගකීමක් වේ.

7. පැමිණිලි ක්‍රියාවලිය නිසි ලෙස භාවිත කිරීමේ යුතුකම

ඔබ ඔබගේ මූල්‍ය ආයතනයෙහි සේවාව සම්බන්ධයෙන් අසතුටින් සිටී නම් හෝ ඔබට මූල්‍ය ආයතනය විසින් අසාධාරණ ලෙස සලකනු ලැබ ඇතැයි විශ්වාස කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි සහ සාක්ෂි ඉදිරිපත් කරමින් අදාළ පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලිය අනුගමනය කිරීම ඔබගේ යුතුකමක් වේ. එසේ ම, ආරවුලක් මතු වූ විට හෝ පැමිණිල්ලක් ගොනු කරන විට, ඔබ විසින් අවශ්‍ය තොරතුරු ලබා දෙමින් සහ විසඳීමේ ක්‍රියාවලියට සම්බන්ධ වෙමින් මූල්‍ය ආයතනය හෝ නියාමන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ඔබගේ වගකීමක් වේ.

8. මූල්‍ය තත්වයන් හා පෞද්ගලික තොරතුරු වෙනස්වීම් දැන්වීමේ යුතුකම

ඔබගේ මූල්‍ය තත්ත්වයෙහි සහ පෞද්ගලික තොරතුරුවල සිදුවන ඕනෑ ම සැලකිය යුතු වෙනසක් (ආදායමේ, රැකියා තත්ත්වයෙහි හෝ ලිපිනයෙහි වෙනස්කම් වැනි) පිළිබඳ ව තම මූල්‍ය ආයතන දැනුවත් කිරීම ඔබගේ යුතුකමක් වේ. එසේ ම, ඔබට ණය ගෙවීම් කිරීමට හෝ කළමනාකරණය කිරීමට අපහසුතා ඇති වුවහොත්, හැකි ඉක්මනින් ඔබගේ මූල්‍ය සේවා සපයන්නන්ට දැනුම් දීම ඔබගේ වගකීමක් වේ.

9. නෛතික අවශ්‍යතා සමග අනුකූල වීමේ යුතුකම

ඔබගේ මූල්‍ය ගනුදෙනු හා සම්බන්ධ නෛතික සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම ඔබගේ යුතුකමක් වන අතර ණය ගිවිසුම්වල නියමයන්ට ගරු කිරීම, බදු ගෙවීම වැනි අනෙකුත් මූල්‍ය නීතිවලට අනුකූල වීම සහතික කිරීම ඔබගේ වගකීමක් වේ.

10. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණයන් අවභාවිත කිරීමෙන් වැළකීමේ යුතුකම

මූල්‍ය ගිවිසුමක් අවලංගු කිරීමට උත්සාහ කිරීම හෝ වංචනික ලෙස චෝදනා සම්බන්ධයෙන් ආරවුල් ඇති කර ගැනීම වැනි වංක අරමුණු සඳහා ඔබ විසින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ නීති භාවිතා නොකිරීම ඔබගේ යුතුකමක් වේ. ඔබගේ ගිවිසුම් අවලංගු කිරීමට හෝ අසාධාරණ පිළිවෙත් සම්බන්ධයෙන් පියවර ගැනීමට ඔබට අයිතියක් ඇති අතර, මෙම අයිතිවාසිකම්

නීත්‍යානුකූල මූල්‍ය වගකීම් මග හැරීමට උත්සාහ නොකර සාධාරණ ව හා යහපත් විශ්වාසයකින් යුතු ව භාවිතා කිරීම ඔබගේ වගකීමක් වේ.

ඒ අනුව, මූල්‍ය ගනුදෙනුවල දී ඔබ, ඔබගේ යුතුකම් ඉටු කරන විට සහ දැනුවත්, වගකිවයුතු සහ සහයෝගයෙන් කටයුතු කිරීමෙන්, ඔබට ඇති ආරක්ෂාවන්ගෙන් සම්පූර්ණයෙන් ම ප්‍රතිලාභ ලබා ගත හැකි අතර අභියෝගාත්මක මූල්‍ය තත්ත්වයන්ට මුහුණ දීමෙන් වැළකී සිටිය හැකි ය.

සාරාංශය

වර්තමාන සංකීර්ණ මූල්‍ය පරිසරය තුළ, මූල්‍ය පාරිභෝගික ඔබගේ මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් සහ යුතුකම් අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. ඔබගේ මූල්‍ය ගනුදෙනුවල දී සාධාරණත්වය, විනිවිදභාවය සහ ආරක්ෂාව සඳහා ඔබට හිමිකම් ඇති අතර, ඔබ දැනුවත් ව සිටීම, විචක්ෂණශීලී ව ක්‍රියා කිරීම සහ ඔබගේ මූල්‍ය බැඳීම් ඉටු කිරීමේ වගකීම ද දැරිය යුතු වේ. ඒ අනුව, මූල්‍ය ආයතන සහ මූල්‍ය පාරිභෝගිකයින් අතර සම්බන්ධතාව ගොඩනැගී ඇත්තේ අන්‍යෝන්‍ය විශ්වාසය, විනිවිදභාවය සහ වගවීම යන පදනම මත වේ. වර්තමානය වන විට ඔබ මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් අතින් වඩාත් පොහොසත් වන අතර මෙම අයිතිවාසිකම් මගින් ඔබට ඔබගේ මූල්‍ය යහපැවැත්ම සහ ආරක්ෂාව හැඩගස්වා ගත හැකි දැනුවත් තීරණ ගැනීමට බලය ලබා දේ. කෙසේ වෙතත්, අයිතිවාසිකම් වගකීම් සමග අත්වැල් බැඳ ගත යුතු අතර මෙම සමබර ප්‍රවේශය ඔබගේ මූල්‍ය අවශ්‍යතා ආරක්ෂා කරනවා පමණක් නොව, සමස්තයක් ලෙස වඩාත් සදාචාරාත්මක, ස්ථාවර සහ තිරසර මූල්‍ය පද්ධතියක් පවත්වා ගෙන යාමට ද උපකාරී වේ.

තහනම් යෝජනා ක්‍රම හෙවත් පිරමිඩ යෝජනා ක්‍රමවල අහිතකර ප්‍රතිඵල හා ඒවායින් වැළකී සිටීමේ අවශ්‍යතාව

ඩබ්ලියු ඩී යු එස් කේ වීරසිංහ
ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව

නූතන සංකීර්ණ ආර්ථික පසුබිම තුළ විවිධ වංචනික මූල්‍ය ආයෝජන ක්‍රම පැතිර යෑම නිරන්තරයෙන් දක්නට ලැබේ. ඒවායින් එක් නීති විරෝධී ආයෝජන ක්‍රමයක් ලෙස පිරමිඩ යෝජනා ක්‍රම හඳුන්වා දිය හැකි ය. මෙකී පිරමිඩ යෝජනා ක්‍රමවල ව්‍යාප්තිය පුද්ගලයන්ගේ මෙන් ම සමස්ත ආර්ථිකයට තර්ජනයක් ව පවතී. එම නිසා මෙම ලිපියෙහි මූලික අරමුණ වන්නේ, තහනම් යෝජනා ක්‍රම හෙවත් පිරමිඩ යෝජනා ක්‍රම පිළිබඳ ව මූල්‍ය පාරිභෝගිකයන් දැනුවත් කිරීම සහ ඒවායින් මිදිය යුත්තේ මන් ද යන්න ඔවුන්ට පැහැදිලි කර දීම යි.

ඒ අනුව පළමුවෙන් ම පිරමිඩ යෝජනා ක්‍රමයක් යනු කුමක් ද යන්න විග්‍රහ කිරීමට උත්සාහ කරන අතර මෙවැනි යෝජනා ක්‍රම සඳහා පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීමට යොදා ගන්නා විවිධ උපාය මාර්ග දෙවනු ව සලකා බලනු ලබයි. ඉන් අනතුරුව එවැනි යෝජනා ක්‍රම සමඟ සම්බන්ධ වීමෙන් ඇති විය හැකි බරපතළ අහිතකර ප්‍රතිඵල පිළිබඳ ව සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන අතර ලිපියෙහි අවසාන භාගයේ දී මෙවැනි තහනම් යෝජනා ක්‍රමවලින් මිදීමට ඔබ ගත යුතු පියවර පිළිබඳ ව ද කෙටියෙන් විග්‍රහ කිරීම අපේක්ෂා කෙරේ.

පිරමිඩ යෝජනා ක්‍රමයක් යනු කුමක් ද?

පුද්ගලයන් බඳවා ගැනීම මත ප්‍රතිලාභ ලැබෙන හෝ සහභාගිවන්නන්ගේ දායක මුදල් ඉහළ දැමීම මත ප්‍රතිලාභ ලබා දෙන යෝජනා ක්‍රමයක් "තහනම් යෝජනා ක්‍රමයක්" හෙවත් "පිරමිඩ යෝජනා ක්‍රමයක්" ලෙස බැංකු පනතෙහි 83 (ඇ) වගන්තියට අනුව සරල ව හඳුනා ගත හැකි ය. ඒ අනුව කිසියම් යෝජනා ක්‍රමයකට පුද්ගලයන් බඳවා ගැනීම පිණිස සහ බඳවා ගැනෙන සාමාජිකයන්ට ලාභ ලැබීම පිණිස තවත් සාමාජිකයන් බඳවා ගැනීමට අනුබල සපයන නැතහොත් ව්‍යාපාරයට සහභාගීවන්නන් ගෙවන මුදල ඉහළ දැමීමෙන් ලාභ ලබා දෙන යෝජනා ක්‍රම, මෙකී තහනම් යෝජනා ක්‍රම ගණයට අයත් වේ.

ඉහත ලක්ෂණ දෙක හැරුණු විට පිරමිඩ යෝජනා ක්‍රමවල මතු කියවෙන ලක්ෂණ ද දැකිය හැකි ය. එනම්, මෙවැනි ව්‍යාපාරවල සත්‍ය නිෂ්පාදන හෝ සේවාවන් අලෙවි කිරීම සිදු නොවේ. ඒ වෙනුවට භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීම මුවාවෙන් මුදල් එකතු කිරීම සිදු වේ. තව ද, ඉහළ ලියාපදිංචි කිරීමේ හෝ බඳවා ගැනීමේ ගාස්තු අය කිරීම ද මෙම ව්‍යාපාරවල දැකිය හැකි ලක්ෂණයකි.

මේ හැරුණු විට මෙවැනි යෝජනා ක්‍රමවලට මුදල් ගලා ඒම, බඳවා ගැනීම මත සිදුවන හෙයින් බඳවා ගැනීම අවසන් වූ අවස්ථාවක ඒවා කඩා වැටීමකට ලක් වේ. එවැනි තත්ත්වයක් තුළ පිරමිඩ යෝජනා ක්‍රම ඉතා ම කෙටිකාලීන ව්‍යාපාර වන අතර එම යෝජනා ක්‍රමයේ මුල් සාමාජිකයන් විශාල වශයෙන් ලාභ ලබන අතර මේවා බිඳවැටෙන විට පහළ ස්ථරවල සිටින සාමාජිකයන්ගේ වත්කම් විනාශ වීම සිදු වන බව පෙන්වා දිය හැකි ය. මේ අනුව ඉහත ලක්ෂණ ඇති යෝජනා ක්‍රම, "පිරමිඩ යෝජනා ක්‍රම" ලෙස හඳුන්වා දිය හැකි අතර එවැනි ව්‍යාපාරයකට කුමන අයුරකින් හෝ සම්බන්ධ වීම, අනුබලදීම හෝ පවත්වා ගෙන යෑම ශ්‍රී ලංකාව තුළ නීතියෙන් දඬුවම් ලැබීමට හේතු වන බව අවධාරණය කළ යුතු ය. නීති රීති මගින් මෙවැනි තහනම් යෝජනා ක්‍රම පවත්වා ගෙන යෑම තහනම් කර තිබුණ ද, තවමත් බොහෝ පිරිස් මේවාට සම්බන්ධ වන අයුරු දැක ගත හැකි ය. විශේෂයෙන් ම මෙයට හේතු වන්නේ පුරවැසියන් ඊට ආකර්ෂණය කර

ගැනීම සඳහා එම පිරමිඩ යෝජනා ක්‍රම පවත්වාගෙන යන්නන් විසින් විවිධ මුළා කරවනසුලු උපාය මාර්ග යොදා ගැනීම යි. එම නිසා එවැනි මුළා කරවනසුලු උපාය මාර්ග මොනවා ද යන්න මීළඟට සලකා බැලීම වැදගත් වේ.

පිරමිඩ යෝජනා ක්‍රමවලට ජනතාව ආකර්ෂණය කර ගැනීම සඳහා යොදා ගන්නා උපක්‍රම

පිරමිඩ යෝජනා ක්‍රම මෙහෙයවන්නෝ එහි අනීතික ස්වභාවය වසන් කිරීම සඳහා මෙන් ම පුරවැසියන් ඒවාට ආකර්ෂණය කර ගැනීම සඳහා ද තොරතුරු සැඟවීම හෝ විකෘති කිරීම, වැරදි තොරතුරු ඉදිරිපත් කිරීම වැනි උපක්‍රම රැසක් භාවිත කරති. ඉන් කිහිපයක් මෙසේ සලකා බලමු.

1. පිරමිඩ යෝජනා ක්‍රම, බහුජාල අලෙවිකරණය ලෙස හුවා දැක්වීම

මෙහි දී සිදු වන්නේ තොරතුරු විකෘති කර ඉදිරිපත් කිරීමකි. පිරමිඩ යෝජනා ක්‍රම මෙහෙයවන්නෝ, සාමාජිකයන් බඳවා ගැනීමේ දී ඍජු ව ම මුදල් අය කිරීම වෙනුවට භාණ්ඩයක් විකිණීම ඔස්සේ මුදල් එකතු කිරීම සිදු කරති. ඔවුන් මෙය බහුජාල අලෙවිකරණය ලෙස නම් කරන නමුත්, එය ඇත්ත වශයෙන් ම බහුජාල අලෙවිකරණයක් නොවේ. බහුජාල අලෙවිකරණය යටතේ තොග හා සිල්ලර වෙළෙඳාම යටතේ පාරිභෝගිකයන්ට භාණ්ඩ හා සේවා විකුණන අතර තොග වෙළෙන්දන් හා සිල්ලර වෙළෙන්දන් භාණ්ඩ විකිණීමේ දී ඔවුන් විසින් එම භාණ්ඩ/ සේවා පෞද්ගලික ව මිල දී ගත යුතු නොවේ. ඔවුන් ලාභ ලබන්නේ එකී භාණ්ඩ පාරිභෝගිකයන් වෙත විකිණීමෙන් ලැබෙන කොමිස් මුදලකිනි. එහෙත් පිරමිඩ යෝජනා ක්‍රම තුළ එම ව්‍යාපාරයට බැඳෙන සෑම අයෙකු ම භාණ්ඩයක් අනෙක් අයෙකුට විකිණීමට පෙර තමා මිල දී ගත යුතු වේ. එමෙන් ම මෙම පිරමිඩ යෝජනා ක්‍රම තුළ අළෙවි කරන භාණ්ඩ වෙළෙඳපොළ මිලට වඩා අධික මිලකට විකිණේ. තව ද, මෙම භාණ්ඩ සඳහා අළෙවියෙන් පසු සේවාවක් නොලැබේ. එහෙත් තොග වෙළෙඳාම, සිල්ලර වෙළෙඳාම ආදී සාමාන්‍ය වෙළෙඳාමේ දී ඒවා සාමාන්‍ය වෙළෙඳපොළ මිලට විකිණෙන අතර අලෙවියෙන් පසු සේවාවක් ද ලැබිය හැකි ය. ඒ අනුව තොග වෙළෙඳාම හා සිල්ලර වෙළෙඳාම ඇතුළත් බහුජාල අලෙවිකරණය, පිරමිඩ යෝජනා ක්‍රමවලින් පැහැදිලි ව වෙනස් වන බව අවබෝධ කර ගැනීම අවශ්‍ය වේ. බහුජාල අළෙවිකරණය නීති විරෝධී දෙයක් නොවන හෙයින් පිරමිඩ යෝජනා ක්‍රම මෙහෙයවන්නන් තම අනීතික මුදල් එකතු කිරීම බහුජාල අළෙවිකරණය ලෙස හුවා දැක්වීමට උත්සාහ කිරීම පුද්ගලයන් මුළා කිරීමට යොදා ගන්නා එක් උපාය මාර්ගයක් ලෙස පෙන්වා දිය හැකි ය.

2. මුළා කරවනසුලු ලියකියවිලි ඉදිරිපත් කිරීම

ඉහතින් සඳහන් කළ පරිදි පිරමිඩ යෝජනා ක්‍රම පවත්වා ගෙන යෑම ශ්‍රී ලංකාව තුළ තහනම් වෙයි. ඒ අනුව කිසියම් පුද්ගලයෙකු පිරමිඩ යෝජනා ක්‍රමවලට බඳවා ගැනීමේ දී ඔහු එම ව්‍යාපාරයෙහි ලියාපදිංචි තොරතුරු ඉල්ලා සිටියහොත්, මෙම ව්‍යාපාර මෙහෙයවන්නෝ සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් ලබා ගත් යම් ව්‍යාපාර ලියාපදිංචියට අදාළ ලේඛන ඉදිරිපත් කරති. අත්‍යවශ්‍යයෙන් ම එම ලේඛන කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් අලෙවි කිරීම සඳහා ලියාපදිංචි කරන ලද සමාගමකට අදාළ ලේඛන විය හැකි යි. එහෙත් එවැනි ලියාපදිංචි ලේඛන භාවිත කොට මුදල් එකතු කිරීමේ ව්‍යාපාර පවත්වා ගෙන යාම නීත්‍යානුකූල නොවේ. එම නිසා කිසියම් සැක සහිත ව්‍යාපාරයකට බඳවා ගැනීමට උත්සාහ කිරීමේ දී ඉදිරිපත් කෙරෙන ලේඛනවල සැබෑ අරමුණ සහ ඇත්ත වශයෙන් ම පවත්වා ගෙන යන ව්‍යාපාරයේ අරමුණු අතර සබඳතාව සලකා බැලිය යුතු ය.

3. අධික ලාභ පොරොන්දු වීම

පිරමිඩ යෝජනා ක්‍රම මෙහෙයවන්නෝ සාමාජිකයන් බඳවා ගැනීමේ දී අඩු මහන්සියකින් විශාල ලාභයක් ලැබිය හැකි බව මවා පෑමට උත්සාහ කරති. මෙහි දී ඔවුන් විසින් ඒ බව තහවුරු කිරීම සඳහා සමාජයේ පිළිගත් පුද්ගලයෝ ප්‍රවර්ධකයන් ලෙස යොදා ගැනෙති. එම ප්‍රවර්ධකයන් මගින් ඔවුන්ට ලැබුණු විදේශ සංචාර, විවිධ හෝටල්වල නිවාඩු ගත කිරීම් ආදී සුඛෝපභෝගී ජීවිතයකට අදාළ අත්දැකීම් ඉදිරිපත් කරවීමට මෙන් ම ඔවුන් මෙම ව්‍යාපාරවලට සම්බන්ධ වී කෙටි කලක් තුළ එවැනි ලාභයක් ලැබූ බව මවා පෑමට ද මොවුහු කටයුතු කරති. එහෙත් මේ සියල්ල අසත්‍ය තොරතුරු වන බවත්, එකී පුද්ගලයන් මෙවැනි ව්‍යාපාර ප්‍රවර්ධනය කරන්නන් බවත් වටහාගත යුතු ය. ඒ අනුව ක්ෂණික ලාභ ලැබීම පිළිබඳ ආකර්ෂණීය කතන්දර ඉදිරිපත් කිරීමේ උපක්‍රමය ද පිරමිඩ යෝජනා ක්‍රම ප්‍රවර්ධනයේ තවත් එක උපායක් ලෙස හඳුනා ගත යුතු ය.

4. අන්තර්ජාලය ඔස්සේ පිරමිඩ යෝජනා ක්‍රම පවත්වා ගෙන යාම

ක්‍රිප්ටෝ මුදල්වල ආයෝජනය කිරීමේ මුවාවෙන් ද විවිධ පුද්ගලයන් පිරමිඩ යෝජනා ක්‍රම පවත්වා ගෙන

යාමට උත්සාහ කර ඇත.මෙහි දී ගූගල් ප්ලේස්ටෝර් (Google Play store) හෝ ඇපල් ස්ටෝර් (Apple store) මගින් ජංගම යෙදවුමක් බාගත කරන මෙන් ඔබෙන් ඉල්ලා සිටින අතර එමගින් ක්‍රිප්ටෝ මුදල්වල ආයෝජනය කිරීම සඳහා ඔබ පොලඹවයි. අනතුරු ව මාසික ව ඔබට ප්‍රතිලාභ ලැබෙන බවත්, එය අදාළ ජංගම දුරකථන යෙදවුමේ පෙන්නුම් කරන බවත් ප්‍රකාශ කරයි. එහෙත් මේවා ව්‍යාජ කේතකරණ ක්‍රම මගින් පෙන්නුම් කරන ව්‍යාජ අගයයන් බවත්, සත්‍ය වශයෙන් එවැනි මුදලක් ඔබට ලැබී නැති බවත් අවබෝධ කර ගත යුතු ය. මෙහි දී ඔබගේ විශාල තොරතුරු ප්‍රමාණයක් ඔවුන් ලබා ගන්නා අතර ඔබ හරහා තවත් පුද්ගලයන්ව මෙම ව්‍යාපාරයට බඳවා ගැනීමට ඔබව උනන්දු කරයි. ඒ හැරුණු විට වෙළෙඳ දැන්වීම් ක්ලික් කිරීම වැනි ඵලදායි නොවන කටයුතු මගින් ද ඔබට මුදල් උපයා ගත හැකි බව ඔවුහු පෙන්වා දෙති. මෙහි දී මතක තබා ගත යුත්තේ මේ සියල්ල ව්‍යාජ ලෙස සකස් කරන ලද මෘදුකාංග ඔස්සේ පවත්වා ගෙන යන තහනම් යෝජනා ක්‍රම බවත්, කිසිදු ක්‍රිප්ටෝ මුදල් ඒකකයක් ශ්‍රී ලංකාව තුළ නීත්‍යානුකූල ව පිළි නොග න්නා බවත් ය.

5. රැකියා ලබා දෙන මුවාවෙන් පිරමිඩ යෝජනා ක්‍රම පවත්වා ගෙන යාම

මෙහි දී සිදුවන්නේ රැකියා ලබා දීමට පොරොන්දු වී ඒ වෙනුවෙන් කෙටිකාලීන පාඨමාලාවලට සහභාගී වීමට ඔබට ආරාධනා කිරීමකි. එහි දී ඔබට ලියාපදිංචි ගාස්තු ලෙස විශාල මුදලක් ගෙවීමට සිදු වන අතර මෙමගින් රැකියාවක් ලබා ගැනීම සඳහා අදාළ පාඨමාලාවට තවත් සාමාජිකයන් සම්බන්ධ කර දීමට ඔබට සිදු වන බව පවසයි. ඒ අනුව වටහා ගත යුත්තේ ලියාපදිංචි ගාස්තු ලෙස විශාල මුදලක් අය කිරීමත්, රැකියා ලබා ගැනීමට තවත් සාමාජිකයන් සම්බන්ධ කර දීමට සිදු වීමත් යන ක්‍රියාකාරකම් දෙකෙන් ම සිදු වන්නේ, රැකියා ලබාදෙන මුවාවෙන් පිරමිඩ යෝජනා ක්‍රමවලට මුදල් එකතු කිරීම බව යි.

ඉහත පැහැදිලි කිරීම්වලට අනුව, පුරවැසියන් මුළා කර, පිරමිඩ යෝජනා ක්‍රමවලට ආකර්ෂණය කර ගැනීම සඳහා එම යෝජනා ක්‍රම මෙහෙයවන්නන් විවිධ උපාය සහ උපක්‍රම භාවිත කරන බව පෙනී යයි. මෙහි දී මූලික වශයෙන් ම සිදුවන්නේ තොරතුරු වසන් කිරීම හෝ ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම යි. එම නිසා මෙකී උපාය පිළිබඳ ව අවබෝධයෙන් සහ අවධානයෙන් සිටීම පුරවැසියන්ගේ ප්‍රධාන වගකීමකි. එසේ වගකීමෙන් තොර ව කටයුතු නොකර මෙවැනි ව්‍යාපාරයකට සම්බන්ධ වුවහොත්, ඉතා භයානක ප්‍රතිඵල අත් විය හැකි ය. ඒවා මොනවා ද යන්න පිළිබඳ ව ලිපියෙහි මීළඟ කොටසින් සලකා බලමු.

පිරමිඩ යෝජනා ක්‍රමවල අහිතකර ප්‍රතිඵල

පුද්ගලයන් පිරමිඩ යෝජනා ක්‍රමවලින් වැළකිය යුත්තේ, එවැනි යෝජනා ක්‍රමවලට දායක වීමෙන් ඔවුන්ට හිතකර ප්‍රතිඵල අත් නොවන බැවිනි. වෙනත් අයුරකින් කිවහොත්, පිරමිඩ යෝජනා ක්‍රමවලින් ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල වළක්වා ගැනීමට නම්, ඔබ ඒවායින් වැළකී සිටිය යුතු වේ. ඔබේ අයහපතට හේතු වන පිරමිඩ යෝජනා ක්‍රමවලින් අත් විය හැකි පුද්ගලික, සාමාජයීය, සාර්ව ආර්ථිකමය හා මූල්‍ය පද්ධතිමය අහිතකර ප්‍රතිඵල පහත පරිදි පෙන්වා දිය හැකි ය.

පිරමිඩ යෝජනා ක්‍රමවලට දායකවීමෙන් පුද්ගලික ව අත් විය හැකි අහිතකර ප්‍රතිඵල

මූලික ව ම පිරමිඩ යෝජනා ක්‍රම යනු, බඳවා ගැනීම අවසන් වූ පසු බිඳ වැටෙන අස්ථාවර ව්‍යාපාර ආකෘතියකි. එම නිසා පළමුවෙන් ම පුද්ගලයකුට සිදුවන්නේ ඔහුගේ හෝ ඇයගේ මූල්‍ය වත්කම් අහිමි වීම යි. මේ හැරුණු විට පුරවැසියන් පිරමිඩ යෝජනා ක්‍රමවලට මුදල් යොදවන්නේ ණයක් ලබා ගෙන හෝ තමන්ගේ දේපළක් උකසට තබා විය හැකි ය. ඒ අනුව පිරමිඩ යෝජනා ක්‍රමය බිඳ වැටීමත් සමඟ ම ණය පැහැර හැරීමට ලක් වීම හෝ දේපළ සින්න වීම සිදු විය හැකි ය. එම නිසා පිරමිඩ යෝජනා ක්‍රමවලට දායක වීමෙන් පුද්ගලයන්ගේ ණය බර ඉහළ යෑම, නැවත ණය ලබා ගැනීමට නොහැකි වීම, තමන් තුළ මූල්‍ය අස්ථාවරත්වයක් ගොඩනැගීම ආදී අහිතකර ප්‍රතිඵලවලට මුහුණ දීමට සිදු විය හැකි ය. එමෙන් ම බොහෝදුරට පිරමිඩ යෝජනා ක්‍රමවලට සම්බන්ධ වනුයේ නෑදෑයෝ හෝ මිතුරු සමූහ වැනි සමීප සබඳතා සහිත කණ්ඩායම් ය. එවැනි තත්ත්වයක් තුළ පිරමිඩ යෝජනා ක්‍රමය බිඳ වැටීමත් සමඟ ම ඉහත සම්බන්ධතා ජාලය ම කඩා වැටීමට ලක් විය හැකි ය. ඒ අනුව තමන් පිළිබඳ ව විශ්වාසය බිඳ වැටීම, පිළිගැනීම අහිමි වීම, මානසික පීඩාවලට ලක් වීම, සමාජයෙන් කොන් වීම ආදී අහිතකර ප්‍රතිඵලවලට මුහුණ දීමට පිරමිඩ යෝජනා ක්‍රමවලට දායකවන්නන්ට සිදු විය හැකි ය. මෙහි වඩාත් ම අහිතකර ප්‍රතිඵලය වන්නේ නීතිමය ගැටලුවලට ලක් වීම හෝ දඬුවම්වලට මුහුණ දීමට සිදු වීම යි. එනම්, පිරමිඩ යෝජනා ක්‍රමවලට කුමන අයුරකින් හෝ සම්බන්ධ වීමෙන් විමර්ශන කටයුතුවලට මුහුණ දීමට මෙන් ම උසාවිය මගින්

දඬුවම් පැමිණවීමට ද ලක් විය හැකි ය. මන් ද, පිරමිඩ යෝජනා ක්‍රම යනු ශ්‍රී ලංකාවේ නීතිමය වශයෙන් තහනම් කරන ලද කටයුත්තකි. මේ අනුව පිරමිඩ යෝජනා ක්‍රමවලට දායක වන පුද්ගලයන්ට මුහුණ දීමට සිදු වන ඉහත ආකාරයේ අහිතකර ප්‍රතිඵල නිසා සෑම පුද්ගලයෙකු ම එවැනි යෝජනා ක්‍රමවලට දායක වීමෙන් වැළකී සිටීමට වග බලා ගත යුතු ය.

පිරමිඩ යෝජනා ක්‍රමවල අහිතකර සමාජ ප්‍රතිඵල

සමාජයක් තුළ පිරමිඩ යෝජනා ක්‍රම බහුල ව ව්‍යාප්ත වීමෙන් සමාජ සම්බන්ධතා අර්බුදයකට ලක් විය හැකි ය. මෙහි දී පවුල් සබඳතා බිඳ වැටීම, මිතුරු සමාජ පුපුරා යාම, එකිනෙකා අතර විශ්වාසය බිඳ වැටීම ආදී අහිතකර ප්‍රතිවිපාක රැසකට සමාජයකට මුහුණ දීමට සිදු විය හැකි ය. පිරමිඩ යෝජනා ක්‍රම බිඳ වැටෙන විට සම්බන්ධතා දාම ද බිඳ වැටේ. එකී තත්ත්වය තුළ වත්කම් අහිමි වන සමාජ පංතියක් බිහි වන අතර දිළිඳු බව ද ඉහළ යා හැකි ය. දිළිඳු බව ඉහළ යාමත් සමඟ ම සිය දිවි නසා ගැනීම් වැඩි වීම, ඝාතන වැඩි වීම, බිඳුණු පවුල් නිර්මාණය වීම හා අනෙකුත් සමාජ අපරාධ ඉහළ යෑම සිදු විය හැකි යි. සමාජයීය වශයෙන් සිදු වන මෙවැනි අහිතකර ප්‍රතිවිපාකවලින් පුරවැසියන් මුදවා ගැනීමට පිරමිඩ යෝජනා ක්‍රමවලට සම්බන්ධ වීමෙන් වැළකී සිටීමට පියවර ගැනීම සෑම පුරවැසියෙකුගේ ම අත්‍යවශ්‍ය සාමාජයීය වගකීමක් වෙයි.

පිරමිඩ යෝජනා ක්‍රම ව්‍යාප්ත වීමෙන් ඇති විය හැකි සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධතිමය අහිතකර ප්‍රතිවිපාක

පිරමිඩ යෝජනා ක්‍රමවලට පුද්ගලයන් සම්බන්ධ වන්නේ විවිධ මූල්‍ය ආයතනවලින් ණය ලබා ගෙන විය හැකි ය. එවැනි අවස්ථාවල පිරමිඩ යෝජනා ක්‍රම බිඳ වැටීමත් සමඟ ම එකී පුද්ගලයන් ණය පැහැර හැරීමට කටයුතු කළ හැකි ය. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ආයතනවල අක්‍රීය ණය ඉහළ යාම, වත්කම් හීන වීම හෝ සමහර විට මූල්‍ය ආයතන බංකොලොත් වීමට වුව ද ඉඩ ඇත. එසේ මූල්‍ය ආයතන බංකොලොත් වුවහොත්, විශ්වාසය බිඳ වැටී මූල්‍ය වෙළෙඳපොළ අස්ථාවර විය හැකි අතර එවැනි තත්ත්වයක් තුළ සමස්ත මූල්‍ය පද්ධතිය ම වුව ද බිඳ වැටීමකට ලක් විය හැකි ය. සාර්ව ආර්ථික වශයෙන් සලකා බලන විට පිරමිඩ යෝජනා ක්‍රමවලට වැඩි වශයෙන් පුද්ගලයන් සම්බන්ධ වීමෙන් ඔවුන් තුළ පවතින ලාභ අපේක්ෂා හේතු කොට ගෙන කෙටිකාලීන ව සමස්ත ඉල්ලුම ඉහළ යා හැකි අතර එමගින් කෙටි කාලීන උද්ධමනයක් ඇති විය හැකි ය. අනෙක් අතට පිරමිඩ යෝජනා ක්‍රම බිඳ වැටීමත් සමඟ ම සමස්ත ඉල්ලුම පහළ ගොස් අවධමනයක් දක්වා වුව ද ගමන් කළ හැකි ය. එවැනි තත්ත්වයක් තුළ ආයෝජකයන්ගේ විශ්වාසය බිඳ වැටී ආර්ථික වර්ධනය ද පහළ යා හැකි ය.

පුරවැසියන් පිරමිඩ යෝජනා ක්‍රමවලට සම්බන්ධ වීමෙන් රට තුළ නිෂ්ඵල හා අනීතික ආර්ථික ක්‍රියා ඉහළ යන අතර එහි ප්‍රතිඵලයක් ලෙස රැකියා වියුක්තිය ද ඉහළ යා හැකි ය. විශේෂයෙන් ම විදේශයන්හි සිට ක්‍රියාත්මක වන, විදේශ මුදල්වලින් ගෙවීමට සිදු වන පිරමිඩ යෝජනා ක්‍රම සමඟ පුරවැසියෝ සම්බන්ධ වී සිටිත් නම්, විදේශ විනිමය සඳහා අධි ඉල්ලුමක් ඇති වී එය විනිමය අනුපාතය මත ද පීඩනයක් ඇති කළ හැකි ය. මේ අනුව පැහැදිලි වන්නේ මූල්‍ය පද්ධතියෙහි මෙන් ම සාර්ව ආර්ථිකයෙහි ද සමතුලිතතාව බිඳ වැටීමට පිරමිඩ යෝජනා ක්‍රමවලට සම්බන්ධ වීම අහිතකර ලෙස බලපෑ හැකි බව යි.

19961997 කාලය තුළ පිරමිඩ යෝජනා ක්‍රම බහුල ලෙස ව්‍යාප්ත වීමෙන් ඇල්බේනියාවේ සමස්ත ආර්ථිකය මෙන් ම මූල්‍ය පද්ධතිය ද විශාල කම්පනයකට ලක් විය. විරැකියාව ඉහළ යෑම, ඝාතන සහ අපරාධ ඉහළ යෑම මෙන් ම අවසානයේ දී දේශපාලන පෙරළියක් සිදු වීම දක්වා ම එම තත්ත්වය වර්ධනය විය. එම නිසා ඉහතින් සඳහන් කළ සියලු පෞද්ගලික, සාමාජීය හා ආර්ථික අහිතකර ප්‍රතිවිපාකවලින් ශ්‍රී ලංකා රාජ්‍යයත්, පුරවැසියාත් ආරක්ෂා කිරීම සඳහා සෑම පුරවැසියෙකු ම පිරමිඩ යෝජනා ක්‍රමවලට සම්බන්ධ වීමෙන් වැළකී සිටීමට කටයුතු කළ යුතු ය.

පිරමිඩ යෝජනා ක්‍රමවලින් වැළකී සිටින්නේ කෙසේද?

මෙතෙක් පැහැදිලි කළ ආකාරයට, පුරවැසියන් පිරමිඩ යෝජනා ක්‍රමවලට යොමු වීම වැළැක්වීම, සාර්ව ආර්ථික ස්ථායීතාව හා මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වෙයි. ඒ අනුව නීති රීති පැනවීම, දැනුවත් කිරීම ආදී බොහෝ පියවර අනුගමනය කරනු ලබන්නේ පුරවැසියන් මේවාට යොමු වීම වළක්වා ගැනීම සඳහා ය. එහෙත් මෙම පිරමිඩ යෝජනා ක්‍රම ව්‍යාප්ත වීම වැළැක්වීමට නම්, පුරවැසියන් සක්‍රීය ව ඒ සඳහා දායක වීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව පළමුවෙන් ම පුරවැසියන් තම මූල්‍ය සාක්ෂරතාව ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතු ය. එහි දී ශ්‍රී ලංකා මහ බැංකුව වැනි තහවුරු කරන ලද මූලාශ්‍රවලින් තොරතුරු ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. එනම්, නිවැරදි ආදායම් උත්පාදනය හා වියදම් කළමනාකරණය පිළිබඳ ව දැනුම ලබා ගැනීම මෙන් ම පිරමිඩ යෝජනා ක්‍රම වැනි අනීතික

මූල්‍ය ව්‍යාපාරවලින් වැළකී සිටීමට අවශ්‍ය දැනුම ලබා ගැනීම ද වැදගත් වේ. ඒ අනුව තම මුදල් ආයෝජනය කිරීමේ දී ඒ පිළිබඳ ව සොයා බලා කටයුතු කිරීම, අවශ්‍ය අවස්ථාවල වෘත්තීමය උපදෙස් ලබා ගැනීම, නියාමන ආයතන විසින් නිකුත් කෙරෙන රෙගුලාසි හා නිවේදන පිළිබඳ ව නිරන්තරයෙන් අවධානයෙන් සිටීම වැදගත් වේ. විශේෂයෙන් ම පිරමිඩ යෝජනා ක්‍රමවලින් වැළකී සිටීමට මෙම ලිපියේ මුල් භාගයෙන් සාකච්ඡා කෙරුණු පිරමිඩ යෝජනා ක්‍රම මෙහෙයවන්නන් විසින් යොදා ගැනෙන විවිධාකාර කූට ව්‍යාපාර ප්‍රවර්ධන උපාය පිළිබඳ ව ද අවබෝධයෙන් සිටීම වැදගත් වේ. ඒ හැරුණු විට ඔබ දැනුවත් වීම මෙන් ම සෙස්සන් දැනුවත් කිරීම ද පිරමිඩ යෝජනා ක්‍රම සඳහා වන ඉල්ලුම පාලනය කිරීමට උපකාරී වේ. ඔබ ජනමාධ්‍යවේදියෙකු ලෙස ඔබගේ මාධ්‍ය අවකාශය ඒ සඳහා යොදා ගැනීම, පුරවැසියෙකු ලෙස සමාජ මාධ්‍ය මේ උදෙසා යොදා ගැනීම, ගුරුවරයෙකු ලෙස සිසුන් දැනුවත් කිරීම යනාදී වශයෙන් සමාජයීය වගකීමක් ඔබට ද පැවරී ඇත. මෙසේ සමස්තයක් ලෙස සමාජය ම දැනුවත් වීමෙන් පිරමිඩ යෝජනා ක්‍රමවල ව්‍යාප්තිය පාලනය කර ගැනීමට මෙන් ම ඒවායින් ඇති විය හැකි අහිතකර ප්‍රතිවිපාක වළක්වා ගැනීමට ද හැකියාව ලැබේ. මීට අමතර ව පිරමිඩ යෝජනා ක්‍රම පිළිබඳ ව තොරතුරු ලැබුණහොත් ළඟ ම ඇති පොලිස් ස්ථානයට පැමිණිලි කිරීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට පැමිණිලි කිරීම ද සිදු කළ හැකි ය. මහ බැංකුවට පැමිණිලි කිරීමේ දී 'fcrd@cbsl.lk' යන විද්‍යුත් තැපැල් ලිපිනය හෝ 'අධ්‍යක්ෂක, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01' යන ලිපිනය භාවිත කළ හැකි ය. මේ අනුව පිරමිඩ යෝජනා ක්‍රමවල ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා පුරවැසියන් ලෙස ඔබට වගකීමකින් යුතුව කටයුතු කළ හැකි ය.

සාරාංශය හා නිගමනය

පිරමිඩ යෝජනා ක්‍රමයක් යනු කුමක් ද, ඒවායේ ලක්ෂණ කවරේ ද, පිරමිඩ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය සඳහා යොදා ගැනෙන උපායමාර්ග මොනවා ද, පිරමිඩ යෝජනා ක්‍රමවලට දායක වීමෙන් මුහුණ දීමට සිදු විය හැකි අහිතකර ප්‍රතිවිපාක මොනවා ද යන්න සහ එවැනි යෝජනා ක්‍රමවලින් වැළකී සිටීමට අනුගමනය කළ යුතු පියවර මොනවා ද යන්න පිළිබඳ ව මෙම ලිපියෙහිලා දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි. එකී සියලු තොරතුරු විමර්ශනය කිරීමෙන් පිරමිඩ යෝජනා ක්‍රම පුද්ගලයාට මෙන් ම රටක සමස්ත ආර්ථිකයට ම අහිතකර ලෙස බලපාන බව නිගමනය කළ හැකි ය. එම නිසා සෑම පුරවැසියෙකු ම පිරමිඩ යෝජනා ක්‍රමවලට දායක වීමෙන් වැළකී සිටීමට ගත හැකි සෑම පියවරක් ම අනුගමනය කළ යුතු බව අවධාරණය කරමු.



මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහිලා මූල්‍ය ආයතන සතු වගකීම

කේ පී එම් ඩී ඩී සී ෆර්ඩිනැන්ඩු
ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව

පී එම් සී එස් ගුණවර්ධන
සහකාර අධ්‍යක්ෂ
මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව

1.1 හැඳින්වීම

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා වීමට මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් නිසිලෙස ආරක්ෂා වී තිබීම අත්‍යවශ්‍ය අංගයකි. එකී මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම මූල්‍ය නියාමන අධිකාරියට, මූල්‍ය සේවා සපයන්නන්ට මෙන් ම මූල්‍ය පාරිභෝගිකයන්ට ද පැවරේ. මෙම ලිපියෙන් ප්‍රධාන වශයෙන් ම සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන්නේ මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහිලා මූල්‍ය ආයතන සතු වගකීම් මොනවාද යන්න පැහැදිලි කිරීමයි. ඒ අනුව මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහිලා මූල්‍ය ආයතන වගකිව යුත්තේ මන්ද, මූල්‍ය ආයතන සතු එවැනි වගකීම් මොනවාද යන්න හා එසේ මූල්‍ය ආයතන තම වගකීම් නිසි පරිදි ඉටු කිරීමෙන් අත්විය හැකි යහපත් ප්‍රතිඵල මොනවාද යන්න පිළිබඳ ව පහත පරිදි විග්‍රහ කළ හැකි ය.

1.2 මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට මූල්‍ය ආයතන වගකිව යුත්තේ මන්ද?

මූල්‍ය පාරිභෝගිකයෙක් යනු මූල්‍ය ආයතනයක් සමඟ ගනුදෙනු කර ඇති දැනටත් ගනුදෙනු කරන හෝ ගනුදෙනු කිරීමට අපේක්ෂා කරන තැනැත්තෙක් හෝ ආයතනයක් වේ. මෙම මූල්‍ය පාරිභෝගිකයන් මූල්‍ය පද්ධතිය තුළ ප්‍රථමයෙන් ම හා නිරන්තර ව සම්මුඛ වන්නේ මූල්‍ය ආයතනවලට ය. එම නිසා මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රධාන වගකීමක් ඇත්තේ මූල්‍ය ආයතනයන්ට ය. මහ බැංකුව විසින් 2023 අංක 01 දරණ මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ රෙගුලාසි මාලාව ඉදිරිපත් කරන ලද්දේ ද මූල්‍ය ආයතන මගින් මූල්‍ය පාරිභෝගිකයන්ට වගකීම් සහගතව සේවා සැපයීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට ගෙන ය. ඒ අනුව මෙම ලිපිය තුළ දී මූල්‍ය ආයතන වශයෙන් සලකා බලනු ලබන්නේ මහ බැංකුවේ බලපත්‍රලාභී, මහ බැංකුව විසින් නියාමනයට ලක් කෙරෙන මූල්‍ය ආයතන පමණි. මෙම මූල්‍ය ආයතන ගත්විට ඒවා සංවිධානාත්මක ය. එම නිසා අසංවිධානාත්මක මූල්‍ය පාරිභෝගිකයන්ට සාපේක්ෂ ව ඔවුන් බලවත් ය. එමෙන් ම මූල්‍ය පාරිභෝගිකයන්ට සාපේක්ෂ ව කිසියම් කරුණක් පිළිබඳ විශාල තොරතුරු ප්‍රමාණයක් සහ විශේෂඥ දැනුමක් මූල්‍ය ආයතන සතු ව පවතී. එම නිසා මූල්‍ය පාරිභෝගිකයන් සමඟ සෘජු ව නිරන්තරයෙන් කටයුතු කරන පිරිසක් ලෙස මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රධාන වගකීම මූල්‍ය ආයතන සතු වේ. මීට අමතර ව මූල්‍ය නිෂ්පාදන හා සේවා සැලසුම් කරනු ලබන්නේ මූල්‍ය ආයතන විසිනි. එම නිසා එවැනි සේවා හා නිෂ්පාදන සැලසුම් කිරීමේ දී මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා වන අයුරින් ඒවා සිදු කිරීම ඔවුන්ගේ වගකීමකි. අනෙක් අතට ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ නියාමන කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරගෙන යන නමුත් සෑම හුදකලා සිද්ධියක් ම පිළිබඳ තොරතුරු මහ බැංකුවට නොලැබීමේ ඉඩකඩක් ඇත. එහෙත් තමන්ට හමුවන පාරිභෝගිකයන් මුහුණ දෙන සෑම ගැටලුවක් පිළිබඳ ව ම තොරතුරු මූල්‍ය ආයතන සතු වෙයි. මෙකී බොහෝ කරුණු හේතුවෙන් මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දී ප්‍රමුඛ වගකීමක් මූල්‍ය ආයතන ඉසිලිය යුතු ය.

1.3 මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහිලා මූල්‍ය ආයතන සතු වගකීම් මොනවාද?

මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහිලා මූල්‍ය ආයතන සතු ප්‍රධාන ම වගකීම වන්නේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි මාලාව පිළිබඳ තම සේවකයන් දැනුවත් කිරීම, පුහුණු කිරීම හා ඒවාට අදාළ ව කටයුතු කිරීමට පියවර ගැනීමයි. ඒ අනුව මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ ව තම සේවකයන්

දැනුවත් කරමින් එකී අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පහත වගකීම් මූල්‍ය ආයතන විසින් ඉටු කළ යුතු ය.

1.3.1 මූල්‍ය පාරිභෝගික ආරක්ෂණයට අදාළ ආයතනික ප්‍රතිපත්ති සම්පාදනය සහ පාලන ව්‍යුහය ස්ථාපිත කිරීම.

සෑම මූල්‍ය ආයතනයක ම අධ්‍යක්ෂ මණ්ඩලය මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද රෙගුලාසි මාලාවට යටත් ව මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කොට ක්‍රියාත්මක කළ යුතු ය. එම ප්‍රතිපත්තිය කලින් කලට යාවත්කාලීන කිරීම ද අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමකි. මීට අමතර ව එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට විශාල වගකීමක් ඇත. ආයතනයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් සේවකයන් නිසි ලෙස පුහුණු කරමින් අදාළ ඒකක සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් මෙහෙයුම් කාර්ය මණ්ඩලය ලවා මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට වගකීම් සහගත ව දායක විය යුතුය. ඒ අනුව මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දී ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සහ පාලන ව්‍යුහය ස්ථාපිත කිරීම මූල්‍ය ආයතනයක කේන්ද්‍රීය වගකීම වේ.

1.3.2 මූල්‍ය පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම.

මූල්‍ය පාරිභෝගිකයන් භාෂා, ආගම්, වයස් ප්‍රභේද ස්ත්‍රී පුරුෂ ආදී විවිධත්වයෙන් යුතු කණ්ඩායමකි. මෙකී විවිධත්වයන් නොසලකා සෑම මූල්‍ය පාරිභෝගිකයෙකුට ම සාධාරණ හා සමාන ව සැලකීම මූල්‍ය ආයතන සතු වගකීමකි. එහි දී මූල්‍ය පාරිභෝගිකයන්ගේ ආදායම් මට්ටම සහ ඔවුන්ගේ ගෙවීමේ හැකියාව පදනම් කොටගෙන මූල්‍ය නිෂ්පාදන සැලසුම් කොට වෙළඳපොළට ඉදිරිපත් කිරීම මූල්‍ය නිෂ්පාදන හා සේවා ලබා දීමේ දී කිසිදු මූල්‍ය පාරිභෝගිකයකුට වෙනස්කොට නොසැලකීම ආදිය මූල්‍ය ආයතන සාධාරණ ලෙස පාරිභෝගිකයන්ට සැලකීමේ දී අනුගමනය කළ යුතු පියවර වේ. තවද වෙළෙඳ දැන්වීම්කරණයේ දී මෙන් ම මූල්‍ය නිෂ්පාදන අළෙවි කිරීමේ දී සෑම මූල්‍ය පාරිභෝගිකයකුට ම පහසුවෙන් අවබෝධ කරගත හැකි අයුරින් මෙන් ම මූල්‍ය පාරිභෝගිකයන්ට හානි නොවන අයුරින් එම කාර්යයන් සිදු කළ යුතු ය. විශේෂයෙන් ම ණය එකතු කිරීමේ දී ණය ගැතියන් හිංසනයට පත් නොකළ යුතු අතර පිළිගත් ආචාර ධර්මයන්ට යටත් ව ණය නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. මෙහි දී විශේෂයෙන් ම සඳහන් කළ යුත්තේ සෑම මූල්‍ය පාරිභෝගිකයකුට ම තරාතිරම නොබලා මූල්‍ය සේවා සැපයීමේ වගකීමක් මූල්‍ය ආයතන සතු වන බවයි. එසේ නොකළහොත් ඇතැම් කණ්ඩායම් මූල්‍ය පද්ධතියෙන් ඉවත්වීම හා අවිධිමත් මූල්‍ය සේවා සමාජය තුළ ව්‍යාප්ත වීම සිදු විය හැකි ය. එම නිසා ආබාධිත පුද්ගලයන්, වැඩිහිටි පුද්ගලයන්, කාන්තාවන්, පුරුෂයන් ආදී සියලු සමාජ කණ්ඩායම්වලට සාධාරණ ව සැලකීම මූල්‍ය සේවා සපයන ආයතනවල අත්හළ නොහැකි වගකීමක් වශයෙන් පෙන්වා දිය හැකි ය.

1.3.3 සරල ව සහ විධිමත් ව මූල්‍ය පාරිභෝගිකයන්ට තොරතුරු සන්නිවේදනය කිරීම.

සෑම මූල්‍ය ආයතනයක් ම තම නිල වෙබ් අඩවිය මගින් හෝ තම ආයතනයට පැමිණෙන ගනුදෙනුකරුවෙකුට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් තොරතුරු ලබා දීමට බැඳී සිටියි. මෙම තොරතුරු පැහැදිලි ව හා සරල ව කාලානුරූප ව ලබා දීම ද ආයතන සතු වගකීමකි. මූල්‍ය පාරිභෝගිකයන්ට ලබා දෙන ලද තොරතුරු පිළිබඳ ව ගැටලු ඇත්නම් ඒවාට පිළිතුරු ලබා දීම, අවශ්‍ය නම් නැවත නැවත පැහැදිලි කරදීම ද මෙහිදී සිදු විය යුතු ය. ගිවිසුම්, ඉල්ලුම්පත්‍ර, ගිණුම් වාර්තා ආදී පාරිභෝගිකයන්ට අදාළ සියලු ලේඛන විද්‍යුත් හෝ මුද්‍රිත ක්‍රම ඔස්සේ ද පාරිභෝගිකයන්ට ලබා දීමට මූල්‍ය ආයතන කටයුතු කළ යුතු අතර සාමාන්‍ය පොදු ලේඛන භාවිත කළ නොහැකි දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට එම ලේඛන පහසුවෙන් පරිශීලනය කළ හැකි ආකෘති මඟින් සැපයීමට ද කටයුතු කළ යුතු ය. නිවැරදි තොරතුරු නොලැබීමෙන් පාරිභෝගිකයන් වැරදි මූල්‍ය තීරණවලට එළඹිය හැකි ය. එමගින් මූල්‍ය ආයතන සහ පාරිභෝගිකයා අතර සබඳතාව දුර්වල වීමට ද ඉඩ ඇත. එම නිසා මූල්‍ය පාරිභෝගිකයෙකුට අදාළ වන සියලු තොරතුරු කාර්යක්ෂම ව සහ ඔවුන් ඉල්ලා සිටින භාෂාවෙන් ලබා දීම මූල්‍ය ආයතනවල වගකීමක් වන අතර මෙම වගකීම මනාව ඉටු කිරීමෙන් මූල්‍ය ආයතන කෙරෙහි පාරිභෝගික විශ්වාසය සහ ආකර්ෂණය ද ඉහළ නංවා ගත හැකි ය.

1.3.4 මූල්‍ය පාරිභෝගිකයන්ගේ වත්කම් හා තොරතුරු ආරක්ෂා කිරීම.

කිසියම් මූල්‍ය පාරිභෝගිකයකු ඕනෑ ම මූල්‍ය ආයතනයක තමන්ගේ ධනය තැන්පත් කරනු ලබන්නේ එය සුරක්ෂිත ව පවතිනු ඇතැයි යන

විශ්වාසය මත ය. එමෙන් ම තැන්පත් කළ ධනය අදාළ නිෂ්පාදනයේ නියමයන් හෝ කොන්දේසිවලට යටත් ව පාරිභෝගිකයාට නැවත ලබා ගත හැකි විය යුතු ය. මින් අදහස් වන්නේ මූල්‍ය පාරිභෝගිකයන්ගේ වත්කම් සුරක්ෂිත ව තබා ගැනීමේ වගකීම මූල්‍ය ආයතන සතු වන බවයි. මෙම වගකීම නිසි ලෙස ඉටු නොකළහොත් මූල්‍ය ආයතන කෙරෙහි වන මූල්‍ය පාරිභෝගික විශ්වාසය බිඳ වැටෙන අතර එමගින් මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් කඩ වී ඔවුන් මූල්‍ය පද්ධතියෙන් ඉවත් වීම වුව ද සිදු විය හැකි ය. එම නිසා මූල්‍ය පාරිභෝගික වත්කම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති හා ක්‍රමවේද සකස් කිරීම මෙන් ම ඒවා ක්‍රියාත්මක කිරීම මූල්‍ය ආයතනවල වගකීමකි. අනෙක් අතට ගනුදෙනුකරුවන් මූල්‍ය ආයතන සමග ගනුදෙනු කරන විට ඔවුන්ගේ පෞද්ගලික දත්ත විශාල ප්‍රමාණයක් එකී ආයතනයට ලබාදීමට සිදුවේ. එම කිසිදු දත්තයක් මූල්‍ය පාරිභෝගිකයන්ගේ අවසරයෙන් තොර ව වෙනස් කිරීම හෝ වෙනත් පාර්ශ්වයක් සමග හුවමාරු කර ගැනීම සිදු නොකළ යුතු ය. විශේෂයෙන් ම දත්තවලට ප්‍රවේශ වීම සඳහා අවසර නොලත් පුද්ගලයන්ට ඉඩ ලබා නොදිය යුතු අතර රටේ වෙනත් නීතියකින් වෙනත් ආයතන වෙත දත්ත ලබාදීමට සිදු වුවහොත් පමණක් එසේ දත්ත ලබා දීමට මූල්‍ය ආයතන කටයුතු කළ යුතු ය. කිසියම් පුද්ගලයෙකු තමන්ගේ පෞද්ගලික දත්ත වැරදි බව හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට අවස්ථාව ඉල්ලා සිටියහොත් එය ඉටු කර දීම ද මූල්‍ය ආයතනවල වගකීමකි. විශේෂයෙන් ම අලෙවිකරණ හෝ වෙළෙඳ දැන්වීම් කටයුතු සඳහා මූල්‍ය පාරිභෝගිකයකුගේ අවසරයෙන් තොරව දත්ත භාවිතා නොකළ යුතු ය. ඒ අනුව මූල්‍ය පද්ධතිය තුළ විශ්වාසය ආරක්ෂා කර ගැනීම පිණිස වත්කම් හා තොරතුරු ආරක්ෂා කර ගැනීම මූල්‍ය ආයතන විසින් නොපිරිහෙලා ඉටු කළ යුතු වගකීමක් ලෙස හඳුනාගත හැකි ය.

1.3.5 පැමිණිලි හැසිරවීමේ හා සහන සැලසීමේ යාන්ත්‍රණයක් පවත්වාගෙන යෑම.

මූල්‍ය ආයතනවල කටයුතු හේතුවෙන් මූල්‍ය පාරිභෝගිකයන් අතෘප්තියට පත්වන අවස්ථා දැක ගත හැකි ය. එවැනි අවස්ථාවල ඒ පිළිබඳ ව පැමිණිලි කිරීමේ ක්‍රමවේදයක් පවත්වාගෙන යෑම සෑම මූල්‍ය ආයතනයක ම වගකීමකි. එහිදී තැපැල, විද්‍යුත් තැපැල, වෙබ් පත්‍රිකා, සමාජ මාධ්‍ය වැනි විවිධ ක්‍රම ඔස්සේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාවකින් පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසිය යුතු ය. එමෙන් ම සෑම මූල්‍ය ආයතනයක් ම නිශ්චිත කාලරාමුවක් තුළ එම මූල්‍ය පාරිභෝගික පැමිණිලිවලට අවධානය යොමු කර ඒවා නිරාකරණය කිරීමට කටයුතු කළ යුතු ය. විශේෂයෙන් ම තම මූල්‍ය ආයතනය හැර වෙනත් විකල්ප පැමිණිලි කිරීමේ ක්‍රමවේද පිළිබඳ මූල්‍ය පාරිභෝගිකයන් දැනුවත් කිරීම මූල්‍ය ආයතනවල වගකීමකි. ඒ අනුව මූල්‍ය පිළිබඳ ඔම්බුඩ්ස්මන් වරයාට පැමිණිලි කිරීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීම පිළිබඳ තොරතුරු මූල්‍ය පාරිභෝගිකයාට ලබාදිය යුතු ය.

ඉහතින් දක්වන ලද්දේ මූල්‍ය ආයතන විසින් මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඉටු කළ යුතු ප්‍රධාන වගකීම්වලින් කිහිපයකි. මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුත්තේ මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ ව දැනුවත් කිරීම ද මූල්‍ය ආයතනවල වගකීමක් බවයි. ඒ අනුව විවිධ වැඩසටහන්, පත්‍රිකා, සම්මන්ත්‍රණ මගින් මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳව පුරවැසියන් දැනුවත් කිරීමට මූල්‍ය ආයතන පියවර ගත යුතු ය.

1.4 මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අදාළ ව මූල්‍ය ආයතන තම වගකීම් නිසි ලෙස ඉටු කිරීමෙන් ලැබිය හැකි යහපත් ප්‍රතිඵල.

සෑම ආයතනයක් ම මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අදාළ වගකීම් නිසි අයුරින් ඉටු කරන්නේ නම් එම ආයතන කෙරේ පාරිභෝගික විශ්වාසය වැඩි වේ. එමෙන් ම එවැනි ආයතන කෙරෙහි පාරිභෝගික පිළිගැනීම ඉහළ යන අතර මූල්‍ය සේවා සඳහා වන ඉල්ලුම ද ඉහළ යා හැකි ය. අනෙක් අතට එවැනි වගකීම් සහගත ආයතන සමග මූල්‍ය පාරිභෝගිකයන් විසින් පවත්වාගෙන යනු ලබන සබඳතා ද ශක්තිමත් වන අතර එමගින් මූල්‍ය ආයතනවල මූල්‍ය සේවා හා මූල්‍ය නිෂ්පාදනවල අලෙවිය ද ඉහළ යයි. එවැනි තත්ත්වයක් තුළ ණය පැහැර හැරීම් හෝ අක්‍රීය ණය අනුපාතය පහළ යා හැකි ය. අවසාන වශයෙන් මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හේතු කොටගෙන මූල්‍ය ආයතන වල ලාභය ඉහළ යා හැකි ය. තව ද මෙලෙස ආයතන තම වගකීම නිසි ලෙස ඉටු කිරීමෙන් ඔවුන්ගේ නියාමන හා නීතිමය අවදානම් අඩුවන අතර ඒ සඳහා වැය කළ යුතු මානව සම්පත් හා මූල්‍ය සම්පත් අවම කර ගත හැකි ය. මූල්‍ය ආයතන විසින් මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම් නිසි ලෙස ඉටු කිරීමෙන් එම ආයතනවලට පමණක් නොව මූල්‍ය පාරිභෝගිකයන්ට මෙන් ම

නියාමන ආයතනවලට ද ප්‍රතිලාභ අත් වේ. එනම් මූල්‍ය පාරිභෝගිකයන්ට කාර්යක්ෂම ව සහ සාධාරණ ව මූල්‍ය පද්ධතියට සම්බන්ධ වීමට හැකියාව ලැබීම, පහසුවෙන් ණය ගැනීමට හෝ ආයෝජන කිරීමට හැකියාව ලැබීම, මූල්‍ය සාක්ෂරතාව වැඩි දියුණු වීම, නව ආර්ථික අවස්ථා උදා වීම ආදී ප්‍රයෝජන අත්වේ. මූල්‍ය සේවා නියාමන අධිකාරිය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට නියාමන කටයුතු පහසු වන අතර මූල්‍ය පද්ධතියේ ස්ථාවර භාවය පවත්වාගෙන යෑමට මෙන් ම තම ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාත්මක කිරීමට මූල්‍ය ආයතන විසින් තම වගකීම් මනාව ඉටු කිරීම උපකාරී වේ. මේ අනුව මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි මූල්‍ය ආයතන සතුව විශාල වගකීමක් පවතින බවත් ඔවුන් එම වගකීම් නිසි පරිදි ඉටුකිරීමෙන් ඔවුන්ට මෙන් ම මූල්‍ය පාරිභෝගිකයන්ට හා ශ්‍රී ලංකා මහ බැංකුවට ද තම කටයුතු කරගෙන යාමට මහඟු පිටුබලයක් ලැබෙන බවත් පෙන්වා දිය හැකි ය. එහෙයින් සෑම මූල්‍ය පාරිභෝගිකයෙක් ම ප්‍රථමයෙන් ම සම්මුඛ වන විධිමත් පාර්ශ්වකරුවන් ලෙස මූල්‍ය සේවා සපයන ආයතන තම වගකීම් නිසි පරිදි ඉටුකළ යුතු ය.

ඉතිරි කිරීමේ කලාව: හුදෙක් එය වියදම් කපා හැරීමකට වඩා වැඩි දෙයක් වන්නේ ඇයි?

ඩී එම් කේ බී දුනුතිලක
නියෝජ්‍ය අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව

■ හැඳින්වීම

හදිසි අවස්ථාවක ප්‍රයෝජනයට ගැනීම, අනාගත මූල්‍ය හෝ මූල්‍ය නොවන ඉලක්ක ළඟා කර ගැනීම, විශ්‍රාම ගැනීම හෝ දිගු කාලීන ආයෝජන අවස්ථා සඳහා මුදල් වෙන් කිරීම වැනි අරමුණුවලින් ඔබ්බට ගොස් පුද්ගලයෙකුගේ, සමාජයක හෝ රටක මූල්‍ය ස්ථාවරත්වය, දිගුකාලීන මූල්‍ය ආරක්ෂාව උදෙසා වන අත්‍යවශ්‍ය මෙවලමක් ලෙස ඉතුරුම් හඳුන්වා දිය හැකි ය. ඉතුරුම් පවත්වා ගැනීම තුළින් අනපේක්ෂිත වියදම් මනා ලෙස කළමනාකරණය කිරීමට සහ මූල්‍ය ආතතියෙන් තොර ව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කරගත හැකි ය. එනිසා, සමාජයේ කොයි කවුරුත්, ඉතුරුම් ඉලක්ක සහිත සැලසුමකට අනුව ඉතිරි කිරීම පුද්ගල මූල්‍ය ස්වාධීනත්වයට ඉතා වැදගත් වේ. කෙසේ වුවත්, ඉහළ යන පිරිවැය සහ ආර්ථික අවිනිශ්චිතතාවක් සහිත සමාජ, පසුබිමක ඉතිරි කිරීම පහසු කටයුත්තක් නොවේ. එසේම, ඉතුරුම් ලබා ගැනීමේ මුවාවෙන් සිදු කෙරෙන අවිධිමත් මුදල් ගනුදෙනු සහ එවැනි ගනුදෙනුවල ගොදුරු බවට පත්වන පුද්ගලයින් සහ සමාජ කොටස් ඉහළ යමින් පවතී. අවදානම ගැන නොසිතා ඉහළ පොලී අනුපාත පමණක් සැලකිල්ලට ගනිමින් පුද්ගලයින් විවිධ අවිධිමත් ආයතනවල ආයෝජනය කිරීම ප්‍රවනතාවයක් බවට පත්ව ඇති අතර ඒ හේතුවෙන් තමන්ගේ, දේපල, වත්කම් අහිමි කරගනිමින් ඒවායේ වින්දිතයන් බවට පත්වෙමින් ඇත. එවැනි කාල වකවානුවක, ඉතිරි කිරීමේ වටිනාකම අවබෝධ කර ගැනීම, අවිධිමත් ඉතුරුම් ක්‍රම මග හැර ඵලදායී ලෙස ඉතුරුම් සිදු කිරීම යනාදී කරුණු පිළිබඳ ව නිවැරදි අවබෝධයක් ලබා ගැනීම අන් කවරදාටත් වඩා වැදගත් වේ. එබැවින් ඉතුරුම් යනු කුමක්ද, ඉතුරුම්වල වැදගත්කම, ඉතුරුම් සඳහා පවතින මූලධර්ම, විවිධ ඉතුරුම් මාදිලි, ඉතුරුම් සඳහා පවතින බාධා, විනයගරුක ඉතුරුම් සැලැස්මක දිගුකාලීන ප්‍රතිලාභ පිළිබඳ ව මෙම ලිපිය මගින් සාකච්ඡා කරනු ලැබේ.

■ ඉතිරි කිරීම් යනු කුමක්ද?

ඉතිරි කිරීම්, පුද්ගල මූල්‍ය සැලසුම්කරණය සහ ජාතික ආර්ථික සංවර්ධනය යන කාර්යයන් දෙකෙහි ම තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ආර්ථික විද්‍යා න්‍යායට අනුව ඉතිරි කිරීම් යනු පරිභෝජනය සඳහා වියදම් නොකරන ආදායමේ කොටසක් වන අතර එමගින් රටක ප්‍රාග්ධන ඒකරාශිකරණය සහ ආයෝජනය ඉහළ නැංවීමට අවශ්‍ය අරමුදල් සපයනු ලැබේ. සම්භාව්‍ය ආර්ථික ආකෘතීන්ට අනුව, ආයෝජනය සහ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය අරමුදල් සපයන බැවින්, ඉතිරි කිරීම් ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වශයෙන් හඳුන්වා දී ඇත. රටක යටිතල පහසුකම් සංවර්ධනය, තාක්ෂණික දියුණුව සහ ව්‍යාපාර සංවර්ධනය සඳහා අවශ්‍ය ආයෝජන, ඉතුරුම් මගින් බිහි කර ගත හැකි ය. විධිමත් මූල්‍ය ආයතනවල තනි තනි පුද්ගලයින් වශයෙන් හෝ ආයතන වශයෙන් පවත්වා ගෙන යනු ලබන ඉතුරුම්, ණය ලබා දීමට ධනාත්මක ව බලපාන අතර එමගින් නව නිෂ්පාදන හෝ පවතින නිෂ්පාදන ඉහළ නංවා ගැනීමට අවශ්‍ය පහසුකම් සපයනු ලබයි. ඉහළ ඉතුරුම් හැම විට ම ඉහළ ආයෝජන කෙරෙහි

ධනාත්මක වන අතර එමගින් රටක ආර්ථික වර්ධනය, නිෂ්පාදන ඵලදායිතාව සහ සේවා නියුක්තිය ඉහළ මට්ටමකට ගෙන එයි. එනිසා ඕනෑ ම රටක දිගුකාලීන ඉතුරුම්, සමාජයේ යටිතල පහසුකම් සංවර්ධනය, නවෝත්පාදන සහ ස්ථාවර දිගුකාලීන ආර්ථික වර්ධනයක් සහතික කරයි.

එදිනෙදා ජීවිතයේ දී, ඉතිරි කිරීම් යනු කෙනෙකුගේ ආදායමෙන් අනාගත භාවිතය සඳහා වෙන් කරනු ලබන කොටසයි. මිනිසුන් හදිසි අවස්ථාවක ප්‍රයෝජනයට ගැනීම, අධ්‍යාපනය, නිවාස, විශ්‍රාම ගැනීම හෝ නිවසක් මිල දී ගැනීම, මෝටර් රථයක් මිලට ගැනීම හෝ ආයෝජනය කිරීම වැනි විවිධ අරමුණු සඳහා මුදල් ඉතිරි කරයි. ඉතිරි කිරීමේ පුරුද්ද හැම විට ම පුද්ගලයෙකුගේ මූල්‍ය නිදහස සඳහා හිතකර වන අතර ම මූල්‍යමය අපහසුතාවක් නිසා ගොඩනැගෙන ආතතියන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරනු ලබයි. ඉතුරුම් හැම විට ම අනපේක්ෂිත වියදම්වලට පුද්ගලයින්ගේ පෙළඹවීම සීමා කරනවා පමණක් නොව, ණය මත යැපීම ද අඩු කරයි. විනයගරුක මූල්‍ය හැසිරීම් දිරිමත් කරමින් පුද්ගලයෙකුගේ, සමාජයක නැතහොත් රටක දිගුකාලීන මූල්‍ය සැලසුම්කරණයට ඉතුරුම් ලබාදෙන දායකත්වය සුවිශේෂී වේ. එසේ ම එය අපේක්ෂිත සහ අනපේක්ෂිත යන මූල්‍ය ඉලක්ක දෙක ම සපුරා ගැනීමට පුද්ගලයින්ට අවශ්‍ය මූල්‍ය ශක්තිය ලබා දෙයි. ප්‍රමාණවත් ඉතුරුම් පවතින පුද්ගලයෙකුට, සමාජයකට හෝ රටකට ආර්ථික කම්පනයක් නිසි ලෙස කළමනාකරණය කිරීමේ හැකියාව ලැබෙන අතර එමගින් ණය මත යැපීම අඩු කිරීම සහ ස්ථාවර පරිභෝජන මට්ටමක් පවත්වා ගැනීමත් සහතික කරනු ලබයි. වඩා හොඳ අයවැයකරණයක් සහ තාර්කික වියදම් පුරුදු ප්‍රවර්ධනය කරමින් පුද්ගලයෙකුගේ, සමාජයක හෝ රටක මූල්‍ය ආරක්ෂක ජාලයක් ලෙස ඉතිරි කිරීම් ක්‍රියා කරයි.

ඉතිරි කිරීමේ දී වඩා වැදගත් වන්නේ ඉතිරිකරන මුදල නොව ඒ සඳහා පවතින පුරුද්දයි...

■ ඉතිරි කිරීම්වල වැදගත්කම

ඉතුරුම් යනු, වෙන් කරනු ලබන මුදලකට වඩා වැඩි අර්ථයක් සහිත සංකල්පයකි. පුද්ගලයෙකුගේ, සමාජයක හෝ රටක මූල්‍ය සුරක්ෂිතතාව, මූල්‍ය නිදහස සහ අනාගත අවස්ථා නිර්මාණය කිරීම සඳහා ඉතුරුම් ධනාත්මක වේ. මූල්‍ය යහපැවැත්ම කරා යන ගමනේ දී, ඉතිරි කිරීම් යනු පළමු හා වැදගත් ම පියවර වන අතර ඉතිරි කරනු ලබන මුදල කොතරම් කුඩා වුවත් ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කර ගැනීම තුළින්, ජීවිත කාලය පුරා ම ප්‍රතිලාභ ලබා ගත හැකි ය. එනිසා, ඉතිරි කිරීම යනු මූල්‍ය ස්ථාවරත්වය සහ මූල්‍ය ස්වාධීනත්වය සඳහා අඩිතාලම සකස් කරනු ලබන, සමාජයේ කොයි කවුරුත් ප්‍රගුණ කළ යුතු පුරුද්දක් වශයෙන් හඳුනාගැනේ. ඉතුරුම් සහිත පුද්ගලයෙක්, කුටුම්භයක් හෝ සමාජයක් මූල්‍යමය වශයෙන් වඩාත් සුරක්ෂිත වන අතර එකී ඉතුරුම් ඔවුන්ගේ අනාගතය වඩාත් යහපත් කරනු ඇත. ඉතුරුම්ගත ප්‍රාග්ධනයක් පවතී නම් නව ආදායම් උත්පාදන කටයුතු පහසු කරන අතර අනවශ්‍ය මූල්‍ය වගකීම්වලින් පුද්ගලයින් නිදහස් කරනු ලබයි. ඉතුරුම් ඔබගේ හදිසි අවස්ථාවක්, විශ්‍රාම ගැනීමක් හෝ පුද්ගලික මූල්‍ය ඉලක්කයක් වඩාත් පහසු කරනු ඇත. එවැනි වැදගත්කම් කිහිපයක් මෙහි දී ඉතා කෙටියෙන් සාකච්ඡා කරනු ලැබේ.

මූල්‍ය ආරක්ෂාව සහතික කිරීම

රැකියා අහිමි වීම, හදිසි වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍යතා, අධ්‍යාපනික අවශ්‍යතා හෝ නිවාස අලුත්වැඩියා වැනි අනපේක්ෂිත සිදුවීම්වල දී ඉතිරි කිරීම් කෙනෙකුගේ ජීවිතය වඩාත් පහසු කරනු ඇත. ඉතුරුම් සංචිතයක් පවත්වාගෙන යෑම තුළින් ණය ලබාගැනීමකින් තොරව හෝ ඔවුන්ගේ සුපුරුදු ජීවන රටාවට හානියක් නොකර මූල්‍යමය වශයෙන් පවතින අර්බුද කළමනාකරණය කළ හැකි ය. එය මූල්‍යමය වශයෙන් ආරක්ෂාව පිළිබඳ හැඟීමක් ලබා දෙන අතර දුෂ්කර කාලවල දී ස්ථාවරත්වය පවත්වා ගැනීමට උපකාරී වේ.

මූල්‍ය සහ මූල්‍ය නොවන ඉලක්ක සපුරා ගැනීම

ණය මත පමණක් රඳා පැවතීමකින් තොර ව මෝටර් රථයක් මිලදී ගැනීම, නිවසක් හිමිකර ගැනීම හෝ උසස් අධ්‍යාපනය හැදෑරීම, නව ආයෝජනයක් ආරම්භ කිරීම දක්වා වන ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතිරි කිරීම් සහාය වනු ඇත. අඛණ්ඩ ව ඉතුරුම් පවත්වා ගෙන යෑම තුළින්, පුද්ගලයන්ට සැලසුම් සහගත ව හා ආතතියෙන් තොර ව තම මූල්‍ය හෝ මූල්‍ය නොවන ඉලක්ක කරා ඉතා පහසුවෙන් ළඟා විය හැකිය.

විශ්‍රාම සැලසුම් කිරීම

විශ්‍රාම සැලසුමක් සකස් කිරීමේ දී ඉතිරිකිරීම් වඩාත් තීරණාත්මක සාධකයක් වේ. යම් පුද්ගලයෙකුට එදිනෙදා ජීවිතයේ දී ලැබෙන වැටුප් හෝ ආදායම්

නොමැති ව ගියහොත්, ඉතිරි කිරීම් සහ ආයෝජන ඔහුගේ/ඇයගේ ජීවිතය පවත්වා ගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය බවට පත් වේ. විශ්‍රාම ගැනීමට පෙර සිට ම ඉතිරි කිරීම ආරම්භ කළහොත්, ඔවුන්ගේ පසුකාලීන ජීවිතය වඩාත් සුවපහසු ව සහ ස්වාධීන ව ගත කළ හැකි ය.

ණය වළක්වා ගැනීම

යම්කිසි පුද්ගලයෙකු ඉතුරුම් කිරීම් පවත්වාගෙන යනු ලබන්නේ නම්, ණය කාඩ්පත්, ණය හෝ අන් අයගෙන් ණයට ගැනීම මත යැපීමේ අවශ්‍යතාව අඩු වේ. මෙය ඉහළ පොලී ගෙවීම් සහ මූල්‍ය පීඩනය වළක්වා ගැනීමට උපකාරී වන අතර ඉතිරි කිරීම මගින් ඔබට අවශ්‍ය දේ සඳහා රිසි පරිදි මුදල් යොදවා ඔබේ ආදායමට අනුව ජීවත් වීමට ඉඩ සලසයි.

මානසික නිදහස සහතික කිරීම

ඉතුරුම් හැම විට ම මානසික නිදහස පවත්වා ගැනීමට හේතු වේ. අනපේක්ෂිත වියදම් සඳහා ඔබ සූදානම් බව ඔබට හැඟෙන නිසා එමගින් මූල්‍යමය අපහසුතාවක් නිසා ඇතිවන ආතතිය අඩු කරනු ලැබේ. මෙකී මානසික සුවය, ඉතිරි කිරීමේ දී බොහෝ විට නොසලකා හරින ලද ප්‍රතිලාභයකි. නමුත් එය ජීවිතයේ සමස්ත යහපැවැත්ම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරයි.

ආයෝජන සඳහා අවස්ථාව

ඉතුරුම් සහිත පුද්ගලයෙකුට ආයෝජන අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ලබා ගත හැකි ය. ව්‍යාපාරයක් ආරම්භ කිරීම, වැඩි දියුණු කිරීම, දේපළ මිල දී ගැනීම හෝ කොටස්වල ආයෝජනය කිරීම වැනි ආයෝජන අවස්ථා සඳහා ඉතුරුම්ගත අරමුදල් යෙදවිය හැකි ය. එවැනි ආයෝජන පුද්ගලයෙකුගේ දිගුකාලීන මූල්‍ය සුරක්ෂිතතාව සහතික කරනු ලබයි.

මූල්‍ය විනය ගොඩනැගීම

නිතිපතා ඉතිරි කිරීම මගින් අයවැයකරණය, සැලසුම් කිරීම සහ වියදම් කළමණාකරණය වැනි හොඳ මූල්‍ය පුරුදු දිරිමත් කරන අතර ජීවිතයේ සෑම අදියරයක දී ම ඉවසීම, වගකීම සහ ප්‍රමුඛතා සැකසීමේ වැදගත්කම මැනවින් කියා දෙයි.

■ ඉතුරුම් මාදිලි

පුද්ගලයෙකුගේ ආදායම් මට්ටම, පවතින මූල්‍ය ඉලක්ක, මුදල් අවශ්‍ය කාල රාමුව සහ අවදානම් දරා ගැනීමට පවතින හැකියාව වැනි සාධක අනුව විවිධ ආකාරවලින් ඉතුරුම් පවත්වාගෙන යා හැකි ය. පුද්ගලයෙකුට සාම්ප්‍රදායික ඉතුරුම් ක්‍රමයක හෝ නවීන ඉතුරුම් ක්‍රමයක මුදල් යෙදවිය හැකි අතර විවිධ ඉතුරුම් ක්‍රමවල මිශ්‍රණයක් පවත්වා ගෙන යෑමෙන් මුදල්වල ආරක්ෂාව, ද්‍රවශීලතාව සහතික කරගනිමින් සමතුලිත බවක් ගොඩනගා ගත හැකි ය. ඉතිරිකිරීමේ වඩාත් පොදු සහ ප්‍රායෝගික ක්‍රම කිහිපයක් පහත දැක්වේ

ඉතුරුම් ගිණුම

මුදල්වල ආරක්ෂාව, මුදල් සඳහා පහසු ප්‍රවේශය, කෙටි කාලින මූල්‍ය ඉලක්ක, හදිසි මුදල් අවශ්‍යතා සඳහා හෝ කෙටි කාලීන ව පොළියක් ලබා ගැනීමේ අරමුණින් විධිමත් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ඉතුරුම් ගිණුමක් පවත්වා ගෙන යා හැකි ය. ඉතිරි කිරීමේ වඩාත් මූලික සහ බහුලව භාවිතා වන ක්‍රමය ලෙස මෙය හඳුන්වා දිය හැකි ය.

ස්ථාවර තැන්පතු (FDs)

ස්ථාවර තැන්පතු යනු කලින් තීරණය කළ පොලී අනුපාතිකයකට ස්ථාවර කාලයක් සඳහා එකවර මුදලක් තැන්පත් කිරීම යි. ඉතුරුම් ගිණුම්වලට වඩා ඉහළ ප්‍රතිලාභයක් ලැබෙන අතර, සහතික කළ ප්‍රතිලාභ සඳහා ඇති කැමැත්ත ඇති ව සීමිත ද්‍රවශීලතා පහසුවක් සහිත ව නිශ්චිත කාලසීමාවක් සඳහා මුදල් තැන්පත් කිරීම මෙහි දී සිදු වේ.

පුනරාවර්තන තැන්පතු (RDs)

මෙය ස්ථාවර අදායම් ඇති පුද්ගලයින් සඳහා වඩාත් සුදුසු ඉතුරුම් ක්‍රමයක් වන අතර පුනරාවර්තන තැන්පතුවල දී, නිශ්චිත කාලයක් සඳහා සෑම මසක ම ස්ථාවර මුදලක් ඉතිරි කරනු ලබයි. සැලසුම්ගත ව මාසික ඉතුරුම් පවත්වා ගෙන යෑමට කැමති පුද්ගලයින්ට කෙටි කාලීන හෝ මධ්‍ය කාලීන වශයෙන් පවතින මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමේ දී මෙම ඉතුරුම් මාදිලිය වැදගත් වේ.

ආයෝජන පාදක ඉතුරුම්

ඇතැම් පුද්ගලයින් තම ඉතුරුම් වර්ධනය කර ගැනීම සඳහා අන්‍යෝන්‍ය අරමුදල් (විවිධාංගීකරණය වූ සහ වෘත්තීයමය වශයෙන් කළමනාකරණය කරන ලද අරමුදල්), කොටස් සහ බැඳුම්කර සහ දේපළ වෙළෙඳාම් වැනි සාම්ප්‍රදායික නොවන ආයෝජන ක්‍රමවල අරමුදල් යොදවනු ලැබේ. මෙකී ආයෝජන ක්‍රම කාලයත් සමග සාම්ප්‍රදායික ඉතුරුම්වලට වඩා හොඳ ප්‍රතිලාභ ලබා දේ.

ඩිජිටල් ඉතුරුම් මෙවලම් සහ යෙදුම්

තාක්ෂණයත් සමඟ, බොහෝ දෙනෙක් ඉතුරුම් පවත්වාගෙන යෑම සඳහා ජංගම යෙදුම් සහ ෆින්ටෙක් වැනි ක්‍රම යොදා ගනී. මෙවැනි මෙවලම් සමග ගනුදෙනු කිරීම වඩාත් පහසු වීම නිසා තරුණ පරම්පරාව අතර මෙවැනි ක්‍රම ජනප්‍රිය වෙමින් පවතී. ස්වයංක්‍රීය ඉතුරුම් ක්‍රමයක් වශයෙන් ද ක්‍රියාත්මක වන අතර ඉලක්ක මත පදනම් වූ ඉතුරුම් සැලසුම් මෙවැනි ක්‍රම ඔස්සේ පවත්වාගෙන යා හැකි ය.

රන් සහ වටිනා ලෝහ

බොහෝ සමාජවල, රත්තරන් මිල දී ගැනීම සාම්ප්‍රදායික ඉතිරි කිරීමේ ක්‍රමයක් ලෙස සැලකේ. මුදල් තරම් ද්‍රවශීලී නොවූවත්, උද්ධමනකාරී අවස්ථාවක මුදලේ වටිනාකම ආරක්ෂා කර ගැනීමත් විශේෂයෙන් ආර්ථික පසුබෑම් අතරතුර වටිනාකම් ආරක්ෂා කර ගැනීමේ මාදිලියක් වශයෙන් ද යොදා ගනී.

රජයේ ඉතුරුම් යෝජනා ක්‍රම

බොහෝ රජයන් ආකර්ශනීය පොලී අනුපාතික සහ බදු ප්‍රතිලාභ සහිත යෝජනා ක්‍රම ඉදිරිපත් කරයි, එනම්; ජාතික ඉතුරුම් සහතික, මහජන අර්ථසාධක අරමුදල්, ඉතුරුම් බැඳුම්කර යනාදිය මෙවැනි ඉතුරුම් සඳහා උදාහරණ ලෙස දැක්විය හැකි ය.

විශ්‍රාම වැටුප් අරමුදල් / විශ්‍රාම ගිණුම්

විශ්‍රාම ගැනීමෙන් පසු මූල්‍යමය සහාය අපේක්ෂාවෙන් පවත්වා ගෙන යනු ලබන දිගු කාලීන ඉතුරුම් ක්‍රම මෙහි දී සලකා බැලේ. සේවක භාරකාර අරමුදල, සේවක අර්ථසාධක අරමුදල වැනි ආයෝජන ක්‍රම මෙම ඉතුරුම් මාදිලිය යටතේ සලකා බලයි.

■ ඉතුරුම් ආරම්භ කරන්නේ කෙසේද?

ඉතිරි කිරීම වඩාත් පහසු කටයුත්තක් නොවේ. ඒ සඳහා කැමැත්තක් මෙන් ම පුරුද්දක් තිබිය යුතු ය. පුද්ගලයෙකුට, ඔහු විසින් ම තීරණය කළ මුදලක් නිශ්චිත කාලපරාසයක් සහිත ව විධිමත් මූල්‍ය ආයතනයක දිගුකාලීන ව තැන්පත් කිරීමෙන් සැලකිය යුතු මුදලක් ගොඩනගා ගැනීමට හැකියාව ලැබේ. ඒ සඳහා අනුගමනය කළ යුතු මූලික පියවර කිහිපයකි. එනම්,

අදායම්, වියදම් තක්සේරු කිරීම

පුද්ගලයෙකු මුලින් ම කළ යුත්තේ, තමන්ගේ අදායම්, වියදම් පිළිබඳ ව නිවැරදි තක්සේරුවක් සිදු කිරීම යි. ඔහුගේ වර්තමාන අදායම, වියදම, දැනට පවතින ඉතුරුම් ප්‍රමාණය, ණය ප්‍රමාණය පිළිබඳ ව මෙහි දී සලකා බැලිය යුතු ය. මුදල් වියදම් වන්නේ කුමන කටයුතු සඳහා දැයි නිරන්තර විමසිලිමත් බවකින් සිටිය යුතු ය. අනවශ්‍ය වියදම් මග හැර වියදම් අඩු කිරීම හෝ වියදම් කැප කිරීම මගින් ඉතුරුම් සඳහා ධනාත්මක ප්‍රවේශයක් ලබා ගත හැකි ය.

ඉතුරුම් ඉලක්ක සකස් කිරීම

අනෙක් වැදගත් පියවර වන්නේ ඉතුරුම් සඳහා වන ඉලක්ක සකස් කර ගැනීම යි. ඔබ ඉතිරි කරන්නේ කුමක් සඳහා ද? සහ නැවත මුදල් අවශ්‍ය වන කාලසීමාව, අවශ්‍ය මුදල් ප්‍රමාණය යනා දී කරුණු පිළිබඳ ව මනා අවබෝධයකින් කටයුතු කළ යුතු ය. කෙටි කාලින, මැදි කාලීන හා දිගු කාලීන වශයෙන් ඉතුරුම් ඉලක්ක සකස් කිරීම මගින් විධිමත් ඉතුරුම් සැලැස්මක් ගොඩනගා ගත හැකි ය. එය කෙටි කාලීන ව හදිසි අවස්ථාවක් සඳහා අරමුදලක්, මැදි කාලීන ව මෝටර් රථයක් මිලට ගැනීම හෝ නිවසක් ඉදි කිරීම දිගු කාලීන ව අයෝජනයක් කිරීම වැනි අරමුණු සඳහා එය භාවිත වේ.

ඉතුරුම් සැලැස්මක් සකස් කිරීම

ඉතුරුම් ඉලක්ක වෙත ළඟා වීම සඳහා සුදුසු සැලැස්මක් සකස් කිරීම මෙහි දී සලකා බැලේ. කාලරාමු සහිත ඉතුරුම් ඉලක්ක හැම විට ම ඉතිරි කිරීම වඩාත් අභිප්‍රේරණය කරන අතර ගණනය කිරීමේ පහසුව ඇති කරනු ලැබේ. එසේ සකස් කර ගත් සැලැස්මකට අනුව ආයාසයකින් තොර ව ඔබට හැකි කාලපරාසයක් සහිත ව ඔබගේ මුදල් ඉතිරි කිරීම මගින් බලාපොරොත්තු වන ඉතුරුම් ඉලක්කවලට ඉතා පහසුවෙන් ළඟා විය හැකි ය.

සමාලෝචනය කිරීම සහ ඉතුරුම් ඉලක්ක නැවත සකස් කිරීම

ඔබේ ඉතුරුම් ඉලක්ක කාලානුරූප ව සමාලෝචනය කිරීමෙන් වෙනස් වන ආදායම සහ වියදම් අනුව නැවත සකස් කර ගැනීමේ හැකියාව පවතී. ඒ අනුව අවම වශයෙන් සෑම මාස 6කට වරක්වත් ඔබේ ඉතුරුම් සැලැස්ම සමාලෝචනය කර ඒ අනුව නැවත සකස් කිරීම වැදගත් වේ.

■ ඉතුරුම් සඳහා පවතින පොදු නීති

ඉතිරි කිරීම යනු හුදෙක් මුදල් වෙන් කිරීමට වඩා වැඩි අර්ථයක් සහිත, දිගුකාලීන මූල්‍ය ආරක්ෂාව සහ මානසික නිදහසට මඟ පාදන සමාජයේ කොයි කවුරුත් ප්‍රගුණ කළ යුතු පුරුද්දක් වශයෙන් හඳුන්වා

දිය හැකි ය. වඩාත් සරල නමුත් ඵලදායී නීති කිහිපයක් අනුගමනය කිරීමෙන්, ඕනෑ ම කෙනෙකුට වඩාත් හොඳින් තම මූල්‍ය පාලනය ලබා ගත හැකි අතර මූල්‍ය ආතතිය අඩු කර ගැනීමෙන් අනාගතය මූල්‍යමය වශයෙන් වඩාත් සුරක්ෂිත කරගත හැකි ය. ඔබේ ඉතිරි කිරීමේ පුරුද්ද පහසු කරන මූලික නීති කිහිපයක් මෙහි දක්වා ඇත. එනම්,

මුලින් ඉතිරි කරන්න, පසුව වියදම් කරන්න

අනෙකුත් වියදම් සිදු කිරීමට පෙර ඔබේ ආදායමෙන් කොටසක් සැමවිට ම ඉතුරුම් සඳහා වෙන් කිරීම ඉතුරුම් සඳහා වන මූලික පදනම වේ. එසේ කිරීමෙන් ඉතිරි කිරීම පුරුද්දක් බවට පත් කරගත හැකි අතර තවදුරටත් සිතුවිල්ලක් පමණක් නොවී ප්‍රයෝගික ව අනාගත සිහින සැබෑ කරගත හැකි මාර්ගය සකස් කරගත හැකි ය.

වඩාත් ප්‍රචලිත 50/30/20 නීතිය අනුගමනය කරන්න

ඔබගේ අදායම කොටස් තුනකට වෙන් කර, අදායමින් 50%ක් ආහාර, නිවාස, ඇඳුම්, අධ්‍යාපනය, වැනි මූලික අවශ්‍යතා සඳහා ද 30%ක් විනෝදාස්වාදය, විලාසිතා, ඉහළ මිල ගණන් සහිත වුවමනා සඳහා ද ඉතිරි 20%ක කොටස ඉතිරි කිරීම් සහ ණය ආපසු ගෙවීම සඳහා වෙන් කිරීම මගින් මුදල් පාලනය විධිමත් කර ගැනීමෙන් නිශ්චිත ඉතිරි කිරීමක් සඳහා ප්‍රවේශ විය හැකි ය.

හදිසි අරමුදලක් ගොඩනගන්න

එදිනෙදා ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන අනපේක්ෂිත තත්ත්ව හැසිරවීම සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි ගිණුමක අවම වශයෙන් මාස කිහිපයක ජීවන වියදම් පියවා සඳහා අරමුදලක් පවත්වාගෙන යෑම වැදගත් වේ. අවම වශයෙන් මාස 3ක වියදම් පියවා ගැනීම සඳහා ගිණුමක යම් ඉතුරුම් ප්‍රමාණයක් පවත්වා ගැනීම මෙහි දී බලාපොරොත්තු වේ.

අදායමට වඩා අඩුවෙන් වියදම් කරන්න

ඔබේ ආදායමට ගැළපෙන වියදම් රටාවක් අනුගමනය කිරීමෙන් හෝ අදායමට වඩා අඩුවෙන් වියදම් කිරීමෙන් ඉතුරුම් සඳහා වැඩි ඉඩකඩක් සකස් කරගත හැකි ය. ඔබේ අදායම වැඩි වන විටක වුව ද ඔබේ ජීවන රටාව ඉතා ඉක්මනින් වැඩිදියුණු කිරීමට උනන්දු නොවී ඒ වෙනුවට, පළමු ව ඔබේ ඉතුරුම් අනුපාතය වැඩි කරන්න.

කලින් ආරම්භ කරන්න, නිතිපතා ඉතිරි කරන්න

ඉතා කුඩා මුදලකින් හෝ හැකි ඉක්මනින් ඔබ ඉතුරුම් ආරම්භ කළහොත් කාලයත් සමග ඔබේ ඉතුරුම් මුදල් වැඩි කරගත හැකි ය. එනිසා නොපමා ව ඉතිරි කිරීම ආරම්භ කිරීම හා අඛණ්ඩ ව පවත්වාගෙන යෑම අනාගත මූල්‍ය අවශ්‍යතා සඳහා ධනාත්මක හුරු කිරීමක් විය හැකි ය.

අනවශ්‍ය වියදම් කපා හරින්න

ඔබේ වියදම් හැම විට ම නිරීක්ෂණය කර අනවශ්‍ය වියදම් කපා හැර නාස්තිය අඩු කර ගැනීමෙන් ඉතුරුම් වැඩි කරගත හැකි ය. හදිසි මිල දී ගැනීම්, හැඟීම්බර වියදම් හෝ සමාජ තත්ත්ව තරගකාරිත්වය නිසා කරනු ලබන මිල දී ගැනීම් අවම කරගැනීම මගින් අනවශ්‍ය වියදම් අඩු කරගත හැකි ය. හැම විට ම වුවමනා සහ අවශ්‍යතා අතර වෙනස හඳුනා ගෙන මුලින් අවශ්‍යතා ද පසුව වුවමනා ද සපුරා ගැනීමට උත්සහ කිරීම වඩා වැදගත් වේ.

ඔබේ ඉතුරුම් විවිධාංගීකරණය කරන්න

ඔබේ සියලු ඉතුරුම් එක් ආයතනයකට හෝ එක් ඉතුරුම් මාදිලියකට සීමා නොකර විවිධාංගීකරණය කිරීමෙන් අවදානම අඩුකර ගැනීමේ හැකියාව පවතී. ඒ නිසා හැම විට ම බැංකු ගිණුම්, ස්ථාවර තැන්පතු, විශ්‍රාම සැලසුම්, රජයේ යෝජනා ක්‍රම, අන්‍යෝන්‍ය අරමුදල් වැනි ප්‍රභවයන් තුළ ඉතුරුම් පවත්වාගෙන යෑම වඩාත් සුදුසු වේ.

සැලසුම් නොකළ ණයෙන් වළකින්න

ණය ඔබේ අනාගත ඉතුරුම් ඉලක්ක අපහසු කරන බැවින් අත්‍යවශ්‍ය නොවන වියදම් සඳහා ණය ගැනීමෙන් වැළකීම වැදගත් වේ. අනාගත ඉතුරුම් උපාය මාර්ගයේ කොටසක් ලෙස දැනට පවතින ණය ගෙවා දැමීම අත්‍යවශ්‍ය කරුණක් වන අතර යම් ණය මුදලක් ඉල්ලුම් කරන්නේ නම් තමන්ට වඩාත් වාසිදායක විධිමත් මූල්‍ය ආයතනයකින් ලබා ගැනීම වඩාත් වැදගත් වේ

■ ඉතුරුම් සඳහා පවතින බාධා

යම් පුද්ගලයෙකුට ඉතිරි කිරීම සඳහා කැමැත්තක් පුරුද්දක් පැවතිය ද ඒ සඳහා පවතින බාධා පිළිබඳ ව ද සලකා බැලීම වැදගත් වේ. විශේෂයෙන්,

1) අඩු හෝ අක්‍රමවත් ආදායමක් පැවතීම

එහි දී යම් පුද්ගලයෙකු උපයන ආදායමෙන් තම මූලික

අවශ්‍යතා, අනිවාර්ය වියදම් වැනි දෑ සිදු කළ පසු ඔහුට/ඇයට ඉතිරි කිරීමට තරම් ප්‍රමාණවත් මුදලක් ඉතිරි නොවිය හැකි ය.

2) අනපේක්ෂිත වියදම් ඉහළ යෑම

යම් පුද්ගලයෙකු සතු ව හදිසි අරමුදලක් නොමැති වීම නිසා අනපේක්ෂිත ව සිදුවිය හැකි වියදම් එනම් හදිසි වෛද්‍ය බිල්පත්, මෝටර් රථ අලුත්වැඩියාව හෝ රැකියාව අහිමි වීම වැනි හදිසි තත්ත්ව හේතුවෙන් ඉතිරි කිරීම් සඳහා බාධා ඇතිවිය හැකි ය.

3) මනෝවිද්‍යාත්ම සහ චර්යාත්මක සාධක

දිගු කාලීන ව ලබාගත හැකි ප්‍රතිලාභ පිළිබඳ ව කල්පනාකාරී නොවී ක්ෂණික ව ලැබිය හැකි වාසි පිළිබඳ ව පමණක් සිතා කටයුතු කිරීම තුළින් හෝ ඉතිරි කිරීම් සඳහා පැහැදිලි ඉලක්ක හෝ දිරිගැන්වීම් නොමැති ව කටයුතු කිරීම හේතුවෙන් ඉතිරි කිරීම් සඳහා බාධා ඇති වේ.

4) ඉහළ ජීවන වියදමක් පැවතීම

තම ආදායමට වඩා නිවාස, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, ආහාර වැනි පරිභෝජන වියදම් වෙනුවෙන් ඉහළ වියදමක් දැරීමට සිදුවීම ද ඉතුරුම් පවත්වාගෙන යෑම සඳහා බාධාවකි.

5) මූල්‍ය ප්‍රවේශයක් නොමැතිකම

ඉතුරුම් සඳහා පවතින තවත් බාධාවක් ලෙස මූල්‍ය ප්‍රවේශය සඳහා ඇති ඉඩ ප්‍රස්ථා නොමැතිකම දැක්විය හැකි ය. විධිමත් මූල්‍ය ආයතනයක් ආසන්නව නොතිබීම, විශේෂයෙන් ඉතුරුම් ගිණුමක් නොමැතිකම, ඉතිරි කිරීමේ උපකරණ පිළිබඳ ව ඇති අඩු දැනුවත්භාවය මෙහිදී සලකා බැලේ.

6) ජීවන රටාව තුළින් ඇතිවන උද්ධමනය

මිනිසුන්ගේ ආදායමත් සමග වියදම වැඩි වේ. මන්ද මිනිසුන්ගේ ආදායම වැඩිවන විට ඔවුන් සුඛෝපභෝගී ජීවන රටාවකට යොමුවීමත් සමග ඔවුන් තම ජීවන රටාව වැඩි දියුණු කරගනු ලබයි. එවිට ඉතිරි කිරීම් සඳහා ප්‍රමාණවත් අරමුදල් ඉතිරි නොවීම ඉතිරි කිරීම් සඳහා බාධාවකි.

7) මූල්‍ය සාක්ෂරතාවක් නොමැති වීම

මුදල් හැසිරවීම පිළිබඳ ව පුද්ගලයෙකු සතු දැනුම සහ කුසලතාව මූල්‍ය සාක්ෂරතාව වේ. එබැවින් මුදල් ඉපැයීම, මුදල් වියදම් කිරීම, මුදල් ඉතිරි කිරීම සහ මුදල් ආයෝජනය පිළිබඳ නිසි දැනුමක් පුද්ගලයෙකුට නොමැති වීම ඉතිරි කිරීම සඳහා බාධාවකි.

8) අධික ණය බැඳීම්

යම් පුද්ගලයෙකු අධික ලෙස ණය බරින් පීඩිත ව ඇත්නම් ඔහුට/ඇයට තම ණය, පොලිය සමග අඛණ්ඩ ව ගෙවීමට සිදු වේ. විශේෂයෙන් ණය පත්, අධික පොලී සහිත ණය ගැනීම් ආදිය සඳහා තම ආදායමෙන් අධික මුදල් ප්‍රමාණයක් ගෙවීමට සිදුවීම ද ඉතුරුම් සඳහා බාධාවකි.

■ ඔබේ ඉතුරුම් පවත්වා ගෙන යා යුත්තේ කුමන ආයතනයකද?

අවදානම ගැන නොසිතා ඉහළ පොලී ප්‍රතිලාභ ගැන පමණක් සැලකිල්ලට ගනිමින් විවිධ ආයතනවල ඉතුරුම් පවත්වාගෙන යෑමේ ප්‍රවණතාවක් සමාජයේ දක්නට ලැබෙන අතර ඒ හේතුවෙන් ඔවුන් ඉතා මහන්සියෙන් හරි හම්බ කරගත් මුදල් නැති කරගන්නා අවස්ථා සුලබ වෙමින් පවතී. ඒ නිසා ඔබේ ඉතුරුම් වඩාත් සුරක්ෂිත ව පවත්වා ගැනීමට වඩාත් සුදුසු ආයතනයක් තෝරාගැනීම ඔබගේ මුදල්වල ආරක්ෂාවට ඉතාමත් වැදගත් වේ.

පළමු ව, ඔබ තෝරාගන්නා මූල්‍ය ආයතනය විධිමත් නියාමනයක් සහිත ආයතනයක් ද යන්න විමසා බැලිය යුතු ය. ඔබ තෝරාගන්නා ආයතනය විශේෂයෙන් ම ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ වෙනත් රජයේ වගකීමක් සහිත ආයතනයක අධීක්ෂණයක් සහිත ව පවත්වා ගෙන යනු ලබන ආයතනයක් ද සහ ඔබගේ ඉතුරුම් සඳහා විධිමත් ආරක්ෂණයක් සහිතදැයි පරීක්ෂා කිරීම වඩාත් වැදගත් වේ. උදාහරණයක් වශයෙන් දැනටමත් ඔබගේ ඉතුරුම් පවත්වාගෙන යනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කෙරෙන ආයතනයක නම් තැන්පතු රක්ෂණ ක්‍රමයක ආවරණය හිමි වේ. යම්කිසි මූල්‍ය ආයතනය ගැටලුකාරී තත්වයක් ඇති වුවහොත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය මගින් එක් තැන්පතුවක් සඳහා රුපියල් ලක්ෂ 11ක රක්ෂණාවරණයක් හිමි වේ.

ඔබගේ ඉතුරුම් සඳහා ඉහළ පොලි අනුපාතික ලබා දීම යහපත් වුවත් ඉතුරුම් මුදල් ආපසු ලබා ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වඩාත් වැදගත් වේ. විශේෂයෙන් ම විධිමත් මූල්‍ය ආයතනවලට සාපේක්ෂ ව වෙනත් අවිධිමත් ආයතන ඉතුරුම් සඳහා ඉහළ පොලී අනුපාතික ලබා දීමට කටයුතු කරයි. එකී ආයතන මාසික ව එවැනි ආකාරයක ඉහළ පොලියක්

ලබා දීමට කටයුතු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව විමසීම මෙහි දී වඩාත් වැදගත් වේ. ඔබ පවත්වාගෙන යන ඉතුරුම් සඳහා ලබාදෙන පොලී අනුපාතිකය වැදගත් සාධකයක් වුව ද එසේ විමසීමෙන් ඔබට ලැබෙන පොලී මුදල කෙසේ වේ දැයි ඔබගේ මුදල්වල ආරක්ෂාව පිළිබඳ සහතිකයක් ලබා ගත හැකි වේ. එම නිසා ඉහළ පොලී අනුපාතික ලබා දෙන ආයතන පිළිබඳ ව වඩාත් සුපරික්ෂාකාරි ව කටයුතු කිරීම වැදගත් වන අතර එය ඔබේ ඉතුරුම් වඩාත් ආරක්ෂා කරනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ නිසි අවසරයකින් තොර ව පුද්ගලයෙකුට හෝ ආයතනයකට කිසිදු ආකාරයක තැන්පතුවක් භාර ගැනීමට නොහැකි අතර එය දඬුවම් ලැබිය හැකි වරදකි.

අදාළ මූල්‍ය ආයතනය විසින් ඔබට ලබාදෙනු ලබන ගනුදෙනු පහසුකම් සහ පාරිභෝගික සේවය පිළිබඳව ද අවධානය යොමු කළ යුතු ය. වඩාත් පහසුවෙන් ළඟා විය හැකි කාර්යක්ෂම, ඉහළ ගුණාත්මක පාරිභෝගික සේවාවක් සපයන ආයතනයක් තෝරා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. විශේෂයෙන් ම, මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ පහසුකම්, අන්තර්ජාල බැංකු පහසුකම්, දුරකථන යෙදවුම් මගින් කරනු ලබන ගනුදෙනු, සහ ව්‍යාජ ගනුදෙනුවල දී ලබාදෙන ආරක්ෂාව මෙන් ම අනෙකුත් ගනුදෙනු සේවා සඳහා පවතින අවස්ථා ද සලකා බැලීම කළ යුතු ය.

■ සමාලෝචනය

ඉතුරුම් සහිත සමාජයක්, රටක් හැමවිට ම මූල්‍යමය වශයෙන් වඩාත් සුරක්ෂිත වන අතර සතුටුදායක අනාගතයකට හිමිකම් කියනු ඇත. ඉලක්කගත සැලසුමකට අනුව ඉතිරි කිරීමෙන් දිගුකාලීන ව බොහෝ මූල්‍ය සහ මූල්‍ය නොවන සිහින සැබෑ කරගත හැකි අතර මූල්‍යමය ගැටලු හේතුවෙන් ඇතිවන මානසික පීඩනය අවම කරගත හැකි ය. රටක ආයෝජනයට ඉතුරුම් ධනාත්මක ප්‍රවේශයක් ලබාදෙන අතර ඒ තුළින් ස්ථාවර ආර්ථික වර්ධනයක් සඳහා අවශ්‍ය පසුබිම සකස් කරනු ලැබේ. යම් පුද්ගලයෙකුට ඉතුරුම්ගත ප්‍රාග්ධනයක් හිමි නම් ණය ලබා ගැනීමකින් තොර ව තමන්ගේ එදිනෙදා අවශ්‍යතා මෙන් ම දිගුකාලීන ව ආයෝජන අවස්ථා වෙත ප්‍රවේශ වීම වඩාත් පහසු කරගත හැකි ය. දිනෙන් දින වෙනස් වෙන සමාජ ආර්ථික පරිසරයක ඉතා කුඩා මට්ටමින් වුව ද නිසි සැලැස්මක් සහිත ව සිදු කරනු ලබන ඉතුරුම් ඕනෑ ම හදිසි අවස්ථාවක් මනා ලෙස කළමනාකරණය කරන අතර ඒ සඳහා එක් එක් පුද්ගලයෙකුට සුදුසු ඉතුරුම් මාදිලියක් තෝරා ගැනීම වඩාත් වැදගත් වේ. ප්‍රතිලාභය ගැන පමණක් නොසිතා අවදානම පිළිබඳව ද සැළකිලිමත් වෙමින් විධිමත් මූල්‍ය ආයතනයක ඉතුරුම් පවත්වාගෙන යෑම ද මෙහි දී වැදගත් වේ. අවිධිමත් ඉතුරුම් ඔබගේ මුදල් අපතේ යවනු ඇත. ඒ නිසා ශ්‍රී ලංකා මහ බැංකුව නියාමනය කරන මූල්‍ය ආයතනයක හෝ රජයේ නියාමනයකට යටත්වන වෙනත් මූල්‍ය ආයතනයක ඔබගේ ඉතුරුම් පවත්වාගෙන යෑම ඔබගේ මුදල් ආරක්ෂා කරයි. එනිසා, ඉතුරුම් සඳහා ඇති බාධා ඉවත් කර ගනිමින් ඔබට හැකි මුදලක් නිශ්චිත කාලපරාසයක් සහිත ව ඉතිරි කිරීම අන් කවරදාටත් වඩා වැදගත් මෙන්ම සියලු දෙනා විසින් ම ප්‍රගුණ කලයුතු මාහැඟි පුරුද්දකි. එය හැමවිටම ඔබත්, ඔබේ පවුලත්, රටත් මූල්‍යමය වශයෙන් සුරක්ෂිත කරයි.

අපි ඉතිරි කරමු. !

ඉතුරුම් සංස්කෘතියක් ගොඩ නගමු. !

රටේ අනාගතය සුරක්ෂිත කරමු. !

මොකක්ද මේ මූල්‍ය ආයතන නිරාකරණය?

ඒ ටී එම් සිල්වා
ජ්‍යේෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
තැන්පතු රක්ෂණ හා නිරාකරණ දෙපාර්තමේන්තුව

හැඳින්වීම

මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ඕනෑ ම රටක ආර්ථික වර්ධනයේ සහ මහජන විශ්වාසයේ පදනම වන අතර, මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීමේ දී බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (මූල්‍ය ආයතන) ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන අතරමැදියන් ලෙස කටයුතු කරන මූල්‍ය ආයතන, ගනුදෙනු සඳහා පහසුකම් සැපයීම, ඉතිරි කිරීම් ඵලදායී ආයෝජන සඳහා මූල්‍යනය කිරීම, ව්‍යාපාර සහ පුද්ගලයින්ට ණය ලබා දීම, ආර්ථිකයේ විවිධ අංශවලට මූල්‍ය සහාය දීම සහ ආර්ථිකය තුළ ද්‍රවශීලතාව සහතික කිරීම වැනි ප්‍රධාන කර්තව්‍ය ඉටුකරයි. තව ද ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම, යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම සහ මූල්‍ය අන්තර්ගතභාවය වැඩි දියුණු කිරීම මගින් ඔවුන් ආර්ථික වර්ධනයට සහාය වේ. එපමණක් නොව, ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සුරක්ෂිත ව තබාගැනීම සහ ගෙවීම් පද්ධතිවල ක්‍රියාකාරිත්වයට සහභාගී වීම මගින් මෙම මූල්‍ය ආයතන මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය පවත්වා ගනී.

කෙසේ වෙතත්, ආර්ථිකයේ සිදුවන පසුබෑම්, වැරදි කළමනාකරණ භාවිත හෝ මූල්‍ය ආයතන කෙරෙහි සිදුවන බාහිර කම්පන ඇතුළු විවිධ සාධක හේතුවෙන් මෙම ආයතන මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දිය හැකි ය. මූල්‍ය ආයතනයක් අසාර්ථක වූ විට, ප්‍රතිවිපාක දරුණු විය හැකි අතර එය තැන්පත්කරුවන්ට, ණය හිමියන්ට සහ සමස්ත ආර්ථිකයට ම බලපෑම් කළ හැකි ය. බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවල සිදුවන අර්බුදයක් මූල්‍ය අතරමැදිකරණයට බාධා එල්ල කළ හැකි අතර, මූල්‍ය පද්ධතිය කෙරෙහි විශ්වාසය අඩපණ කිරීම මෙන්ම එමගින් පුළුල් ආර්ථික අස්ථාවරත්වයක් පවා ඇති කළ හැකි ය. මූල්‍ය ආයතනයක් ශක්‍ය නොවූ විට හෝ ශක්‍ය නොවීමේ අවදානමක් ඇති විට, එම තත්ත්වය ක්‍රමානුකූල ව කළමනාකරණය කිරීම සඳහා එම ආයතනයේ පද්ධතිමය වැදගත්කම සහ බලපෑම සැලකිල්ලට ගෙන තීරණාත්මක මැදිහත්වීමක් අවශ්‍ය වේ. මූල්‍ය ආයතන නිරාකරණ යාන්ත්‍රණය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන්නේ මෙහි දී ය.

මූල්‍ය ආයතන නිරාකරණය යනු ආයතනයේ තීරණාත්මක කර්තව්‍ය අඛණ්ඩ ව පවත්වාගෙන යෑමට, තැන්පත්කරුවන්ට හා අනෙකුත් ණය හිමියන්ට වන අලාභ අවම කිරීමට, රාජ්‍ය මූල්‍ය ආධාර අවම කිරීමට, නිරාකරණයේ සමස්ත පිරිවැය අවම කිරීමට සහ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීමට නිරාකරණ බලධාරීන් මැදිහත් වන ව්‍යුහගත ක්‍රියාවලිය යි. දීර්ඝ හා බාධාකාරී විය හැකි සාම්ප්‍රදායික ඈවර කිරීම මෙන් නොව, මූල්‍ය ආයතන නිරාකරණ යාන්ත්‍රණය මගින් මූල්‍ය පද්ධතියට අවදානම් අවම කරන අතර ම තීරණාත්මක කර්තව්‍ය සහ සේවා අඛණ්ඩ ව පවත්වා ගෙන යා හැකි බව සහතික කරයි. ශ්‍රී ලංකාවේ, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත, ශක්‍ය නොවීමේ අවදානමක පවතින මූල්‍ය ආයතන හැසිරවීම සඳහා නීතිමය පදනම සපයන අතර, ඵලදායී නිරාකරණ උපාය මාර්ග සවිස්තරාත්මක ව විදහා දක්වයි. තව ද නිරාකරණය කිරීම සඳහා අදාළ වන ජාත්‍යන්තර ප්‍රමිතීන් හා යහපත් පරිචයන් සලකා බලා එම නිරාකරණ උපාය මාර්ග පෙළගස්වා ඇත.

මහජන විශ්වාසය සහ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගනිමින් බලපත්‍රලාභී මූල්‍ය ආයතන නිරාකරණය කිරීම සඳහා බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවට ඇති අරමුණු, බලතල, සහ බැංකු නිරාකරණය පිළිබඳ ව දළ විශ්ලේෂණයක් සැපයීම මෙම ලිපියේ අරමුණ යි.

මූල්‍ය ආයතන නිරාකරණය වැදගත් වන්නේ ඇයි?

ගෝලීය මූල්‍ය අර්බුදය මගින් ශක්‍ය නොවීමේ අවදානමක් පවතින බැංකු නිරාකරණය කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් සඳහා ඇති අවශ්‍යතාව වඩාත් ඉස්මතු කළේ ය. මූල්‍ය අර්බුදය අතරතුර, බොහෝ මූල්‍ය ආයතන "අසමත් විය නොහැකි සා විශාල (too big to fail)" ලෙස සලකනු ලැබූ අතර, ඒවායේ බිඳවැටීම වැළැක්වීම සඳහා අදාළ රටවල රජයයන්ට දැවැන්ත මහජන අරමුදල් වෙන් කිරීමට බල කෙරිණි. පුළුල් ආර්ථික ව්‍යසනයක් වළක්වා ගැනීම සඳහා මෙම රාජ්‍ය අනුග්‍රහය අවශ්‍ය වුව ද, ඉන් බදු ගෙවන්නන් මත සැලකිය යුතු බරක් පැටවුණු අතර, ප්‍රශ්න සහගත කාලවල දී අධිකාරි විසින් මූල්‍ය ආයතන බේරා ගනු ඇතැයි විශ්වාස කරන්නේ නම්, එම මූල්‍ය ආයතන අධික අවදානම් සහිත කටයුතුවල යෙදිය හැකි බවට වන මතය (Moral Hazard) පිළිබඳ දැඩි ලෙස විවාද කෙරිණි.

කෙසේ වෙතත්, මූල්‍ය ආයතන නිරාකරණ සංකල්පය 20072008 ගෝලීය මූල්‍ය අර්බුදයට පෙර සිට පැවත එන්නකි. අතීත අවස්ථාවන්හි දී මූල්‍ය ආයතන අසාර්ථක වීමේ තත්ත්ව බොහෝ විට තාවකාලික ආකාරයකින් කළමනාකරණය කරන ලද අතර, තැන්පත්කරුවන් ආරක්ෂා කිරීමට සහ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීමට අදාල රජයයන් පියවර ගත්හ. නිදසුනක් වශයෙන්, 1930 දශක යේ සිදු වූ මහා අවපාතය (Great Depression) අතරතුර, තැන්පතු රක්ෂණය කිරීමට සහ බැංකු අසාර්ථකත්වයන් වඩාත් ක්‍රමානුකූල ව කළමනාකරණය කිරීමට ඇමරිකා එක්සත් ජනපදය 1933 දී ෆෙඩරල් තැන්පතු රක්ෂණ සංස්ථාව (Federal Deposit Insurance Corporation) පිහිටුවන ලදී. මෙය බැංකු නිරාකරණ ක්‍රියාවලී විධිමත් කිරීම, තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂා කර ඇති බව සහතික කිරීම සහ බැංකු එකිනෙක කඩාවැටීමේ සම්භාවිතාව අඩු කිරීම කෙරෙහි සැලකිය යුතු වෙනසක් සනිටුහන් කළේ ය.

ඉන් පසු දශක කිහිපය තුළ, විවිධ රටවල් සිය මූල්‍ය ආයතන නිරාකරණ රාමු සකස් කර ගත් නමුත්, මෙම පද්ධති බොහෝ විට ප්‍රතික්‍රියාශීලී වූ අතර ජාත්‍යන්තර සම්බන්ධීකරණයක් නොතිබුණි. 20 වන සියවසේ අග භාගයේ සහ 21 වන සියවසේ මුල් භාගයේ දී ලෙහ්මන් බ්‍රදර්ස් (Lehman Brothers) වැනි ප්‍රධාන මූල්‍ය ආයතන බිඳ වැටීම, මෙම නිරාකරණ රාමුවල සීමාවන් ගැන ප්‍රශ්න මතු කළේ ය. විශේෂයෙන් ලෙහ්මන් බ්‍රදර්ස් බංකොලොත් භාවය, තනි විශාල ආයතනයක අසාර්ථකත්වය ගෝලීය මූල්‍ය බිඳ වැටීමක් ඇති කළ හැකි ආකාරය පෙන්නුම් කළ අතර, වඩාත් ඵලදායී සහ සම්බන්ධීකරණ නිරාකරණ යාන්ත්‍රණ සඳහා වන අවශ්‍යතාව අවධාරණය කළේ ය.

මෙම අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, ජාත්‍යන්තර ප්‍රජාව මූල්‍ය ආයතන නිරාකරණය සඳහා වඩාත් පුළුල් ප්‍රවේශ වර්ධනය කිරීමට පටන් ගත්හ. 2009 දී පිහිටුවන ලද මූල්‍ය ස්ථායිතා මණ්ඩලය (Financial Stability Board), අසාර්ථක මූල්‍ය ආයතන විසඳීම සඳහා ගෝලීය ප්‍රමිති නිර්මාණය කිරීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේ ය. මූල්‍ය ස්ථායිතා මණ්ඩලය මගින් 2011 දී ප්‍රකාශයට පත් කරන ලද "ඵලදායී විසඳුම් පාලන තන්ත්‍රවල ප්‍රධාන ගුණාංග" (zKey Attributes for Effective Resolution Regimes'), බදු ගෙවන්නන් විසින් අරමුදල් සපයන ලද රාජ්‍ය අනුග්‍රහය සඳහා අවශ්‍යතාව අවම කරන නිරාකරණ රාමු සැලසුම් කිරීම සඳහා රටවල් සඳහා සැලැස්මක් සපයන ලදී. බදු ගෙවන්නන්ට වඩා කොටස් හිමියන් සහ ණය හිමියන් පාඩු දරන යාන්ත්‍රණවල (Bail-in) වැදගත්කම මෙම රාමු මගින් අවධාරණය කෙරේ. ඊට අමතර ව, අසාර්ථක මූල්‍ය ආයතන ක්‍රමානුකූල ව වසා දැමීම කළමනාකරණය කිරීම සඳහා නීතිමය සහ මෙහෙයුම් ධාරිතාවයෙන් යුත් නිරාකරණය කිරීමේ අධිකාරි නිර්මාණය කිරීම ඔවුන් ප්‍රවර්ධනය කරයි.

මූල්‍ය ආයතන නිරාකරණයේ ඉතිහාසය තාවකාලික මැදිහත්වීම්වලින් ව්‍යුහගත, ජාත්‍යන්තර ව සම්බන්ධීකරණය වූ රාමු දක්වා ක්‍රමානුකූල විකාශනයක් පිළිබිඹු කරයි. අතීත අර්බුදවලින් උගත් පාඩම් නූතන නිරාකරණ යාන්ත්‍රණ සැකසීමට මග පාදා ඇත. මෙම යාන්ත්‍රණ මූල්‍ය ස්ථාවරත්වය ඉහළ නැංවීම, බදු ගෙවන්නන් ආරක්ෂා කිරීම සහ සදාචාරාත්මක නොවන අවදානම් (Moral Hazard) අවම කිරීම අරමුණු කර ගනී. මූල්‍ය පද්ධතිය නිරන්තරයෙන් විකාශනය වෙමින් පවතින අතර, අනාගත අර්බුදවලින් ගෝලීය ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා ඵලදායී, මූල්‍ය ආයතන නිරාකරණයේ වැදගත්කම ඉහළම මට්ටමක පවතී.

ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන නිරාකරණය කිරීමේ අධිකාරි බලය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 62 වන වගන්තිය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ආයතනවල නිරාකරණ අධිකාරිය ලෙස පිළිගෙන ඇත. තව ද, 2023 සැප්තැම්බර් මස 14 වන දින සහතික සටහන් කළ බැංකු (විශේෂ විධිවිධාන) පනත 2023 නොවැම්බර් මස 15 වන දින සිට බලාත්මක වූ අතර බැංකු නිරාකරණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ

නිරාකරණය කිරීමේ අධිකාරිය, 03 වන වගන්තිය මගින් තහවුරු කර ඇත. එලෙස ම, බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 57 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර ව, බලපත්‍රලාභී බැංකු නිරාකරණයට අදාළ වන, බැංකු (විශේෂ විධිවිධාන) පනතේ ෂ කොටසේ සහ ෂෂ කොටසේ වන නිරාකරණ විධිවිධාන, සියලු ම බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අදාළ කිරීම අංක 2432/02 යන අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2025 අප්‍රේල් මස 16 දින ප්‍රකාශයට පත් කරන ලදී.

මූල්‍ය ආයතන සඳහා මූල්‍ය ස්ථායිතා මණ්ඩලයේ (FSB) ඵලදායී නිරාකරණය පාලන තන්ත්‍රවල ප්‍රධාන ගුණාංග ඇතුළු ව ජාත්‍යන්තර හොඳම ප්‍රමිතීන් හා යහපත් පරිචයන් සමග සමපාත වන මෙම බැංකු (විශේෂ විධිවිධාන) පනත ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කළ හැකි නිරාකරණ ක්‍රියාමාර්ග, මූල්‍ය ආයතන සඳහා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සහ ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලි සඳහා ද විධිවිධාන සලසයි. තව ද, මෙම පනත මගින් මූල්‍ය ආයතන සඳහා නිරාකරණ සැලසුම් සැකසීමටත් ඒ සඳහා අදාළ තොරතුරු එක් රැස් කිරීම, යාවත්කාලීන කිරීම, නිරාකරණ පියවර තීරණය කිරීමට සහ සකස් කිරීමට අවශ්‍ය ස්ථානීය පරීක්ෂණ හරහා රැස් කරන ලද තොරතුරු ඇතුළු ව ඕනෑ ම තොරතුරක් සපයන ලෙස යම් පුද්ගලයෙකුට නියම කිරීමටත් මහ බැංකුවට බලය ලබා දී ඇත. තව ද මෙම පනත යටතේ මහ බැංකුව විසින් කිසියම් නියෝගයක්, නියාමනයක්, මග පෙන්වීමක්, තීරණයක්, මාර්ගෝපදේශයක් හෝ උපදෙස් නිකුත් කර ඇති හෝ ඉල්ලීමක් කර ඇති ඕනෑ ම මූල්‍ය ආයතනයක් එම ඉල්ලීමට අනුකූල විය යුතු ය. එලෙස ම මෙම පනත යටතේ සකසනු ලබන නිරාකරණ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා, අවශ්‍ය නියාමන හෝ අධීක්ෂණ අනුමැති කඩිනමින් ලබා දෙමින් එම ක්‍රියාවලිය පහසු කිරීම සඳහා මහ බැංකුවේ සෑම නියාමන සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවක් ම ඊට සහයෝගය ලබා දිය යුතු ය.

මෙම බැංකු (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාර ව මහ බැංකුව විසින් නියාමනය හෝ අධීක්ෂණය කරනු නොලබන, බලපත්‍රලාභී මූල්‍ය ආයතනයක හිමිකාර සමාගමක්, අනුබද්ධිත හෝ ආශ්‍රිත සමාගමක් හෝ මූල්‍ය කණ්ඩායමක් හෝ සමූහ ව්‍යාපාරයක් ඇති ඕනෑ ම ආයතනයක්, එම බලපත්‍රලාභී මූල්‍ය ආයතනය සඳහා හෝ වෙනුවෙන් ඕනෑ ම තීරණාත්මක සේවාවක් හෝ කාර්යයන් ඉටු කිරීම සඳහා වැදගත් වන්නේ නම්, නිරාකරණය කිරීමේ අධිකාරී බලය එම සමාගමට හෝ ආයතනයට අදාළ කර ගැනීමට මහ බැංකුවට හැකි ය. එලෙස ම එවැනි ආයතන විසින් එවැනි සේවාවක් හෝ කාර්යය අත්හිටුවීම එම මූල්‍ය ආයතනයේ තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ අවශ්‍යතාවලට අහිතකර වීමට හෝ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට තර්ජනයක් වීමට ඉඩ ඇති අවස්ථාවක, එවැනි සේවාවක් හෝ කාර්යය අඛණ්ඩ ව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා එවැනි බලපත්‍රලාභී මූල්‍ය ආයතනයට විකල්ප නොමැති අවස්ථාවක, මෙම පනතේ අදාළ විධිවිධාන එම සමාගමට හෝ ආයතනයට අදාළ කර ගැනීමට මහ බැංකුවට හැකියාව ඇත.

ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන නිරාකරණය කිරීමේ අධිකාරී බලය හඳුන්වාදී ම මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ගෙන ඇති වැදගත් පියවරක් වන අතර මෙම නව ආයතනමය ව්‍යුහය හා නීතිමය රාමුව, ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය ජාත්‍යන්තර හොඳම ප්‍රමිති සමග සමපාත කිරීමට උපකාරී වන අතර, එමගින් මූල්‍ය පද්ධතියේ විශ්වාසනීයත්වය හා ස්ථාවරත්වය ඉහළ නංවයි.

ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන නිරාකරණය කිරීමේ ප්‍රධාන අරමුණු

බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව තම නිරාකරණ කිරීමේ අධිකාරිය මූල්‍ය ආයතන මත ක්‍රියාත්මක කිරීමේ දී, පහත ප්‍රධාන අරමුණු සහතික සාක්ෂාත් කර ගැනීමට උත්සාහ දරයි.

- මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය තහවුරු කිරීම: ගෙවීම්, නිෂ්කාශන සහ බේරුම් කිරීමේ පද්ධති ඇතුළු ව මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පවත්වා ගැනීම මගින් ආර්ථිකයේ සමස්ත සෞඛ්‍යය සහ විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම.
- තීරණාත්මක කාර්යයන් අඛණ්ඩ ව පවත්වා ගැනීම: බලපත්‍රලාභී මූල්‍ය ආයතනයක තීරණාත්මක කාර්යයන් අඛණ්ඩ ව ක්‍රියාත්මක වීම බිඳ නොවැටෙන අයුරින් සහතික කිරීම මගින් මූල්‍ය සේවාවන්හි අඛණ්ඩතාව සහ තැන්පත්කරුවන්ගේ විශ්වාසය පවත්වා ගැනීම.
- රාජ්‍ය මූල්‍ය ආධාර අවම කිරීම: පද්ධතිමය වැදගත්කම සහ බලපෑමක් ඇති මූල්‍ය ආයතන අර්බුදවල දී රජයේ මූල්‍ය ආධාර අවම කිරීමෙන් මහජන අරමුදල් ආරක්ෂා කිරීම සහ බදු ගෙවන්නන් මත බර අඩු කිරීම.
- තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම: බලපත්‍රලාභී මූල්‍ය ආයතනයක තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් සහ තැන්පතුවල ආරක්ෂාව සුරැකීම මගින් මූල්‍ය පද්ධතිය පිළිබඳ ජනතාවගේ විශ්වාසය ශක්තිමත් ව පවත්වා ගැනීම.

- වත්කම්වල වටිනාකම සුරැකීම සහ ණය හිමියන්ගේ අලාභ අවම කිරීම: බලපත්‍රලාභී මූල්‍ය ආයතනයක වත්කම්වල වටිනාකම විනාශ වීම වැළැක්වීම සහ ණය හිමියන්ට සිදුවන අලාභ අවම කිරීම මගින් නිරාකරණ ක්‍රියාවලියේ සමස්ත පිරිවැය අවම කිරීම.

මෙම අරමුණු හරහා, ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය, විශ්වසනීයත්වය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට උත්සාහ දරනු ලැබේ. මෙය ජාත්‍යන්තර හොඳ ම පරිචයන් සමග සමපාත වන අතර, ආර්ථිකයේ දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීමට දායක වේ.

ප්‍රධාන නිරාකරණ බලතල

බැංකු (විශේෂ විධිවිධාන) පනතෙහි හෝ වෙනත් ඕනෑ ම ලිඛිත නීතියක වෙනත් විධිවිධානවලට පටහැනි ව කුමක් සඳහන් වුව ද, බලපත්‍රලාභී මූල්‍ය ආයතනයක් තවදුරටත් ශක්‍ය නොවන බවට හෝ ශක්‍ය වීමට ඉඩ ඇති බවට සාධාරණ අපේක්ෂාවක් නොමැති බවට මහ බැංකුව සෑහීමකට පත්වන විට, මහ බැංකුවට මෙම පනත යටතේ එවැනි මූල්‍ය ආයතනයක් නිරාකරණය කිරීමට තීරණය කළ හැකි ය. එලෙස නිරාකරණය යටත් වන මූල්‍ය ආයතනයක්, මහ බැංකුවේ පාලනය යටතේ එහි ව්‍යාපාර කටයුතු කරගෙන යාම සිදුවේ.

මෙවැනි මූල්‍ය ආයතනයක් නිරාකරණය කිරීම සඳහා මහ බැංකුවට පහත දැක්වෙන ප්‍රධාන නිරාකරණය කිරීමේ බලතල හිමිවේ.

- අද්මිනිස්ත්‍රාසිකරුවෙකු (Administrator) පත් කිරීම: මූල්‍ය ආයතනයේ ක්‍රියාකාරකම් කාර්යක්ෂම ව කළමනාකරණය කිරීම සහ නිරාකරණ ක්‍රියාවලිය සුමට ව ක්‍රියාත්මක කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසිකරුවෙකු පත් කිරීම.

- කොටස් පැවරීමක් සිදු කිරීම: මූල්‍ය ආයතනයේ කොටස් පැවරීමක් සිදු කිරීම හරහා නව ආයෝජකයින් සඳහා අවස්ථා සලසා ගැනීම.

- වත්කම් සහ වගකීම් පැවරීම: මූල්‍ය ආයතනයේ සියලු ම හෝ තෝරාගත් වත්කම් සහ වගකීම් වෙනත් ආයතනයකට මාරු කිරීම.

- ප්‍රාග්ධන වැඩි කිරීම: වත්මන් කොටස් හිමියන් සහ නව කොටස් හිමියන් හරහා ප්‍රාග්ධනය වැඩි කිරීමක් (capital infusion) මගින් මූල්‍ය ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය ඉහළ නැංවීම.

- සේතු බැංකුවක් (Bridge Bank) පිහිටුවීම: මුදල් විෂයය භාර අමාත්‍යවරයාගෙන් සේතු බැංකුවක් පිහිටුවීම සඳහා ප්‍රාග්ධනය සපයන ලෙසට ඉල්ලා සිටීම.

- තාවකාලික මූල්‍ය සහාය ලබා ගැනීම: මූල්‍ය ආයතනයේ මූල්‍යමය ගැටලු සඳහා මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තා මත පදනම් ව අමාත්‍යවරයාගෙන් තාවකාලික මූල්‍ය සහාය ඉල්ලා සිටීම.

ඉහත සඳහන් ප්‍රධාන නිරාකරණය කිරීමේ බලතලවලට අමතර ව මෙම පනත යටතේ මූල්‍ය ආයතනයක නිරාකරණය සඳහා, මහ බැංකුවට සෘජු ව හෝ අද්මිනිස්ත්‍රාසිකරුවෙකු පත් කිරීම හරහා ක්‍රියාත්මක කළ හැකි බලතල රාශියක් බැංකු (විශේෂ විධිවිධාන) පනතෙහි 14 වන වගන්තියේ (2) වන උප වගන්තිය මගින් දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා වන මූල්‍ය ආයතන නිරාකරණය

මූල්‍ය ආයතන නිරාකරණය යනු මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහතික කිරීම, තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව සුරැකීම සහ ආර්ථිකයේ විශ්වසනීයත්වය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාවලියකි. 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ශක්‍ය නොවන මූල්‍ය ආයතන නිරාකරණය කිරීම සඳහා නීතිමය හා ක්‍රියාමාර්ගික රාමුවක් සපයා ඇත. මෙම පනත ජාත්‍යන්තර හොඳ ම පරිචයන් සමග සමපාත වන අතර, මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය, තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව සහ මහජන අරමුදල් ආරක්ෂා කිරීම වැනි ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම අවධාරණය කරයි.

මෙම නව නීතිමය රාමුව හරහා, ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය තවදුරටත් ශක්තිමත් කිරීමට හා ආර්ථික ස්ථාවරත්වය තහවුරු කිරීමට ඉඩ සලසයි. ශ්‍රී ලංකා මහ බැංකුව, නිරාකරණ අධිකාරිය ලෙස නීතිගත කිරීම, නිරාකරණ ක්‍රියාවලිය කාර්යක්ෂම ව ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් පියවරක් වන අතර, එය මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය ඉහළ නැංවීමට ද උපකාරී වේ. අනාගතයේ දී, මෙම මූල්‍ය ආයතන නිරාකරණ යාන්ත්‍රණ හරහා ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය තවදුරටත් දියුණු කිරීමට හා ගෝලීය මූල්‍ය පරිසරය සමඟ සමපාත වීමට ඉඩ සලසයි. මෙම ප්‍රගතිය, ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ දිගුකාලීන ස්ථාවරත්වය සහතික කිරීමට මහත් බලාපොරොත්තු ඇති කරවයි.

මූල්‍ය වංචා හඳුනා ගනිමු: ඩිජිටල් ලෝකයේ ඔබ ආරක්ෂා වන්නේ කෙසේද?

කේ වී ඩී යූ එම් විජේගුණරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව

ඔබ ත්‍යාගයක් දිනූ බවට කියවෙන උද්යෝගීමත් පණිවුඩයක්! ඔබේ තැන්පතු, ඔබේ ඉතුරුම් ආරක්ෂා කරගැනීමට නම් වහා ම ක්‍රියාත්මක වන ලෙසට කෙරෙන අනතුරු ඇඟවීමක්! මිතුරු වේශයෙන් පැමිණ ඔබේ අතැති මුදල් දෙගුණ කර දෙන්නට වන පොරොන්දුවක්! කෙටි ක්‍රමවලින් මුදල් උපයන, දියුණු වන මාර්ග...! මෙතෙකින් නොනැවතී දිනෙන් දින විවිධ නිර්මාණාත්මක ස්වරූපවලින් ඔබ වෙතට පැමිණෙන අවස්ථා තවදුරටත් අවස්ථා ම පමණක් නොවන බවට වටහා ගැනීමට ඔබ තවමත් ප්‍රමාද නැත.

මේ කවර ආකාරයකින් පැමිණිය ද වෙහෙස මහන්සි වී උපයා ගන්නා ඔබේ වටිනා මුදල් වෙනත් පාර්ශ්වයක් අතට පත් වී මූල්‍ය වංචාවන්ගේ බිල්ලක් වීමට මත්තෙන් ඒ පිළිබඳ ව වරක් දෙවරක් නොව කිහිප වරක් ම සුපරික්ෂාකාරී ව විමසිලිමත් ව සොයා බැලීමට ඔබ ඔබම පුහුණු කර ගත යුතු කාලය එළඹ ඇත. නූතන තාක්ෂණය හේතුවෙන් දුරස්ථ බවකින් තොර ව වත්මන් ලෝකයේ ඔබ වෙතට සමීප වන්නට මූල්‍ය වංචාකරුවන්ට ඕනෑ තරම් ක්‍රමෝපාය පවතී. එබැවින් ඔවුන් තවදුරටත් සාම්ප්‍රදායික ක්‍රමවලින් පෙනී සිටින්නේ නැත. අහිංසක මිනිසුන්ගේ සිහින, අපේක්ෂාවන් ගොදුරු කර ගනිමින්, ඔබේ ආදායම් මාර්ගවලට උපායශීලී ව ප්‍රවේශ වීමට ඔවුහු මාන බලමින් සිටිති.

කිසිදු සාධාරණ උත්සාහයකින් තොර ව ඔබේ වාසනාවට ඔබට මුදල් ලැබේ යැයි ඔබ තවදුරටත් විශ්වාස කරයි නම්, මෙවන් කූට මූල්‍ය වංචාකරුවන්ට ඔබ වැන්නවුන් ඉතා හොඳ ඉල්ලමකි. මුදල් ආයෝජන සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී නැවත නැවතත් බුද්ධිමත් නොවුණහොත් ඒ පිටුපස ඇති අනතුර, අවදානම ඔබට තව දුර නැති බව වහා වටහා ගත යුතු ය.

සාම්ප්‍රදායික පාර්සල් වංචාවල සිට නූතන මාර්ගගත මූල්‍ය වංචා දක්වා විවිධ පැතිකඩ හරහා සමාජය රැවටෙන්නා වූ විවිධාකාර මූල්‍ය වංචා පිළිබඳ ව මූලික අවබෝධයක් සපයමින්, ඒවායින් සුරක්ෂිත වන ආකාරය දැනුවත් කිරීම මෙම ලිපිය මගින් අපේක්ෂා කෙරේ.

පාර්සල් වංචා (Parcel Scams)

ඔබ වටිනා පාර්සලයක් දිනාගෙන ඇති බවට ඔබ වෙත ලැබෙන කෙටි පණිවිඩයක්, ඇමතුමක් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් සමඟින් මෙම වංචාව ආරම්භ වේ. මෙය බොහෝ විට යම් දිනුම් ඇදීමක ප්‍රතිඵලයක් වශයෙන් ස්වර්ණාභරණ, විදුලි උපකරණ, විදේශයකින් ලැබීමට නියමිත වටිනා ත්‍යාගයක් හෝ මුදල් පාර්සලයක් ලෙසින් විවිධ ස්වරූපවලින් පෙන්නුම් කරයි.

මෙහි ඔබට හිමි පාර්සලය ඔබ සතු කරගැනීමට පෙර ප්‍රවාහන හෝ රේගු ගාස්තුවක් ඔවුන් ඉල්ලා සිටින ගිණුම් අංකයකට මාර්ගගත ව ගෙවන ලෙස ඉල්ලා සිටී. නමුත් ගාස්තුව ගෙවූ පසු ඔබ ව ඇමතූ පාර්ශ්වය නැවත සම්බන්ධ කර ගැනීමට ක්‍රමයක් නොමැති අතර ඔබට හිමිවන පාර්සලයක් ද නොමැත.

පාර්සල් වංචාවේ ස්වභාවය පිළිබඳ විමසා බලමු.

- පාර්සලය තුළ අඩංගු දෑ පිළිබඳ ඔබට අදහසක් ලබා දීමට, ඒ ඔස්සේ ඔබ තවත් පෙලඹවීමට ව්‍යාජ ඡායාරූප පවා ඔබට එවයි.

- ඔබට එවන කෙටි පණිවිඩය හදිසි තත්ත්වයක් මවාපාන අතර වහා ක්‍රියාත්මක වීමට පොලඹවයි.
- ඔබේ ත්‍යාගය ලැබීමට නම් තැන්පත් කළ යුතු මුදල, ඔවුන් සඳහන් කරන ත්‍යාගයේ වටිනාකමට සාපේක්ෂ ව ඉතා සුළු වටිනාකමකි. එබැවින් පසු ව ලැබීමට නියමිත විශාල ත්‍යාගය වෙනුවෙන් සුළු මුදලක් අහිමි කර ගැනීමට බොහෝ විට පුද්ගලයන් පැකිලෙන්නේ නැත.

පාර්සල් වංචාව හඳුනා ගන්නේ කෙසේද? මෙම කරුණු පිළිබඳ ව නැවතත් සිතා බලන්න.

- ඔබ කිසි දිනෙක අයදුම් නොකළ ත්‍යාග යක්/හිමිකමක් වෙනුවෙන් ඔබට මුදලක් ගෙවීමට ඉල්ලා සිටී.
- ඔබට පාර්සලය එවන පාර්ශ්වය මින් පෙර ඔබ නොදන්නා අයෙකි. තහවුරු කර නොගත් පාර්ශ්වයකි.
- ඔබට එවන පණිවිඩය බොහෝ දුරට සැක කටයුතු සබැඳීන් සහිත වේ.

පාර්සල් වංචාවෙන් ඔබ ආරක්ෂා වන්නේ කෙසේද?

- ඔබ අයදුම් නොකළ කිසිදු ත්‍යාගයකට හෝ පාර්සලයකට මුදල් ගෙවීමෙන් වළකින්න.
- ඔබ ව අමතන පාර්ශ්වයේ අනන්‍යතාව/දුරකථන අංකය හෝ විද්‍යුත් තැපැල පරීක්ෂාකාරී ව වහා ම තහවුරු කර කරගන්න. බොහෝ වංචාකරුවන් ව්‍යාජ තැපැල් ලිපිනයන් භාවිත කරති.
- ලිපිනය පිළිබඳ සැකකටයුතු අවස්ථාවන්හි දී ඔබට ප්‍රාදේශීය තැපැල් කාර්යාලය හෝ කුරියර් සේවාවක් සෘජුව ම සම්බන්ධ කර පරීක්ෂා කර බැලිය හැකිය.

ලොතරැයි වංචා (Lottery Scams)

පාර්සල් වංචාවලට තරමක් සමාන වේ. මෙහි දී ඔබට විදේශයක දී දිනුම් අදින ලද ලොතරැයියක හෝ ත්‍යාග ප්‍රදානයක දී වටිනා වාහනයක් හෝ විශාල මුදල් ත්‍යාගයක් හිමි වී ඇති බව පවසමින් පණිවිඩයක්, SMS හෝ උය්වීචව හෝ විද්‍යුත් තැපැල හරහා ලැබේ. නමුත් මෙම ත්‍යාගය ඔබට අත්පත් කරගැනීමට නම් ඊට අදාළ ඇසුරුම් ගාස්තු, රේගු ගාස්තු සහ ප්‍රවාහන වියදම් ඔබ විසින් දැරිය යුතු බවට ඔවුහු පවසති. ඇතැම් විට ඔබ මෙයට යම්කිසි ප්‍රතිචාරයක් දැක්වුවහොත්, මෙම ගනුදෙනුව සිදුකර අවසන් වන තෙක් මෙවන් ඇමතුම් හෝ පණිවිඩ එකක් නොව කිහිප වාරයක් ඔබට ලැබෙනු ඇත.

මෙම වංචාවන්ට හසුවූ තැනැත්තන් දිනුම් ඇදීම පිළිබඳ පුවත් දුටු වහා ම ඉන් උද්දාමයට පත් ව එයින් ම විශාල පෙලඹවීමකට ලක්වෙයි. වටිනා ත්‍යාගයක් හිමිකර ගැනීමට සුළු මුදලක් වැය කිරීම පිළිබඳ ව දෙවරක් නොසිතයි.

ලොතරැයි වංචාවේ ස්වභාවය පිළිබඳ විමසා බලමු.

- කෙදිනකවත් මිලදී නොගත් හෝ අයදුම් නොකළ ලොතරැයි ටිකට් පතක් ඔබ ජයග්‍රහණය කර ඇති බවට ලැබෙන පණිවිඩයකි.
- ඔබට ත්‍යාගය හිමිවීමට පෙර ඔවුන්ට මූලික ගෙවීමක්/මුදල් තැන්පතුවක් සිදුකරන ලෙසට ඉල්ලයි.
- මෙය කිසිදු විනිවිද භාවයකින් තොර බව සහ නිත්‍යානුකූල ක්‍රමවේදයක් නොමැති බව ඉතා පැහැදිලි ය.

ලොතරැයි වංචාවෙන් ඔබ ආරක්ෂා වන්නේ කෙසේද? මෙම කරුණු පිළිබඳව නැවතත් සිතා බලන්න.

- ඔබ කිසි දිනෙක අයදුම් නොකළ හෝ ඉල්ලීම් නොකළ ලොතරැයියකින් ඔබට දිනුම් ඇදීමක් ලැබිය නොහැකි බව තරයේ සිහි තබා ගන්න.
- අදාළ මූල්‍ය ගනුදෙනුව ව්‍යාජ එකක් නොවේ නම් කිසිවිටෙකත් ගෙවීමක් ඉල්ලන්නේ නැත. අව්‍යාජ මුදල් ගනුදෙනුවල දී මූලික ගෙවීම් ඉල්ලා නොසිටියි.
- අදාළ දිනුම් ඇදීම විදේශයකින් ඔබට හිමි වී ඇති බවට පවසයි නම් අදාළ දේශීය නියෝජිතයන්ගෙන් හෝ තානාපති කාර්යාල හරහා ඔබට විමසා බැලිය හැකි ය.

රැකියා වංචා (Employment Scams)

රැකියා විරහිත ව මහත් බලාපොරොත්තු සහිත ව පසුවන ඕනෑ ම අයෙක් තමන්ට හිමි වීමට ඇති රැකියාව වෙනුවෙන් ඕනෑ ම අවදානමක් ගැනීමට සූදානමින් සිටි සිටින බැව් හොඳින් වටහාගන්නා වංචාකරුවෝ එයින් වංචනික ප්‍රයෝජන ගනිති. මෙම වංචාවල දී දේශීය ව හෝ විදේශීය ව ඉතා ආකර්ෂණීය වැටුප් තල සහිත ව ව්‍යාජ රැකියා අවස්ථා ලබා දෙන බවට පවසා පුද්ගලයන් රැවටීමට ලක් කරයි. මේ සම්බන්ධයෙන් සිදු කළ යුතු සම්බන්ධීකරණ කටයුතු සහ වීසා සහ වෙනත් ලියකියවිලි කටයුතු වෙනුවෙන් ඇවැසි මූලික වියදම ඔබ විසින් දැරිය යුතු බවත් එය ඔවුන් පවසන ගිණුමකට තැන්පත් කරන ලෙසත් ඔබට පවසයි. ඔබ විසින් වියදම දැරූ පසු අදාළ රැකියා අවස්ථාව පිළිබඳ තවදුරටත් විමසීමට කිසිවෙකුත් නොමැත.

රැකියා වංචාවේ ස්වභාවය පිළිබඳ ව විමසා බලමු.

- විධිමත් තහවුරු කර ගැනීමේ ක්‍රියා පටිපාටියක් හෝ සම්මුඛ පරීක්ෂණ මාලාවක් දැකිය නොහැක.
- රැකියාව හිමි වීමටත් මත්තෙන් අතිකාරම් මුදලක් ගෙවන ලෙසට ඉල්ලයි.
- ආයතනික තොරතුරු සහ රැකියා විස්තර අපැහැදිලි ය. නිල රැකියා ගිවිසුමක් ද නොමැත.

රැකියා වංචාවෙන් ඔබ ආරක්ෂා වන්නේ කෙසේද? මෙම කරුණු පිළිබඳ ව නැවතත් සිතා බලන්න.

- සෑම විට ම බඳවා ගැනීම් සිදුකරන ආයතනයේ හෝ අදාළ නියෝජිතයාගේ නීත්‍යානුකූලභාවය සහ විශ්වසනීයත්වය තහවුරු කරගන්න.
- රැකියා අයදුම්පත්‍ර වෙනුවෙන් කිසිවිටෙකත් හඳුනා නොගත් පුද්ගලයන් වෙත මූලික ගෙවීම් සිදු කිරීමෙන් වළකින්න.
- ලිඛිත රැකියා ගිවිසුමක් ඉල්ලා සිටින්න. සේවා යෝජකයා සෘජුව ම සම්බන්ධ කරගත හැකි ලිපිනයක් සහ දුරකථන අංකයක් ඉල්ලා සිටින්න.

ප්‍රේම වංචා (Romance Scams)

වංචාකරු ඔබට දුරස්ථ ව වාසය කරන බොහෝ විට විදේශිකයෙකු ලෙස පෙනී සිටිමින් ප්‍රථමයෙන් ම මාර්ගගත ව ඔබ සමග ආදර සබඳතාවක් ආරම්භ කරයි. සැලකිය යුතු කාලයකට පසු ඔබේ විශ්වාසය දිනා ගැනීමෙන් අනතුරුව ඔබේ අනාගත ජීවන සහකරු ලෙස පෙනී සිටිමින් නිවසක් ඉදිකිරීම විදේශ රටක පදිංචියට යෑම හෝ විවාහ උත්සවය සැලසුම් කිරීම යනාදී ඔබ දෙදෙනාගේ ම අනාගතය වෙනුවෙන් වන අතිශය පෞද්ගලික හේතු දක්වමින් එකී අවශ්‍යතාවන් වෙනුවෙන් ඔබෙන් මුදල් ඉල්ලා සිටියි. මෙසේ ඔහු/ඇය කෙරෙහි විශ්වාසය තබා මුදල් ලබා දීමෙන් අනතුරුව ඔබ සමග පැවති සියලු ම සබඳතා විසන්ධි කර දමයි.

ප්‍රේම වංචාවේ ස්වභාවය පිළිබඳ ව විමසා බලමු.

- මෙකී වංචාවලට ගොදුරු වන්නන් වංචාකරුවන් ආදරණීය සහකරුවකු ලෙස තම ජීවිතයට අනිසි ලෙස හිතවත් කරගනියි.
- සබඳතාව ඉතා වේගයෙන් ක්‍රියාත්මක වන අතර සිහින මවාපාමින් විශාල පොරොන්දු රැසක් ඉදිරිපත් කරයි.
- ඔබ කිසි දිනෙකත් මෙම පුද්ගලයා හමු වී නොමැත.
- පෞද්ගලික මෙන් ම සංවේදී කාරණාවන් ඉදිරිපත් කරමින් ඔබෙන් මුදල් ඉල්ලා සිටියි.

ප්‍රේම වංචාවෙන් ඔබ ආරක්ෂා වන්නේ කෙසේද? මෙම කරුණු පිළිබඳ ව නැවතත් සිතා බලන්න.

- ඉතාම කෙටි කාලයක් තුළ හරි හැටි හඳුනා ගැනීමකින් තොර ව මාර්ගගත ව ඉතා වේගයෙන් බැඳෙන සබඳතාවන් පිළිබඳ ව වඩාත් සැලකිලිමත් වන්න.
- පෞද්ගලික ව හමුවී නොමැති කිසි ම පුද්ගලයෙකුට මුදල් යැවීමෙන් වළකින්න.
- මාර්ගගත ව මුණ ගැසෙන ආධුනික පුද්ගලයන් වෙත ඔබේ පෞද්ගලික මූල්‍ය තොරතුරු කිසිවක් හුවමාරු කිරීමෙන් වළකින්න.

භාණ්ඩ/ සේවා වංචා (Goods/ Services Scams)

ඔබව පුදුම කරවන තරම්, වටිනා වාසි රැසක් සහිත ව, ඉතා ම අඩු මුදලකට විකිණෙන යම් භාණ්ඩයක් හෝ සේවාවක් සම්බන්ධයෙන් බොහෝ විට මාර්ගගත ව ඔබට දැකිය හැකි වන දැන්වීමකි. විකුණුම්කරු විසින් මේ අදාළ භාණ්ඩය හෝ සේවාව ඔබට වෙන් කරවා ගැනීමට හෝ ඔබ වෙත ගෙන්වා ගැනීමට නම් යම්කිසි අත්තිකාරම් මුදලක් ගෙවන මෙන් ඉල්ලා සිටියි. ඔබ අත්තිකාරම් මුදල ගෙවූ පසු අදාළ භාණ්ඩය හෝ සේවාව ඔබට නොලැබේ. එමෙන් ම විකුණුම්කරු සම්බන්ධ කර ගැනීමට ද නොහැකි වේ.

භාණ්ඩ/ සේවා වංචාවේ ස්වභාවය පිළිබඳ ව විමසා බලමු.

- අදාළ පිරිනැමීම/දීමනාව අහිමි කර ගැනීම පාඩුවක් බවට ඇඟවීම.
- වෙනත් අයෙකු මෙම දීමනාව හිමි කර ගැනීමට මත්තෙන් එම අවස්ථාව වහා ම ඔබ සතු කරගන්නා ලෙස කෙරෙන පෙළඹවීම සහ බලපෑම.
- විකුණුම්කරු විසින් අත්තිකාරම් මුදල ගෙවීමට කෙරෙන බලපෑම.
- අදාළ භාණ්ඩය හෝ සේවාව මිලදී ගැනීමට පෙර පරීක්ෂා කර බැලීමට ඇති නොහැකියාව.
- විකුණුම්කරු සම්බන්ධ කර ගැනීමට කිසිදු මාර්ග යක් නොමැති වීම සහ ඔවුන් පවසන තොරතුරු තහවුරු කරගත නොහැකි වීම.

භාණ්ඩ/සේවා වංචාවෙන් ඔබ ආරක්ෂා වන්නේ කෙසේද? මෙම කරුණු පිළිබඳ ව නැවතත් සිතා බලන්න.

- ඔබ කිසි දිනක නොදන්නා පුද්ගලයන්ගේ හෝ වෙබ් අඩවිවලින් කිසිවිටෙකත් භාණ්ඩ මිලදී ගැනීමේ දී අත්තිකාරම් ගෙවීමෙන් වළකින්න.

- සෑම විට ම විකුණුම්කරු පෞද්ගලික ව හමුවීමට අවස්ථාව ලබාගන්න. එමෙන් ම මාර්ගගත ව භාණ්ඩ මිලදී ගැනීමේ දී ආධුනික ආයතනවලින් මිලදී ගන්නේ නම් භාණ්ඩ තමන් වෙත ලැබුණු පසු මුදල් ගෙවීමේ විකල්පය පුහුණු කරන්න.
- ඕනෑ ම ගනුදෙනුවක් සිදුකිරීමට පෙර මාර්ගගත විකුණුම්කරුගේ හෝ අදාළ මාර්ගගත වෙළෙඳපොළෙහි විශ්වසනීයත්වය සහ අනන්‍යතාව තහවුරු කර ගන්න.

මාර්ගගත විකුණුම් සහ ජංගම ගෙවීම් යෙදවුම් සම්බන්ධ වංචා (Online Shopping) Payment App Scams)

මෙහි දී ප්‍රසිද්ධ සන්නාමයන් සහිත නිෂ්පාදන ඉතාම අඩු මිල ගණන් යටතේ විකිණීම සම්බන්ධයෙන් වන දීමනා සහිත වංචා සහගත වෙබ් අඩවි සහ වෙළෙන්දන් බොහෝවිට දැකිය හැකි ය.

ඇතැම් අවස්ථාවන්හි දී අදාළ ගනුදෙනුව සම්පූර්ණ කිරීම සඳහා ඔබේ පෞද්ගලික බැංකු විස්තර හෝ රහස්‍ය මුර පද ඉල්ලා සිටියි. ඉතා උපක්‍රමශීලී මෙම වංචාකරුවන් ඔබේ බැංකු ගිණුම් අංකය නොදන්නා ගෙවීම් යෙදවුම්වලට සම්බන්ධ කරමින් අවභාවිතා කරයි.

මාර්ගගත විකුණුම් සහ ජංගම ගෙවීම් යෙදවුම් සම්බන්ධ වංචාවේ ස්වභාවය පිළිබඳ විමසා බලමු.

- මෙම වංචාවලට හසුවන පුද්ගලයන් මාර්ගගත ගෙවීම්වල දී සිදු විය හැකි අවදානම් පිළිබඳ අවධානයක් යොමු නොකිරීම.
- අදාළ වෙබ් අඩවිය හෝ ගෙවීම් යෙදවුම ව්‍යාජ වංචා සහගත බවට ඇති නොදැනුවත්කම.

ඔබ සැලකිලිමත් විය යුත්තේ ඇයි?

- ඕනෑවට වඩා මිල ගණන් අවම කරන නොදන්නා වෙළෙන්දන් සහ වෙබ් අඩවිවලින්.
- ඔබේ රහස් මුර පද, පෞද්ගලික හඳුනාගැනීමේ අංක (OTP) වැනි කිසිදු තුන්වන පාර්ශ්වයක් සමගින් හුවමාරු නොකළ යුතු අතිශය පෞද්ගලික තොරතුරු ඔබෙන් ඉල්ලා සිටින විට.
- පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ආපසු ගෙවීම පිළිබඳ ප්‍රතිපත්තියක් නොමැති විට.

මාර්ගගත විකුණුම් සහ ජංගම ගෙවීම් යෙදවුම් සම්බන්ධ වංචාවෙන් ඔබ ආරක්ෂා වන්නේ කෙසේද? මෙම කරුණු පිළිබඳ ව නැවතත් සිතා බලන්න.

- බොහෝ දෙනා අතර ප්‍රචලිත මාර්ගගත වෙළෙඳ යෙදවුම් පමණක් භාවිත කරන්න.
- වෙළෙන්දෙක් හෝ බැංකු නියෝජිතයෙක් වශයෙන් පෙනී සිටියත් කිසිදු තුන්වන පාර්ශ්වයකට ඔබේ පෞද්ගලික මුර පද හෝ රහස්‍ය අංක ලබාදීමෙන් වළකින්න.
- ඔබට ආධුනික හෝ නොදන්නා ගෙවීම් පද්ධති හෝ යෙදවුම් ඔබේ ජංගම දුරකථනයට හෝ ජංගම උපකරණවලට බාගත කිරීමෙන් වළකින්න.
- කිසිසේත් ම නොදන්නා වෙබ් අඩවියක ඔබේ බැංකු ගිණුම් අංක ඇතුළත් කිරීමෙන් වළකින්න.

වෙස් වලා ගැනීම්/ අනන්‍යතාවය මත කෙරෙන වංචා (Impersonation/ Identity Theft)

වංචාකරු ඔබට මූල්‍ය ප්‍රතිලාභ ලබා දීමේ පොරොන්දුව මත ඔබේ හැඳුනුම්පතේ තොරතුරු හුවමාරු කිරීමට හෝ බැංකු ගිණුමක් විවෘත කිරීමට ඔබ ව පොළඹවයි. ඔබ වෙනුවෙන් ම යැයි පවසා රැස්කර ගන්නා මෙකී පෞද්ගලික තොරතුරු, පසු ව ඔබේ අනුදැනුමකින් තොර ව අනීතික කටයුතු සඳහා යොදා ගැනෙයි. පසුකාලීන ව නීති විරෝධී කටයුත්තක් සිදුවීමෙන් අනතුරුව සිදු කෙරෙන පරීක්ෂණවල දී, මේ අන්දමින් ඔබ විසින් හුවමාරු කරගත් ඔබේ ම පෞද්ගලික තොරතුරු හේතුවෙන් කිසිදු දැනුවත් භාවයකින් තොර ව ඔබ ද නොදන්නා වැරදිවලට සම්බන්ධ වී තිබේ.

වරදට හසුවන්නන් බොහෝවිට සිය පෞද්ගලික තොරතුරු වෙනත් පාර්ශ්වයන් සමග බෙදා ගැනීමේ අවදානම නොදැන, ඔවුන් තවෙකෙකුට උපකාරයක් කරන ලෙස හෝ ඔවුන්ට හිමි මුදලක් ලබා ගැනීම ලෙසට අනුමාන කරයි.

වෙස්වලා ගැනීමේ වංචාවේ ස්වභාවය පිළිබඳ ව විමසා බලමු.

- මෙකී ආධුනිකයන් මුදල් හුවමාරු කිරීම පිණිස ඔබේ පෞද්ගලික තොරතුරු ඉල්ලා සිටියි.
- වෙනත් පාර්ශ්වයක් වෙනුවෙන් ඔබට බැංකු ගිණුමක් විවෘත කරන ලෙස ඉල්ලා සිටියි.
- විධිමත් හෝ ලිඛිත ගිවිසුමක් මීට අදාළ නොවේ.

වෙස් වලා ගැනීමේ වංචාවෙන් ඔබ ආරක්ෂා වන්නේ කෙසේද? මෙම කරුණු පිළිබඳ ව නැවතත් සිතා බලන්න.

- ඔබ නොදන්නා කිසිදු පාර්ශ්වයකට ඔබේ ජාතික හැඳුනුම්පත, බැංකු පාස් පොත, 'ඒ.ටී.එම්' කාඩ් පත හෝ ගිණුම් අංකය ලබාදීමෙන් වළකින්න.
- වෙනත් පාර්ශ්වයක් ඔවුන් වෙනුවෙන් ඔබට බැංකු ගිණුමක් විවෘත කරන ලෙස ඉල්ලා සිටියි නම් වහා

ම මගහරින්න. එහි අවශ්‍යතාව පිළිබඳ තාර්කික ව විමසා බලන්න.

- යම්කිසි ලෙසකින් ඔබේ පෞද්ගලික තොරතුරු හෝ ලියකියවිලි අවභාවිත කර ඇති බවට ඔබට සැක සහිත ඕනෑ ම විටෙක වහා ම ඔබේ ගිණුම් පවත්වාගෙන යන බැංකුවට සහ ළඟම ඇති පොලිස් ස්ථානය වෙත වාර්තා කරන්න.

ක්‍රිප්ටෝ/අතත්‍ය මුදල් වංචා (Cryptocurrency Scams)

ඉහළ එමෙන් ම වේගවත් ප්‍රතිලාභ ලැබෙන බවට පොරොන්දු වෙමින් ඔබට ක්‍රිප්ටෝ (අතත්‍ය මුදල්) යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීමට, මෙකී වංචාකරුවෝ ආරාධනා කරති. මෙවැනි ඇතැම් යෝජනා ක්‍රමවල දී නව සාමාජිකයන් මෙම යෝජනා ක්‍රමවලට හඳුන්වා දීම මත ප්‍රසාද දීමනා ඉපයීමේ හැකියාවක් ඇති ලෙස ප්‍රකාශ කරයි. මූලික අදියරවල දී ඔබේ විශ්වාසය දිනාගැනීම පිණිස ඉක්මන් ප්‍රතිලාභ ගෙවයි.

ප්‍රධාන වශයෙන් ම ක්‍රිප්ටෝ මුදල් පිළිබඳ ඇති නිවැරදි අවබෝධයක් නොමැතිකම හේතුවෙන්, ඉහළ ප්‍රතිලාභ ඉතා ඉක්මණින් ලබාදෙන බවට කෙරෙන වංචා සහගත පොරොන්දුවලට ඇතැමුන් ඉක්මණින් හසු වේ.

ක්‍රිප්ටෝ/ අතත්‍ය මුදල් වංචාවේ ස්වභාවය පිළිබඳ විමසා බලමු.

- කිසිදු නියාමනයකින් තොර ව සහ නීතිමය ආවරණයක් නොමැති ව ක්‍රිප්ටෝ ආයෝජන සඳහා ප්‍රතිලාභ පොරොන්දු වීම.
- වෙනත් අය හඳුන්වා දීම වෙනුවෙන් දීමනා පිරිනැමීම.
- ලාභ උත්පාදනය වන ආකාරය පිළිබඳ කිසිදු විනිවිද භාවයක් නොමැතිකම.

ක්‍රිප්ටෝ/ අතත්‍ය මුදල් වංචාවෙන් ඔබ ආරක්ෂා වන්නේ කෙසේද? මෙම කරුණු පිළිබඳ ව නැවතත් සිතා බලන්න.

- ක්‍රිප්ටෝ මුදල් ආයෝජනයට පෙර ඒ ආශ්‍රිත සියලු ම අවදානම් පිළිබඳ ව හොඳින් දැනුවත් වන්න.
- අලුතින් සාමාජිකයන් හඳුන්වා දීම මත දීමනා හෝ ලාභ පොරොන්දු වන යෝජනා ක්‍රම පිරමිඩාකාර විය හැකි ය.
- ඕනෑ ම ආයෝජන ක්‍රමයක මුදල් යෙදවීමට පෙර රජයේ පිළිගත් ආයතනයක් විසින් පිළිගැනීමට ලක් කර ඇති බව සහ නියාමනයට ලක් කර ඇති බවට තහවුරු කරගන්න.

මෙම මූල්‍ය වංචා සමාජය තුළ මෙතරම් ව්‍යාප්ත වන්නේ කෙසේද?

මෙකී විවිධාකාර මූල්‍ය වංචාවන් වේගයෙන් සමාජයේ ව්‍යාප්ත වන්නේ සහ මෙතරම් සාර්ථක ව ක්‍රියාත්මක වන්නේ මිනිසුන්ගේ නූගත්කම නිසාම නොවේ. ඇතැම් අවස්ථාවල උගත් ධනවත් විවිධ තරාතිරම්වල පුද්ගලයන් පවා මෙම වංචාවලටට හසු වන්නේ මූල්‍ය වංචාකරුවන්ගේ ඇති දක්ෂකම සහ මිනිසුන් රැවටීමට ඇති මනා නිපුණත්වය හේතුවෙනි. සමාජයේ විවිධ මට්ටම්වල පුද්ගලයන්ගේ හැසිරීම සහ දැනුවත් භාවය පිළිබඳ මේ වංචාකරුවන් මනා ලෙස අධ්‍යයනය කරමින් ඔවුන් සමග විශ්වාසය ගොඩනැගෙන ආකාරයට කෙසේ හැසිරිය යුතු ද යන්න ඉතා පැහැදිලි ව හඳුනාගෙන ඇත. මූල්‍ය වංචාකරුවන්ගේ ස්වභාවය තවදුරටත් විශ්ලේෂණය කළහොත්:

- **මූල්‍ය වංචාකරුවන් ඔබේ හැඟීම් සමග ගනුදෙනු කරයි.**

මූල්‍ය වංචාකරුවන් ඔබ සමග ගනුදෙනු කරන්නේ හුදෙක් මුදල්වලින් පමණක් ම නොවෙයි; ඔවුන් මිනිස් සිතේ ඇතිවන විවිධාකාරී වූ ඔබේ හැඟීම්වලට ආමන්ත්‍රණය කරයි, ඒ ඔස්සේ ඔබව වංචාවන්වලට පොළඹවා ගනියි.

- ඔවුන් ඉක්මන් ප්‍රතිලාභ පොරොන්දු වන විට, ඒ ඔස්සේ ඔබේ දැඩි ආශාවන් සහ බලාපොරොත්තු සහගත බව තව තවත් වැඩි කරයි. ඉතා ඉක්මණින් පොහොසත් විය හැකි ආකාර පිළිබඳ ව ඔබ සිහින මවයි.
- ඔබේ බැංකු ගිණුමට ඇති අවදානම් පිළිබඳ ව ඔවුන් පවසන විට, ඔබට බියක් තැති ගැනීමක් ඇතිවේ. ගිණුමෙහි ඇති මුදල් ආරක්ෂා කර ගැනීමට ඔබ වහා ක්‍රියාත්මක වේ.
- ඔබට ප්‍රතිලාභ ලබා ගැනීමට ඇත්තේ ඉතාම කෙටි කාලයක් බවට ඔවුන් පවසන විට, ඔබේ මනස ඉතා හදිසි, එමෙන් ම බලවත් අවශ්‍යතාවක් වෙනුවෙන් කලබලකාරී වෙයි.
- ඔබ තවදුරටත් ප්‍රමාද වුවහොත් ඔබට ලැබිය හැකි වටිනා අවස්ථාවක් ඔබෙන් ගිලිහී යන බවට ඔවුන් පවසන විට, ඔවුන් ඔබ තුළ පසුතැවීම් සහගත හැඟීමක් නිර්මාණය කරයි.

මේ ආකාර වූ හැඟීම් මිනිස් සිත තුළ ඇති කළ විට මිනිසුන් තර්කානුකූල ව අවස්ථා විමසනවා වෙනුවට දෙවරක් නොසිතා ඉබේ ම ක්‍රියා කරන්නට වහා ම පෙළඹේ.

සිය දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු වෙනුවෙන් මුදල් සොයමින් සිටින පියෙක්, සිය අනාගතය වෙනුවෙන් විදේශගත වීමට සිහින මවන තරුණයෙක්, රෝගාතුර ව සිටින සිය පවුලේ සාමාජිකයෙකුගේ ප්‍රතිකාර වෙනුවෙන් මුදල් එකතු කරන අයෙක් වැනි අප අතර ම සිටින අපේ ම දැඩි මුදල් අවශ්‍යතාවන්ගෙන් පෙළෙන මිනිසුන්, වංචා කරුවන්ගේ ගොදුරු බවට පහසුවෙන් පත් වන්නේ එකී වික්ෂිප්ත වූ මානසික මට්ටම් පිළිබඳ ව අපටත් වඩා හොඳින් ඔවුන් අවබෝධ කරගෙන සිටින බැවිනි.

- **වංචාකරුවන් සාමාන්‍යයෙන් පැමිණෙන්නේ ඔබ විශ්වාස කරන පුද්ගලයන් හරහායි.**

වර්තමානයේ දැකිය හැකි විශාලතම අනතුරු සහගත තත්ත්වයක් වන්නේ බොහෝ වංචාවන් ව්‍යාප්ත වන්නේ ඔබට හුරුපුරුදු පුද්ගලයන් හරහා වීමයි.

මේ ඔස්සේ ආරක්ෂාව පිළිබඳ ව්‍යාජ හැඟීමක් උපදවයි. අප හොඳින් දන්නා පුද්ගලයෙක් මෙකී වංචා සහගත කටයුතු විශ්වාස කරයි නම්ඒවා අනිවාර්යෙන් ම සත්‍ය බවට විශ්වාස කිරීමට ඔබ පොළඹවනු ලබයි. නමුත් බොහෝ විට ඔවුනුත් එම වංචාවේ ම ගොදුරු බවට පත්වී ඇති බැව් දැනගන්නාා විට බොහෝ ප්‍රමාද ය.

- **මූල්‍ය වංචාකරුවන් පෙනුමෙන් සහ කථාවෙන් වෘත්තිකයන් ලෙස පෙනී සිටියි.**

අද ක්‍රියාත්මක කෙරෙන බොහොමයක් මූල්‍ය වංචා ඉතා සූක්ෂ්ම ලෙස සංවිධානය කර ඇත්තේ ජනතාව පැහැදිලි ව ම නොමග යවන පරිදි ය.

මනා ලෙස සැකසූ වෙබ් අඩවි, වෘත්තිමය ලෙස පිළියෙළ කළ ලියකියවිලි, ලියාපදිංචි කළ බවට හැඟවෙන සන්නාම, ලාංඡන මෙන් ම මූල්‍ය උපදේශකයන් හෝ බැංකුකරුවන් ලෙසින් පෙනී සිටිමින් ඔබ අමතන ආයතනික සේවකයන් හරහා ජනතාව මුළා කරමින් සිටිති. මෙවන් මුහුණුවරක් සහිත ව ජනතාව ඉදිරියට පැමිණෙන විට සත්‍ය සහ ව්‍යාජ පුද්ගලයන් කවුරුන්දැයි පැහැදිලි ව ම හඳුනා ගැනීම සැබවින් ම අපහසු කාර්යයක් වේ.

- **ඔබට අවම ගෙවීමක් යටතේ හෝ කිසිදු ගෙවීමකින් තොර ව ආකර්ෂණීය ප්‍රතිලාභ ලබාදෙයි.**

ඔබට විශාල ප්‍රතිලාභ ලැබෙන බවට හැඟවූ විට එමගින් ඔබේ අවධානය දිනා ගත හැකි බව මූල්‍ය වංචාකරුවන් හොඳින් දනී. මාසයක් වැනි කෙටි කාලයක් ඇතුළත ඔබ අතැති මුදල දෙගුණ කර දීම, කිසිදු සුදුසුකමක් නොමැති වුවත් විදේශයක රැකියාවක් ලබා දීම, ලකුණු කළ මිලට වඩා හරි අඩකට ලබාගත හැකි රත්තරන්, ලියකියවිලි පිරවීමේ හිසරදයට සමුදෙමින් ඉක්මනින් ණය ලබා ගැනීමේ අවස්ථා, මෙවැනි උපක්‍රමශීලී ඉදිරිපත් කිරීම් අතර කැපී පෙනේ. මෙවැනි පොරොන්දු හරහා ජනතාව යොමු කරන්නේ තාර්කික චින්තනය පසෙකලා සිහින මැවීමටයි. නොදැනුවත් ව ම ඔවුන්ගේ උගුලට හසුවන්නේ එවිටයි. සැබෑ ජීවිතයේ දී කිසිදු අවදානමක් නොමැති ව, කිසිදු සාධාරණ කාලයක් වැය නොකර, කිසිදු උත්සාහයකින් තොර ව, කිසිදු ප්‍රතිලාභයක් ලබා ගත නොහැකි බව, මෙම අවස්ථා පිළිබඳ ව තාර්කික බුද්ධියකින් විමසූ විට වැටහේ.

- **ප්‍රතිලාභ සීමිත බැවින් මේ පිළිබඳ තොරතුරු වෙනත් අය සමඟ හුවමාරු කර නොගන්නා ලෙසට ඔබෙන් ඉල්ලයි.**

"මේ සුවිශේෂී දීමනාවක්, හැමෝට ම මේ අවස්ථාව ලැබෙන්නේ නැ, මෙය ඔබ සතුවන තෙක් අනිත් අය සමඟ හුවමාරු කරගන්න එපා, රහසිගත ව තබාගන්න". "ප්‍රතිලාභ සීමිත නිසා, බොහෝ පිරිසක් මෙයට සම්බන්ධ වුණොත් වැඩි දෙනෙකුට අවස්ථාව ලබා දෙන්න බෑ, එසේ වුවහොත් ඔබේ අවස්ථාවත් අහිමි විය හැකියි". මේ අන්දමින් උපාය සහගත ප්‍රකාශ හරහා ජනතාව නොමග යැවීමට මූල්‍ය වංචාකරුවෝ දක්ෂ වෙති.

මෙම රහස්‍යභාවය මත, මේ පිළිබඳ ව කිසිවෙක් තවකෙක් සමග පරීක්ෂා කිරීමට තබා දැඩි තණ්හාව හේතුවෙන් පැවසීමටවත් ඉදිරිපත් නොවේ. තමන් වංචාවකට හසු වී ඇති බවට ඔවුන් වටහා ගන්නා විට, කාලය බොහෝ දුර ගොස් ඇති අතර ඊට විරුද්ධ ව ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රමාද වැඩි ය.

- **ඩිජිටල් සාක්ෂරතාවේ හිඟකම සහ දැනුවත් භාවය අඩු කම.**

මූල්‍ය ආයතන සැබවින් ම ක්‍රියාත්මක වන ආකාරය, බැංකු හෝ මූල්‍යායතන ලියාපදිංචි දැයි හඳුනාගත හැකි ආකාරය, ආරක්ෂිත ව පිවිසිය හැකි වෙබ් අඩවි ගැන හෝ පණිවිඩ ලබාගත හැකි ආකාර මෙන් ම සැක කටයුතු මූල්‍ය වංචාවක් අදාළ බලධාරීන්ට වාර්තා කළ හැකි ආකාරය පිළිබඳ ව මූල්‍ය වංචාවලට හසුවන බොහොමයක් අය නොදනිති. සමාජයේ උගත් යැයි පිළිගත් පුද්ගලයන්ගේ පවා මූල්‍ය සාක්ෂරතාව සහ තාක්ෂණය පිළිබඳ ඇති නොදැනුවත් භාවය හේතුවෙන් දිනෙන් දින නව මුහුණුවරින්, විශේෂයෙන් සමාජ මාධ්‍ය ජාලා හරහා පෙනී සිටින මූල්‍ය වංචාකරුවන් ඔබ සිතනවාට වඩා වේගයෙන් සාර්ථක වෙමින් පවතී.

අපේ ආරක්ෂාව අපි ම සපයා ගනිමු.

මෙහි දී ඔබට වැදගත් ම පණිවිඩය වන්නේ මූල්‍ය වංචාවන්ගෙන් බේරී සිටීම කළ නොහැක්කක් නොවන බවයි. ඒ සඳහා ඔබට විශේෂ පුහුණුවක් අවශ්‍ය වන්නේ නැත. ඔබට අවශ්‍ය වන්නේ ඉතා සුළු දැනුවත් භාවයක්, විමසිලිමත් භාවයක් සහ හොඳ මූල්‍ය විනයක් පමණි. මූල්‍ය වංචාකරුවන්ගෙන් ආරක්ෂා විය හැකි ආකාරය අපි විමසා බලමු.

- **ක්‍රියාත්මක වීමට පෙර දෙවරක් සිතීමට පුරුදු වෙමු.**
- මුදල් සම්බන්ධ තීරණ ගැනීමේ දී කලබල නොවිය යුතු ය.
- මූල්‍යමය ගනුදෙනුවල දී ස්වයං විශ්ලේෂණයක් සහිත ව ඒ සම්බන්ධයෙන්, පහත සඳහන් ප්‍රශ්න නැවත වරක් ඔබෙන් ම විමසා බලන්න.
- මෙම පුද්ගලයන් එතරම් ඉහළ ප්‍රතිලාභයක් මට ගෙවන්නේ ඇයි, මට දීමනාවක් හිමි නම් ඒ වෙනුවෙන් ප්‍රථමයෙන්ම මට ගෙවීමට යැයි පවසන්නේ ඇයි, මේ ලියාපදිංචි සහ නියාමනය වන ආයතනයක්ද?
- අවසාන තීරණයකට එළැඹීමට මත්තෙන් මොහොතක් නතර වන්න. ඔබට තවදුරටත් ආරක්ෂා වීමට නම් විශ්වාස කටයුතු වෙනත් අයෙකුගෙන් විමසා බලන්න. මූල්‍ය වංචාවන් ඉතා වේගයෙන් වර්ධනය වෙමින් පවතී. තීරණය ගැනීමට ඔබ මොහොතකට ප්‍රමාද වීම, අනිවාර්යෙන් ම ඔබේ දිගු කාලීන සතුටට හේතු වනු ඇත.
- **ආයතනයේ අනන්‍යතාව සහ ලියාපදිංචිය තහවුරු කරගනිමු.**

තනි පුද්ගලයෙක් විසින් සිදු කරන ප්‍රකාශයන් හෝ පෙළඹවීම් මත නොරැඳී ආයතනික නිල වෙබ් අඩවි සහ නියාමනය කෙරෙන ආයතන හරහා ඔබට ලබා දෙන තොරතුරු පිළිබඳ ව සුපරික්ෂාකාරී වන්න.

- **විශ්වාස කටයුතු වෙනත් අයෙක් අමතා විමසීමට කල් ගනිමු.**

ඔවුන් ලබාදෙන දීමනාවල රහස්‍ය භාවය සුරැකීමට මූල්‍ය වංචාකරුවන්ට ඇවැසි වුවත්, එකී නිහඬතාව බිඳීමට ඔබට අයිතියක් තිබේ. මූල්‍යමය තීරණවල දී එක් මනසකින් විමසනවාට වඩා සෑම විට ම අවම වශයෙන් පුද්ගලයන් දෙදෙනෙකු හෝ සිටී නම් විමසිලිමත් භාවය වැඩි ය. ඇතැම්විට ඔබ නොදකින පැතිකඩකින් අවදානම කල්තියා හඳුනා ගැනීමට ඉඩහසර උදාවනු ඇත.

- **පෞද්ගලික තොරතුරු ආරක්ෂා කර ගනිමු.**

බැංකු ගිණුම් මුර පද, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයට යොදන පෞද්ගලික හඳුනා ගැනීමේ අංක (PIN), එක් වරක් භාවිත කෙරෙන මුර පද (OTP), ජාතික හැඳුනුම්පත්/විදේශ ගමන් බලපත්‍ර අංක, නොදන්නා යෙදවුම්වලට ඇතුළත් වීමට ඇඟිලි සලකුණු සහ මුහුණු මුර පද යනාදිය දෛනික ජීවිතයේ දී ඔබ භාවිත කරන වෙනත් භෞතික දෑ මෙන් ම, අතිශය පෞද්ගලික තොරතුරු ලෙසට සැලකිය යුතු ය. කිසිදු නීත්‍යානුකූල මූල්‍ය ආයතනයක් මෙම තොරතුරු SMS, WhatsApp හෝ දුරකථන ඇමතුම් හරහා ඉල්ලා නොසිටින බව තරයේ වටහා ගන්න. සෑම විට ම එසේ හුවමාරු කිරීමට කෙරෙන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට ඔබට අයිතියක් ඇති අතර සැක සහිත ඕනෑ ම විටෙක තහවුරු කර ගැනීමට මූල්‍ය ආයතනය ඇමතීමට ද ඔබට හැකියාව ඇත.

- **සමාජ මාධ්‍ය භාවිතයේ දී සහ මාර්ගගත පණිවුඩ පිළිබඳ ව විපරම් සහිත වෙමු.**

මූල්‍ය වංචාකරුවන් තවදුරටත් සම්ප්‍රදායික රාමුවට කොටු වී ඔබ වෙතට නොපැමිණේ. සමාජ මාධ්‍ය ජාලවල වේගවත් ව්‍යාප්තිය හේතුවෙන් උද්වේගකර පණිවුඩ, Facebook දැන්වීම්, ඡායාරූප මාධ්‍යයේ ව්‍යාජ ගිණුම්, බැංකු ඇඟවීම් ලෙසට ලැබෙන ව්‍යාජ ඊ-මේල් පණිවුඩ, අනීතික ආයෝජන ක්‍රම ප්‍රවර්ධනය කෙරෙන ශ්‍රව්‍යදෘශ්‍ය වීඩියෝ ඕනෑ තරම් ඔබේ දුරකතනයටත් ලැබෙනු ඇති. සැකකටයුතු හෝ නොදන්නා කිසිදු සබැඳියක් (Link) පරීක්ෂා කිරීමෙන් වළකින්න. ඕනෑ ම ආයතනික ප්‍රවර්ධන මූලාශ්‍රයක නිල සමාජ මාධ්‍ය ජාල පැහැදිලි ව හඳුනාගැනීමට නිල් පැහැති හරි සලකුණ (Blue tick) තිබේදැයි විමසන්න. මාර්ගගත ව, නොමිලේ, මුදල් හෝ විශේෂ දීමනා ලබා දීමට පොරොන්දු වන ඕනෑ ම අයෙක් පිළිබඳ ව සැක සහිත ඇසින් බැලීම වරදක් නොවේ. එය වඩාත් නුවණට හුරු ය.

- **සැක කටයුතු ඕනෑ ම මූල්‍ය වංචාවක් වහා ම වාර්තා කිරීමට පුහුණු වෙමු.**

පෞද්ගලික ව ඔබේ මුදල් අහිමි නොවුව ද, යම් තැනක මූල්‍ය වංචාවක් සිදු වේ යැයි ඔබට හැඟේ නම්, සැක කටයුතු ඕනෑ ම මොහොතක ඒ පිළිබඳ ව වාර්තා කරන්න. ඔබේ විමසිලිමත් භාවය තුළින් තවෙකෙකු බේරාගත හැකි ය.

- මූල්‍ය වංචාවක ගොදුරක් බවට පත්වුවහොත් : ළඟ ම ඇති පොලිස් ස්ථානයට පැමිණිල්ලක් යොමු කරන්න.

- බැංකු ගිණුමක් සම්බන්ධ ව සිදු වූ වංචාවක් නම් : අදාළ බැංකුව වෙත ද වහා ම වාර්තා කරන්න.

සමාප්තිය

ඩිජිටල් අවකාශයේ සැරිසැරීමේ ඇති පහසුව මෙන් ම මූල්‍ය ගනුදෙනුවල සිදුවන වේගවත් ව්‍යාප්තිය සමගින් මූල්‍ය වංචාකරුවන්ගෙන් බේරීමට නම්, සුපරීක්ෂාකාරී වීම පමණක් තවදුරටත් විකල්පයක් නොවේ. එය අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ගයකි. මූල්‍ය වංචා යනු මුදල් සම්බන්ධ ගනුදෙනු පිළිබඳ වන අපරාධමය වරදක් පමණක් ම නොවේ. ඒවා පුද්ගල විශ්වාසයන් පාවා දීම තුළින් දිගුකාලීන ව සමාජයීය මෙන් ම ආර්ථිකමය කැළැල් ඇති කළ හැකි ව්‍යසනකාරී තත්ත්වයන් ලෙසට හඳුන්වා දිය හැකියි. මූල්‍ය වංචා නවීන තාක්ෂණයත් සමගින් අඛණ්ඩ ව පරිණාමය වනවිට ඊට සමගාමී ව අපගේ දැනුවත් භාවය ද, ආරක්ෂාකාරී පියවර ද එසේ ම විය යුතු ය. දැනුවත් ව සිටීමෙන්, සැක කටයුතු ප්‍රශ්න සහගත දීමනා, මූල්‍ය යෝජනා ක්‍රම පිළිබඳ ව නිරන්තරයෙන් ප්‍රශ්න කිරීමෙන්, ආරක්ෂාකාරී පියවර අපගේ ප්‍රජාව තුළ ප්‍රචලිත කිරීමෙන්, අප රැවටීමට සිටින මූල්‍ය වංචාකරුවන්ට එරෙහි සාමූහික අවියක් අප අතර ම ගොඩනගා ගත හැකිවනු ඇත. වංචාවක ගොදුරක් වූ පසු, ඉතා මහන්සියෙන් රැස් කරගත් සිය සේසත ම අහිමි කරගැනීමෙන් පසු, දුක් වීම, බිය වීම හෝ පසු තැවීම නොව, වංචාවට පෙර සූදානමක් ලෙසින් දැනුමින් සවිමත් වීම, විමසිලිමත් වීම, සුපරීක්ෂාකාරී වීම හොඳ ම අවිය බව සැවොම වටහා ගත යුතු ය.

මූලාශ්‍ර:

- මූල්‍ය වංචා: සැනසුම සොයා වැනසෙමුද?, මූල්‍ය බුද්ධි ඒකකය ශ්‍රී ලංකා මහ බැංකුව. (2023)

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/financial_scams_the_hell_underneath_the_heaven_s.pdf (Accessed: 01 June 2025).

ගෙවීම් කාඩ්පත්වල විකාශය: වර්තමාන ගැටලු සහ ඉදිරි ගමන් මග

එච් පී ඒ ප්‍රියශාන්ති
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව

ගෙවීම් කාඩ්පත් යනු වර්තමානයේ දී පාරිභෝගිකයින්ට මෙන් ම ව්‍යාපාරිකයින්ට ද නැතිව ම බැරි මූල්‍ය උපකරණයකි. මූල්‍ය ආයතයක් මගින් තනි පුද්ගලයෙකු හෝ ආයතයක් වෙත නියමිත කාල පරිච්ඡේදයක් සඳහා ලබා දෙන මෙම කාඩ්පත් භාවිත කර ගිණුම් පරීක්ෂා කිරීම, මුදල් ආපසු ගැනීම, මුදල් මාරු කිරීම, බිල්පත් ගෙවීම යනාදිය සිදු කළ හැකි ය. කාඩ්පත්වලට පොදු මෙන් ම විශේෂිත වූ ගැටලු ද පවතින අතර එම ගැටලු විසඳීම සඳහා සුවිශේෂී වූ විශේෂාංග හඳුන්වා දී ඇත. එම නිසා මෙම ගෙවීම් කාඩ්පත් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ඔබගේ දෛනික කටයුතුවලට පහසුවක් වනු ඇත.

1 රූප සටහන: Dinners' Club Card



1. ගෙවීම් කාඩ්පත්වල ආරම්භය

ප්‍රථම වරට ගෙවීම් කාඩ්පත් නිකුත් කරනු ලැබුවේ 1914 දී Western Union විසිනි. එය ලෝහ භාවිත කර නිමවන ලද්දක් වූ අතර තෝරා ගන්නා ලද පාරිභෝගිකයින් පිරිසක් වෙත මෙය ලබා දී ඇත. මෙම කාඩ්පත භාවිත කර පසුව ගෙවීමේ පදනම මත ණයට මිල දී ගැනීම් පහසුකම සපයා ඇත. ඉන් පසුව තෙල් සමාගම් සහ හෝටල් විසින් ද එයින් අනතුරු ව නිව්යෝර්ක් නගරයේ Charga-Plate Group, Inc. ආයතනය විසින් ද ගෙවීම් කාඩ්පත් නිකුත් කර ඇත. ඉන් අනතුරු ව ලෝකය පුරා රටවල්වල විවිධ ගෙවීම් කාඩ්පත් නිකුත් කිරීම සිදු විය.

1949 දිනෙක ෆ්‍රෑන්ක් මැක්නමාරා නම් පුද්ගලයෙක් නිව්යෝක් නගරයේ ආපනශාලාවක් වෙත දිවා ආහාරය සඳහා ගිය අතර ඔහුට ඔහුගේ මුදල් පසුම්බිය රැගෙන යාමට අමතක වී තිබුණා. මේ නිසා ඔහුට ආහාර සඳහා ගෙවීම් කළ නොහැකි වූ බැවින් එහි දී ඔහුව අත්අඩංගුවට පත්වුණා. පසුව ඔහුගේ බිරිඳ පැමිණ අදාළ මුදල් ගෙවා ඔහු නිදහස් කර ගත්තා.

මෙම සිදුවීම මුල් කරගෙන වසරකට පසුව ෆ්‍රෑන්ක් මැක් නමාරා විසින් Diners' Club කාඩ්පත නමින් හැඳින් වූ කුඩා කාඩ්බෝර්ඩ් කාඩ්පතක් නිර්මාණය කර එමගින් ඔහුගේ බිල්පත් ගෙවීම ආරම්භ කළා.

2 රූපසටහන: ගෙවීම් කාඩ්පත්වල සුවිශේෂී සන්ධිස්ථාන



2. ගෙවීම් කාඩ්පත් වර්ග

ගෙවීම් කාඩ්පත් ප්‍රධාන වශයෙන් කොටස් තුනක් යටතේ වර්ග කෙරේ.

ණයපත (Credit Card): කලින් එකඟ වූ මුදල් සීමාවක් දක්වා කාඩ්පත් හිමියාට භාණ්ඩ හෝ සේවා මිල දී ගැනීමට හෝ උපයෝගී බිල්පත් ගෙවීම ඇතුළු ගෙවීම් සිදු කිරීමට මෙම කාඩ්පත් භාවිත කළ හැකි ය. සිල්ලර වෙළඳාමට මෙන්ම මාර්ගගත මිල දී ගැනුම් සඳහාත් මෙම කාඩ්පත් භාවිත කළ හැකි ය. කාඩ්පත් හිමියන් විසින් කාඩ්පත මගින් සිදු කළ ගෙවීම්වලට අදාළ සම්පූර්ණ මුදල හෝ ගෙවිය යුතු අවම මුදල (minimum payment) මුදල් ගෙවා අවසන් කළ යුතු දිනට ප්‍රථම ගෙවිය යුතු ය. යම් ගාස්තුවක් මත මෙම කාඩ්පත භාවිතා කර ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් මුදල් ආපසු ගැනීමට ද පුළුවනි. ඇතැම් මූල්‍ය ආයතන ණයපත් නිකුත් කිරීම සඳහා වාර්ෂික ගාස්තුවක් අය කරන අතර ඇතැම් ආයතන ගාස්තුවකින් තොර ව ණයපත් නිකුත් කරනු ලබයි.

චාර්ජ් කාඩ්පත (Charge Card) ණයපත හා බොහෝකොට සමාන වන නමුත් එයින් වෙනස් වන්නේ බිල්පත් කාලය තුළ දී චාර්ජ් කාඩ්පතට අදාළ සම්පූර්ණ මුදල කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු වීම යි.

හරපත (Debit Card): හරපත යනු පාරිභෝගිකයාගේ බැංකු ගිණුමෙහි පවතින මුදල් ශේෂය පදනම් කරගෙන මුදල් ආපසු ගැනීමට හෝ භාණ්ඩ/ සේවා මිල දී ගැනීමට මූල්‍ය ආයතනය විසින් කාඩ්පත් හිමියාට පහසුකම් ලබා දෙන කාඩ්පත් විශේෂයකි. මුදල් ආපසු ගැනීමක දී හෝ මිල දී ගැනීමක දී ඊට අදාළ මුදල් ප්‍රමාණය අදාළ අවස්ථාවේ දී ම පාරිභෝගිකයාගේ බැංකු ගිණුමෙන් අඩු වේ. එමෙන් ම හරපතක් මගින් වෙනත් ගිණුමකට මුදල් මාරු කිරීමටත් බිල්පත් ගෙවීමටත් පහසුකම් සපයා දෙයි.

හරපත් හෝ ණයපත් භාවිත කිරීම දිරිමත් කිරීම සඳහා බැංකු විසින් විවිධ ප්‍රවර්ධන උපක්‍රම ක්‍රියාත්මක කරන අතර එහි දී කාඩ්පත් හිමියන් වෙත මුදල් නැවත ලබා දීම්, වට්ටම් ලබා දීම, ආයතනය වෙත පක්ෂපාතී වීම සම්බන්ධයෙන් ලකුණු පිරිනැමීම ඇතුළු වෙනත් ප්‍රතිලාභ ලබා දෙයි.

අගය රාශිගත කාඩ්පත් (Stored Value Card): මෙම කාඩ්පතෙහි පෙර තැන්පත් කරන ලද මුදල් ප්‍රමාණයක් ඇතුළත් ය. එක් එක් ගනුදෙනුව සිදු කරන අවස්ථාවේ දී ඊට අදාළ මුදල් ප්‍රමාණය පෙර තැන්පත් කර ඇති මුදලින් අඩු වේ. බොහෝ විට වවුචරයක ස්වරූපය ගන්නා මෙම කාඩ්පතට නැවත මුදල් ප්‍රතිපූරණය කළ හැකි ය.

ගෙවීම් කාඩ්පත්වල ප්‍රතිලාභ

- භෞතික මුදල් රැගෙන යෑමෙන් සිදුවන අවදානම් අවම වීම
- ලෝකය පුරා පිළිගන්නා මූල්‍ය උපකරණයක් වීම
- පහසු සහ ආරක්ෂිත ගෙවීම් ක්‍රමවේදයක් වීම
- Tap and pay පහසුකම සහිත වීම
- අයවැයකරණය පහසු කරවීම
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් මුදල් ගැනීමේ පහසුකම සහිත වීම
- භාවිත කරන පුද්ගලයාට අනුව විශේෂිත වීම
- ගිණුමේ ඇති ශේෂයට වඩා මුදල් ආපසු ගැනීමට හෝ මිල දී ගැනීම් සිදු කිරීමට හැකි වීම (පූර්ව අනුමැතිය සහිත ව ණයපතට පමණක් අදාළ වේ)
- හදිසි මූල්‍ය පහසුකම්, පහසු මාර්ගගත ගනුදෙනු, ව්‍යවහාර මුදල් පරිවර්තනය, පුනරාවර්තන ගෙවීම් සරල ව සිදු කිරීම, ත්‍යාග සහ මුදල් ආපසු ලැබීම යනාදී ප්‍රතිලාභ හිමි වීම.

3. ගෙවීම් කාඩ්පත් හා සම්බන්ධ ගැටලු

ආරක්ෂක අවදානම ඉහළ යෑම: කාඩ්පත් සොරකම් කිරීමේ හැකියාව හේතුවෙන් වංචා සහ අනවසර ගනුදෙනු සිදු විය හැකිය. ව්‍යාපාර විසින් කාඩ්පත්වල තොරතුරු ගබඩා කර තබන අතර එම තොරතුරු ආරක්ෂිත අයුරින් ගබඩා කර නොමැති නම් ඒවා සොරකම් කර වංචනික ගනුදෙනු සිදු කළ හැකි ය.

තමා සතු මුදලට වඩා වැය කිරීම: ක්ෂණික සහ පහසුවෙන් ම ප්‍රවේශ විය හැකි වීම නිසා කාඩ්පත් හිමියන් විසින් සිය මූල්‍ය හැකියා ඉක්මවා වියදම් කිරීම සුලබ ව දැකිය හැකි ය. එනම් කාඩ්පත භාවිත කර කලින් සැලසුම් නොකළ, අත්‍යාවශ්‍ය නොවන එමෙන් ම විනෝදාත්මක හා ආකර්ෂණීය භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට පහසුවෙන් ම පෙලඹීමට ඇති හැකියාව යි. එමගින් මාසය අවසානයේ දී කළමනාකරණය කරගත නොහැකි ඉහළ ණය ප්‍රමාණයක් සහිතය මූල්‍ය පීඩනයකට මුහුණ දීමට සිදු වේ.

ඉහළ ගාස්තු සහ අය කිරීම්: ගෙවීම් කාඩ්පත්වලට අදාළ විවිධ ගාස්තු හා අය කිරීම් රාශියක් ඇත. විශේෂයෙන් ම කාඩ්පත් හිමියන් නියමිත දිනට ඔවුන්ගේ සම්පූර්ණ ශේෂය නොගෙවන්නේ නම් ඒ සඳහා පොලියක් අය කෙරේ. වාර්ෂික ගාස්තුව ද තවත් උදාහරණයක් ලෙස

දැක්විය හැකි ය. නමුත් වර්තමානයේ දී කාඩ්පත් ලබා ගැනීම දිරි ගැන්වීම සඳහා වාර්ෂික ගාස්තු රහිත ව කාඩ්පත් නිකුත් කරනු ලබන අවස්ථා ද ඇත. වෙනත් රටවල දී මිල දී ගැනීම් සිදු කිරීමට අදාළ ව හා වෙනත් රටවලට මුදල් ගෙවීම් සිදු කිරීමට අදාළ ව ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීමේ දී විශේෂයෙන් ම ගාස්තු අය කෙරේ.

රහස්‍යතා ගැටලු: ගෙවීම් කාඩ්පත් භාවිත කිරීමේ දී ඇතිවන තවත් එක් ප්‍රධාන ගැටලුවක් වන්නේ රහස්‍යතා සම්බන්ධ ව ඇති වන ගැටලු ය. ගනුදෙනුවලට අදාළ විස්තර එනම් ගනුදෙනුව සිදු කරන ස්ථානය සහ ගනුදෙනුවට අදාළ මුදල් ප්‍රමාණය යනාදී පෞද්ගලික තොරතුරු මනා නිරීක්ෂණයකින් සොයා ගනියි. මෙම තොරතුරු අධ්‍යනය කර, පසුව අනිසි බලපෑම් කිරීමට හෝ වංචා සහගත ගනුදෙනු කිරීමට හෝ තෙවන පාර්ශ්වයකට විකිණීමට හෝ හැකි ය.

සංකීර්ණ නීතිරීති සහ කොන්දේසි: බොහෝ කාඩ්පත්වල තේරුම් ගැනීමට අපහසු සංකීර්ණ නියමයන් සහ කොන්දේසි ඇත. මෙම ඇතැම් කොන්දේසිවලට ගාස්තු අදාළ වේ. මෙසේ ඇතැම් නියමයන් හා කොන්දේසිවල විනිවිදභාවයක් නොමැති වීම හේතුවෙන් පාරිභෝගිකයින්ට අනපේක්ෂිත දඩ මුදල්වලට හෝ ගෙවීම්වලට යටත් වීමට සිදු වේ. එය, මූල්‍ය ආයතන සහ පාරිභෝගිකයින් අතර විවිධ ගැටලු ඇති කිරීමට හේතු වෙයි.

හඳුනාගත් ආරක්ෂක ගැටලු මගහරවා ගැනීම සඳහා ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නන් කාඩ්පත් සඳහා විවිධ විශේෂාංග හඳුන්වා දී ඇත. මේවායෙහි EMV චිප්, ද්විසාධක සත්‍යාපනය, තත්කාලීන වංචා නිරීක්ෂණය වැනි තාක්ෂණ ක්‍රමවේද ඇතුළත් වන අතර එමගින් අනවසර ප්‍රවේශ සහ අනිසි භාවිතවලින් කාඩ්පත් ආරක්ෂා කර ගත හැකි ය.

4. ගෙවීම් කාඩ්පත්වල ඇතුළත් විශේෂාංග

4.1. 3 රූපසටහන: කාඩ්පතෙහි ඉදිරි පස

01. **Smart chips**: EMV (Europay, Mastercard, සහ Visa) යනුවෙන් ද හැඳින්වෙන මෙම තාක්ෂණය 2010 දී පමණ හඳුන්වා දී ඇත. තොරතුරු ගබඩා කිරීම සඳහා ඉතා කුඩා ජයසව එකක් කාඩ්පතට සවි කර ඇත. එමගින්, ඉතා සියුම් ක්‍රියාවලියක් හරහා ගනුදෙනුවලට අදාළ දත්ත සංකේතනය කරයි. එක් එක් ගනුදෙනුව සඳහා අනන්‍ය කේතයක් භාවිත කරන අතර එමගින් කාඩ්පත් අනුකරණය කිරීමේ හැකියාව අවම කරයි.

02. ප්‍රධාන කර්මාන්ත කාණ්ඩය හඳුනා ගැනීමේ අංක **(The Major Industry Identifier (MII))**: එමෂ යනු කාඩ්පත් අංකයක පළමු ඉලක්කම වන අතර එය නිකුත් කරන ආයතනය ඇතුළත් කර්මාන්ත කාණ්ඩය දක්වයි. උදාහරණයක් ලෙස, MasterCard සහ Visa කාඩ්පත් මූල්‍ය ගෙවීම් කාණ්ඩය ලෙස වර්ගීකරණය කර ඇති අතර, Dinerzs Club සහ American Express කාඩ්පත් සංචාරක සහ විනෝදාස්වාද කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇත.

03. බැංකුව හඳුනා ගැනීමේ අංකය **(The Bank Identification Number (BIN))**: පළමු ඉලක්කම් 4 සිට 6 දක්වා වන බැංකුව හඳුනා ගැනීමේ අංකය, ගෙවීම් කාඩ්පතක් නිකුත් කරන මූල්‍ය ආයතනය වෙන් කොට හඳුනා ගැනීමට උපකාර වන අතර අදාළ ගනුදෙනු නිවැරදි මූල්‍ය ආයතනය සමග

සම්බන්ධ කිරීමට ද උපකාරී වේ. මෙම අංකය භාවිත කර වංචා අනාවරණ කර ගැනීමට ද හැකි ය. කාඩ්පත් නිකුත් කරන්නා පමණක් නොව ගෙවීම් ජාලය, කාඩ්පත් වර්ගය සහ නිකුත් කරන රට ද හඳුනා ගැනීමට මෙය උපකාරී වේ.

04. **කාඩ්පත් හිමියාගේ නම:** මෙය කාඩ්පත ලබා ගන්නා එනම් එය භාවිතා කිරීමට බලයලත් පුද්ගලයාගේ නමයි. කාඩ්පත භාවිත කර මිල දී ගැනීම් කළ හැක්කේ අදාළ කාඩ්පත් හිමියාට පමණි. ගෙවීම් සක්‍රීය කිරීමට පෙර වෙළෙඳුන් විසින් කාඩ්පත් හිමියන්ගේ අනන්‍යතාව තහවුරු කළ හැකි ය.

05. **බැංකු සන්නාමකරණය:** මෙමගින් කාඩ්පත නිකුත් කරන බැංකුවේ නම සහ ලාංඡනය පෙන්වයි.

06. **පෞද්ගලික ගිණුම හඳුනාගැනීමේ අංකය:** කාඩ්පත් හිමියාගේ ගිණුමට අදාළ ඉලක්කම් 9 කින් යුත් අංකයකි. මෙය ප්‍රාථමික ගිණුම් අංකය (Primary Account Number (PAN)) ලෙස ද හැඳින්වේ.

07. **පරීක්ෂා කිරීමේ ඉලක්කම (Check Digit Number):** කාඩ්පතේ අවසාන ඉලක්කමයි. දෝෂ හඳුනා ගැනීමට සහ කාඩ්පත් අංකයේ වලංගුභාවය සත්‍යාපනය කිරීමට මෙය උපකාරී වේ.

- නිකුත් කරන බැංකුව හඳුනා ගන්නා සඳහා භාවිත කරන බැංකුව හඳුනා ගැනීමේ අංකය (BIN) පෙන්නුම් කරන පළමු ඉලක්කම් 6.
- පරීක්ෂා කිරීමේ ඉලක්කම ලෙස හඳුන්වන අවසාන ඉලක්කම කාඩ්පත් හිමියාගේ හෝ ඔහුගේ ගිණුමේ කිසිදු පෞද්ගලික තොරතුරක් නොපෙන්වන නමුත් දෝෂ හඳුනා ගැනීමේ දී කාඩ්පත් අංකයෙහි වලංගුතාව තහවුරු කිරීම සඳහා එය උපකාරී වේ.
- ඉතිරි ඉලක්කම් 9 කාඩ්පත් හිමියාට පවරා ඇති ගිණුම් අංකය නියෝජනය කරයි.

09. **කල් ඉකුත්වන දිනය:** කාඩ්පත් හිමියාට කාඩ්පත භාවිතා කළ හැකි අවසාන දිනය යි. කල් ඉකුත්වීමට පෙර බැංකුව සාමාන්‍යයෙන් නව කාඩ්පතක් නිකුත් කරයි. මාර්ගගත ගෙවීම් සඳහා කල් ඉකුත්වන දිනය බොහෝ විට අවශ්‍ය වේ.

10. **ගෙවීම් ජාල ලාංඡනය:** මෙය කාඩ්පත පිළිගෙන ගනුදෙනුව සකසන ගෙවීම් ජාලයේ නම පෙන්වයි, උදා: VISA, Mastercard, AMEX. මාර්ගගත ගෙවීම්වල දී ගෙවීම් ජාලය තෝරා ගැනීම අවශ්‍ය වේ.

4.2. 4 රූපසටහන: කාඩ්පතෙහි පසුපස



08. **කාඩ්පත් අංකය:** ගනුදෙනු සඳහා භාවිත කරන ඉලක්කම් 16කින් යුත් අංකයකි (AMEX කාඩ් පත් සඳහා ඉලක්කම් 15කි). මෙයට ඇතුළත් වන්නේ,

01. **චුම්භක ඉරි (Magnetic Stripe):** ප්‍රධාන වශයෙන් චුම්භක ඉරි සහිත ගෙවීම් කාඩ්පත් 1970 දී නිකුත් කරන ලදි. කාඩ්පත් හිමියාගේ තොරතුරු ගබඩා

කරන චුම්භක තීරුවක් ප්ලාස්ටික් කාඩ්පතෙහි පිටුපස (කළු, දුඹුරු හෝ රිදී වර්ණයෙන්) සවි කර ඇත. එවිට එය "magnetic swipe" කාඩ්පතක් ලෙස හැඳින්වේ. චිප් කාඩ්පත් වැනි නව ණයපත්වල චුම්භක ඉරි භාවිත නොකෙරේ.

02. **අත්සන් පුවරුව:** කාඩ්පත් හිමියා හඳුනා ගැනීම සඳහා අත්සන් පුවරුව හඳුන්වා දෙන ලදි. කාඩ්පත් හිමියන් එම පුවරුවේ අත්සන් කිරීමට බැඳී සිටියි. එමගින් වෙළෙන්දන්ට කාඩ්පතේ අත්සන් රිසිට්පත සමඟ සංසන්දනය කිරීමට ඉඩ සැලසෙන අතර එමගින් ආරක්ෂාව වැඩි කිරීම අරමුණු විය. කෙසේ වෙතත්, ව්‍යාජ කාඩ්පත් සකස් කිරීම ඇතුළු තර්ජන හමුවේ මෙයින් බලාපොරොත්තු වූ ආරක්ෂාව සැලසීම සීමා සහිත විය.

03. **කාඩ්පත් සත්‍යාපන අගය:** අන්තර්ජාල ගනුදෙනුවල මෙන් ම ජංගම ගිණුම්වල ඇති යෙදුම් (app) භාවිතා කර සිදු කරන ගනුදෙනුවල ආරක්ෂාව ඉහළ නැංවීමේ අරමුණින් කාඩ්පත් සත්‍යාපන අගය (CVV) හෝ කාඩ්පත් සත්‍යාපන කේත (CVC) අංක 1990 දී පමණ හඳුන්වා දෙන ලදි. මෙම කේතවල ඉලක්කම් තුනක් හෝ හතරක් අඩංගු වන අතර ඒවා කාඩ්පතේ පිටුපස මුද්‍රණය කර ඇති අතර එමගින් අනවසර ගනුදෙනු අඩු කරයි.

04. **හොලෝග්‍රෑම්:** හොලෝග්‍රෑම් එකක් යනු කුඩා පරාවර්තක ත්‍රිමාණ රූපයක් අඩංගු ආරක්ෂක විශේෂාංගයකි. මෙම පින්තූරය ව්‍යාජ ලෙස පිටපත් කිරීම ඉතා අපහසු ය.

05. **ගෙවීම් කාඩ්පතක අවසාන ඉලක්කම් හතර:** කාඩ්පතේ ඉදිරිපස පැත්තේ දිස්වන PANහි අවසාන කොටසමය. මෙම විශේෂාංගය හරපත්වල නොමැත.

ක්‍රියාකාරිත්වය සහ ආරක්ෂාව යන කොටස් දෙක ම සැලකිල්ලට ගෙන ස්මාර්ට් විශේෂාංග සමඟින් නවීන කාඩ්පත් නිර්මාණය වෙමින් පවතී. වේගවත්ව, ආරක්ෂිතව සහ වඩාත් පහසු ලෙස ගනුදෙනු කිරීම මෙම නවෝත්පාදනයන්ගේ අරමුණයි.

ඩිජිටල් තිරය (Digital Display)

මෙම කාඩ්පත ඩිජිටල් තිරයකින් සමන්විත ය. එය සාමාන්‍යයෙන් තුනී බැටරියක් සහිත කුඩා LCD හෝ B-තීන්ත තිරයකි. මෙම ඩිජිටල් තිරයේ ගතික CVV, එක් වරක් පමණක් භාවිත කළ හැකි මුර පද, ගිණුමේ ශේෂය යනාදිය සාමාන්‍යයෙන් ප්‍රදර්ශනය වේ. මෙහි ආරක්ෂාව ඉතා ඉහළ වන අතර අනන්‍යතාව තහවුරු කිරීම සඳහා වෙනත් උපකරණයක් භාවිත කිරීම අවශ්‍ය නොවේ.

ජෛවමිතික කාඩ්පත් (Biometric Cards)

ඇඟිලි සලකුණු හඳුනා ගැනීමේ තාක්ෂණය ගෙවීම් කාඩ්පතට සෘජුව ම එක් කිරීමෙන් ජෛවමිතික ගෙවීම් කාඩ්පත් සකසා ඇත. එමගින් ආරක්ෂාව ඉහළ නැංවීම අරමුණු කෙරේ. අදාළ කාඩ්පත් හිමියාට පමණක් ගනුදෙනුව සම්පූර්ණ කළ හැකි ය. එබැවින් කාඩ්පත නැති වූ විට හෝ සොරකම් කර ඇති විටෙක කාඩ්පත යොදා ගෙන වංචනික ගනුදෙනු සිදු කළ නොහැකි ය.

5. ශ්‍රී ලංකාවේ ගෙවීම් කාඩ්පත් හිමියන් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර

ශ්‍රී ලංකාව තුළ ගෙවීම් කාඩ්පත් නිකුත් කරන සේවා සපයන්නන් රට තුළ ගෙවීම් කාඩ්පත් ආශ්‍රිත ව්‍යාපාර හෝ ක්‍රියාකාරකම්වල නියැලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වේ. මෙම සැපයුම්කරුවන් ප්‍රධාන කාණ්ඩ දෙකකට අයත් වේ. එනම් ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නන් සහ මූල්‍ය අත්පත් කරගන්නන් යනුවෙනි.

ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නන්ට වර්තමානයේ දී හරපත්, ණයපත්, අයභාර කාඩ්පත් සහ අගය රාශිගත කාඩ්පත් පිරිනමන ආයතන ඇතුළත් වේ. බැංකු මෙන් ම බැංකු නොවන වෙනත් ආයතන ද ගෙවීම් කාඩ්පත් නිකුත් කරනු ලැබේ.

මූල්‍ය අත්පත්කරුවන් යනු මිල දී ගැනීම් සඳහා ගෙවීම් කාඩ්පත් පිළිගැනීමට පහසුකම් සපයන ආයතන

1 වගුව: ශ්‍රී ලංකාවේ බලයලත් ගෙවීම් කාඩ්පත් සේවා සපයන්නන් (2024 අවසානය වන විට)

ව්‍යාපාර වර්ගය	සේවා සපයන්නන් ප්‍රමාණය
හරපත් නිකුත් කරන්නන්	32
ණයපත් නිකුත් කරන්නන්	18
අගය රාශිගත කාඩ්පත් නිකුත් කරන්නන්	12
අයභාර කාඩ්පත් නිකුත් කරන්නන්	01
මූල්‍ය අත්පත්කරුවන්	13

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

යි. එනම් කාඩ්පත් පාදක ගනුදෙනු සුරක්ෂිත ව හා කාර්යක්ෂම ව සිදු කිරීම සඳහා පහසුකම් සැලසීමයි. ඔවුන් විසින් මුදල් අත්තිකාරම්වලට අදාළ ප්‍රතිපූරණ ද සිදු කෙරෙයි.

ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු විසින් ණය කාඩ්පත් නිකුත් කිරීම ආරම්භ වූයේ 1989 දී ය.

ජංගම දුරකථනවල ඇති යෙදුම් (app) හරහා මිල දී ගැනීම් සිදු කිරීමේ දී හෝ මාර්ගගත ගනුදෙනු සඳහා ආරක්ෂිත ක්‍රමවේදයක් ලෙස යොදා ගනී.

කාඩ්පත සහ ඊට අදාළ ආරක්ෂක තොරතුරු වෙබ් බ්‍රව්සරය සහ සේවාදායකයා අතර හුවමාරු වෙයි. මෙම හුවමාරුව ආරක්ෂිත ව සම්ප්‍රේෂණය වන බව සහතික

5 රූපසටහන: හරපත් සහ ණයපත් මගින් සිදු කරන මූල්‍ය ගනුදෙනුවල ප්‍රමාණය හා වටිනාකම





මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

අප රටේ ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන පාදක ගෙවීම් පද්ධති නියාමනය කරනු ලබන්නේ 2013 ජුනි 07 වන දින නිකුත් කරන ලද 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග මගිනි. ණයපත්වලට අදාළ මෙහෙයුම් විධිමත් කිරීම සඳහා 2010 අංක 1 දරන ණයපත් මෙහෙයුම් මාර්ගෝපදේශ නිකුත් කර ඇත. තව ද, තාක්ෂණික වර්ධන සමඟ මූල්‍ය ගනුදෙනුවල ආරක්ෂාව සහතික කිරීම සඳහා ගෝලීය සහ දේශීය වශයෙන් ගනු ලැබ ඇති ආරක්ෂක පියවර අප රට ද උපයෝගී කර ගනු ලබයි. මෙම ආරක්ෂක විශේෂාංග පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

ශ්‍රී ලංකාවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් මුදල් ආපසු ගැනීමේ දී ඡෂහ මත පදනම් වූ සත්‍යාපනය බහුලව භාවිත වන අතර, ඡෂහ අංකය සෑම කාඩ්පත් හිමියෙකුටම අනන්‍ය වේ. එය කිසිවකු සමඟ හුවමාරු කර නොගත යුතුය. මෙය කාඩ්පතට ඇතුළත් කර ඇති EMV චිප් තාක්ෂණය සමඟ අත්වැල් බැඳ ගනී.

අන්තර්ජාල හරහා මිල දී ගැනීම් ජනප්‍රිය වීමත් සමඟ ශ්‍රී ලංකාව තුළ මාර්ගගත ගනුදෙනු වැඩි වශයෙන් භාවිතා වන බැවින්, එක් වරක් පමණක් භාවිතා කළ හැකි මුර පද (OTP) හඳුන්වා දී ඇත. ඒ අනුව, මෙය

කිරීම සඳහා ගෙවීම් දොරටු මගින් ආරක්ෂිත සොකට් ස්ථර (Secure Socket Layer (SSL)) සංකේතනය භාවිතා කරයි.

ශ්‍රී ලංකාවේ ජංගම මුදල් පසුම්බි භාවිතය වැඩිවීමත් සමඟ ටෝකනකරණය සහ සම්බන්ධතා රහිත ගෙවීම් ඉහළ ගොස් ඇති අතර, එහි දී ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදනය (Near Field Communication (NFC)) තාක්ෂණය භාවිතා කර පෞද්ගලික තොරතුරු නිශ්චිත ටෝකනයක් මගින් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ. ගනුදෙනුව අතරතුර කාඩ්පත් විස්තර සම්ප්‍රේෂණය නොවන බවට මින් සහතික වේ. එයින් වංචා සිදු වීමේ හැකියාව අඩු කෙරෙයි.

3D Secure (3DS) සත්‍යාපනයේ දී මුර පද භාවිත කෙරෙන අතර එමගින් මාර්ගගත ගනුදෙනු සඳහා අමතර ආරක්ෂාවක් සපයනු ලැබේ. අනවසර ගනුදෙනු වැළැක්වීම සඳහා ජංගම දුරකථන බැංකු යෙදුම් හරහා තම කාඩ්පත අගුළු ඇරීමේ සහ අගුළු දැමීමේ විකල්පය ද ශ්‍රී ලාංකේය කාඩ්පත් හිමියන්ට ලබා දී ඇත.

6. ගෙවීම් කාඩ්පත් සඳහා වන අනාගත අභියෝග

තාක්ෂණය සහ ආරක්ෂාව අඛණ්ඩ ව වෙනස් වීම සාමාන්‍ය තත්ත්වයක් වුව ද එතුළින් නව ආකාරයේ

වංචා බිහි වන අතර ඒ අනුව ඉදිරියේ දී ද නව ආකාරයේ තර්ජන සහ අවදානම් ඇති විය හැකි බව දැකිය හැකි ය.

කාඩ්පත් ක්ලෝනකරණය සහ ස්කිමිං (Advanced Card Cloning) Skimming)**:** අපරාධකරුවන් ගෙවීම් කාඩ්පතක චුම්බක තීරුවෙහි ඇති තොරතුරු සොරකම් කර, එම සොරකම් කර ගත් දත්ත ව්‍යාජ කාඩ්පතකට පිටපත් කිරීමයි.

Social Engineering) Deep fakes: Phishing attacks යනු තමාගේ සංවේදී දත්ත තමන් විසින් ම වංචනිකයින් අතට පත් කිරීමට කාඩ්පත් හිමියන් පෙලඹවීමේ ජනප්‍රිය උපක්‍රමයකි. එමඟින් වංචා ඉහළ යන අතර ඒවා අනාවරණ කර ගැනීමේ දී විවිධ අපහසුතාවලට මුහුණ දීමට සිදු වේ.

කෘත්‍රිම බුද්ධිය (AI) භාවිතයෙන් ක්‍රියාත්මක වන වංචා: ඉදිරියේ දී අපේක්ෂා කළ හැකි වඩාත් ම බලවත් තර්ජනය වන්නේ AI බලයෙන් ක්‍රියාත්මක වන වංචා ය. කාඩ්පත් හිමියන්ගේ හැසිරීම් සහ ගනුදෙනුවලට අදාළ දත්ත විශ්ලේෂණය කිරීමට AI සතු හැකියාව භාවිතයෙන් මෙය සිදු කළ හැකි ය. එපමණක් නොව AI තාක්ෂණය මගින් කාඩ්පත් හිමියන්ට වංචාකරුවන්ගේ හැසිරීම් තේරුම් ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා මෙන් ම අදාළ මූල්‍ය ආයතනවලට ඒවා අනාවරණ කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා ද අඩු කරයි. ඉතාමත් දියුණු මෘදුකාංග භාවිතයෙන් පෞද්ගලික තොරතුරු ලබා ගැනීමේ ඊමේල් (Phishing e-mails) නිෂ්පාදනය කළ හැකි අතර, ඒවා භාවිතයෙන් තොරතුරු සොරකම් කර මූල්‍ය වංචා සිදු කළ හැකි ය.

කෘත්‍රිම අනන්‍යතා වංචාව (Synthetic Identity Fraud): ජෛවමිතික සත්‍යාපනයේ දියුණුවත් සමඟ කෘත්‍රිම ලෙස ඇඟිලි සලකුණු නිර්මාණය වැනි දියුණු තාක්ෂණ මතුවනු ඇත. වංචනිකයින්ට ඩිජිටල් ගෙවීම් පද්ධති සූරා කෑමට සහ ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලික තොරතුරු සොරකම් කිරීමට මෙමගින් මග පාදන අතර එය සයිබර් අපරාධ සහ දත්ත කඩ කිරීම් (data breaches) වැඩි වීමට ද හේතු වේ.

මහා පරිමාණ දත්ත කඩ කිරීම්: ඩිජිටල් ගෙවීම් පද්ධති අඛණ්ඩ ව වර්ධනය වන විට මහා පරිමාණ දත්ත කඩ කිරීම් අවදානම ද වැඩි වේ. මිලියන සංඛ්‍යාත කාඩ්පත් හිමියන්ගේ පෞද්ගලික සහ මූල්‍ය දත්ත මෙහි දී නිරාවරණය කළ හැකි ය. තාක්ෂණයේ පරිණාමයත් සමඟ එවැනි ප්‍රහාර ක්‍රියාත්මක කිරීමට භාවිත කෙරෙන ශිල්පීය ක්‍රම වඩාත් දියුණු වෙමින් පවතින බැවින් ඒවා හඳුනා ගැනීමට අපහසු වේ.

රැහැන් රහිත අන්තර් නිරෝධනය (Wireless Interception - NFC/RFID ප්‍රහාර): සම්බන්ධතා රහිත ගෙවීම් කාඩ්පත් සහ හඳුනා සහ රේඩියෝ සංඛ්‍යාත හඳුනාගැනීමේ (RFID) තාක්ෂණය භාවිත කරන උපාංග ප්‍රමාණය වැඩිවීමත් සමඟ නව ආරක්ෂක අවදානම් මතු වී තිබේ. රැහැන් රහිත ස්කීම් උපාංග භාවිත කරමින් සයිබර් අපරාධකරුවන්ට අසල ඇති කාඩ්පත් තොරතුරු (කාඩ්පත් හිමියා පවා නොදැනුවත්ව ම) ග්‍රහණය කර ගත හැකි ය. මෙවැනි ප්‍රහාර බොහෝ විට කාර්යබහුල පොදු ස්ථානවල සිදුවන අතර කාඩ්පත සමඟ භෞතික සම්බන්ධතා අවශ්‍ය නොවන බැවින් ඒවා හඳුනා ගැනීම දුෂ්කර වේ.

අනිෂ්ට මෘදුකාංග සහ දුරස්ථ ප්‍රවේශ මෙවලම් (Malware) Remote Access Tools): ගෙවීම් පද්ධතියට අනවසරයෙන් ඇතුළුවීම සඳහා ප්‍රහාරකයින් වඩාත් ඵලදායී මාධ්‍යයක් ලෙස අනිෂ්ට මෘදුකාංග සහ දුරස්ථ ප්‍රවේශ මෙවලම් භාවිත කරයි. මෙම මෙවලම් POS යන්ත්‍ර, පාරිභෝගික දත්ත සමුදායන් සහ ආයතනික ජාල ආදියට අනවසරයෙන් රිංගා ගැනීමට භාවිත කළ හැකි ය. ප්‍රහාරකයින්ට ඇතුළට රිංගා ගත් පසු ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමට, ගෙවීම් කාඩ්පත් දත්ත විශාල ප්‍රමාණයක් සොරකම් කිරීමට සහ අනාවරණය වීම වළක්වා ගැනීම සඳහා අදාළ පද්ධති හැසිරවීම තමා යටතට ගැනීමට පවා පුළුවනි. බොහෝ විට අනිෂ්ට මෘදුකාංග අනාවරණ නොවී දිගු කාලයක් සැඟවී තිබෙන බැවින් කාලයත් සමඟ සැලකිය යුතු හානියක් සිදු වේ.

7. ගෙවීම් කාඩ්පත්වල ඉදිරි ආරක්ෂක පියවර

ගෙවීම් කාඩ්පත්වල ආරක්ෂාවට එරෙහි ව මතුවන තර්ජනවලට ගත යුතු ක්‍රියාමාර්ග එක් වරක් එය හඳුන්වා දීමෙන් පසුව අවසන් වන්නේ නැත. එය චක්‍රයක ස්වභාවය ගනී. නව වංචා හඳුන්වා දෙන අතර සෑම නව අභියෝගයක් ම නැවත නැවතත් වෙනස් වෙනස් ස්වරූපයන්ගෙන් ද පැමිණෙයි. එබැවින් වඩාත් දියුණු ආරක්ෂිත විශේෂාංග නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වේ.

AI පද්ධති සංවර්ධනය හේතුවෙන් තත්කාලීන වංචා හඳුනා ගැනීමේ මෘදුකාංග (Real time fraud detection software) හඳුන්වා දෙයි. මෙම මෘදුකාංගවලට ඇල්ගොරිතම සහ වියදම් රටා හඳුනා ගැනීමට හැකියාව ඇති අතර එමගින් සාමාන්‍ය නොවන වෙනස්කම්

දක්නට ලැබුණහොත් ඒවා පහසුවෙන් හඳුනා ගැනීමට උපකාරී වේ. එම සැක සහිත ක්‍රියාකාරකම් අවහිර කිරීමට මෙන් ම ඒවා සම්පූර්ණ කිරීමෙන් වළක්වා, වේගවත් ප්‍රතිචාරයක් ලබා දීමටත් මෙම මෘදුකාංගවලට හැකි වනු ඇත.

දියුණු ව්‍යාජ තාක්ෂණ ක්‍රමවේදයන්ට එරෙහි ව සටන් කිරීම සඳහා ජෛවමිතික බහුසාධක සත්‍යාපනය (Biometric Multi-Factor Authentication) උපකාරී වනු ඇත. ජෛවමිතික ව්‍යාජ ලෙස පිටපත් කිරීම ඉතාමත් දුෂ්කර ය. මෙම ජෛවමිතික සඳහා උදාහරණ ලෙස ඇඟිලි සලකුණු ස්කෑන්, මුහුණු හඳුනාගැනීමේ මෘදුකාංග හෝ හඬ රටා ඇතුළත් වේ.

කලින් සඳහන් කළ පරිදි CVV කේත යනු ඔබගේ ගෙවීම් කාඩ්පතේ පිටුපස ඇති ඉලක්කම් 3කින් යුත් කේතය වේ. කෙසේ වෙතත්, අනාගතය දී ගතික CVV කාඩ්පත් නිකුත් කෙරෙන අතර එමඟින් CVV කේත සෑම මිනිත්තු කිහිපයකට වරක් වෙනස් වන අතර එමඟින් කාඩ්පත සොරකම් කිරීමේ හැකියාව අඩු වේ. නමුත් එය Card Not Present (CNP) ගනුදෙනුවල දී භාවිත කළ නොහැකි ය.

Blockchain තාක්ෂණය පරිගණක රාශියක් හරහා ගනුදෙනු ගබඩා කරන බෙදා හරින ලද ලෙජර් (distributed ledger) තාක්ෂණයක් භාවිත කරයි. එබැවින් තනි ආයතනයකට සමස්ත ජාලය ම හැසිරවීමේ බලයක් හිමි නොවේ. දත්ත ගබඩා කිරීම විමධ්‍යගත කිරීම නිසා මෙය ඵලදායී වන අතර, දත්ත උල්ලංඝනය කිරීමේ අවදානම අඩු කරයි. ජාලයේ බහුතරයක පාලනය නොමැති ව, සියලු පසු කාලීන කොටස් මාරු නොකර වාර්තාවක් වෙනස් කිරීම අතිශයින් දුෂ්කර වනු ඇත.

අදෘශ්‍යමාන සත්‍යාපනය (Invisible authentication) යනු තිර අන්තර්ක්‍රියා, මූසික චලනය, ටයිප් කිරීමේ වේගය (screen interaction, mouse movement, typing speed) යනාදි හැසිරීම් ජෛවමිතික ව ලුහුබැඳීමයි. මේ අනුව, සාමාන්‍ය හැසිරීම් රටාව බිඳ වැටුනහොත්, අතිරේක සත්‍යාපන පියවරක් ගැනීමේ අවශ්‍යතාව ඇති වේ. මෙම ක්‍රමය අතිශයින් ම සාර්ථක වන්නේ එය එක් එක් පුද්ගලයාට විශේෂිත වූ ක්‍රියා මත රඳා පවතින බැවින් සහ එය අනුකරණය කිරීම අපහසු බැවිනි.

භෞතික ලක්ෂණ ඇතුළත් කිරීම තුළින් පහසුවෙන් කාඩ්පත් හැසිරවීම මෙන්ම තොරතුරු සොරකම් කිරීම ද අභියෝගාත්මක වෙයි. ඩිජිටල් ගෙවීම් පද්ධතිවල ජෛවමිතික සත්‍යාපනයේ කැපී පෙනෙන සන්ධිස්ථානයක් වූයේ ඇඟිලි සලකුණු සත්‍යාපනයට ඉඩ සැලසීමයි. පසුව ගනුදෙනුකරුවන්ගේ මුහුණු හඳුනාගැනීමේ දක්වා එය දියුණු විය. මෙම ආරක්ෂක ක්‍රියා මාර්ග තව දුරටත් දියුණු වනු ඇත.

ගෙවීම් කාඩ්පත් දෛනික මූල්‍ය ගනුදෙනු පහසු කරවන අතර ඊට අදාළ තාක්ෂණය ද වේගයෙන් වර්ධනය වේ. අප රටේ ද ගෙවීම් කාඩ්පත් භාවිතය වැඩි වී ඇති අතර සමගාමී ව ගෙවීම් කාඩ්පත් හා සම්බන්ධ වංචනික ක්‍රියා ද දිනෙන් දින ඉහළ යමින් පවතී. එම නිසා අප රට තුළ මෙන්ම ගෝලීය වශයෙන් ද ගෙවීම් කාඩ්පත්වලට ඇති තර්ජන හා ඉන් මිදීම සඳහා ඔබ අත්‍යවශ්‍යයෙන්ම දැන ගත යුතු ආරක්ෂිත පියවර පිළිබඳ ව ද නිරන්තරයෙන් විමසිලිමත් ව සිටීම ඔබගේ ගනුදෙනුවල පහසුව හා සුරක්ෂිතතාව වෙනුවෙන් ඉතාමත් වැදගත් වේ.

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

වංචාවලට නොරැවටෙන්න!

පාර්සල් වංචා

- වටිනා පාර්සල් සහ තෑගි
- නාඳුනන පුද්ගලයින්ගෙන් ලැබෙන පණිවුඩ
- විවිධ ගාස්තු අයකිරීම්

ලොතරැයි වංචා

- අනපේක්ෂිත ලොතරැයි ජයග්‍රහණ
- නාඳුනන පුද්ගලයින්ගෙන් ලැබෙන පණිවුඩ
- විවිධ ගාස්තු අයකිරීම්

රැකියා වංචා

- ඇදහිය නොහැකි තරමේ රැකියා ලාභ
- වහාම සේවයට බඳවා ගැනීමට සූදානම
- බඳවා ගැනීම ප්‍රථම පොඩි මුදලක් ඉල්ලීම

ප්‍රේම වංචා

- විවාහ පොරොන්දු
- නිවසක් ඉදි කිරීමට සැලසුම් කිරීම
- මූල්‍ය සහාය පැතීම

නිෂ්පාදන වංචා

- අඩු පිරිවැයක් සමග ඉහළ ප්‍රතිලාභ
- භාණ්ඩ භෞතිකව පරීක්ෂා කිරීමට ඇති අකමැත්ත
- අත්තිකාරම් මුදල් ගෙවන ලෙස ඉල්ලා සිටීම

පුණ්‍යාධාර වංචා



- ඇදහිය නොහැකි තරමේ යහපත් පුණ්‍ය කටයුත්තක් වීම
- හදිසි පරිත්‍යාග සඳහා ඉල්ලීම්
- පෞද්ගලික මූල්‍ය තොරතුරු ඉල්ලා සිටීම

අනන්‍යතා සොරකම

- නාඳුනන පුද්ගලයින් පෞද්ගලික තොරතුරු ඉල්ලා සිටීම
- නැතිවූ/ සොරකම් කළ හඳුනා ගැනීමේ ලේඛන
- මූල්‍ය දත්ත වෙත නීතිවිරෝධී ලෙස පිවිසීමට තැත් කිරීම

ක්‍රිප්ටෝ (Crypto) මුදල් වංචා

- කෙටි කලක් තුළ ඉක්මන් ප්‍රතිලාභ
- ඉතා ආකර්ෂණීය අලෙවිකරණය
- නියාමන අධිකාරියක් නොතිබීම

ආයතනික වංචා

- ආයාචිත (Spam) ඊමේල් පණිවුඩ
- දත්ත පද්ධතිවලට අනවසරයෙන් ඇතුළු වීම
- සොරකම් කළ හෝ අයථා ලෙස පරිහරණය කළ වත්කම්

විශ්වාස කිරීමට පෙර දෙවරක් සිතන්න

ඔබේ පෞද්ගලික දත්ත සුරකින්න

ප්‍රශ්න අසන්න

රැල්ලට හසු නොවන්න

ඔබේ මුදලට කුමක් සිදු වන්නේ ද යන වග දැන ගන්න

සහාය පතන්න

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ පණිවුඩයකි.

www.fiusrilanka.gov.lk ☎ 0112 477125 / 0112 477509